Voluntary National Review

on the Status of Implementing the Sustainable Development Goals

තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ තත්වය පිළිබඳ

ස්වේච්ඡා ජාතික සමාලෝචනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

2018 ජූනි

Government of the Democratic Socialist Republic of Sri Lanka

June, 2018

තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ තත්වය පිළිබඳ

ස්වේච්ඡා ජාතික සමාලෝචනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ තත්වය පිළිබඳ ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා ජාතික සමාලෝචනය

සියලුම හිමිකම් ඇවිරිණි, කෙසේ වෙතත් මූලාශ්‍රය සඳහන් කර මෙම ලේඛනය සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් සමාලෝචනය කිරීමට, උධෘත කිරීමට, නැවත සකස් කිරීමට හෝ පරිවර්තනය කිරීමට හැකිය

© තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය 2018 තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය විසින් ප්‍රකාශ කරන ලදී

තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය
1090, ශ්‍රී ජයවර්ධනපුර මාවත
රාජගිරිය
ශ්‍රී ලංකාව

පිටු සැකසුම අබ්දුල් බසිත්

පිටකවර සැලසුම ඩිල්ක් ෆෙරොස්

1 NO POVERTY
2 ZERO HUNGER
3 GOOD HEALTH AND WELL-BEING
4 QUALITY EDUCATION
5 GENDER EQUALITY
6 CLEAN WATER AND SANITATION
7 AFFORDABLE AND CLEAN ENERGY
8 DECENT WORK AND ECONOMIC GROWTH
9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE
10 REDUCED INEQUALITIES
11 SUSTAINABLE CITIES AND COMMUNITIES
12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION
13 CLIMATE ACTION
14 LIFE BELOW WATER
15 LIFE ON LAND
16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS
17 PARTNERSHIPS FOR THE GOALS
SUSTAINABLE DEVELOPMENT GOALS

ජනාධිපතිතුමාගේ
පණිවුඩය

තිරසර සංවර්ධන, වනජීවි සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය විසින් සම්පාදිත තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ තත්වය පිළිබඳ ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා ජාතික සමාලෝචනය සඳහා මෙම පණිවුඩය එවීමට හැකිවීම සතුටකි.

ශ්‍රී ලංකාව යනු ස්වභාවික සුන්දරත්වයෙන් අනූන සහ අභිමානවත් සංස්කෘතියකට හිමිකම් කියන දිවයිනක් වන අතර ඉතිහාසය පුරාවටම තිරසර සංවර්ධන මූලධර්මයන් වැළඳගත් රටකි. ජාතියක් ලෙස, ශ්‍රී ලංකාව සෑම විටම පරිසරය ආරක්ෂා කිරීම, සමාජ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම සහ ආර්ථික සමෘද්ධිය ළඟා කරගැනීම යන ගෝලීය ප්‍රයත්නයන්හිදී එයට සහය ලබාදීමට බැඳී සිටී.

මෙම පසුබිම තුළ අනෙකුත් ජාතීන් සමගම අපි තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය සමග බද්ධ වීමට 2015 දෙසැම්බර් මසදී බැඳී සිටියෙමු. 2017 ජූලි මාසයේදී පැවැත්වූ ඉහළ මට්ටමේ දේශපාලන සාකච්ඡාවේදී මීළඟට 2018 ජූලි මාසයේදී පැවැත්වෙන ඉහළ මට්ටමේ දේශපාලන සාකච්ඡාවේදී

ස්වේච්ඡා ජාතික සමාලෝචනය ඉදිරිපත් කිරීමට වන අපගේ අභිලාශය ප්‍රකාශ කර සිටියෙමු. මෙම සමාලෝචනය සිදු කර සියල්ල ඇතුළත් වූ ක්‍රියාවලියක් තුළින් මෙම වාර්තාව ලබාදීමට හැකිවීම පිළිබඳව මම ඉතා සතුටට පත් වෙමි.

වාර්තාවේ සඳහන් කර ඇති පරිදි, අධ්‍යාපනය හා සෞඛ්‍යය යන ක්ෂේත්‍ර තුළ මෙන්ම සියලු දෙනාටම පාහේ විදුලිය සැපයීම සම්බන්ධවද ශ්‍රී ලංකාව විශාල ප්‍රගතියක් ලබා ඇත. කෙසේ වෙතත්, සෞඛ්‍ය අංශය තුළ මැලේරියා උවදුර තුරන් කිරීම සහ මාතෘ මරණ අඩු කිරීම වැනි වන සාධනීය ජයග්‍රහණයන් පැවතියද වයස්ගත ජනගහනය වැනි බෝ නොවන රෝග වැනි අභියෝගයන් මතු වී ඇත. දීර්ඝ කාලීන, මධ්‍ය කාලීන සහ කෙටි කාලීන සැලසුම් සංවර්ධනය කිරීමෙන් සහ එම සැලසුම් යථාවත් කිරීම සඳහා සම්පත් වෙන් කිරීම මගින් මෙම අභියෝගයන් ජය ගැනීමට රජය විසින් පියවර ගෙන ඇත.

කිසිවෙකු මග නොහැරීම යන මූලධර්මය තිරසර සංවර්ධන ඉලක්කවල මධ්‍යය වන අතර එනිසාම තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා සියලු දෙනා ඇතුළත් වන විධි නියෝගයක් සකසා ගත යුතු වන්නේය. සෞඛ්‍ය පද්ධතිය, අධ්‍යාපන පද්ධතිය සහ සමාජ ආරක්ෂණ වැඩසටහන් ඇතුළත් වන සුබසාධන ප්‍රතිපත්ති සහ වැඩසටහන් යන සියල්ල, කිසිවෙකු මඟ නොහැරීම තහවුරු කරයි. ශ්‍රී ලංකාව 2017 වසර දිළිඳු බව තුරන් කිරීමේ වසර ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

අපගේ රට තිරසර සහ ප්‍රත්‍යස්ථ සමාජයක් බවට පරිවර්තනය කරගැනීම සඳහා වගකීම් බෙදාහදා ගැනීමට මමත් මගේ සහෝදර ජනයා සමග එක් වෙමි. රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය සහ සිවිල් සමාජ සංවිධාන වෙතින් සහය ලබමින් මෙම ක්‍රියාවලියේ ප්‍රධාන භූමිකාව දැරූ තිරසර සංවර්ධන, වන ජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය වෙත මගේ කෘතඥතාව පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

මෛත්‍රීපාල සිරිසේන
ජනාධිපති



අගමැතිතුමාගේ පණිවුඩය

2015 සහශ්‍රක සංවර්ධන ඉලක්ක සාර්ථකව ළඟා කරගනිමින් ශ්‍රී ලංකාව ජාතික ප්‍රතිපත්ති සහ උපාය මාර්ගයන් වෙත වන බැඳීම යළි තහවුරු කර ඇති අතර එය තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේලා මහඟු පිටිවහලක් වී ඇත. 2025 දැක්මඃ පොහොසත් රටක් යනු රජයේ දැක්ම පිළිබඳ ලේඛනය වන අතර එහි, ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනයන් සඳහා ඉවහල් වන මධ්‍යකාලීන ප්‍රතිපත්ති සහ උපක්‍රමයන් විස්තරාත්මකව දක්වන රාජ්‍ය ආයෝජන වැඩසටහනද එහි ඇතුළත් වේ.

එමෙන්ම, ශ්‍රී ලංකාව දැනටමත් 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත බලාත්මක කර ඇති අතර තිරසර සංවර්ධන සභාවක් ස්ථාපිත කිරීම සඳහා වන ජාතික ප්‍රතිපත්තියක් සහ උපාය මාර්ගයක් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩ සලසයි. එමෙන්ම 2015 වසරේදී, තිරසර සංවර්ධනය සඳහා වගකීම පි‍ණිස තිරසර සංවර්ධන සහ වනජීවි අමාත්‍යාංශය ස්ථාපිත කරන ලදී.

2017 වසරේදී පැවැත්වුණු ඉහළ මට්ටමේ දේශපාලන සාකච්ඡාවේදී පළමු ස්වේච්ඡා ජාතික සමාලෝචනය ඉදිරිපත් කිරීමේ තම අභිලාශය ශ්‍රී ලංකාව විසින් දක්වන ලදී. ස්වේච්ඡා ජාතික සමාලෝචනය සැකසීමේ ක්‍රියාවලිය සඳහා බහු පාර්ශ්වකාර එළඹුමක් සකසන ලද අතර එහිදී ප්‍රධාන ආයතනවල නිලධාරීන්ගෙන් සමන්විත කාර්ය සාධක බලකායක් මගින් ක්‍රියාත්මක කෙරිණි.

ස්වේච්ඡා ජාතික සමාලෝචනයේ තේමාව වන්නේඃ තිරසර සහ ප්‍රත්‍යස්ථ සමාජයන් වෙත පරිවර්තනය වීම රජයේ සංවර්ධන න්‍යාය පත්‍රයේ ප්‍රධාන අංගය ලෙස සැලකීමයි. වර්තමානයේදී ශ්‍රී ලංකාව, ඉහළ ආදායම් ලබන දැනුම මත පදනම් වූ, ඉහළ තරඟකාරී සහ සමාජ වෙළෙඳපොළ ආර්ථිකයක් වෙත යන ගමනේදී එහි දීර්ඝ කාලීන උපක්‍රමික සහ ව්‍යුහාත්මක සංවර්ධන අභියෝගයන් ජය ගැනීම සඳහා අවධානය යොමු කරමින් සිටී. ග්‍රාමීය සංවර්ධනය සහ සමාජ ආරක්ෂණය වෙත අවධානය යොමු කිරීමේදී කිසිවෙකු මඟ නොහැර සියලු දෙනාට සංවර්ධනයේ ප්‍රතිලාභ අත්විඳීම සහතික කිරීමට අපේක්ෂා කෙරේ.

ස්වේච්ඡා ජාතික සමාලෝචනය සැකසීමේ ක්‍රියාවලිය සමග සම්බන්ධ වූ සියලුම දෙනාට මගේ ස්තුතිය පිරිනමන අතර ස්වේච්ඡා ජාතික සමාලෝචනය තුළ හඳුනාගෙන ඇති තිරසර සංවර්ධන ඉලක්ක ලබාගැනීමට පසුගාමී අංශවලට වර්තමානයේ සහ අනාගතයේදී රජය විසින් ක්‍රියාත්මක කරන සංවර්ධන ග්‍රායාමයන් සහය ලබාදෙනු ඇතැයි අපේක්ෂා කරමි.

අපගේ අනාගත සැලසුම්වලට ස්වේච්ඡා ජාතික සමාලෝචනය මහඟු පිටිවහලක් වන බවට කිසිදු සැකයක් නැත. එමෙන්ම තිරසර සංවර්ධනය සඳහා වන ස්වේච්ඡා ජාතික සමාලෝචනය 2018 නිව්යෝක්හිදී මෙම උසස් අරමුණු ප්‍රායෝගික තලයකට ගෙන ඒම සඳහා වැදගත් භූමිකාවක් දරනු ඇති බව මට විශ්වාසය.



රනිල් වික්‍රමසිංහ
අගමැති

තිරසර සංවර්ධන, වනජීවි සහ ප්‍රාදේශීය සංවර්ධන

ඇමතිතුමාගේ

පණිවුඩය

ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීමේ ලා ප්‍රධාන කාර්ය භාරයක් සිදු කරන තිරසර සංවර්ධන, වනජීවි සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය වන මගේ අමාත්‍යාංශයට ස්වේච්ඡා ජාතික සමාලෝචන ක්‍රියාවලිය සාර්ථකව සිදු කිරීමට සහ වලංගුකරණ වැඩමුළුවේදී එකඟ වූ පරිදි ජාතික වාර්තාව සැකසීමට හැකි වීම පිළිබඳව සතුටට පත් වෙමි.

තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය තුළ,ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනය සම්බන්ධව මගේ අමාත්‍යාංශය සම්බන්ධීකාරක, පහසුකම් සැපයුම්කරු සහ වාර්තාකරු ලෙස කටයුතු කරයි. තිරසර සංවර්ධන ඉලක්ක ජාතික, පළාත් සහ ප්‍රාදේශීය මට්ටමින් රජයේ සැලසුම්වලට අනුගත කිරීමට

සහ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමට සහ ඔවුන් පුහුණු කිරීමට අපි කටයුතු කළෙමු.

මෙම ස්වේච්ඡා ජාතික සමාලෝචන වාර්තාව සකසා සම්පාදනය කරනු ලැබුවේ රජයේ පමණක් නොව පුද්ගලික අංශයේ, ප්‍රජා සංවිධානවල, විශේෂඥයින්ගේ සහ විද්වතුන්ගෙන් සැදුම්ලත් පාර්ශ්වකරුවන් ගණනාවකගේ සහයෝගයෙනි. වලංගුකරණ වැඩමුළුව ඇතුළුව පාර්ශ්වකරුවන් සම්බන්ධ කිරීමේ වැඩමුළු පහක් පැවැත්වුණු අතර එයට බොහෝ පිරිසක් සහභාගී වූහ. මගේ අමාත්‍යාංශය යටතේ ස්වේච්ඡා ජාතික සමාලෝචනය සැකසීමේ ක්‍රියාවලිය සිදු කරනු ලැබුවේ ප්‍රධාන අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල නියෝජිතයින්ගෙන් සැදුම්ලත් කාර්ය සාධක බලකායක් විසින් වන අතර එයට වාර්තා ලිවීම සඳහා ආයතනික උපදේශකයෙකුගේ සහය ලබාගනු ලැබිණි.

මෙම වාර්තාව තුළ තිරසර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් ඇති සැලකිය යුතු ජයග්‍රහණ, අභියෝග සහ ඉදිරි ගමන් මග විස්තර කරනු ලබයි. මෙම වාර්තාව මගින් තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ පරතරයන්, එම ක්‍රියාවලිය සඳහා සහය ලබාදීමට ප්‍රධාන රජයේ ආයතන විසින් ගන්නා ලද මූලාරම්භයන් සහ තිරසර සංවර්ධනයට අදාළ දීර්ඝ සහ මධ්‍යකාලීන ජාතික ප්‍රතිපත්ති පිළිබඳවද සඳහන් වෙයි. ඹහීඈක්ෂ මගින් සහය ලබා වෙළෙඳපොළ එළඹුමක් භාවිතා කළ වලංගුකරණ වැඩමුළුවේදී, 80% කට වඩා වැඩි පිරිසක් ප්‍රධාන සොයාගැනීම් සමගද, 95% ක් අභියෝගයන් සමගද 98% ක් ස්වේච්ඡා ජාතික සමාලෝචනයේ ඉදිරිමග නිමැවුම් සමගද එකඟ විය. තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීමට මෙම වාර්තාව අපගේ සාමාජික රාජ්‍යයන් සමග බෙදාහදා ගැනීමට හැකිවීම පිළිබඳව සතුටට පත් වෙමි. ස්වේච්ඡා ජාතික සමාලෝචන ක්‍රියාවලිය තුළදී අනෙක් රටවල් සමග අත්දැකීම් බෙදාහදා ගැනීමට අවස්ථාව ලැබීමෙන් පාර්ශ්වකරුවන් සම්බන්ධ වීමේ ක්‍රියාවලිය සහ තිරසර සංවර්ධන ඉලක්ක අධීක්ෂණ ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීමට හැකි විය.

මෙම ග්‍රායාමය සාර්ථක කරගැනීම සඳහා සහය දුන් අතිගරු ජනාධිපතිතුමා, ගරු අගමැති තුමා, තිරසර සංවර්ධන උපදේශක කමිටුව, ස්වේච්ඡා ජාතික සමාලෝචන කාර්ය සාධක බලකාය, ෂජී, අනෙක් රටවල සාමජිකයින්, පුද්ගලික අංශය, විද්වතුන් සහ සිවිල් සමාජ සංවිධාන, එක්සත් ජාතීන්ගේ මෙරට කණ්ඩායම, ඹහීඈක්ෂ නිලධාරීන්, ඕීෂෘ හි ප්‍රජතාන්ත්‍රික පාලනය සහ වගවීමේ ග්‍රාපෘතියේ කාර්ය මණ්ඩලය සහ මෙම අනෙක් සියලුම දෙනාට මගේ ස්තුතිය පල කරමි.



ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා

තිරසර සංවර්ධන, වනජීවි

සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍ය

පටුන

පණිවුඩ	4
කෙටි යෙදුම් මාලාව	8
රූප සටහන් ලැයිස්තුව	12
	13
01. හැඳින්වීම	**15**
02 සමාලෝචනය සකස් කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රම වේදය	**18**
03. ප්‍රතිපත්ති සහ බලදායී පරිසරය	**22**
3.1 තිරසර සංවර්ධන ඉලක්කයන්වල හිමිකාරීත්වය නිර්මාණය කිරීම	23
3.2 තිරසර සංවර්ධන ඉලක්ක සහ ජාතික ප්‍රතිපත්ති අතර පෙළගැන්නුම	27
3.3 ආයතනික යාන්ත්‍රණය	36
3.4 කිසිවෙකු මඟ නොහැරීම	38
04. ඉලක්ක සහ අරමුණු	
4.1 ඉහළ මට්ටමේ දේශපාලන සංසදය 2018 තුළ ගැඹුරින් සමාලෝචනය කිරීම සඳහා තෝරාගත් තිරසර සංවර්ධන ඉලක්ක	42
ඉලක්කය 6: පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව	42
ඉලක්කය 7: දැරිය හැකි පිරිසිදු බලශක්තිය	46
ඉලක්කය 11: තිරසර නගර සහ ප්‍රජාවන්	51
ඉලක්කය 12: වගකීමක් සහිත පරිභෝජනය සහ නිෂ්පාදනය	56
ඉලක්කය 15: මිහිමත ජීවය	59
4.2 අනෙකුත් තිරසර සංවර්ධන ඉලක්ක	65
ඉලක්කය 1: දරිද්‍රතාවට තිත	65
ඉලක්කය 2: කුසගින්න නිවාලීම	69
ඉලක්කය 3: යහපත් සෞඛ්‍යය හා යහපැවැත්ම	73
ඉලක්කය 4: ගුණාත්මක අධ්‍යාපනය	77
ඉලක්කය 5: ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව	83
ඉලක්කය 8: වැදගත් රැකියාවන් හා ආර්ථික වර්ධනය	85
ඉලක්කය 9: කර්මාන්ත, නවෝත්පාදන හා යටිතළ පහසුකම්	88
ඉලක්කය 10: අවම කරන ලද අසමානතාවන්	91
ඉලක්කය 13: දේශගුණික විපර්යාසය	93
ඉලක්කය 14: දිය යට ජීවය	96
ඉලක්කය 16: සාමය හා යුක්තිය	99
05. ක්‍රියාත්මක කරන ආකාර	**103**
06. නිගමනය	**111**

කෙටි යෙදුම් මාලාව

10YFP	තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ වැඩසටහන්වල 10 අවුරුදු රාමුව
ADB	ආසියානු සංවර්ධන බැංකුව
AirMac	වායු සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය
ASEAN	අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංවිධානය
BAU	සාමාන්‍ය ලෙස කෙරෙන ව්‍යාපාර
CBD	ජෛව විවිධත්වය සම්මේලනය
CBSL	ශ්‍රී ලංකා මහ බැංකුව
CCS	කාලගුණ විපර්යාස ලේකම් කාර්යාලය
CEA	මධ්‍යම පරිසර අධිකාරිය
CEB	ලංකා විදුලිබල මණ්ඩලය
CKDu	හේතු හඳුනාගත නොහැකි නිදන්ගත වකුගඩු රෝගය
COSTI	විද්‍යාව, තාක්ෂණය සහ නව්යෝත්පාදනය සඳහා වන සම්බන්ධීකරණ මහලේකම් කාර්යාලය
CPC	ලංකා ඛනිජ තෙල් සංස්ථාව
CRIP	කාලගුණ ප්‍රත්‍යස්ථිතිය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය
CRIWMP	කාලගුණ ප්‍රත්‍යස්ථිති අනුකලිත ජල කළමනාකරණ ව්‍යාපෘතිය
CSOs	සිවිල් සමාජ සංවිධාන
CZCRMP	වෙරළබඩ කලාප සහ වෙරළබඩ සම්පත් ප්‍රධාන සැලසුම්
DCS	ශ්‍රී ලංකා ජනගහන සහ ජන සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
DFAR	ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
DHS	ජන විකාශ සහ සෞඛ්‍ය සමීක්ෂණය
DM	කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
DMC	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
DPMM	ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව
ECE	පූර්ව ළමාවිය අධ්‍යාපනය
ECOSOC	එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ කවුන්සිලය
ETCA	ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතා ගිවිසුම
EEZ	සුවිශේෂී ආර්ථික කලාපය
EU	යුරෝපා සංගමය
FBOs	ගොවි පදනම් සංවිධාන
FDI	සෘජු විදේශ ආයෝජනය
FLFP	ශ්‍රම බලකායේ කාන්තා සහභාගීත්වය
FTA	නිදහස් වෙළඳ ගිවිසුම
G.C.E.	අධ්‍යයන පොදු සහතික පත්‍ර
GAP	යහපත් කෘෂිකාර්මික පරිචයන්

GATT	තීරුබදු සහ වෙළෙඳාම පිළිබඳ පොදු ගිවිසුම
GDP	දළ දේශීය නිෂ්පාදිතය
GII	ස්ත්‍රී පුරුෂ අසමානතා දර්ශකය
GII	ගෝලීය නවෝත්පාදන දර්ශකය
GMPs	යහපත් නිෂ්පාදන පරිචයන්
GNI	දළ ජාතික ආදායම
GoSL	ශ්‍රී ලංකා රජය
GR	ග්‍රාම රාජ්‍යය
GSP	වරණයන් පිළිබඳ පොදු ක්‍රමය
GSTP	ගෝලීය වරණ වෙළෙඳ ක්‍රමය
HARTI	හෙක්ටර් කොබ්බෑකඩුව කෘෂි පර්යේෂණ සහ පුහුණු ආයතනය
HCR	ජනගහන දරිද්‍රතා අනුපාතය
HDI	මානව සංවර්ධන දර්ශකය
HFIAS	ගෘහස්ථ ආහාර අනාරක්ෂිත බව වෙත පිවිසුම් පරිමාණය
HLPF	ඉහළ මට්ටමේ දේශපාලන සාකච්ඡාව
IAP2	මහජන සහභාගීත්වය පිළිබඳ ජාත්‍යන්තර සංගමය
IAS	ආක්‍රමණික පිටස්තර සත්ව විශේෂ
ICT	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය
IDB	කාර්මික සංවර්ධන මණ්ඩලය
IFAD	කෘෂිකර්ම සංවර්ධන සඳහා වන ජාත්‍යන්තර අරමුද
ILO	ජාත්‍යන්තර කම්කරු සංවිධානය
IOM	සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය
IPPC	ජාත්‍යන්තර පැලෑටි ආරක්ෂණ සම්මේලනය
IUCN	සොබාදහම සංරක්ෂණය කිරීම සඳහා වන ජාත්‍යන්තර සංගමය
IUU	නීති විරෝධී, වාර්තා නොකළ සහ නියාමනය නොකළ
LFP	ශ්‍රම බලකා සහභාගීත්වය
LLRC	උගත් පාඩම් සහ සංහිඳියා කොමිෂන් සභාව
LRT	සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධතිය
MCH	මාතෘ හා ළමා සෞඛ්‍යය
MDGs	සහශ්‍රක සංවර්ධන ඉලක්ක
MDM	ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
MMDE	මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය
MOH	සෞඛ්‍ය අමාත්‍යාංශය
MRG	බහු පාර්ශ්ව සමුද්දේශ කණ්ඩායම
MSAPN	පෝෂණය සඳහා වන බහු ආංශික ක්‍රියාකාරී සැලසුම
MSDWRD	තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය
NADeP	ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන

NAMA	බලපෑම් අවම කිරීමේ යෝග්‍ය ජාතික ක්‍රියාමාර්ගය
NAP	2016 -2025 ශ්‍රී ලංකාවේ කාලගුණ විපර්යාස බලපෑම සඳහා වන ජාතික ගැලපුම් සැලසුම
NAP-CC	කාලගුණ විපර්යාස බලපෑම සඳහා වන ජාතික ගැලපුම් සැලසුම
NAP-LD	ශ්‍රී ලංකාවේ භූමි හායනයට එරෙහිව සටන් කිරීමේ ජාතික ක්‍රියාකාරී වැඩසටහන
NARA	ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය
NASTEC	විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ජාතික කොමිෂන් සභාව
NBSAP	ජාතික ජෛව විවිධත්වය පිළිබඳ උපායමාර්ගික ක්රියාකාරී සැලසුම
NCCP	ජාතික කාලගුණ විපර්යාස ප්‍රතිපත්තිය
NCDs	බෝ නොවෙන රෝග
NCRE	සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය
NDA	ජාතික වශයෙන් නම් කරන ලද නියෝජිතායතනය
NDCs	ජාතිකමය ලෙස නිර්ණය කරන ලද දායකත්වයන්
NEDA	ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය
NFP	ජාතික කේන්ද්‍රීය ලක්ෂ්‍යය
NPD	ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව
NEP	ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය
NNC	ජාතික පෝෂණ සභාව
NPSSD	තිරසර සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය
NRIFAP	ජාතික REDD+ ආයතනික රාමුව සහ ක්‍රියාකාරී වැඩසටහන
NSTP	ජාතික විද්‍යා සහ තාක්ෂණික ප්‍රතිපත්තිය
NSWMSC	ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහය මධ්‍යස්ථානය
NWSDB	ජාතික ජල සැපයුම් සහ ජලාපවහන මණ්ඩලය
ODA	නිල සංවර්ධන සහය
ODSM	මෙහෙයුම් ඉල්ලුම් පැති කළමනාකරණය
OMP	අතුරුදහන් වූ අය පිළිබඳ කාර්යාලය
PIP	රාජ්‍ය ආයෝජන වැඩසටහන
RTS	ශීඝ්‍ර සංක්‍රමණ පද්ධතිය
R&D	පර්යේෂණ හා සංවර්ධන
SCP	තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය
SDC	තිරසර සංවර්ධන සභාව
SDGs	තිරසර සංවර්ධන ඉලක්ක
SDS	තිරසර සංවර්ධන උපාය මාර්ග
SEP	පාර්ශ්වකරුවන් සම්බන්ධ කරගැනීමේ සැලසුම
SLCDMP	ශ්‍රී ලංකා විස්තීර්ණ ආපදා කළමනාකරණ වැඩසටහන

SLCG	ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක බලකාය
SLITA	ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය
SLNDMP	ශ්‍රී ලංකා ජාතික ආපදා කළමනාකරණ සැලසුම
SLSFTA	ශ්‍රී ලංකාව සහ සිංගප්පූරුව අතර නිදහස් වෙළෙඳ ගිවිසුම
SLTB	ශ්‍රී ලංකා ප්‍රවාහන මණ්ඩලය
SOE	රජයට හිමි ව්‍යාපාර
STIS	විද්‍යා, තාක්ෂණ සහ නව්‍යකරණ උපාය මාර්ග
SVPs	ආංශික අවදානම් පැතිකඩ
SWML	සැලසුම් සහගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රය
TB	ක්ෂය රෝගය
TNA	කාර්මික අවශ්‍යතා ඇගයුම්
TNC	කාලගුණ විපර්යාස පිළිබඳ තුන්වන ජාතික සන්නිවේදනය
TVET	තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව
UDA	නාගරික සංවර්ධන අධිකාරිය
UNCLOS	සමුද්‍ර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය
UNCTAD	වෙළෙඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය
UNDP	එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
UNDESA	එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව
UNECC	එක්සත් ජාතීන්ගේ ඉලෙක්ට්‍රොනික සන්නිවේදන සම්මුතිය
UNEP	එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන
UNESCAP	ආසියා සහ පැසිෆික් ප්‍රදේශ සඳහා වන එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ කොමිෂන් සභාව
UNICEF	එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල
UNSDF	එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන රාමුව
USA	ඇමරිකා එක්සත් ජනපදය
VIOs	ස්වේච්ඡා සම්බන්ධ සංවිධාන
VNR	ස්වේච්ඡා ජාතික සමාලෝචනය
WBB	සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය
WFP	ලෝක ආහාර වැඩසටහන
WHO	ලෝක සෞඛ්‍ය සංවිධානය
WMA	ආපදා කළමනාකරණ අධිකාරිය
WRMTMP	බස්නාහිර කලාපීය මහානගර ප්‍රධාන ප්‍රවාහන සැලසුම
WTO	ලෝක වෙළෙඳ සංවිධානය

රූප සටහන් ලැයිස්තුව

2.1 රූපය	ශ්‍රී ලංකා ස්වේච්ඡා ජාතික සමාලෝචනය සඳහා බහු පාර්ශවකරුවන්ගෙන් අදහස් විමසීම	20
3.1 රූපය	ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති රාමුවේ සැලසුම	28
3.2 රූපය	තිරසර සංවර්ධන ඉලක්ක PIP 2017-2020 සමග පූර්ණ පෙළගැන්වුම්	30
3.3 රූපය	තිරසර සංවර්ධන ඉලක්ක PIP 2017-2020 සමග පූර්ණ හා අර්ධ පෙළගැන්වුම්	31
3.4 රූපය	තිරසර සංවර්ධන ඉලක්ක ක්ෂේත්‍රයන් සහ රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020 අතර පෙළගැන්නුම	32
4.1 රූපය	2016 වසරේදී දිස්ත්‍රික්ක අනුව ආරක්ෂිත පානීය ජලය වෙත පිවිසුම	43
4.2 රූපය	2016 වසරේ සනීපාරක්ෂක පහසුකම්	43
4.3 රූපය	අංශය අනුව විදුලි බල පරිභෝජනය (සාපේක්ෂ කොටස්වලින් (%): 1970-2016)	47
4.4 රූපය	මූලික බලශක්ති සැපයුම තුළ ප්‍රධාන බලශක්ති මූලාශ්‍ර කොටස;*	47
4.5 රූපය	මූලික බලශක්ති මුසුව තුළ විවිධ මූලාශ්‍රවල කොටස (1976-2016)	48
4.6 රූපය	ෆොසිල ඉන්ධන ආනයනය (2007-2016)	49
4.7 රූපය	ශ්‍රී ලංකාවේ නිවාස නොමැති සහ ඉඩම් නොමැති පවුල් සංඛ්‍යාව	52
4.8 රූපය	පොදු ප්‍රවාහන සේවා භාවිතා කරන මගීන් සංඛ්‍යාවේ වර්ධනය	52
4.9 රූපය	ශ්‍රී ලංකාව තුළ වන ආවරණයේ සහ ජනගහනයේ සිදු වූ වෙනස	60
4.10 රූපය	ශ්‍රී ලංකාවේ ඉඩම් පරිහරණයේ සිදු වූ වෙනස්කම්	62
4.11 රූපය	ජාතික දරිද්‍රතා රේඛාවේදී දරිද්‍රතා සංඛ්‍යා දර්ශකයේ ප්‍රවණතාවන්	65
4.12 රූපය	ජාතික දරිද්‍රතා රේඛා මට්ටමේදී වයස් හා ස්ත්‍රී පුරුෂ කණ්ඩායම් අතර දරිද්‍රතාව පිළිබඳ සාරාංශය - 2012/13 සහ 2016	66
4.13 රූපය	ශ්‍රී ලංකාවේ මාතෘ මරණ අනුපාතය :(1995-2015)	73
4.14 රූපය	පාසල්වලට ඇතුළත් වීමේ හා පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කිරීමේ අනුපාතය	77
5.1 රූපය	නිළ සංවර්ධන සහාය (දළ දේශීය නිෂ්පාදිතයෙන් %)	104
5.2 රූපය	ආදායම (දළ දේශීය නිෂ්පාදිතයෙන් %)	104
5.3 රූපය	අපනයන (දළ දේශීය නිෂ්පාදිතයේ %)	106

වගු ලැයිස්තුව

3.1 වගුව	ස්වේච්ඡා ජාතික සමාලෝචනය සහ පශ්චාත් ස්වේච්ඡා ජාතික සමාලෝචන අදියර තුළ සම්බන්ධ වීමේ මෙවලම්	24
3.2 වගුව	තිරසර සංවර්ධන ඉලක්ක රාජ්‍ය ආයෝජනයේ ප්‍රධාන ක්ෂේත්‍රවලට අනුරූපණය කිරීම	29
3.3 වගුව	තිරසර සංවර්ධන සාධක සමග 2017-2020 රාජ්‍ය ආයෝජන වැඩසටහන පෙළගැන්නුම් වන ප්‍රතිශතය	31
3.4 වගුව	තිරසර සංවර්ධන ඉලක්ක රාජ්‍ය ආයෝජනයේ ප්‍රධාන ක්ෂේත්‍රවලට අනුරූපණය කිරීම	33
3.5 වගුව	තිරසර සංවර්ධන ඉලක්ක ජාතික සංවර්ධන න්‍යාය පත්‍රයට ඒකාබද්ධ වන මට්ටම	33
3.6 වගුව	තිරසර සංවර්ධනයේ ප්‍රධාන ක්ෂේත්‍රයන් සඳහා යෝජිත ක්‍රියාමාර්ග	35
3.7 වගුව	රාජ්‍ය සංවිධාන ආකාරයන්	36
4.1 වගුව	ප්‍රධාන පරිශීලකයින් අනුව බලශක්තිය සඳහා වන ඉල්ලුම 2016	46
4.2 වගුව	ශ්‍රී ලංකාවේ ආරක්ෂිත ප්‍රදේශ සහ ප්‍රමාණය	59
4.3 වගුව	ශ්‍රී ලංකාවේ ප්‍රධාන වර්ගීකරණ කණ්ඩායම්වල ඒකදේශීය භාවය	60
4.4 වගුව	ශ්‍රී ලංකාවේ පාංශු ඛාදනයේ ආර්ථික පිරිවැය	62
5.1 වගුව	ශ්‍රී ලංකාව සඳහා තිරසර සංවර්ධන ඉලක්කවලට අදාළ දත්ත ලද හැකි බව	109

විධායක සාරාංශය

ශ්‍රී ලංකාව, විශේෂයෙන්ම සෞඛ්‍යය, අධ්‍යාපනය සහ දරිද්‍රතාව යන අංශ අතින්, සහස්‍ර සංවර්ධන ඉලක්ක යටතේ ඉහළ මට්ටමේ මානව සංවර්ධනයක් සහ බොහෝ සාර්ථකත්වයන් අත්කරගෙන සිටී. දශක තුනක් පැවති යුද්ධය 2009 වසරේදී අවසන් වීමත් සමග සාමය හා සමෘද්ධිය පිරි කාල පරිච්ඡේදයක් රටට උදාවී තිබේ. පැරිස් දේශගුණ ගිවිසුම සහ ආපදා කළමනාකරණය සඳහා වන සෙන්දායි රාමුව ඇතුළු පරිසරය හා සම්බන්ධ ජාත්‍යන්තර ගිවිසුම් හා සම්මුතීන් ගණනාවකට අත්සන් කිරීම මගින් තිරසර සංවර්ධනය උදෙසා දරන ගෝලීය ප්‍රයත්නයන් සාර්ථක කරගැනීම සඳහා ශ්‍රී ලංකාවේ කැපවීම මනාව පෙන්නුම් කෙරේ.

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය අනුමත කරන ලද තැන් පටන් එය රට තුළ ක්‍රියාවට නැංවීමට පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකා රජය විවිධ මූලාරම්භයන් ගෙන තිබේ. තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාවට නැංවීම සම්බන්ධීකරණය කිරීම, ඒ සඳහා පහසුකම් සැලසීම හා ඒ පිළිබඳ වාර්තා කිරීම සඳහා වන කේන්ද්‍රීය ලක්ෂය වශයෙන් තිරසර සංවර්ධනය උදෙසා කැපවුණු අමාත්‍යාංශයක් ස්ථාපිත කිරීම; තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාවට නැංවීම සඳහා දේශපාලන නායකත්වය සැපයීමට තිරසර සංවර්ධනය සඳහා පාර්ලිමේන්තු තේරීම්කාරක සභාවක් පිහිටුවීම; සහ තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාවට නැංවීමට නෛතික රාමුව සැපයීම සඳහා 2017 වසරේ අංක 19 දරණ තිරසර සංවර්ධන පනත බලාත්මක කිරීම යනාදිය එයට ඇතුළත් වේ.

2030 න්‍යාය පත්‍ර ප්‍රකාශයේ විධි විධානවලට අනුකූලව, ශ්‍රී ලංකාව විසින් එහි පළමු ස්වේච්ඡා ජාතික සමාලෝචනය ඉදිරිපත් කිරීම සඳහා පවතින උනන්දුව 2018 ජූලි මස පවත්වන ලද ඉහළ මට්ටමේ දේශපාලන සංසදයේදී පළ කරන ලදී. ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා ජාතික සමාලෝචන ක්‍රියාවලිය, පාර්ශවකරුවන් රැසකගේ මැදිහත්වීම සහිත සහයෝගී හා සියල්ල ඇතුළත් ක්‍රියාවලියක් විය. ශ්‍රී ලංකා ස්වේච්ඡා ජාතික සමාලෝචනය මගින් තිරසර සංවර්ධන ඉලක්ක අන්‍යෝන්‍යව ක්‍රියාත්මක කිරීමට හැකියාව ලබාදෙන රටේ ප්‍රතිපත්තිය සහ බලදායී පරිසරය පරීක්ෂා කෙරෙන අතර තිරසර සංවර්ධන ඉලක්ක 17 ම සඳහා වත්මන් තත්වය හා ප්‍රවණතා, පරතරයන් හා අභියෝග සහ ඉදිරි ගමන්මග පිළිබඳ විශ්ලේෂණයක් සපයයි.

රටෙහි වත්මන් ප්‍රතිපත්ති රාමුව මගින් තිරසර සංවර්ධනය උදෙසා රට කැපවී කටයුතු කරන ආකාරය තවදුරටත් පිළිබිඹු වේ. ශ්‍රී ලංකාවේ දිගු කාලීන සංවර්ධන සැලැස්ම වන දැක්ම 2025, එහි මධ්‍ය කාලීන සැලැස්ම වන රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020 සහ 2018 වසරේ 'නීල හරිත' අය වැය යනාදිය මගින් පිළිබිඹු වන ශ්‍රී ලංකාවේ උපායමාර්ගික සංවර්ධන රාමුව තිරසර සංවර්ධන ඉලක්ක සමග සැලකිය යුතු අන්දමින් ගැලපේ.

විශේෂයෙන්ම මෑත වසරවලදී දේශගුණික තත්වයන් මුල් කොට ඇතිවුණු ආපදා ඇතුළුව රට මුහුණ දෙමින් සිටින ඉහළ යන පාරිසරික අභියෝග සැලකිල්ලට ගැනීමේදී, 2018 ඉහළ මට්ටමේ දේශපාලන සංසදයේ කේන්ද්‍රීය තිරසර සංවර්ධන ඉලක්ක 6,7,11,12 සහ 15 ශ්‍රී ලංකාවට විශේෂයෙන්ම වැදගත් වේ. එම තිරසර සංවර්ධන ඉලක්ක ස්වේච්ඡා ජාතික සමාලෝචනය මගින් විස්තරාත්මකව සමාලෝචනය කෙරේ.

ප්‍රත්‍යාස්ථ සමාජයක් බවට පත්වීමේ මාර්ගයේදී, ආරක්ෂාකාරී ප්‍රභවයන් වෙතින් සිදු කරන ජල සැපයුමේ හා සනීපාරක්ෂක පහසුකම්වල ඉහළ ආවරණය, ආසන්න වශයෙන් සියලු දෙනා වෙත විදුලිය සැපයුම සහ ස්ථිර නිවාසවල ජීවත් වන ජනගහනය ඉහළ නැංවීම යනාදිය ඇතුළුව සැලකිය යුතු මට්ටමේ ජයග්‍රහණ ශ්‍රී ලංකාව අත්කරගෙන සිටී. එමෙන්ම තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටා පිළිබඳ ජාතික මටටමින් උනන්දුව ඉහළ යමින් පවතී. එමෙන්ම ශ්‍රී ලංකාව විශාල ජෛව විවිධත්වයකට උරුමකම් කියන අතර ඒ හේතුවෙන් ගෝලීය වශයෙන් ජෛව විවිධත්වය බහුල ලෙස සංකේන්ද්‍රිත ස්ථාන 35 අතර ශ්‍රී ලංකාවද හඳුනාගැනේ. කෙසේවුවද, ප්‍රවාහනය හා බලශක්ති සැපයුම සඳහා ෆොසිල ඉන්ධන ආනයනය මත වැඩි වැඩියෙන් රඳා පැවතීම, නාගරික මධ්‍යස්ථාන හා ප්‍රජාවන් ආපදා අවදානම්වලට පහසුවෙන් ගොදුරු වීම වර්ධනය වීම සහ වනාන්තර හා ඉඩම් සම්පත් හායනය යනාදිය ප්‍රත්‍යාස්ථිතිය අත් කරගැනීම සඳහා යන ගමනේදී මතුවන අභියෝග වේ.

තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාවට නැංවීම වේගවත් කිරීම සඳහා ශ්‍රී ලංකාව විවිධ ක්‍රියාමාර්ග ගනිමින් සිටී. තිරසර සංවර්ධන ඉලක්ක වෙනුවෙන් මුදල් යෙදවීම සඳහා, දේශීය ආදායම් එක් රැස් කිරීමේ ධාරිතාව වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන තිබෙන අතර සැබැවින්ම බදු පදනම පුළුල් කරමින් බදු ව්‍යුහය සරල කිරීම සඳහා පියවර ගනිමින් තිබේ. තවද, වඩාත් නව්‍යකරණය වූද දැනුම මත පදනම් වූද ආර්ථිකයක් බවට පරිවර්තනය වීමේ අවශ්‍යතාව හඳුනාගත් ශ්‍රී ලංකාව වර්තමානයේදී තාක්ෂණය සහ ඩිජිටල්කරණය යන අංශ වැඩි දියුණු කිරීම අරමුණු කරමින් කටයුතු කරයි. එයට අමතරව, තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාවට නැංවීම යනු සියල්ල ඇතුළත් ප්‍රයත්නයක් බව සහතික කිරීම සඳහා දැනුවත්භාවය ඉහළ නැංවීම සහ ධාරිතා සංවර්ධනය හා සම්බන්ධව මූලාරම්භයන් ශ්‍රී ලංකාව විසින් ගෙන තිබේ.

01

හැඳින්වීම

2015 වසරේදී එක්සත් ජාතීන්ගේ අනෙකුත් සාමාජික රාජ්‍යයන් 192 සමග ශ්‍රී ලංකාවද තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය සහ තිරසර සංවර්ධන ඉලක්ක 17 ඉටු කිරීම සඳහා බැඳී සිටීමට ප්‍රතිඥා දුණි. 2030 න්‍යායපත්‍රය, සංවර්ධනයේ ආර්ථික, සාමාජීය සහ පාරිසරික පරිමාණයන් එකමුතු කරන්නා වූ ප්‍රවේශයක් තුළින් තිරසර සංවර්ධනය කරා යන මාවත වඩාත් සඵල කිරීමට ශ්‍රී ලංකාවට උපකාරී වී තිබේ.

තිරසර සංවර්ධන ඉලක්ක සාර්ථක අන්දමින් ක්‍රියාවට නැංවීම සඳහාත් ඉටු කරගැනීම සඳහාත් ශ්‍රී ලංකාව සතු විභවය, විශේෂයෙන්ම සෞඛ්‍යය, අධ්‍යාපනය සහ දරිද්‍රතාව සම්බන්ධයෙන්, සහස්‍ර සංවර්ධන ඉලක්ක යටතේ වන කාර්යසාධනය තුළින් පිළිබිඹු වේ. එයට අමතරව, 2015 වසරේදී 0.766 ක (73 වන ස්ථානය) මානව සංවර්ධන දර්ශකයක් වාර්තා කරමින් ශ්‍රී ලංකාව ඉහළ මානව සංවර්ධනයක් සහිත රටවල් කාණ්ඩය යටතේ ශ්‍රේණිගත වී ඇත. 1 මෙය, සාමාජීය සංවර්ධනය සම්බන්ධයෙන් රටෙහි ශක්තිමත් පදනම පෙන්නුම් කරයි. ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනය සඳහා ශක්තිමත් පදනමක් සපයන තවත් වැදගත් සාධකයක් වනුයේ සාමය හා සමෘද්ධිය පිරි කාල පරිච්ඡේදයකට මුලපුරමින්, දශක තුනක යුද්ධය 2009 වසරේදී නිමාවට පත්වීමයි. පරිසරය සහ ස්වභාවික සම්පත් හා සම්බන්ධ අංශවල ප්‍රතිපත්ති සංවර්ධනයන් යනු තවත් එවැනි ශක්ති ප්‍රභවයකි. ශ්‍රී ලංකාව 1980 තරම් ඈත අවධියේදී ජාතික පරිසර පනත බලාත්මක කළ අතර එතැන් සිට විවිධ පාරිසරික හා ස්වභාවික සම්පත් පැතිකඩ ආවරණය කරමින් නොයෙකුත් ජාතික ප්‍රතිපත්ති සහ නීති පද්ධති හඳුන්වා දී තිබේ. එමෙන්ම පැරිස් දේශගුණ ගිවිසුම සහ ආපදා කළමනාකරණය සඳහා වන සෙන්දායි රාමුව ඇතුළුව පරිසරය හා සම්බන්ධ විවිධ ජාත්‍යන්තර ගිවිසුම් හා සම්මුතීන්වලට ශ්‍රී ලංකාව අත්සන් තබා තිබේ. මෙම සාධක, තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාවට නැංවීමත් සපුරා ගැනීමත් සඳහා හිතකර පරිසරයක් ශ්‍රී ලංකාවට නිර්මාණය කර දී තිබේ.

2030 න්‍යාය පත්‍රය අනුමත කරන ලද අවස්ථාවේ සිට ශ්‍රී ලංකාව තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාවට නැංවීම සඳහා පහසුකම් සැලසීමත් එය ඉදිරියට ගෙන යාමත් සඳහා නොයෙකුත් මූලාරම්භයන් ගෙන තිබේ. එවැනි එක් මූලාරම්භයක් වනුයේ, පාර්ලිමේන්තු කටයුතු අනෙකුත් අමාත්‍යංශ සමග සම්බන්ධීකරණය කිරීම සහ විශේෂඥ උපදෙස් සැපයීම යන අරමුණු පෙරදැරිව තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාවට නැංවීමට පහසුකම් සැලසීම සඳහා තිරසර සංවර්ධනය පිළිබඳ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පිහිටුවීමයි. මෙය රටේ ඉහළම ව්‍යවස්ථාදායක ආයතනය මට්ටමින් තිරසර සංවර්ධන ඉලක්ක වෙනුවෙන් රටේ කැපවීම අවධාරණයට ලක් කරයි. මෙයට අමතරව, ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන විෂයය පිළිබඳ වගකීම දරණ රේඛීය අමාත්‍යංශය වශයෙන් තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යංශය 2015 වසරේදී පිහිටුවන ලද අතර 2018 මැයි මස සිට ප්‍රාදේශීය සංවර්ධන කාර්යයන්ද එයට එක් කොට තිබේ. ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාවට නැංවීම් කටයුතු සම්බන්ධීකරණය, ඒ සඳහා පහසුකම් සැලසීම සහ වාර්තාකිරීම සඳහා වන කේන්ද්‍රීය ලක්ෂය වශයෙන් තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳ අමාත්‍යංශය කටයුතු කරයි. එමෙන්ම, 2017 වසරේ අංක 19 දරණ තිරසර සංවර්ධන පනත බලාත්මක කිරීම තවත් වැදගත් පියවරකි. එමගින්, පවතින රාජ්‍ය ආයතන පද්ධතිය භාවිතා කරමින් තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාවට නැංවීම සඳහා මනා සංවිධිත ආයතනික යාන්ත්‍රණයක් ඇතිකිරීමට පදනම සැපයේ.

රට කෙතරම් දුරට තිරසර සංවර්ධන මූලධර්ම හා අනුගතව කටයුතු කරන්නේද යන්න ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති රාමුව මගින් වැඩි දුරටත් පිළිබිඹු වේ. ශ්‍රී ලංකාවේ දිගු කාලීන සංවර්ධන සැලැස්ම වන දැක්ම 2025 ඃ පොහොසත් රටක්, මධ්‍ය කාලීන සංවර්ධන සැලැස්ම වන රාජ්‍ය ආයෝජන වැඩසටහනඃ 2017-2020 සහ කෙටි කාලීන සැලැස්ම වන 2018 වසරේ ”නීල හරිත” අයවැය තුළින් රටේ වත්මන් උපායමාර්ගික සංවර්ධන රාමුව පරීක්ෂාවට ලක් කළ හැකි වේ. තිරසර සංවර්ධන මූලධර්ම මගින් ආර්ථික, සාමාජීය සහ පාරිසරික කාරණා එකමුතු කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරයි. ඉහත ලේඛන මගින් ඉදිරිපත් කෙරෙන ශ්‍රී ලංකාවේ උපායමාර්ගික දර්ශනය මගින් මෙම පරිමාණයන් විවිධ මට්ටම්වලින් සංකලනය කොට තිබේඃ රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020 මගින් රටේ අවශ්‍ය කොටස් සියල්ලම වෙත සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු සම්පාදනය කෙරේ. එමෙන්ම, ආර්ථික වර්ධනය ඇති කිරීම සඳහා පහසුකම් සැලසීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් හා පරිසරයේ ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගනිමින්ද, පාරිසරික කළමනාකරණය ප්‍රමුඛතා ක්ෂේත්‍රයක් වශයෙන් හඳුනාගෙන තිබේ; දැක්ම 2025 මගින් ශ්‍රී ලංකාව දැනුම මත පදනම් වූ, තරගකාරී සමාජ අලෙවිකරණ ආර්ථිකයක් බවට පරිවර්තනය කිරීමේ දැක්ම ඉදිරිපත් කෙරෙන අතර කෘෂිකර්මාන්තය හා තිරසර සංවර්ධනය යන තේමාව යටතේ පරිසරය, සංවර්ධන ප්‍රමුඛතාවක් වශයෙන් හඳුනාගැනේ; 2018 ”නීල හරිත” අයවැය මගින්, පාරිසරික වශයෙන් තිරසර සංවර්ධන උපායමාර්ගයක් යොදා ගනිමින් සාගරයන්හි පූර්ණ ආර්ථික විභවය ගවේෂණය කිරීම සඳහා වන රජයේ දැක්ම අවධාරණය කෙරේ.

2030 න්‍යාය පත්‍ර ප්‍රකාශයේ විධි විධානවලට අනුකූලව, ශ්‍රී ලංකාව විසින් එහි පළමු ස්වේච්ඡා ජාතික සමාලෝචනය ඉදිරිපත් කිරීම සඳහා පවතින උනන්දුව 2018 ජූලි මස පවත්වන ලද ඉහළ මට්ටමේ දේශපාලන සංසදයේදී පළ කරන ලදී. මෙම ස්වේච්ඡා ජාතික සමාලෝචන ක්‍රියාවලිය, එක්සත් ජාතීන්ගේ මහ ලේකම් විසින් ස්වේච්ඡා ජාතික සමාලෝචන සකස්කිරීම පිළිබඳ ඉදිරිපත් කරන ලද මෙහෙයුම් නිර්ණායක හා අනුගතව සිදු කරන ලදී. එමෙන්ම ස්වේච්ඡා ජාතික සමාලෝචන ක්‍රියාවලිය පුරාම බහු පාර්ශවකාර ප්‍රවේශයක් අනුගමනය කරන ලදී.

---

1 UNDP (2016), 'මානව සංවර්ධන වාර්තාව 2016 ඃ මානව සංවර්ධනය සියලුදෙනා වෙත'. http://hdr.undp.org/sites/default/files/2016_human_development_report.pdf මගින් ලබාගත හැකිය.

මෙම ස්වේච්ඡා ජාතික සමාලෝචන වාර්තාව, තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ දැනුවත්භාවය සහ ඒවායේ හිමිකම නිර්මාණය කරමින්, ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාවට නැංවීමේ වත්මන් තත්වය ඇගයුමට ලක් කරයි. මෙම වාර්තාව එක්සත් ජාතීන්ගේ මහ ලේකම් විසින් ඉදිරිපත් කරන ලද මෙහෙයුම් නිර්ණායක යටතේ යෝජිත ව්‍යුහය හා විශාල වශයෙන් අනුකූලව සකසා ඇත. ඒ අනුව, 2 වන කොටස මගින් ස්වේච්ඡා ජාතික සමාලෝචනය සකස්කිරීමේ ක්‍රමවේදය සහ ක්‍රියාවලිය විස්තර කෙරෙන අතර 3 වන කොටස මගින් රට තුළ අන්‍යෝන්‍ය වශයෙන් තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාවට නංවනු ලබන ප්‍රතිපත්තිය සහ බලදායී පරිසරය පරීක්ෂාවට ලක් කෙරේ. 4 වන කොටස මගින් 1 සිට 16 දක්වා වන තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ දළ විශ්ලේෂණයක් සැපයෙන අතර එහිදී 2018 වසරේ ඉහළ මට්ටමේ දේශපාලන සංසදයේදී ගැඹුරින් සමාලෝචනය කරන ලද තිරසර සංවර්ධන ඉලක්ක විශේෂයෙන් අවධාරණයට ලක්කරයි. එමෙන්ම තිරසර සංවර්ධන ඉලක්කය 17, 5 වන කොටස තුළ ක්‍රියාවට නැංවීමේ ක්‍රම යටතේ සාකච්ඡා කෙරේ. ඉන් අනතුරුව 6 වන කොටස මගින් විශ්ලේෂණය හා සොයාගැනීම් පිළිබඳ සාරාංශයක් සපයනු ලැබේ.

02

සමාලෝචනය සකස් කිරීමේ ක්‍රමවේදය සහ ක්‍රියාවලිය

තිරසර සංවර්ධන ඉලක්ක, කිසිවෙකු මග නොහැරීමේ ප්‍රතිපත්තිය අවධාරණය කරමින්, තිරසර සංවර්ධනය පිළිබඳ හවුල් ආඛ්‍යානයක් සැපයීම අරමුණු කරන්නා වූ, සියල්ල ඇතුළත් හා විස්තීර්ණ රාමුවක් ඉදිරිපත් කරයි. ඒ අනුව, ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා ජාතික සමාලෝචන ක්‍රියාවලිය පහත කරුණු ඉටු කරන සහයෝගී හා සියල්ල ඇතුළත් ව්‍යායාමයක් වශයෙන් සැලසුම් කර තිබේ:

- තිරසර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ වත්මන් තත්වය සහ ප්‍රගතිය පිළිබඳ මෙන්ම ඒවා අත්කරගැනීමේ සාර්ථකත්වයන් සහ එහිදී මතුවන අභියෝග පිළිබඳ විස්තීර්ණ හා සවිස්තරාත්මක අවබෝධයක් ලබාදීම.
- ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන ඉලක්ක මුඛ්‍ය ධාරාගත කිරීම සඳහා ගෙන තිබෙන මූලාරම්භයන් සාකච්ඡා කිරීම.
- 2030 න්‍යාය පත්‍රය ක්‍රියාවට නැංවීමේදී පවතින පරතරයන් හා අභියෝග හඳුනාගැනීම සහ එය ක්‍රියාත්මක කිරීම වැඩි දියුණු කිරීම සඳහා ගතයුතු පියවර සංක්ෂිප්තව දැක්වීම.

ස්වේච්ඡා ජාතික සමාලෝචන ක්‍රියාවලිය මෙහෙයවීම සඳහා සහ ස්වේච්ඡා ජාතික සමාලෝචන වාර්තාව සකස් කිරීම සඳහා පහත ආයතනවල නියෝජිතයින්ගෙන් සමන්විත වන්නාවූද එක්සත් ජාතීන්ගේ මෙරට කාර්යාලය නිරීක්ෂකයෙකු ලෙස කටයුතු කරන්නා වූද කාර්ය සාධන බලකායක් නිර්මාණය කරන ලදී. එම ආයතන නම්, ජනාධිපති කාර්යාලය, අගමැති කාර්යාලය, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු, විදේශ කටයුතු, මහවැලි සංවර්ධන හා පරිසර සහ තිරසර සංවර්ධන, වනජීවී හා ප්‍රාදේශීය සංවර්ධන යන අමාත්‍යාංශ, මුදල් කොමිෂන් සභාව, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව, සංගණන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සහ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වේ. ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් ස්වේච්ඡා ජාතික සමාලෝචනය සකස් කිරීම සඳහා පහසුකම් සලසා දෙන ලදී.

ශ්‍රී ලංකා ස්වේච්ඡා ජාතික සමාලෝචනයේදී ප්‍රශස්ත මට්ටමින් ප්‍රත්‍යවේක්ෂණය සහ ඇගයුම් කිරීමට ඉඩ සැලසීම වෙනුවෙන්, දත්ත රැස් කිරීම සහ විශ්ලේෂණය සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක ක්‍රම යොදා ගනු ලැබිණි. ඒ අනුව, ද්විතීයික දත්ත රැස් කිරීමේ මෙවලම් (උදා: ප්‍රකාශන/ ප්‍රතිපත්ති ලේඛන සමාලෝචනය) මෙන්ම ප්‍රාථමික දත්ත රැස්කිරීමේ මෙවලම් (උදා: පාර්ශවකරුවන්ගේ අදහස් විමසීම සහ ප්‍රධාන තොරතුරු දැනුම්දෙන්නන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම) යන දෙවර්ගයම තොරතුරු එකතු කිරීම සඳහා භාවිතා කරන ලදී.

අ) ද්විතීයික තොරතුරු සමාලෝචනය

සමාලෝචිත ද්විතීයික තොරතුරු තුළට තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ ජාතික හා ආංශික ප්‍රතිපත්ති ලේඛන, සංඛ්‍යා ලේඛන දත්ත සහ ගෝලීය ප්‍රකාශන ඇතුළත් විය. එහිදී පහත සඳහන් ප්‍රධාන ජාතික ප්‍රතිපත්ති ලේඛන සමාලෝචනය කරන ලදී:

- රටෙහි දිගු කාලීන සංවර්ධන ගමන් පථය විදහා දක්වන 'දැක්ම 2025'
- ශ්‍රී ලංකා රජයේ මධ්‍ය කාලීන ආයෝජන සැලැස්ම පිළිබඳ විස්තර කෙරෙන 'රාජ්‍ය ආයෝජන සැලැස්ම 2017 -2020'
- ශ්‍රී ලංකාවේ 2018 ජාතික අයවැය, 'නීල හරිත අයවැය'

ජාතික ප්‍රතිපත්ති දර්ශනය තුළ තිරසර සංවර්ධන ඉලක්ක සමග පෙළගැන්නුම සහ ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ පවතින පරතරයන් විශ්ලේෂණය කිරීම සඳහා මෙම ලේඛන සියුම් ලෙස පරීක්ෂා කරන ලදී. එයට අමතරව, කිසිවෙකු මග නොහැරෙන බව සහතික කරමින්, තිරසර සංවර්ධන ඉලක්ක 17 හිම ප්‍රගතිය හා තත්වය ඇගයුම් කිරීම සඳහා මෙන්ම තිරසර සංවර්ධන ඉලක්ක අත්කරගැනීම සඳහා වන ප්‍රතිපත්ති/ වැඩසටහන් හඳුනාගැනීම සඳහා අදාළ ආංශික ප්‍රතිපත්ති ලේඛන සහ සංඛ්‍යා ලේඛන තොරතුරු සමාලෝචනය කරන ලදී.

ආ) පාර්ශවකරුවන්ගේ අදහස් විමසීම

ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා ජාතික සමාලෝචන ක්‍රියාවලිය, රජය, පුද්ගලික අංශය, අධ්‍යාපනය හා සම්බන්ධ ප්‍රජාව, සංවර්ධන සහකරුවන් සහ ස්වේච්ඡා සම්බන්ධ සංවිධාන ඇතුළු සිවිල් සමාජ සංවිධාන යනාදී පාර්ශවකරුවන් රැසක් සම්බන්ධ වූ සහයෝගී හා සියල්ල ඇතුළත් ක්‍රියාවලියක් විය. පළමු පියවර වශයෙන්, පාර්ශවකරුවන් සම්බන්ධකරගැනීමේ සැලසුමක් ප්‍රධාන අරමුණු දෙකක් ඇතිව සංවර්ධනය කරන ලදී: i) ස්වේච්ඡා ජාතික සමාලෝචනය සකස් කිරීමට යෙදවුම් ලබාගැනීම සඳහා මෙන්ම දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා, රට තුළ තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාවලියට සම්බන්ධව සිටින සියලු පාර්ශවකරුවන් වෙතින් අදහස් විමසීම; ii) පශ්චාත් 2018 ස්වේච්ඡා ජාතික සමාලෝචන කාලපරිච්ඡේදය තුළදී පාර්ශවකරුවන්ට අඛණ්ඩව සම්බන්ධ වීම සඳහා අවස්ථාව නිර්මාණය කරදීම ; යනු එම අරමුණු වේ. මහජන සහභාගීත්වය පිළිබඳ ජාත්‍යන්තර සංගමය විසින් සකස් කරන ලද මහජන සහභාගීත්ව පරාසය හා අනුකූලව පාර්ශවකරුවන් සම්බන්ධ කරගැනීමේ සැලසුම සකස් කරන ලදී. [2] පළමු අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා පාර්ශවකරුවන් රැසකගේ අදහස් විමසීම සඳහා නොයෙකුත් වැඩමුළු පවත්වන ලදී. එයට අමතරව, තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාවට නැංවීමේදී සියලු පාර්ශවකරුවන් සම්බන්ධ කරගැනීම සඳහා මාර්ගගත වේදිකාවක් නිර්මාණය කර තිබේ. එය වනාහී, ස්වේච්ඡා ජාතික සමාලෝචනය 2018 ඉක්මවා යන ක්‍රියාවලියකි.

---

2 වැඩිදුර තොරතුරු සඳහා, 3.1 කොටස වෙත යොමුවන්න.

2.1 රූපය ෑ ශ්‍රී ලංකා ස්වේච්ඡා ජාතික සමාලෝචනය සඳහා බහු පාර්ශවකරුවන්ගෙන් අදහස් විමසීම



i. ශ්‍රී ලංකා ස්වේච්ඡා ජාතික සමාලෝචනය සඳහා බහු පාර්ශවකරුවන් වෙතින් අදහස් විමසීමේ ජාතික වැඩමුළුව

රජය, පුද්ගලික අංශය, අධ්‍යාපන ක්ෂේත්‍රය සහ සිවිල් සමාජය නියෝජනය කරන පාර්ශවකරුවන් එක් රැස් කොට එක් වේදිකාවක් මතට ගෙන ආ මෙම වැඩමුළුව මගින් තිරසර සංවර්ධන ඉලක්ක රට තුළ ක්‍රියාවට නැංවීමේ තත්වය, එහි සාර්ථකත්වයන්, එහිදී මුහුණ දෙනු ලබන අභියෝග සහ ඉදිරි ගමන් මග සාකච්ඡා කරන ලදී. තිරසර සංවර්ධන ඉලක්ක 17 ක්‍රියාවට නැංවීමේදී සියලු පාර්ශවකරුවන් විසින් ගනු ලැබූ ප්‍රධාන මුල් පියවර හඳුනාගැනීමත් 'කිසිවෙකු මග නොහැරීමේ' ප්‍රතිපත්තිය අන්තර්ගත කරන ලද අවස්ථා හඳුනාගැනීමත් මෙම වැඩමුළුව මගින් තවදුරටත් අරමුණු කරන ලදී.

ii. ශ්‍රී ලංකා ස්වේච්ඡා ජාතික සමාලෝචනය සඳහා බහු පාර්ශවකාර තේමාගත වැඩමුළු

ඉහළ මට්ටමේ දේශපාලන සංසදය 2018 අවස්ථාවේදී ගැඹුරින් සමාලෝචනය කිරීම සඳහා තෝරාගනු ලැබූ තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ ගැඹුරින් විශ්ලේෂණයක් සිදුකිරීම විශේෂයෙන්ම අරමුණු කොටගත් බහු පාර්ශවකාර වැඩමුළු දෙකක් සංවිධානය කරන ලදී. දෙවන වැඩමුළුව සඳහා රටේ සියලු දිස්ත්‍රික්ක නියෝජනය කරමින් රාජ්‍ය නිලධාරීන් සහ සිවිල් සමාජ සංවිධානවල, අධ්‍යාපනික ආයතනවල හා පුද්ගලික අංශයේ නියෝජිතයින් ඇතුළුව 200කට අධික පිරිසක් සහභාගී වූහ. එහිදී පහත සඳහන් ඉලක්ක සවිස්තරාත්මකව සාකච්ඡා කරන ලදීඃ

ඉලක්කය 6: සියලු දෙනා වෙත ජලය හා සනීපාරක්ෂාව ලැබීම හා ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම

ඉලක්කය 7: සියලුදෙනාහට මිල අඩු, විශ්වසනීය, තිරසර හා නවීන බලශක්තිය වෙත සම්ප්‍රවේශය සහතික කිරීම

ඉලක්කය 11: නගර සහ මානව ජනාවාස, සියල්ල ඇතුළත්, ආරක්ෂාකාරී, ප්‍රත්‍යාස්ථ හා තිරසර බවට පත් කිරීම.

ඉලක්කය 12: තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටා සහතික කිරීම

ඉලක්කය 15: භෞමික පරිසර පද්ධතිවල තිරසර භාවිතය ආරක්ෂා කිරීම, ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම, වනාන්තර තිරසර අන්දමින් කළමනාකරණය කිරීම, කාන්තාරකරණය වැළැක්වීම සහ භූමි හායනය නැවැත්වීම හා ප්‍රතිවර්තනය සහ ජෛව විවිධත්වය නැතිවී යාම වැළැක්වීම

ඉලක්කය 17: තිරසර සංවර්ධනය ක්‍රියාවට නැංවීමේ ආකාර ශක්තිමත් කිරීම සහ ඒ සඳහා ගෝලීය හවුල්කාරීත්වය පුනර්ජීවනය කිරීම

iii. බහු පාර්ශවකරුවන් වෙතින් අදහස් විමසීමේ ප්‍රාදේශීය වැඩමුළුව

ස්වේච්ඡා ජාතික සමාලෝචන ක්‍රියාවලිය තුළදී කිසිවෙකු මග නොහැරෙන බව සහතික කිරීම සඳහා රජයේ පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටම්වල මෙන්ම බිම් මට්ටමින් ක්‍රියාත්මක වන සිවිල් සමාජ සංවිධාන සහ ප්‍රජා පාදක සංවිධානවල නියෝජිතයින් එක් ස්ථානයකට ගෙන ඒම මෙම වැඩමුළුව මගින් විශේෂයෙන්ම අරමුණු කරන ලදී. එම වැඩමුළුව මගින් තවදුරටත් පහත කරුණු මත අවධානය යොමු කෙරිණි. තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ බිම් මට්ටමින් දැනුවත්භාවය ඉහළ නැංවීම හා හිමිකාරීත්වය ඇති කිරීම; උප ජාතික මට්ටමින් ආයතනික යාන්ත්‍රණය හඳුනාගැනීම සහ තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාවට නැංවීමේදී පවතින ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා අභියෝග තවදුරටත් පරීක්ෂාවට ලක් කිරීම; ආන්තීකරණයට ලක්වූ කණ්ඩායම්වල අදහස් හා ප්‍රතිපෝෂණය රැස් කිරීම.

iv. වාර්තාව සමාලෝචනය හා වලංගු කිරීම

ස්වේච්ඡා ජාතික සමාලෝචන කාර්යසාධන බලකාය විසින් ස්වේච්ඡා ජාතික සමාලෝචන වාර්තාව දැඩි සමාලෝචන ක්‍රියාවලියකට ලක් කෙරුණු අතර එහිදී යෙදවුම් හා ප්‍රතිපෝෂණය ලබාගැනීම සඳහා වාර්තා කෙටුම්පත් අදාළ රේඛීය අමාත්‍යාංශ සහ අනෙකුත් අදාළ රජයේ ආයතන අතර සංසරණය කරන ලදී. නොයෙකුත් පාර්ශවකාර කණ්ඩායම් (රජය, සිවිල් සමාජ සංවිධාන, අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ පිරිස්, තරුණයින් හා පුද්ගලික අංශය) ආවරණය කරන 150 ක පිරිසකගේ සහභාගීත්වයෙන් වලංගුකරණ වැඩමුළුව පවත්වන ලද අතර එහිදී තිරසර සංවර්ධන ඉලක්ක 17 ටම අදාළ ප්‍රධාන සොයාගැනීම්, අභියෝග සහ ඉදිරි ගමන්මග සහිත වාර්තාවේ අවසන් කෙටුම්පතෙහි සංශ්ලේෂණයක් වලංගුකරන ලදී. ශ්‍රී ලංකා ස්වේච්ඡා ජාතික සමාලෝචනයේ අංගයක් වශයෙන් පෙරදී සංවිධානය කරන ලද බහු පාර්ශවකරුවන් වෙතින් අදහස් විමසීමේ වැඩමුළුවලට සම්බන්ධ වූ විවිධ පාර්ශවකරුවන්ද මෙම වැඩමුළුවට සහභාගී වූහ.

03

ප්‍රතිපත්ති සහ බලදායී පරිසරය

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යායපත්‍රය අනුමත කරන ලදුව තිරසර සංවර්ධන ඉලක්කයන් සපුරාගැනීමේ ලා සක්‍රිය දායකත්වයක් අවශ්‍ය කෙරේ. මෙම සන්දර්භය පසුබිම් කරගෙන, ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ ලා රට තුළ පවතින ප්‍රතිපත්තිමය සැකැස්ම සහ බලදායී පරිසරය මෙම කොටසින් විස්තරාත්මකව පරීක්ෂා කෙරේ. මෙම ගෝලීය න්‍යාය පත්‍රය අනුගමනය කිරීමේ ලා සියලු දෙනාගේ සහභාගීත්වය තහවුරු කිරීමට සියලු පාර්ශ්වකරුවන් අතර තිරසර සංවර්ධන ඉලක්කවල හිමිකාරීත්වයක් ඇති කිරීමට රට විසින් ගන්නා ලද පියවරයන් පළමු උප කොටසින් විස්තර කෙරේ. ප්‍රතිපත්ති පෙළගැන්නුම පිළිබඳව වන දෙවන උප කොටසින්, ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති රාමුව තිරසර සංවර්ධන ඉලක්ක සමග කෙතරම් දුරට පෙළගැන්වෙන්නේද යන්න අගයන අතර රටේ ප්‍රතිපත්තිමය දෘෂ්ටිය තුළ ආර්ථික, සමාජ සහ පාරිසරික මානයන් අනුකලනය වීම ගවේෂණය කරනු ලබයි. මින් පසු තුන්වන උප කොටස තුළින් 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා රටේ ආයතනික රාමුව සකසා ගෙන ඇති ආකාරය පිළිබඳව සාකච්ඡා කෙරේ. අවසන් උප කොටස තුළින් ශ්‍රී ලංකාව තුළ කිසිවෙක් මඟ නොහැරීමේ ප්‍රතිපත්තිය මුඛ්‍ය ධාරාවක් බවට පත් කරගෙන ඇති අයුරු අගයනු ලැබේ.

3.1

තිරසර සංවර්ධන ඉලක්කයන්වල හිමිකාරීත්වය නිර්මාණය කිරීම

තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා රට තුළ සිටින සියලුම පුරවැසියන්ගේ සහභාගීත්වය අවශ්‍ය වේ. මෙම ක්‍රියාවලිය සමග සම්බන්ධ වන ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ ප්‍රභේදයන්ට ඇතුළත් වන්නේ:

පාර්ලිමේන්තුව ඇතුළුව රජයේ සියලුම අංශයන් සහ සියලුම මට්ටම්

සිවිල් සමාජය

පුද්ගලික අංශය

විද්වතුන්

තිරසර සංවර්ධන ඉලක්කයන් සාර්ථක ලෙස ළඟා කරගැනීම රඳා පවතින්නේ මෙම පාර්ශ්වකරුවන් තමන්ගේම අවශ්‍යතාවයන් සහ අභිලාශයන් ලෙස කෙතරම් ප්‍රබල ලෙස හඳුනාගනු ලබන්නේද යන්න මතයි. වෙනත් ලෙසකින් පවසන්නේ නම් තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳව පාර්ශ්වකරුවන් කිසියම් හිමිකාරීත්ව හැඟීමක් දැරිය යුතුය. එබැවින්, පාර්ශ්වකරුවන් කිහිප දෙනෙක් අතර තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ හිමිකාරීත්වයක් ඇති කිරීම, ශ්‍රී ලංකාව තුළ එම ඉලක්ක සාක්ෂාත් කිරීමේ ලා වන අත්‍යවශ්‍ය කොන්දේසියකි. විවිධ පාර්ශ්වකරුවන් අතර හිමිකාරීත්වය පිළිබඳ හැඟීමක් ඇති කිරීමේ විශ්වසනීය ක්‍රමයක් වන්නේ ඔවුන්ව සහභාගීත්ව ක්‍රියාවලියකට යොමු කිරීමයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය නිර්දේශ කරනුයේ, තිරසර සංවර්ධන ඉලක්කයන් සඳහා වන ක්‍රියාවලිය සියලු පාර්ශ්වකරුවන්ට හිමිකාරීත්වය පිළිබඳ හැඟීමක් ඇති කරවන සියල්ල ඇතුළත් සහ සහභාගීත්ව ක්‍රියාවලියක් විය යුතු බවයි. සාරාංශව ගත් විට තිරසර සංවර්ධන ඉලක්කයන් යනු කිසිවකු මග හැර නොයන සහ ස්වේච්ඡා දායකත්වයන්ට විවෘත බහු පාර්ශ්වකරුවන් සහිත මූලාරම්භයක් විය යුතුය.

2030 න්‍යාය පත්‍රයේ පාර්ශ්වයක් ලෙස ශ්‍රී ලංකා රජය, තිරසර සංවර්ධනයේ අත්‍යවශ්‍ය සහ වැදගත් සංරචකයක් ලෙස සියල්ල ඇතුළත් වීම සලකනු ලබන අතර මෙම අරමුණ සාක්ෂාත් කිරීමේ ලා සහභාගීත්ව එළඹුම ප්‍රධාන වෙන බව හඳුනාගනු ලබයි. එබැවින් ශ්‍රී ලංකා රජය, ආරම්භයේ සිටම මුළුමහත් සමාජය දෙසටම යොමු වූ එළඹුමක් සංවර්ධනය කරගනිමින් බහු පාර්ශ්ව මැදිහත්වීමක් තහවුරු කිරීමේ ලා සියලු උත්සහයන් ගනිමින් සිටී. පාර්ශ්වකරුවන් ගණනාවක් සමග සම්බන්ධ වීමේදී පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම, ඔවුන්ගේ අදහස් විමසීම සහ ක්‍රියාත්මක කිරීමේදී ඔවුන්ගේ සක්‍රිය සහයෝගය ලබාගැනීම මෙන්ම සමාලෝචන සහ අධීක්ෂණ ක්‍රියාවලීන් තුළ ඔවුන්ව සම්බන්ධ කරගැනීම සහ ක්‍රියාවලිය පුරාම තම අවශ්‍යතාවයන්, අභිලාශයන් සහ ගැටළු සන්නිවේදනය කිරීමට අදාළ සියලු දෙනා හට අවස්ථාව ලබාදීම යනාදිය වැදගත් වේ.

තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාවලිය තුළ උපරිම සහභාගීත්ව මට්ටමක් තහවුරු කරගැනීමට සහ හිමිකාරීත්වය පිළිබඳ ප්‍රබල හැඟීමක් ඇති කිරීමට, ස්වේච්ඡා ජාතික සමාලෝචන කාල සීමාව තුළ සහ ඊට ඔබ්බෙන් පාර්ශ්වකරුවන්ගේ මැදිහත්වීම සඳහා මාර්ගෝපදේශයක් සැපයීම පිණිස ශ්‍රී ලංකාවේ 2018 ස්වේච්ඡා ජාතික සමාලෝචනය සැකසීමට අදාළව IAP2 රාමුව සංවර්ධනය කරමින් පාර්ශ්වකරුවන් සම්බන්ධ වීමේ සැලසුමක් (SEP) සකස් කරනු ලැබිණි. IAP2 රාමුව මහජන සහභාගීත්වයේ මට්ටම් පහක් හඳුන්වා දෙනු ලබයි - එනම් දැන්වීම, අදහස් විමසීම, සම්බන්ධ වීම, සහයෝගයෙන් ක්‍රියා කිරීම සහ සවිබලගැන්වීම - මෙහිදී එක් එක් මට්ටම සාක්ෂාත් කරගැනීම් උදෙසා නිශ්චිත මහජන සහභාගීත්ව මෙවලම් භාවිත කෙරේ. තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ සමස්ත ක්‍රියාවලිය පිළිබඳව සලකා බලන කල පළමු මට්ටම් හතර වැඩි වශයෙන් අදාළ වන අතර පාර්ශ්වකරුවන් සවිබල ගැන්වී, සමස්ත සම්බන්ධ වීමේ ක්‍රියාවලියේම අවසන් ඉලක්කය ලෙස සැලකිය හැකිය. ස්වේච්ඡා ජාතික සමාලෝචන අදියර සහ පශ්චාත් ස්වේච්ඡා ජාතික සමාලෝචන කාල සීමාව සඳහා හඳුනාගන්නා ලද පාර්ශ්වකරුවන් සම්බන්ධ කරගැනීමේ මෙවලම්වල යෝජිත පත්‍රධාරය වගුව 3.1 තුළ දක්වා ඇත. 2018 ස්වේච්ඡා ජාතික සමාලෝචන කාල සීමාව තුළදී සීමිත කාල රාමුව සහ කාර්යයේ අදහස් විමසීමේ අවශ්‍යතාවය සලකා බලා වැඩ මුළු සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලදී. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා ස්වේච්ඡා ජාතික සමාලෝචනය හා සම්බන්ධ වඩා හදිසි කාර්යයන් සම්පූර්ණ කිරීමෙන් පසුව බහු පාර්ශ්වකාර සමුද්දේශ කණ්ඩායම (MRG) වැනි පාර්ශ්වකරුවන් සම්බන්ධ කිරීමේ දීර්ඝ කාලීන ක්‍රියාමාර්ගයන් ගැනීම පිළිබඳව ස්වේච්ඡා ජාතික සමාලෝචන කාර්ය සාධක බලකාය විස්තරාත්මකව සාකච්ඡා කර ඇත

වගුව 3.1: ස්වේච්ඡා ජාතික සමාලෝචනය සහ පශ්චාත් ස්වේච්ඡා ජාතික සමාලෝචන අදියර තුළ සම්බන්ධ වීමේ මෙවලම්

සම්බන්ධ වීමේ මට්ටම සම්බන්ධ වීමේ මට්ටම	VNR සඳහා භාවිතා කළ සම්බන්ධ වීමේ මෙවලම්	දීර්ඝ කාලීන සම්බන්ධ වීමේ මෙවලම්	දීර්ඝ කාලීනව සම්බන්ධ වීමේ වගකීම	පාර්ශ්වකරුවන්
දැනුම් දීම	▪ වෙබ් අඩවි වෙතින් සම්බන්ධ වීම ▪ ඊමේල් සබැඳියක් සම්පාදනය කර ප්‍රධාන පාර්ශ්වකරුවන් සමග සන්නිවේදන මාධ්‍යයක් සංවර්ධනය කිරීම	• තිරසර සංවර්ධන ඉලක්ක වෙබ් අවියක් සංවර්ධනය කිරීම	• MSDWRD, UN මෙරට කණ්ඩායම සහ කාර්ය බලකාය/උපදේශක කමිටුව	▪ පොදු ජනතාව ඇතුළු පාර්ශ්වකරුවන්
අදහස් විමසීම	• IPS හි ඊමේල්, වෙබ් හා සමාජ මාධ්‍ය පහසුකම් හරහා ඇරයුම් කිරීම • SEP සමග හමුවීම සංවිධානය කිරීම	SDG වෙබ් පෝටලය සමග සම්බන්ධ මාර්ගගත තිරසර සංවර්ධන ඉලක්ක ජාලයක් සංවර්ධනය කිරීම		▪ වෙබ් පෝටල: සියලු පාර්ශ්වකරුවන් සැලසුම් කිරීම *හමුවීම:* MSDWRD, UN මෙරට කණ්ඩායම, IPS, VNR කාර්ය බලකාය පාර්ශ්වකරුවන් VNR කාර්ය බලකාය , පාර්ශ්වකරුවන්
සම්බන්ධ වීම	▪ ජාතික වැඩමුළු 3 • උප ජාතික වැඩමුළු 1 වලංගුකරණ වැඩමුළු	• වැඩමුළු සඳහා වෙබ් පැතිකඩ සංවර්ධනය	• වැඩමුළු සහ වෙබ් පදනම සැලසුම් කිරීමට MSDWRD, UN මෙරට කණ්ඩායමේ තාක්ෂණික සහය	• ජාතික වැඩමුළු රජයේ, පුද්ගලික අංශය, සි.ස.සං • විද්වතුන් , උප ජාතික වැඩමුළු පළාත්, දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය මට්ටමේ රජයේ නියෝජිත, සි.ස.සං. සහ ප්‍ර.ප.සං, පුද්ගලික අංශය සහ විද්වතුන්
සහය ලබාදීම		• බහු පාර්ශ්ව සමුද්දේශ කණ්ඩායම් (MRG)	▪ MSDWRD, කාර්ය බලකාය/උපදේශක කමිටුව සහ UN මෙරට කණ්ඩායම ය.	▪ සියලුම පාර්ශ්ව කණ්ඩායම් වෙතින් නියෝජිතයින් 8-10

ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන විෂය සඳහා වග කියනු ලබන රේඛීය අමාත්‍යාංශය වන තිරසර සංවර්ධන, වන ජීවී සහ කලාපීය සංවර්ධනය පිළිබඳ අමාත්‍යාංශය විසින් ස්වේච්ඡා ජාතික සමාලෝචනය සඳහා සූදානම් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට පෙර 2015-2018 කාල සීමාව තුළ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ අදහස් විමසීමේ සහ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් තුළින් අනෙක් රේඛීය අමාත්‍යාංශ සහ ජාතික හා උප ජාතික පාර්ශ්වකරුවන් සම්බන්ධ කිරීමට පියවරයන් ගණනාවක් ගනු ලැබීය. මේවාට, රාජ්‍ය අංශයේ නිලධාරීන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ සිවිල් සමාජය, විද්වතුන් සහ පුද්ගලික අංශය මෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ වෙනත් ප්‍රදායක නියෝජිතායතන වැනි අනෙක් ක්ෂේත්‍රවල පාර්ශ්වකරුවන් සඳහා සැලසුම් කළ හා පැවැත්වූ ක්‍රියාකාරකම් ඇතුළත් වේ.

පහත සාරාංශගත කොට ඇත්තේ තිරසර සංවර්ධන ඉලක්ක සම්බන්ධ හිමිකාරීත්වය නිර්මාණය කිරීමේ සහ 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම තුළ විවිධ පාර්ශ්වකරුවන් සම්බන්ධ කැගැනීමේ ලා ශ්‍රී ලංකාව් විසින් ගන්නා ලද ප්‍රධාන ක්‍රියාමාර්ගයන් ය.

අ) තිරසර සංවර්ධන ඉලක්ක තුළ රජයේ විවිධ මට්ටම් සහ අංශවල මැදිහත්වීම

තිරසර සංවර්ධන, වන ජීවී සහ කලාපීය සංවර්ධනය පිළිබඳ අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම සම්බන්ධව විවිධ රාජ්‍ය නියෝජිතායතනවලට ඇති කාර්ය භාරයන් සහ වගකීම් හඳුනාගැනීම සහ ආයතනික රාමුව තුළව වන සම්බන්ධතා, උපරිපතනයන් සහ පරතරයන් හඳුනාගැනීම සඳහා මූලාරම්භයන් ගෙන ඇත. අනෙකුත් රේඛීය අමාත්‍යාංශ, තිරසර සංවර්ධන, වන ජීවී සහ කලාපීය සංවර්ධනය පිළිබඳ අමාත්‍යාංශය විසින් කරන ලද ඉල්ලීම මත තිරසර සංවර්ධනය සඳහා නාභීය ලක්ෂ්‍යයන් ඇති කරන ලදී. රේඛීය අමාත්‍යාශ සහ පළාත් සභාවල නාභීය ලක්ෂ්‍යයන් ජාතික සහ උප ජාතික මට්ටම්වලින් තිරසර සංවර්ධන, වන ජීවී සහ කලාපීය සංවර්ධනය පිළිබඳ අමාත්‍යාංශය සමග සම්බන්ධ වේ. මීට අමතරව, ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය තුළ මහජන නියෝජිතායතන සම්බන්ධ වීම සඳහා පහසුකම් සැපයීමට තිරසර සංවර්ධන, වන ජීවී සහ කලාපීය සංවර්ධනය පිළිබඳ අමාත්‍යාංශය විසින් පහත ක්‍රියාමාර්ගයන් ගෙන ඇත:

- තිරසර සංවර්ධනය හා සම්බන්ධ විවිධ ඉලක්කයන් ආවරණය කරමින් රාජ්‍යසේවය ලබාදීමේ උපාය මාර්ගයක් කෙටුම්පත් කර ඇත.

- ව්‍යවස්ථාපිත නියෝජිතායතන 425 ක විධි නියෝගයන් මත පදනම්ව ඒවායේ තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ වගකිම් දක්වන අත්පොතක් සකසා ඇත

- ස්වේච්ඡා ජාතික සමාලෝචන ක්‍රියාවලිය සඳහා මාර්ගෝපදේශය සැපයීමට සහ සහය දැක්වීමට ප්‍රධාන රජයේ ආයතන අතුරින් ස්වේච්ඡා ජාතික සමාලෝචනය සැකසීම සඳහා වන කාර්ය සාධක බලකාය" ක් පත් කරන ලදී

- තිරසර සංවර්ධන ඉලක්ක දර්ශක රාමුව භාෂා තුනකින් පල කෙරිණි. තිරසර සංවර්ධන, වන ජීවී සහ කලාපීය සංවර්ධනය පිළිබඳ අමාත්‍යාංශය විසින් දරන ලද මෙම උත්සාහයන්ට ශක්තියක් සපයමින් අනෙක් ප්‍රධාන නියෝජිතායතන විසින් පහත ඒකාබද්ධ ක්‍රියාමාර්ගයන් ගනු ලැබිණි:

- තිරසර සංවර්ධන ඉලක්ක සංවර්ධන න්‍යායපත්‍රය තුළට අන්තර්ගත කිරීමට, තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛතාවය ලබාදීමට සහ තිරසර සංවර්ධන, වන ජීවී සහ කලාපීය සංවර්ධනය පිළිබඳ අමාත්‍යාංශය සමග සම්බන්ධව ආංශික ප්‍රතිපත්ති සමග තිරසර සංවර්ධන ඉලක්ක දේශීයකරණය කිරීම (උදා: කෘෂිකාර්මික අංශය), සඳහා භඡෘ මගින් සිදු කළ අනුරූපණ ව්‍යායාමයන්

- ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන ඉලක්කවල ප්‍රගතිය මැනීම සඳහා වන පදනම් රේඛාවන් හඳුනාගැනීමට සහ සුදුසු දර්ශකයන් සංවර්ධනය කිරීමට ශ්‍රී විසින් කරන ලද ඇගයීම් ශ්‍රී විසින් "ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන ඉලක්ක දර්ශකයන්ගේ තත්වය" සම්බන්ධ ප්‍රකාශනයක් සහ තිරසර සංවර්ධන ඉලක්ක දර්ශක රාමුවක් සහිත වෙබ් අඩවියක් පල කරන ලදී.

- DPMM, UNICEF සහ UNDP විසින් සිදු කළ ශ්‍රී ලංකාව පිළිබඳ සිද්ධි අධ්‍යයනය තුළින් තිරසර සංවර්ධන ඉලක්ක වෙත වන ප්‍රගතිය ඇගයීම සඳහා වන ධාරිතාවන් සහ ජාතික ඇගයීම් පද්ධතිය පිළිබඳ කලාපීය සමාලෝචනය සමග සහභාගි වීම.

මෙම මූලාරම්භයන්ට, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ වෙනත් ව්‍යවස්ථාපිත ආයතනවල රාජ්‍ය අංශයේ නිලධාරීන් සහභාගි වූ බහු පාර්ශ්වකරුවන් සම්බන්ධ වූ අතර, තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීමට සහ රාජ්‍ය නිලධාරීන් අතර තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාවලිය පිළිබඳ හිමිකාරීත්වයක් ඇති කිරීමට එය පිටිවහලක් විය.

ආ) තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ ලා පාර්ලිමේන්තුවේ මැදිහත්වීම

සමාලෝචනය, උපදේශන සේවා සපයමින්, පාර්ලිමේන්තුව සහ අදාළ අමාත්‍යාංශ සමග ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය කරමින් සහ තිරසර

3 එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 සඳහා වන පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ මධ්‍යකාලීන වාර්තාව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අටවන පාර්ලිමේන්තුවේ 2017 අංක 226 දරන මාලාව (පළමු සැසිය)

සංවර්ධන ඉලක්ක සඳහා උපදෙස් සපයමින් ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීමේ අරමුණ ඇතිව එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 සඳහා වන පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව ස්ථාපිත කරන ලදී.[3] කමිටුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 15 කින් සමන්විත වෙයි. "පහත දේ සඳහා නිර්දේශ සැපයීම: අදාළ රේඛීය අමාත්‍යාංශ සමග සම්බන්ධ වී ජාතික ප්‍රතිපත්ති සහ නීති සැකසීම; ප්‍රමාණවත් දේශීය සම්පත් වෙන් කිරීම සහ ජාත්‍යන්තර මූල්‍යයන සම්පත් සොයාගැනීම; රජයේ ක්‍රියාත්මක නියෝජිතායතන සම්බන්ධීකරණය කිරීම; ජාතික, පළාත් සහ ප්‍රාදේශීය මට්ටම් ජාලකරණය කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම; රාජ්‍ය-පුද්ගලික හවුල්කාරීත්වය සඳහා දිරි දීම; එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සහ සිවිල් සමාජ සංවිධානවල සහය ලබාගැනීම; කලාපීය සහ ජාත්‍යන්තර මට්ටමින් රටවල් අතර විශේෂඥභාවය සහ අත්දැකීම් හුවමාරු කරගැනීම; වෙනමම වූ දත්ත පද්ධතියක් සංවර්ධනය කිරීම සහ කලින් කලට ප්‍රගතිය සමාලෝචනය කිරීම; සහ ඉහත කරුණුවලට සම්බන්ධ හෝ අනුෂංගික සියලු දේ සම්බන්ධව සලකා බැලීම යනාදිය තේරීම් කාරක සභාවේ විධිනියෝගයන් වේ."[4]

ඇ) තිරසර සංවර්ධන ඉලක්ක වෙත සිවිල් සමාජ සංවිධාන, පුද්ගලික අංශය සහ විද්වතුන්ගේ මැදිහත්වීම

තිරසර සංවර්ධන, වන ජීවී සහ කලාපීය සංවර්ධනය පිළිබඳ අමාත්‍යාංශය විසින් සිවිල් සමාජ සංවිධාන, පුද්ගලික අංශය සහ විද්වතුන් බහු පාර්ශ්වකරුවන්ගේ අවස්ථාවන් සඳහා සහභාගි වීම තහවුරු කරගැනීමට ක්‍රියා මාර්ග ගෙන ඇත. එමෙන්ම රාජ්‍ය අංශය, පුද්ගලික අංශය, සිවිල් සමාජ සංවිධාන සහ විද්වතුන් ගේ නියෝජිතයින්ගෙන් සමන්විත වන තිරසර සංවර්ධනය පිළිබඳ උපදේශක කමිටුවී ද පත් කර ඇත. මීට අමතරව, ස්වේච්ඡා ජාතික සමාලෝචනය සැකසීමේදී රාජ්‍ය නොවන පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසීම සඳහාද විශේෂ අවධානයක් යොමු කරන ලදී. එහිදී අවබෝධ වූයේ ස්වේච්ඡා ජාතික සමාලෝචන ක්‍රියාවලිය තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ පුළුල් ක්‍රියාවලියෙන් වෙන් කළ නොහැකි බවයි. එනිසා පශ්චාත් 2018 ස්වේච්ඡා ජාතික සමාලෝචන මැදිහත්වීමක් සඳහා වන පුළුල් වේදිකාව වෙනුවෙන් වන පදනම ස්වේච්ඡා ජාතික සමාලෝචන අදියරේ සිටම සැලසුම් කළ යුතුය. එබැවින් තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය පුරාම මෙන්ම 2018 ස්වේච්ඡා ජාතික සමාලෝචන කාල සීමාවටත් ඔබ්බෙන් සක්‍රියව පවතින සියලු පාර්ශ්වකරුවන් ඇතුළත්වන මැදිහත්වීමේ ක්‍රියාවලියක් ඇති කිරීමේ ලා පාර්ශ්වකරුවන් සම්බන්ධ වීමේ සැලසුමක් සකසනු ලැබීය. එහි ප්‍රධාන අරමුණු දෙකකි:

1. ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාවලියට සම්බන්ධ සියලුම පාර්ශ්වකරුවන්ගේ අදහස් ස්වේච්ඡා ජාතික සමාලෝචනය සූදානම් කිරීම සඳහා ලබාගැනීම සහ දැනුවත් කිරීම උදෙසා සියලුම පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසීම
2. පශ්චාත් 2018 ස්වේච්ඡා ජාතික සමාලෝචන කාල සීමාව තුළ සියලුම පාර්ශ්වකරුවන්ගේ අඛණ්ඩ මැදිහත්වීම සඳහා වේදිකාවක් නිර්මාණය කිරීම

ස්වේච්ඡා ජාතික සමාලෝචන කාලය තුළ පාර්ශ්වකරුවන් මැදිහත්වීම සහතික කිරීම සඳහා සැලසුම් කළ ප්‍රධාන මෙවලම වූයේ වැඩමුළු ය. ජාතික මට්ටමේ වැඩමුළු තුනෙන් සහ කලාපීය වැඩමුළුවෙන් පසු බිම් මට්ටමින් ක්‍රියා කරන ප්‍රජා පදනම් සංවිධාන හරහා කලාපීය උපදේශන වැඩමුළු තුළින් ආන්තිකකරණය වූ ප්‍රජාවන් නියෝජනය කිරීමට ක්‍රියාමාර්ගයන් ගනු ලැබිණි. ස්වේච්ඡා ජාතික සමාලෝචන ක්‍රියාවලිය තුළ සියලු දෙනා ඇතුළත් වූ සහභාගීත්වයක් තහවුරු කිරීම සඳහා විවෘත කැඳවීම් හරහා අයදුම් පත්‍ර කැඳවන ලද අතර මාධ්‍ය, සමාජ මාධ්‍ය සහ ප්‍රධාන වෙබ් අඩවි හරහා ප්‍රසිද්ධ කරනු ලැබීය

තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය පුරාම සියලුම පාර්ශ්වකරුවන්ගේ මැදිහත්වීම තහවුරු කිරීමට මාර්ගගතව සම්බන්ධ වීමේ මෙවලම් ස්ථාපිත කිරීමට පාර්ශ්වකරුවන් සම්බන්ධ කරගැනීමේ සැලසුම විසින් යෝජනා කර ඇත. ඒ අනුව, දීර්ඝකාලීන පාර්ශ්වකරුවන් සම්බන්ධ කරගැනීමේ වේදිකාවක් ලෙස තිරසර සංවර්ධන ඉලක්ක වෙබ් පෝටලයක් සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකාව මේ මොහොතේ කටයුතු කරමින් සිටී. පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධතාවය සහ අඛණ්ඩ සහයෝගය වැඩි දියුණු කිරීමේ ක්‍රියාමාර්ගයක් ලෙස, පාර්ශ්වකරුවන් සම්බන්ධ කරගැනීමේ සැලසුම විසින් බහු පාර්ශ්ව සමුද්දේශ කණ්ඩායමක්ද යෝජනා කරන අතර එමගින් පශ්චාත් ස්වේච්ඡා ජාතික සමාලෝචනය ක්‍රියාත්මක වන කාලය තුළ තිරසර සංවර්ධන ඉලක්ක සඳහා යෝජිත වෙබ් පෝටලය සම්බන්ධව ආදානයන් සපයනු ඇත.

ඈ) එක්සත් ජාතීන්ගේ මැදිහත් වීම

එක්සත් ජාතීන්ගේ මෙරට කණ්ඩායම සහ ආසියා පැසිෆික් කලාපයේ එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ කොමිෂන් සභාව (ESCAP), ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම සඳහා වටිනා සහයක් ලබාදෙන අතර රටේ රාජ්‍ය අංශය සමග මෙන්ම සිවිල් සමාජ සංවිධාන සමගත් ශක්තිමත් සම්බන්ධතාවක් ඇති කරගෙන ඇත. එක්සත් ජාතීන්ගේ මෙරට කණ්ඩායම, ආසියා පැසිෆික් කලාපයේ එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ කොමිෂන් සභාව සහ මහජන සහභාගීත්වය පිළිබඳ ජාත්‍යන්තර සංගමය සමග එක්ව තාක්ෂණික සහ මූල්‍ය සහය තුළින් මෙන්ම බහු පාර්ශ්වකරුවන් සම්බන්ධ කරගැනීමේ ක්‍රියාකාරකම් තුළින් ශ්‍රී ලංකා රජයේ ව්‍යායාමයන්ට සහය ලබාදී ඇත. එක්සත් ජාතීන්ගේ සහයට පහත දේ ඇතුළත් වේ:

- 2017 -2020 රටේ පොදු ආයෝජන වැඩසටහන් සහ තිරසර සංවර්ධන ඉලක්ක අතර වන ඇලපුම විශ්ලේෂණය කරමින් ශීඝ්‍ර අනුකලිත ඇගයීම් සිදු කිරීම තුළින් තිරසර සංවර්ධන ඉලක්ක ජාතික ප්‍රතිපත්තිවලට ඒකාබද්ධ කිරීම සහ ප්‍රතිපත්ති අනුරූපණය කිරීම සඳහා තාක්ෂණික සහය ලබාදීම

4 Ibid, p 43

- ස්වේච්ඡා ජාතික සමාලෝචනය සැකසීම සඳහා මූල්‍ය සහය ලබාදීම සහ රජයේ විවිධ කටයුතු සඳහා අනුග්‍රාහකත්වය සැපයීම
- ජාතික උපදේශන ක්‍රියාවලිය තුළ සහභාගීත්වය සහ ආදාන ලබාදීම හා ජාත්‍යන්තර අත්දැකීම් හුවමාරු කරගැනීම
- ඵලදායී බහු පාර්ශ්ව සහභාගීත්වයක් සඳහා නිර්දේශ ලබාදීම උදෙසා තිරසර සංවර්ධන ක්‍රියාවලිය තුළ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය තහවුරු කිරීමට ඇගයීමේ කටයුතු සිදු කිරීම
- ජාතික ස්වේච්ඡා සමාලෝචනය සැකසීම සඳහා පාර්ශ්වකරුවන් සම්බන්ධ කරගැනීමේ ක්‍රියාමාර්ග සැලසුම් කිරීම සහ සංවිධානය කිරීම
- 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගගත සහභාගීත්ව වේදිකාවක් සැකසීම සඳහා තාක්ෂණික සහය ලබාදීම

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ශ්‍රී ලංකා රජය සමග සම්බන්ධ වී 2018 මාර්තු මස තිරසර සංවර්ධන ඉලක්ක සඳහා දත්ත සම්බන්ධ පළමු ජාතික සිම්පෝසියම (ඃඍඨ්ජ්ඛණ) පවත්වන ලදී. මෙය දින දෙකක් පුරා පැවති අතර ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන ඉලක්ක දර්ශකයන්ගේ වර්තමාන තත්වය පිළිබඳව සාකච්ඡා කිරීමට සහ වැඩි දියුණු කළ දත්ත, දැනුම් කළමනාකරණය සහ සාක්ෂ්‍ය පදනම් ප්‍රතිපත්ති සැලසුම්කරණය තුළින් ගමන් මග උපාය මාර්ග තෝරා ගැනීම සඳහා බහු පාර්ශ්වකරු වේදිකාවක් (රජයේ නියෝජිතයින්, එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන, විද්වතුන්, සිවිල් සමාජය සහ දත්ත හා පර්යේෂණ සංවිධානවල නියෝජිතයින්ගෙන් සමන්විත) සපයනු ලැබිණි.

3.2

තිරසර සංවර්ධන ඉලක්ක සහ ජාතික ප්‍රතිපත්ති අතර පෙළගැන්නුම

2030 න්‍යායපත්‍රය සාක්ෂාත් කරගැනීමට රට නිසි මගට පිවිස ඇතිදැයි හඳුනාගැනීමේ මූලික පියවරක් වශයෙන්, තිරසර සංවර්ධන ඉලක්ක හා රටේ ප්‍රතිපත්ති අතර වන ගැලපුම විශ්ලේෂණය කිරීම, පවතින ප්‍රතිපත්ති වෙත ගැඹුරු දැක්මක් සපයනු ඇති අතර එය තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා මෙන්ම නිරාකරණය කළ යුතු පරතරයන්ද පියවනු ඇත. එබැවින් මෙම කොටස මගින් ප්‍රධාන ජාතික ප්‍රතිපත්ති ලේඛන ත්‍රිත්වය - 2025 දැක්ම, 2017-20205 රාජ්‍ය ආයෝජන වැඩසටහන සහ 2018 අයවැය

ඒවා තිරසර සංවර්ධන ඉලක්ක සමග පෙළගැන්නුම් කෙරෙන ආකාරය පිළිබඳව පෙර සිදුකළ අධ්‍යයනයන්ද සමග විශ්ලේෂණය කරනු ඇත. මීට අමතරව, මෙම ප්‍රධාන ප්‍රතිපත්ති ලේඛන තුළ තිරසර සංවර්ධනයේ මානයන් ත්‍රිත්වය අන්තර්ගත වී ඇතිද යන්නත් මෙම කොටස හරහා පරීක්ෂා කෙරේ.

වර්තමාන ජාතික ප්‍රතිපත්ති රාමුව

2025 දැක්මඃ පොහොසත් රටක් තුළින්, සියලුම පුරවැසියන්ට ඉහළ ආදායම් මාර්ග ලබාගැනීමේ හා රට දැනුම් පදනම් වූ, ඉහළ තරඟකාරීත්වයකින් හෙබි සමාජ වෙළෙඳපොළ ආර්ථිකයක් කිරීම හරහා වඩා යහපත් ජීවන තත්වයන් ලබාගැනීමේ අවස්ථාව ඇති කරමින් 2025 වර්ෂය වන විට ශ්‍රී ලංකාව සමෘද්ධිමත් රටක් කිරීමට වන රජයේ දැක්ම අවධාරණය කරයි. 6

2025 දැක්ම තුළ ඇති ඉහළ තිරසර වර්ධනයක් සඳහා වන දීර්ඝකාලීන අරමුණු සාක්ෂාත් කරගත හැකි වනුයේ, මධ්‍ය කාලීන සංවර්ධන ප්‍රමුඛතා අතර සම්පත් වෙන් කිරීම සඳහා වන විස්තීර්ණ රාජ්‍ය ආයෝජන වැඩසටහනක් හරහා සීමිත ෆිස්කල් ඉඩකඩ තුළ රාජ්‍ය ආයෝජන නිසි පරිදි කළමනාකරණය කිරීම හරහාය. ඒ සඳහා, දැනට සිදු කෙරෙමින් පවතින, වාර්ෂික, පරිණත සහ අනාගත ව්‍යාපෘති දහසකට වැඩි සංඛ්‍යාවක් විස්තර කෙරෙන විස්තීර්ණ රාජ්‍ය ආයෝජන වැඩසටහන (PIP) 2017-2025 ශ්‍රී ලංකා රජය විසින් සංවර්ධනය කර ඇත. PIP 2017-2020 සකසා ඇත්තේ පුළුල් පරාසයක ප්‍රතිපත්ති ලේඛන, මැතිවරණ ප්‍රකාශන සහ ඉතා වැදගත් වශයෙන් තිරසර සංවර්ධන ඉලක්ක මත පදනම්වය. (රූපය 3.1)

5 රාජ්‍ය ආයෝජන වැඩටහන (PIP) 2017-2025, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව t http://www.mnpea.gov.lk/web/ index.php/en/news-events/2-uncategorised/181-public-investment-programme.html වෙතින් ලද හැකිය
6 2025 දැක්මඃ පොහොසත් රටක්. http://www.pmoffice.gov.lk/download/press/D00000000061_EN.pdf වෙතින් ලද හැකිය

3.1 රූපය : ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති රාමුවේ සැලසුම



රාජ්‍ය ආයෝජන වැඩසටහන සකස් කර ඇත්තේ "පංච විධ සැලැස්ම: මාස 60 කින් නව රටක්", "මෛත්‍රී පාලනයක්: ස්ථාවර රටක්" සහ "අනාගතයට සහතිකයක්" යනාදී ලෙස ජනතාව ඉදිරියට ගෙන ආ රජයේ සමස්ත සංවර්ධන දැක්ම මත පදනම්වයි. ප්‍රතිපත්ති ප්‍රකාශයේ සංවර්ධන ඉලක්ක පහට පහත දේ අයත් වේ; (1) රැකියා අවස්ථා මිලියනයක් උත්පාදනය කිරීම; (2) ආදායම් මට්ටම් වැඩි කිරීම; (3) ග්‍රාමීය ආර්ථිකයන් සංවර්ධනය; (4) ග්‍රාමීය, වතු, මධ්‍යම පාංතික සහ රජයේ සේවකයන්ට ඉඩම් හිමිකාරීත්වය තහවුරු කිරීම සහ (5) පුළුල් සහ ශක්තිමත් මධ්‍යම පංතියක් ඇති කිරීම. ජෂජ 2017-2020 ප්‍රධාන වශයෙන් සූදානම් කරන ලද්දේ දී ඇති කාලය තුළ ආයෝජනය කළ හැකි සම්පත් ප්‍රමාණය තක්සේරු කිරීමේ අරමුණ ඇතිවය. එම සම්පත් විවිධ අංශ, උප අංශ සහ විවිධ රජයේ නියෝජිතායතන අතර වෙන් කළ යුතු ආකාරයද දක්වනු ලබයි. එබැවින්, එය රජය කෙටි කාලීන (වාර්ෂික) අරමුදල් වෙන් කිරීම දක්වනු ලබන 2018 අයවැය සමග සමීපව සම්බන්ධ වේ.

2018 අයවැය "නීල-හරිත අයවැය" යන තේමාවෙන් යුක්ත වන අතර ශ්‍රී ලංකාවේ ඌන උපයෝජිත සමුද්‍ර සම්පත් භාවිතා කරමින් පාරිසරිකව තිරසර ආර්ථික වර්ධනයක් උත්පාදනය කිරීම සහ එමගින් නව තිරසර තාක්ෂණයන් භාවිතා කර ආර්ථිකය විවිධාංගිකරණය කිරීම මත කේන්ද්‍ර වේ. අයවැය විශේෂයෙන්ම අවධානය යොමු කරන්නේ රජයේ ආදායම් අඩුවිම, රාජ්‍ය ණය වැඩිවීම, ගෙවුම් ශේෂ අර්බුදය සහ ස්වභාවික ආපදා සිදුවීම් වැඩිවීම යනාදිය අඛණ්ඩව අඩු කිරීම වැනි කෙටි කාලීන අභියෝගයන්ට මුහුණ දීම කෙරෙහිය. මීට අමතරව, 2018 අයවැය මගින්, ඒක පුද්ගල ආදායම වර්ධනය, රැකියා උත්පාදනය, සෘජු විදේශ වත්කම් ගලා ඒම, අපනයනයන් වැඩි කිරීම වැනි මධ්‍ය කාලීන ඉලක්ක සපුරා ගැනීමේ මූලාරම්භයන් ගණනාවක්ද හඳුනාගෙන ඇත.

තිරසර සංවර්ධන ඉලක්ක 17 සඳහාම ස්වේච්ඡාවෙන් කටයුතු කිරීම වැදගත් අංගයක් වන බවට රජය හඳුනාගෙන ඇත. එක් එක් ඉලක්ක සඳහා වෙන් වූ ජාතික ප්‍රතිපත්ති ඇති අතරම මේ සියලුම ඉලක්ක සපුරාගැනීම සඳහා සහය ලබාදීමට ස්වේච්ඡාවෙන් කටයුතු කිරීම සම්බන්ධ ජාතික ප්‍රතිපත්තියක් වැදගත් වන අතර එබැවින්ම අත්‍යවශ්‍ය වූ අවශ්‍යතාවයක් වේ.

තිරසර සංවර්ධන ඉලක්ක සමග ගැලපෙන ප්‍රතිපත්ති පිළිබඳ ඇගයීම

රටේ ප්‍රතිපත්ති රාමුව තිරසර සංවර්ධන ඉලක්ක සමග කෙතරම් දුරට පෙළගැන්නුම් වී ඇතිදැයි හඳුනාගැනීමට, ජාතික දැක්ම උපාය මාර්ගය, ජාතික සංවර්ධන සැලසුම, ආංශික සැලසුම් සහ ප්‍රාදේශීය සංවර්ධන න්‍යාය පත්‍ර වැනි කෙටි කාලීන, මධ්‍ය සහ දීර්ඝ කාලීන ප්‍රතිපත්ති ලේඛන අනුව ජාතික/උප-ජාතික ප්‍රමුඛතා සමග තිරසර සංවර්ධන ඉලක්ක අනුරූපණය කිරීම හඳුනාගැනීම වැදගත් වේ. මෙය පවතින පරතරයන් සහ අභිසාරිතාවන් හඳුනාගැනීමට උපකාර වන අතර එමගින් වඩා හොඳින් ජාතික ප්‍රතිපත්ති රාමුව තුළට තිරසර සංවර්ධන ඉලක්ක අනුගත කිරීමට ඉවහල් වෙයි. කෙසේ වෙතත්, එවන් ලේඛන ලබාගත නොහැකි වීම සහ සංකීර්ණ බව හේතුවෙන් තිරසර සංවර්ධන ඉලක්ක සමග ප්‍රතිපත්තිවල ගැලපීම පරීක්ෂා කිරීම අසීරු කාර්යයක් බවට පත් කරන අතර බොහෝ විට රටවල්වලට සිදුවන්නේ ප්‍රධාන ජාතික ප්‍රතිපත්ති ලේඛන කිහිපයක් සමග පමණක් මෙම විශ්ලේෂණය සිදු කිරීමටයි.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් රාජ්‍ය ආයෝජන වැඩසටහන තිරසර සංවර්ධන ඉලක්ක සමග ඇති පෙළගැන්නුම ඇගයීමට ඒ සම්බන්ධව ශීඝ්‍ර අනුකලිත ඇගයීමක් සිදු කළ අතර ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන ඉලක්ක සහ ජාතික ප්‍රතිපත්ති රාමුව අතර වන පරතරයන් අනාවරණය කරගැනීමට වෙනම අතිරේක විශ්ලේෂණයක් සිදු කරන ලදී. මෙම විශ්ලේෂණයන්ගේ සොයාගැනීම් පහත දක්වා ඇත.

අ) රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020 පිළිබඳ ශීඝ්‍ර අනුකලිත ඇගයීම

පෙළගැන්නුම් කටයුත්ත සමග ඉදිරියට යාමට සහ ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන ඉලක්ක පැතිකඩක් සංවර්ධනය කිරීමට, රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020 තුළ ඇති ඉලක්කවලට අදාළව වගුව 3.2 මගින් දක්වා ඇති පරිදි තිරසර සංවර්ධන ඉලක්ක අනුරූපණය කෙරිණි. ශීඝ්‍ර අනුකලිත ඇගයීම විසින් ඉලක්ක 169 කින් රටේ ප්‍රතිපත්ති සංවර්ධනයට අදාළ නොවන හෝ පාලන ගැටළුවලට අයත්, කලාපීය හෝ ගෝලීය මට්ටමින් නිරාකරණය කළ යුතු ඉලක්ක 16 ක් (9%) ක් හඳුනාගෙන ඇත. එමෙන්ම ශ්‍රී ලංකාවට අදාළ වුවද පෙළගැන්නුම් කර නොමැති ඉලක්ක 44 ක් (26%) ක් හඳුනාගෙන ඇත.

වගුව 3.2: තිරසර සංවර්ධන ඉලක්ක රාජ්‍ය ආයෝජනයේ ප්‍රධාන ක්ෂේත්‍රවලට අනුරූපණය කිරීම

වගුව 3.2: තිරසර සංවර්ධන ඉලක්ක රාජ්‍ය ආයෝජනයේ ප්‍රධාන ක්ෂේත්‍රවලට අනුරූපණය කිරීම

ඉලක්කය	තිරසර සංවර්ධන ඉලක්ක	ඉලක්ක ගණන			%
		එකතුව	අදාළ වන	පෙළගැන්නුම් වූ	පෙළගැන්නුම
1	දිළිඳුබව නැති කිරීම	7	6	6	86%
2	කුසගින්න නැති කිරීම	8	7	5	63%
3	යහපත් සෞඛ්‍යය සහ යහපැවැත්ම	13	13	9	69%
4	ගුණාත්මක අධ්‍යාපනය	10	10	10	100%
5	ස්ත්‍රී පුරුෂ සමානත්මතාවය	9	9	6	67%
6	පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව	8	8	7	88%
7	දැරිය හැකි සහ පිරිසිදු බලශක්තිය	5	5	5	100%
8	වැදගත් රැකියා සහ ආර්ථික සංවර්ධනය	12	11	10	83%
9	කර්මාන්ත, නව්‍යකරණය සහ යටි තල පහසුකම්	8	8	8	100%
10	අසමානතා අඩු වීම	10	7	6	60%
11	තිරසර නගර සහ ප්‍රජාවන්	10	9	9	90%
12	වගකිවයුතු පරිභෝජනය සහ නිෂ්පාදනය	11	10	7	64%
13	කාලගුණ ක්‍රියාමාර්ග	5	4	4	80%
14	දිය යට ජීවය	10	9	3	30%
15	මිහිමත ජීවය	12	12	4	33%
16	සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන	12	12	5	42%
17	ඉලක්ක සඳහා හවුල්කාරීත්ව	19	13	5	26%
		169	153	109	64%

මූලාශ්‍රය: ශ්‍රී ලංකව තුළ SDG ක්‍රියාත්මක කිරීමට සහය දක්වන MAPS එළඹුම, ශ්‍රී ලංකා රජය සහ ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද කණ්ඩායම, 2018 ජනවාරි

කෙතරම් දුරට පෙළගැන්නුම් වී ඇතිදැයි (පාර්ශ්විකව හෝ පූර්ණ ලෙස) හඳුනාගැනීමට පෙළගැන්නුම් ඉලක්ක තවදුරටත් විශ්ලේෂණය කර ඇත. පෙළගැන්නුම් වී ඇති ඉලක්ක 109 අතුරින්, ඉලක්ක 64 ක් පූර්ණ වශයෙන් පෙළ ගැන්නුම් වී ඇතිදැයි හඳුනගෙන ඇත (මුළු ඉලක්කවලින් 38%). පූර්ණ පෙළගැන්නුම යනු ජාතික සැලසුම් ලේඛනය තුළ තිරසර සංවර්ධන ඉලක්ක සමග පාඨයෙන් පමණක් නොව විෂය ක්ෂේත්‍රය සහ අභිලාශයද ඇතුළත් වන ඉලක්කයි.

සමහර අවස්ථාවලදී ඒවායේ ප්‍රගතිය මැනීමට දර්ශක දක්වා හෝ/සහ සම්පත් වෙන් කිරීමද කර ඇත. ඉතිරි ඉලක්ක 45 අර්ධ වශයෙන් පෙළගැන්නුම් වන ඒවා ලෙස (මුළු ඉලක්ක වන්ලින් 27%) හඳුනාගනු ලැබිණි.

3.2 රූපය : තිරසර සංවර්ධන ඉලක්ක PIP 2017-2020 සමග පූර්ණ පෙළගැන්වුම්



මූලාශ්‍රය: ශ්‍රී ලංකාව තුළ SDG ක්‍රියාත්මක කිරීමට සහය දක්වන MAPS එළඹුම, ශ්‍රී ලංකා රජය සහ ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද කණ්ඩායම, 2018 ජනවාරි

රූප සටහන 3.2 සහ 3.3 මගින් රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති තුළ ඇති රාජ්‍ය මූල්‍ය ව්‍යාපෘති සහ වැඩසටහන් තිරසර සංවර්ධන ඉලක්ක සමග පෙළගැන්නුම් වෙන අයුරු තව දුරටත් විස්තර කෙරේ. රූප සටහන 3.2 පෙන්වන ආකාරයට, පූර්ණ වශයෙන් පෙළගැන්වෙන ජලය සහ සනීපාරක්ෂාව තිරසර සංවර්ධන ඉලක්කය 6 හැර, සියලුම අනෙක් තිරසර සංවර්ධන ඉලක්ක 80% කට වඩා අඩුවෙන් පෙළගැන්වී ඇත. තිරසර සංවර්ධන ඉලක්කය 1 (දිළිඳුබව), තිරසර සංවර්ධන ඉලක්කය 4 (අධ්‍යාපනය), තිරසර සංවර්ධන ඉලක්කය 7 (බලශක්තිය) සහ තිරසර සංවර්ධන ඉලක්කය 11 (තිරසර නගර) තුළ 60% - 80% ක් දක්වා පෙළගැන්නුමක් දැකිය හැකිය. 40% - 60% දක්වා පූර්ණ පෙළගැන්නුමක් සහිත ඉලක්ක (තිරසර සංවර්ධන ඉලක්ක 3,8,9,10 සහ 12) සඳහා තිරසර සංවර්ධන ඉලක්ක සමග වඩා වැඩි පෙළගැන්නුමක් අවශ්‍ය කෙරේ. පූර්ණ පෙළගැන්නුම 40% ට වඩා අඩු අනෙක් ඉලක්ක සම්බන්ධව මීළඟ රාජ්‍ය ආයෝජන වැඩසටහන තුළ වැඩි අවධානයක් යොමු කිරීම වැදගත් වේ. රූප සටහන 3.2 දෙස බලන විට පෙනී යන්නේ ශ්‍රී ලංකාව තුළ 2030 න්‍යාය පත්‍රය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය ආයෝජන වැඩසටහනෙහි ප්‍රතිපත්ති මූලාරම්භයේ සහ රාජ්‍ය මූල්‍ය සැලසුම් තුළ තිරසර සංවර්ධන ඉලක්ක සමග වන පෙළගන්වීම තවදුරටත් සංවර්ධනය කළ හැකි බවයි. කෙසේ වෙතත්, රූප සටහන 3.3 තුළ ඇති පූර්ණ සහ පාර්ශ්වික පෙළගැන්වීම්වල අධ්‍යයනය මගින් අනාවරණය වන්නේ සමස්තයක් ලෙස ගත් විට තිරසර සංවර්ධන ඉලක්ක 12ක් 80% ට වඩා වැඩි බවත් කිසිදු තිරසර සංවර්ධන ඉලක්කයක පෙළගැන්නුමක් 40% ට අඩු නොවන බවත් ය.

7 ශීඝ්‍ර අනුකලිත ඇගයීම යනු රටවල් තුළ තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම සඳහා වන සූදානම ඇගයීමට, රටේ සන්දර්භයට විවිධ තිරසර සංවර්ධන ඉලක්කවල අදාළත්වය තීරණය කිරීමට සහ ඉලක්ක අතර අන්තර් සම්බන්ධතා ඇතිකිරීමට සහය දක්වන මෙවලමකි.

3.3 **රූපය :** තිරසර සංවර්ධන ඉලක්ක **PIP** 2017-2020 සමග පූර්ණ පෙළගැන්වුම්

මූලාශ්‍රයː ශ්‍රී ලංකාව තුළ SDG ක්‍රියාත්මක කිරීමට සහය දක්වන MAPS එළඹුම, ශ්‍රී ලංකා රජය සහ ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද කණ්ඩායම, 2018 ජනවාරි

ශීඝ්‍ර අනුකලිත ඇගයීම තුළින් පහත තේමා පහ සම්බන්ධව රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020 තුළ වන ප්‍රතිපත්තිමය මූලාරම්භයන් සහ තිරසර සංවර්ධන ඉලක්ක අතර ඇති අසමාන පෙළගැන්නුම අනාවරණය කරයිː සමෘද්ධිය, ජනතාව, මිහිකත, සාමය සහ හවුල්කාරීත්වය. ඉහත ප්‍රතිඵල මත පදනම්ව, වැඩියෙන්ම පෙළගැන්වුම් වී ඇති තේමාව වන්නේ සමෘද්ධිය (95%) වන අතර ඉන්පසු ජනතාවයි (80%). මිහිකත තේමාව මධ්‍යම මට්ටමින්ද (58%) හවුල්කාරීත්වය සහ සාමය 50% කට වඩා අඩු පෙළගැන්නුමකින්ද සමන්විත වෙයි (වගුව 3.3 සහ රූප සටහන 3.4).

වගුව 3.3ː තිරසර සංවර්ධන සාධක සමග 2017-2020 රාජ්‍ය ආයෝජන වැඩසටහන පෙළගැන්නුම් වන ප්‍රතිශතය

	ඉලක්ක ගණන		%
	සලකා බලන ලද	පෙළගැන්නුම් කළ	පෙළගැන්නුම
ජනතාව	45	36	80
මිහිකත	43	25	58
සමෘද්ධිය	40	38	95
සාමය	12	5	42
හවුල්කාරීත්වය	13	5	38
	153	109	71

මූලාශ්‍රයː ශ්‍රී ලංකාව තුළ SDG ක්‍රියාත්මක කිරීමට සහය දක්වන MAPS එළඹුම, ශ්‍රී ලංකා රජය සහ ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද කණ්ඩායම, 2018 ජනවාරි

රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020 වෙත මාර්ගෝපදේශය ලබාදී ඇත්තේ වර්තමාන රජයේ සංවර්ධන ප්‍රමුඛතා සහ ප්‍රතිපත්ති වන බැවින් මෙය යම් තාක් දුරකට, ආර්ථිකයට (සමෘද්ධිය) සහ ග්‍රාමීය සංවර්ධනයට (සමෘද්ධිය) වැඩි ප්‍රමුඛතාවක් ලබාදීමේ වර්තමාන රජයේ ප්‍රතිපත්තීන් පැහැදිලි කරන අතර එහි සමාජ ආර්ථික දැක්ම සහ උපාය මාර්ගය පිළිබිඹු කරයි. වර්තමාන පොදු ප්‍රතිපත්ති පරිසරය අරමුණු කරන්නේ සෑම දෙනාටම සමාජමය ලෙස තරගකාරී වෙළෙඳපොළ සංකල්පයක් යටතේ ධනය ඉපයීමට, සමෘද්ධිමත් වීමට සහ ඉහළ ජීවන මට්ටමක් ලබාදීමට හැකිවන ලෙස ඉහළ මධ්‍යම ආදායම් තත්වයක් වෙත යන ශීඝ්‍ර ගමනක් තුළින් කඩිනම් ආර්ථික වර්ධනයක් අත්පත් කරගැනීමය.

3.4 රූපය : තිරසර සංවර්ධන ඉලක්ක ක්ෂේත්‍රයන් සහ රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020 අතර පෙළගැන්නුම



මූලාශ්‍රයඃ ශ්‍රී ලංකාව තුළ SDG ක්‍රියාත්මක කිරීමට සහය දක්වන MAPS එළඹුම, ශ්‍රී ලංකා රජය සහ ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද කණ්ඩායම, 2018 ජනවාරි

රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020 හි මූලික ක්ෂේත්‍ර තුළ, එනම් මානව සම්පත් සංවර්ධනය, කෘෂිකර්මය, කර්මාන්ත, ආයෝජනය, වෙළෙඳාම සහ සංචාරක ව්‍යාපාරය, යටි තල පහසුකම්, යහපාලනය, පාරිසරික කළමනාකරණය, සමාජ ආරක්ෂණය සහ ප්‍රාදේශීය සංවර්ධනය වැනි සමෘද්ධිමත්භාවය සහ ජනතාවට වඩා වැඩියෙන් අදාළ වන ක්ෂේත්‍රයන් තුළ වැඩි වශයෙන් පිළිබිඹු වේ. කෙසේ වෙතත්, 2030 වන විට තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී තේමාවන් තුලනය කිරීම වැදගත් වේ.

ආ) රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020 තිරසර සංවර්ධන ඉලක්ක සමග අනුරූපණය කිරීම

ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවද මීට සමාන විශ්ලේෂණයක් සිදු කරන නමුදු, එහිදී ජාතික ප්‍රතිපත්ති තිරසර සංවර්ධන ඉලක්ක සමග පෙළගැන්නුම් වීම අවබෝධ කරගැනීම සඳහා රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020 පදනම් ලේඛනය කරගනිමින් වෙනස් ක්‍රමවේදයක් භාවිතා කරනු ලබයි. වගුව 3.4 මගින් දක්වා ඇති පරිදි, රටේ තිරසර සංවර්ධන පැතිකඩ පිළිබඳව පුළුල් සමාලෝචනයක් ලබාගැනීම සඳහා රාජ්‍ය ආයෝජනයන්ගේ ප්‍රධාන ක්ෂේත්‍ර තිරසර සංවර්ධන ඉලක්ක මත අනුරූපණය කරන ලදී. වගුව 3.4 මගින් දක්වා ඇති පරිදි තිරසර සංවර්ධන ඉලක්ක 17 ම , අවම වශයෙන් රාජ්‍ය ආයෝජන වැඩසටහන තුළ එක් තේමාත්මක ක්ෂේත්‍රයක් හෝ ආවරණය කර ඇති අතර එමගින් රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020 තුළ තිරසර සංවර්ධන ඉලක්ක යහපත් අන්දමින් ආවරණය කර ඇති බව පෙනේ.

දෙවනුව, රාජ්‍ය ආයෝජන වැඩසටහන විසින් විවිධ වූ තිරසර සංවර්ධන ඉලක්ක ආවරණය කිරීම හඳුනාගැනීමට හා රාජ්‍ය ආයෝජන වැඩසටහනේ ප්‍රමුඛතා තිරසර සංවර්ධන ඉලක්ක සමග පෙළගැන්නුම් වෙන මට්ටම හඳුනාගැනීමට ඉහත තිරසර සංවර්ධන ඉලක්ක අනුරූපණය කිරීම තවදුරටත් පුළුල් කෙරිණි. මෙම විශ්ලේෂණය මත පදනම් වෙමින්, තිරසර සංවර්ධන ඉලක්කවලින් 35% ක් පූර්ණ වශයෙන් පෙළගැන්නුම් වී ඇති බවද ඉලක්කවලින් 53% ක් සාමාන්‍ය ලෙස (38%) හෝ මඳ වශයෙන් (15%) පෙළගැන්නුම් වී ඇති බවද හඳුනාගැණින (වගුව 3.5) තිරසර සංවර්ධන ඉලක්කවලින් 15% ක් රටේ සන්දර්භයට පෙළගැන්නුම් වී නොමැති බව හඳුනාගැණින.

වගුව 3.4: තිරසර සංවර්ධන ඉලක්ක රාජ්‍ය ආයෝජනයේ ප්‍රධාන ක්ෂේත්‍රවලට අනුරූපණය කිරීම

ඉලක්කය	තිරසර සංවර්ධන ඉලක්ක	රාජ්‍ය ආයෝජන වැඩසටහන තුළ අංශය/තේමාව
1	දිළිඳුබව නැති කිරීම	සියලුම ආර්ථික සහ සමාජ අංශ
2	කුසගින්න නැති කිරීම	කෘෂිකර්මය සහ සෞඛ්‍යය
3	යහපත් සෞඛ්‍යය සහ යහපැවැත්ම	සෞඛ්‍යය
4	ගුණාත්මක අධ්‍යාපනය	අධ්‍යාපනය
5	ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය	සමාජ ආරක්ෂණය
6	පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව	ජලය සහ සනීපාරක්ෂාව, වාරිමාර්ග
7	දැරිය හැකි සහ පිරිසිදු බලශක්තිය	විදුලිය සහ බලශක්තිය
8	වැදගත් රැකියා සහ ආර්ථික සංවර්ධනය	ශ්‍රමය සහ සියලුම ආර්ථික සහ සමාජ අංශ
9	කර්මාන්ත, නව්‍යකරණය සහ යටි තල පහසුකම්	කර්මාන්ත, ශ්‍රමය, තාක්ෂණය හා පර්යේෂණ සහ යටිතල පහසුකම්
10	අසමානතා අඩු වීම	ශ්‍රමය, සමාජ ආරක්ෂණය
11	තිරසර නගර සහ ප්‍රජාවන්	නාගරික සංවර්ධනය, නිවාස, සංස්කෘතිය, ආගම සහ ජාතික ඒකාබද්ධතාව, ප්‍රවාහනය, මාර්ග
12	වගකිවයුතු පරිභෝජනය සහ නිෂ්පාදනය	කෘෂිකර්මය, පරිසරය හා ආපදා කළමනාකරණය, සංචාරක ව්‍යාපාරය
13	කාලගුණ ක්‍රියාමාර්ග	පරිසරය හා ආපදා කළමනාකරණය
14	දිය යට ජීවය	පරිසරය හා ආපදා කළමනාකරණය, ධීවර
15	මිහිමත ජීවය	පරිසරය හා ආපදා කළමනාකරණය, වාරිමාර්ග
16	සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන	රාජ්‍ය කළමනාකරණය/පාලනය, තොරතුරු සන්නිවේදන තාක්ෂණය
17	ඉලක්ක සඳහා හවුල්කාරීත්ව	සියලුම ආර්ථික සහ සමාජ අංශ

මූලාශ්‍රය: ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව (NPD)

වගුව 3.5: තිරසර සංවර්ධන ඉලක්ක ජාතික සංවර්ධන න්‍යාය පත්‍රයට ඒකාබද්ධ වන මට්ටම



මූලාශ්‍රය: ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව (NPD)

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද මෙම විශ්ලේෂණයන් දෙක, තිරසර සංවර්ධන ඉලක්කයන් ක්‍රියාත්මක කිරීම පවතින සැලසුම් සහ උපාය මාර්ග තුළින් ඉදිරියට ගෙන යා හැකි ප්‍රමාණය පරීක්ෂා කිරීම සඳහා භාවිතා කළ හැකිය. කෙසේ වෙතත් විශ්ලේෂණයන් දෙකම සැලකිල්ලට ගෙන ඇත්තේ රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020 ලේඛනය වීම නිසා සීමාවන් ඇති වේ.

මේ ස්වභාවය පවතින පෙළගැන්නුම් විශ්ලේෂණයක් සඳහා එහි විෂය ක්ෂේත්‍රයේ පවතින විශාලත්වය මෙන්ම එමගින් අනාගතයේ වසර තුනක් සඳහා ප්‍රාග්ධන අයවැය ඇස්තමේන්තුව සැපයීම යන කරුණ හේතුවෙන් රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020 යහපත් ආරම්භයක් සපයයි. රාජ්‍ය ආයෝජන වැඩසටහන සැකසීම සාමාන්‍යයෙන් සෑම වසරකම අවසානයේ කාර්ය සාධනය සමාලෝචනය කරන පිරිවටන සැලසුම් එළඹුමක් භාවිතා කරමින් වාර්ෂික සිදු කරන අතර මධ්‍ය කාලීන දෘෂ්ටිකෝණය රඳවාගනිමින් සැලසුම් කාල සීමාව වසරකින් දීර්ඝ කෙරේ. මෙමගින්, මුල් ඉලක්ක වෙතින් ඉවතට නොගොස් සැලසුමට අවශ්‍ය ගැලපුම් සහ සංශෝධනයන් සිදු කිරීමටත් රාජ්‍ය ආයෝජන වැඩසටහන, ස්ථිතික ලේඛනයක් ලෙස නොව ගතික මෙවලමක් ලෙස භාවිතා කිරීමටත් ඉඩ සැලසේ.

තිරසර සංවර්ධන ඉලක්ක පෙළගැන්නුම සම්බන්ධ සාකල්‍ය දැක්මක් සඳහා අනෙකුත් සංවර්ධන සැලසුම් සහ ප්‍රතිපත්ති රාමු ඇතුළත් කිරීම අවශ්‍ය වේ. ඒවා බැහැර වීම හරහා සිදුකෙරෙන විශ්ලේෂණයන් තුළින් පෙළගැන්නුම අවතක්සේරු කිරීමක් සිදු විය හැකි අතර ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ තිරසර සංවර්ධන ඉලක්ක අනුගත කිරීම සම්බන්ධව වැරදි අර්ථ නිරූපණයක් ඇති විය හැකිය. උදාහරණයක් ලෙස, මිහිකත සහ සාමය යන් තේමාවන් හා සම්බන්ධ ජාතික ප්‍රතිපත්ති තිරසර සංවර්ධන ඉලක්කවලට අඩු පෙළගැන්නුමක් පෙන්නුම් කළද, රජයේ දීර්ඝකාලීන ප්‍රතිපත්ති සහිත 2025 දැක්ම තුළ " කෘෂිකර්මය සහ තිරස සංවර්ධනය" හා පාලනය සහ වගවීම" ඉහළ ප්‍රමුඛතා සහිත ක්ෂේත්‍ර ලෙස හඳුනාගෙන ඇත. එමෙන්ම, රජයේ කෙටි කාලීන සංවර්ධන සැලසුම, 2018 අයවැය නීල හරිත අයවැය ලෙස නම් කර ඇති අතර, මිහිකත තේමාවට සැලකියයුතු සම්බන්ධයක් අවධාරණය කර ඇත.

මීට අමතරව කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් සිදු කරන කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය; පෝෂණය සඳහා වන බහු ආංශික ක්‍රියාකාරී සැලසුම (MSAPN) සහ සාමය හා සංහිඳියාව දීර්ඝ කාලීනව පවත්වාගැනීම තහවුරු කිරීමට රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ උපක්‍රම ඇතුළුව අදාළ තිරසර සංවර්ධන ඉලක්ක සමග පෙළගැන්නුම් වෙන ආංශික සැලසුම් ගණනාවක්ද ඇත.

ආර්ථික, සමාජ සහ පාරිසරික මානයන් ඒකාබද්ධ කිරීම

තිරසර සංවර්ධන ඉලක්කයන් ක්‍රියාත්මක කිරීමට පදනම් වන්නේ ආර්ථික සංවර්ධනය, සමාජ අන්තර්කරණය සහ පාරිසරික තිරසර බව යන ප්‍රධාන මානයන් හරහා යන අරමුණු වෙත යොමු වූ කැපවීමයි. එබැවින්, රටේ ප්‍රතිපත්ති රාමුව තුළට මෙම ප්‍රධාන තිරසර මානයන් ඒකාබද්ධ වීම පරීක්ෂා කිරීම වැදගත් ය. මේ සන්දර්භය තුළ, ආර්ථික සංවර්ධනය, සමාජ අන්තර්කරණය හා පාරිසරික තිරසරභාවය සහ යහපාලනය යන සාධක තුන වෙත අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කරන ප්‍රතිපත්තිමය මූලාරම්භයන් ඉදිරිපත් කරයි.

2017-8 කාලය තුළ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය ඇමෙරිකානු ඩොලර් 4,066 ක් සමග ශ්‍රී ලංකාව ඉහළ මධ්‍යම ආදායම් තත්වයට ළඟා වෙමින් සිටී. කෙසේ වෙතත්, ඉහළ ආදායම් ලබන රටක් ඒක පුද්ගල දළ ජාතික ආදායම ඇඩො 12,235 ක ඉහළ ආදායමක් ලබන අතර එය ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල දළ ජාතික ආදායමට (ඇඩො 3,956) වඩා තුන් ගුණයක් වැඩිය.9 මෙමගින් පිළිබිඹු කරන්නේ කඩිනම් ආර්ථික සංවර්ධනයක් තුළින් පරතරයන් පියවීම අවශ්‍ය වන බවයි. ඉහළ ආදායම් ලබන රටවල්වල වේගය සමග සමපාත වීමට කටයුතු කිරීම් සඳහා ශ්‍රී ලංකාව විසින් ඉහළ තාක්ෂණික විසඳුම් ප්‍රවර්ධනය හරහා ඵලදායීතාව වැඩි කිරීම, වටිනාකම් එක් කළ ආර්ථික කටයුතු සඳහා තෝරාගත් පරිදි සම්පත් යෙදවීම, අගය දාමයන් ප්‍රවර්ධනය යනාදී ප්‍රතිපත්ති පෙරමුණු තුළ සහෝපකාරී ප්‍රතිසංස්කරණ සිදු කළ යුතු අතර ආර්ථික සංවර්ධනය පවත්වාගැනීම සඳහා එහි සම්පත් පදනම අඛණ්ඩව පුළුල් කිරීම සහ නවීකරණය කළ යුතුය.

2025 දැක්ම -පොහොසත් රටක්, රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020 සහ 2018 අයවැය තුළ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකාවේ වර්තමාන උපායමාර්ගික සංවර්ධන රාමුව, තිරසර සංවර්ධනයේ ප්‍රධාන මානයන් වන ආර්ථික, සමාජ සහ පාරිසරික මානයන් සමග ප්‍රමාණවත් ලෙස ඒකාබද්ධ වී ඇත. රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017 -2020 සකස් කර ඇත්තේ "පංච විධ සැලැස්මඃ මාස 60 කින් නව රටක්", යන සමස්ත සංවර්ධන දැක්ම මත පදනම්ව වන අතර, එහි,ආර්ථිකය ශක්තිමත් කිරීම, ආයෝජන ප්‍රවර්ධනය සහ යටි තල පහසුකම් සංවර්ධනය රට ශීඝ්‍රයෙන් ඉහළ මධ්‍යම ආර්ථික තත්වයකට ගෙන ඒම සඳහා වන ප්‍රධාන මාවත් ලෙස සඳහන් වේ. මෙය සංවර්ධන රාමුව තුළ ආර්ථික මානයන් ඒකාබද්ධ සහ අනුකලනය කිරීම අවධාරණය කරයි. රාජ්‍ය ආයෝජන වැඩසටහන ඉස්මතු කරන පරිදි රජයේ සමස්ත ප්‍රතිපත්තිය තුළ ජනතාවගේ ජීවන තත්වයන් වැඩි දියුණු කිරීමට සහ රටේ සංවර්ධනයට දායක වන ලෙස ඔවුන්ව බලගැන්වීමට සමාජයේ සියලුම අත්‍යවශයයික අංශයන් සඳහා නිශ්චිත සමාජ ආරක්ෂණ ක්‍රමයන් ක්‍රියාත්මක කිරීම රජයේ සමස්ත ප්‍රතිපත්තියට අයත් වෙයි; මෙය සමාජ මානයන් ඒකාබද්ධ කිරීම ඉස්මතු කරයි. පාරිසරික මානයන් ඒකාබද්ධ කිරීම සම්බන්ධව ගත් විට, තිරසර සංවර්ධනය වෙත ගමන් කරන පරිසරයේ ගුණාත්මක බව තහවුරු කරන අතර අවශ්‍ය ආයෝජනයන් තුළින් ආර්ථික වර්ධනය සඳහා පහසුකම් සැපයීම පිණිස රාජ්‍ය ආයෝජන වැඩසටහන ප්‍රධාන ප්‍රමුඛතාවය සහිත ක්ෂේත්‍රයක් ලෙස පාරිසරික කළමනාකරණය හඳුනාගනී

8 CBSL (2018). වාර්ෂික වාර්තාව,2017 ශ්‍රී ලංකා මහ බැංකුව

9ලෝක බැංකුවේ රටවල් සහ ණයදෙන කණ්ඩායම් වර්ගීකරණය

2025 දැක්ම තුළ දක්වා ඇති රජයේ දැක්ම වන්නේ 2025 වන විට රට ඉන්දීය සාගරයේ දැනුම මත පදනම්වූ, ඉහළ තරගකාරීත්වයකින් හෙබි, සමාජ වෙළෙඳපොළ ආර්ථිකයක් හිමි මධ්‍යස්ථානයක් බවට පත් කිරීමෙන් රට පොහොසත් රටක් බවට පත් කිරීමටයි. මේ අනුව 2025 දැක්ම ආර්ථික මානය සහ සමාජ මානය (සමාජ ආරක්ෂණය) සඳහ ඉහළ ප්‍රමුඛතාවක් ලබාදී තිබුණද,එය පාරිසරික මානය ඒකාබද්ධ කර ඇත්තේ කෘෂිකර්මය සහ තිරසර සංවර්ධනය යන ප්‍රධාන ක්ෂේත්‍ර සමගයි. 2018 අයවැය මෙම මානයන් තුනම සමාන ලෙස ඒකාබද්ධ කර ඇති අතර පාරිසරික මානය සඳහා වැඩි අවධානයක් ලබාදී ඇත. මුදල් අමාත්‍යවරයා පැහැදිලි කළ පරිදි

2018 අයවැය ඉදිරිපත් කරන විට, එය "නීල" පැහැ වන්නේ මුද්‍රයට සම්බන්ධ කටයුතුවල පූර්ණ ආර්ථික විභව්‍යතාවය සමස්ත වර්ධන උපායමාර්ගය සමඟ ඒකාබද්ධ කිරීමට රජය සැලසුම් කරන බැවිනි. එය "හරිත" පැහැ වන්නේ රජය රටේ ආර්ථිකය ගොඩනැගීමට අපේක්ෂා කරන්නේ පාරිසරිකව තිරසර සංවර්ධන උපායමාර්ගයක් මත පදනම්ව වන බැවිනි.

හරිත ආර්ථිකයේ ප්‍රධාන ලක්ෂණය වන්නේ තිරසර සංවර්ධනයේ සමාජ, පාරිසරික සහ ආර්ථික මානයන් තුලිත කරන අඩු කාබන් සහිත, සම්පත් කාර්යක්ෂම සහ සමාජමය ලෙස ඇතුළත් වන වර්ධනයයි. හරිත ආර්ථිකයක් තුළ ආදායමේ සහ රැකියාවල වර්ධනය සම්පත් සීමාවන් සහ කාලගුණ විපර්යාස ප්‍රමාණවත් පරිදි විසඳනු ලබයි; එය පදනම් වන්නේ හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම, වඩා පිරිසිදු බලශක්ති සහ සම්පත් කාර්යක්ෂමතාව සහ තිරසර හා සියල්ල ඇතුළත්වන ජීවනෝපායන්ට සහය සලසන සුවපත් පරිසර පද්ධතියක් සඳහා ආයෝජනයන් සිදු කිරීම මතයි. නීල ආර්ථික සංකල්පය, විශාල ආර්ථික, සමාජ සහ පාරිසරික ඒකාබද්ධතා අගයක් සහිත සමුද්‍ර සහ වෙරළබඩ පරිසර පද්ධතීන් තිරසර සංවර්ධනයේ අත්‍යවශ්‍ය අංගයක් බව හඳුනාගනිමින් හරිත ආර්ථික රාමුව සම්පූර්ණ කර එයට ඌනපූරණයන් සපයයි

වගුව 3.6: තිරසර සංවර්ධනයේ ප්‍රධාන ක්ෂේත්‍රයන් සඳහා යෝජිත ක්‍රියාමාර්ග

<table>
<tr><th>ආර්ථිකමය තිරසර බව</th><th>සමාජමය තිරසර බව</th><th>පරිසරමය තිරසර බව</th></tr>
<tr>
<td>කෘෂිකර්මය
• පශ්චාත් අස්වනු අහිමිවීම අඩු කිරීම
• තරගකාරීත්වය නඩත්තු කිරීම
• ඵලදායිතාව වැඩි දියුණු කිරීම
කර්මාන්ත
• පොකුරු පදනම් කාර්මික කලාප ස්ථාපිත කිරීම
• කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම
• පර්යේෂණ සහ සංවර්ධන
• රාජ්‍ය පුද්ගලික හවුල්කාරීත්වය
සේවා
▪ ප්‍රවාහන අංශය සංවර්ධනය කිරීම
▪ මූල්‍ය සේවා වැඩි දියුණු කිරීම
▪ සංවර්ධනය සඳහා තිරසර සංචාරක කර්මාන්තය</td>
<td>• ශ්‍රම බලකායේ කාන්තා සහභාගීත්වය
• ආබාධිත පුද්ගලයන්ට ශ්‍රම බලකාය වෙත වැඩි ප්‍රවේශ්‍යතාවය
• කාර්යක්ෂම නාගරීකරණයට සහය දීමට මූල්‍ය ක්‍රමය සංවර්ධනය කිරීම</td>
<td>• අපද්‍රව්‍ය කළමනාකරණය
• කාබන් විමෝචනය පාලනය කිරීම
• ජල කළමනාකරණ ක්‍රමය
• ආපදා කළමනාකරණ සහ වැඩි භෞතික සහ මූල්‍ය ප්‍රත්‍යස්ථිතිය
• දර්ශක පදනම් රක්ෂණය
• කාබනික කෘෂිකර්මය ප්‍රවර්ධනය</td>
</tr>
</table>

මූලාශ්‍රය: ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව (NPD)

3.3

ආයතනික යාන්ත්‍රණය

මෙම අංශය තුළින් 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා රටේ ආයතනික රාමුව සකසා ගෙන ඇති ආකාරය පිළිබඳව සාකච්ඡා කෙරේ. මෙයට පවතින ආයතනික යාන්ත්‍රණය සහ 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට පවතින ව්‍යුහයන් සම්බන්ධ කරගැනීමට පහසුකම් සපයන 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත පිළිබඳ සමාලෝචනයක්ද ඇතුළත් වේ. මෙයට පසු මෙම ආයතනික යාන්ත්‍රණයන් තිරසර සංවර්ධන ඉලක්ක සඳහා මූලායයනය කිරීම සඳහා මෙන්ම අදාළ අධීක්ෂණ සහ ඇගයීම් අරමුණු සඳහා භාවිතා කළ හැකි ආකාරයන් පිළිබඳව සමාලෝචනයක් ඇතුළත් වේ.

පවතින ආයතනික යාන්ත්‍රණයේ ව්‍යුහය

ශ්‍රී ලංකාවේ පාලන යාන්ත්‍රණය ආයතන ස්ථර තුනකින් සමන්විත වෙයි, ඒවානම්; ජාතික රජයේ ආයතන, පළාත් පාලන ආයතන සහ ප්‍රාදේශීය පාලන ආයතන වශයෙනි. ජාතික රජයේ ආයතන අමාත්‍යාංශවල සිට ග්‍රාම නිලධාරිවරු දක්වා වන සංවිධානමය ධූරාවලියක් නියෝජනය කරයි. ධූරාවලියේ ඉහළම සිටින්නේ පුළුල් ජාතික මාතෘකා සම්බන්ධව ප්‍රතිපත්ති තීරණ ගනු ලබන රේඛීය අමාත්‍යාංශයන් ය. එක් එක් අමාත්‍යාංශය යටතට රේඛීය නියෝජිතායතන ගණනාවක් පවතින අතර ඒවා අමාත්‍යාංශයේ විෂයපථයට ගැනෙන විශේෂිත ක්ෂේත්‍රයන් සම්බන්ධව කටයුතු කරයි. අමාත්‍යාංශයක් තුළ ඇති රේඛීය ආයතනවලට රජයේ දෙපාර්තමේන්තු සහ සංස්ථාපිත මණ්ඩල සහ සංස්ථා වැනි රජයට හිමි ව්‍යාපාර සහ රජයට හිමි සමාගම් අයත් වේ.

අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවලට වෙන් කරන වියදම් සෘජුවම පාලනය කරනු ලබන්නේ භාණ්ඩාගාරය විසින් වන අතර රජයට හිමි ව්‍යවසායන්ට තම මූල්‍ය කටයුතු හැසිරවීම සම්බන්ධව යම් ස්වාධීනත්වයක් ඇත. මධ්‍යම රජයට විවිධ රේඛීය ආයතනවල කලාපීය/ප්‍රාදේශීය ශාඛා හරහා ප්‍රාදේශීය නියෝජනයන් ඇති අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ ග්‍රාම නිල්ධාරී අංශ සහිත ඒකරූපී දිස්ත්‍රික් පරිපාලන ක්‍රමයක් ඇත. මෙම අස්ථිත්වයන් යටතේ පවතින මධ්‍යම රජයේ අමාත්‍යාංශ සහ රේඛීය නියෝජිතායතන එක්ව පුළුල් විෂය ක්ෂේත්‍රයක් ආවරණය කරන අතර ඒවාට ප්‍රතිපත්ති සම්බන්ධව තීරණ ගැනීමේ සිට ගම් මට්ටමින් සේවාව ලබාදීම දක්වා වන තිරසර සංවර්ධන ඉලක්ක සියල්ලම පාහේ ආමන්ත්‍රණය කළ හැකිය. ආයතනවල විෂය බද්ධ ධූරාවලියට අමතරව, රේඛීය අමාත්‍යාංශයට වාර්තා නොකරන විශේෂ වැය ඒකක 22 ක් ද ඇත. ඒවාට අයත් වන්නේ ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, සභා නායක කාර්යාලය, විපක්ෂ නායක කාර්යාලය, ශේෂ්ඨාධිකරණය සහ පාර්ලිමේන්තුවට සෘජුවම වාර්තා කරන විවිධ කොමිෂන් සභා සහ දෙපාර්තමේන්තුය (උදා. විගණකාධිපති දෙපාර්තමේට්න්හුව, මැතිවරණ දෙපාර්තමේන්තුව).

මධ්‍යම රජයට පහතින් ඇත්තේ පළාත් සභා සහ පළාත් පාලන ආයතනයි (මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා) ඒවා පාලනය කරන්නේ මහජනතාව විසින් ප්‍රාදේශීයව තෝරා ගන්නා පුද්ගලයන් විසිනි. මෙම ප්‍රාදේශීය ආයතන, 1987 පළාත් සභා පනත සහ පළාත් පාලන පනත් තුනක් යටතේ පැවරූ බලය යටතේ අදාළ ඒකකවල නිශ්චිත භූගෝලීය සීමාවන් තුළ විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධව කටයුතු කරයි. මූල්‍ය කොමිෂන් සභාව සහ පළාත් පාලන හා ප්‍රාදේශීය පාලන අමාත්‍යාංශය තුළින් උප ජාතික නියෝජිතායතනවලට මුදල් වෙන් කිරීමට විශේෂ විධි විධාන සකසා ඇත. වගුව 3.7 රාජ්‍ය සංවිධානවල ආකාරයන් පිළිබඳ සාරාංශයක් සපයයි.

වගුව 3.7: රාජ්‍ය සංවිධාන ආකාරයන්

සංවිධාන ආකාරය	ඒකක ගණන
අමාත්‍යාංශ	43
දෙපාර්තමේන්තු	121
රජයට හිමි ව්‍යාපාර	272
විශේෂ වැය ඒකක	22
පළාත් සභා	9
ප්‍රාදේශීය ආයතන (මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා) සංවිධාන ආකාරය	335

මූලාශ්‍රය කළමනාකරණ සේවා අමාත්‍යාංශය

තිරසර සංවර්ධන ඉලක්ක මුඛ්‍යධාරාගත කිරීම

සමස්තයක් ලෙස ගත්විට ශ්‍රී ලංකා රජයට, ජාතික මට්ටමේ සිට බිම් මට්ටම දක්වා විෂය ගණනාවක් ආවරණය කරන ආරක්ෂිත රාජ්‍ය ආයතන පද්ධතියක් ඇත. පවතින රාජ්‍ය ආයතන ක්‍රමයේ ආවරණය සහ ශක්තිය හඳුනාගනිමින්, තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම සඳහා ඒවා ආයතනික සැලසුම්වලට මුඛ්‍යධාරා ගත කොට එම ආයතනික යාන්ත්‍රණයම භාවිතා කිරීමට ශ්‍රී ලංකා රජය තීරණය කර ඇත. තිරසර සංවර්ධන, වන ජීවී සහ කලාපීය සංවර්ධනය පිළිබඳ අමාත්‍යාංශය, තිරසර සංවර්ධන ඉලක්ක ඔවුන්ගේ ආයතනික උපාය මාර්ග සැලසුම්වලට මුඛ්‍යධාරාගත කිරීමට රාජ්‍ය ආයතනවලට සහය ලබාදෙයි.

තිරසර සංවර්ධන පනත

2017 ඔක්තෝබර් මසදී බලාත්මක කෙරුණු 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත, තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම සඳහා තිරසර සංවර්ධන සභාව මධ්‍යගත සම්බන්ධීකරණ භූමිකාවක් දරන මුඛ්‍යධාරාගත කිරීමේ ප්‍රතිපත්තිය අදාළ කරගනිමින්, පවතින රාජ්‍ය ආයතන භාවිතා කරමින් නෛතික රාමුවක් සපයයි. තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම සඳහා වන ජාතික සම්බන්ධීකරණ ආයතනයක් ලෙස තිරසර සංවර්ධන සභාවක් පිහිටුවීමට එය යෝජනා කරයි. තිරසර සංවර්ධන විෂය භාර අමාත්‍යවරයාට වාර්තා කරන තිරසර සංවර්ධන සභාව, ජනාධිපතිවරයා විසින් පත් කරන සාමාජිකයින් 12 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් සිවුදෙනෙක් නිල බලයෙන් පත්වන අතර පළාත් සභා නියෝජනය කිරීමට තුන් දෙනෙකු ඇතුළුව අට දෙනෙකු පත් කරනු ලැබේ. තිරසර සංවර්ධන සභාවට පනට මගින් පැවරූ කාර්යයන් සිදු කිරීමට සහය ලබාදීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් (සංවිධානයේ ප්‍රධාන විධායක නිලධාරි) වරයෙකුගේ නායකත්වයෙන් යුතු නිත්‍ය කාර්ය මණ්ඩලයක් ඇත. ශ්‍රී ලංකාව මේ මොහොතේ තිරසර සංවර්ධන සභාව පිහිටුවීමේ ක්‍රියාවලියේ නියැලෙන අතර 2018 අප්‍රේල් මසදී සභාවට සාමාජිකයින් පත් කරන ලදී.

ආයතනික යාන්ත්‍රණය

තිරසර සංවර්ධන පනත යටතේ ස්ථාපනය කෙරෙන ආයතනික යාන්ත්‍රණය පහත පරිදි සාරාංශගත කළ හැකිය.

- තිරසර සංවර්ධන සභාව විසින් තිරසර සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සහ උපාය මාර්ගය සකසනු ලබන අතර එය අනුමැතිය පිණිස අමාත්‍ය මණ්ඩලයට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරෙනු ඇත.

- පාර්ලිමේන්තුව මගින් අනුමත කිරීමෙන් පසුව තිරසර සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සහ උපාය මාර්ගය ක්‍රියාත්මක වෙනු ඇත. ඉන්පසු ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන සියලුම තිරසර සංවර්ධනය හා සම්බන්ධ කටයුතු සඳහා නෛතිකව බලගැන්වූ රාමුවක් සපයමින් මාර්ගෝපදේශය සකසනු ඇත.

- නව සංවර්ධන ව්‍යාපෘති සඳහා තිරසර සංවර්ධන මාර්ගෝපදේශ සපයන අතරම සභාව විසින් තිරසර සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සහ උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සැපයීම, යාන්ත්‍රණය අධීක්ෂණය කිරීම සහ ප්‍රගති සමාලෝචන ක්‍රියාවලීන් සඳහා සම්බන්ධ වීම යනාදියද සිදු කරනු ඇත.

- පාර්ලිමේන්තුව තුළ තිරසර සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සහ උපාය මාර්ගය සම්මත වූ පසුව, සියලුම විෂය භාර අමාත්‍යාංශ, රේඛීය නියෝජිතායතන සහ උප ජාතික අස්ථිත්වයන් විසින් තම විෂය ක්ෂේත්‍රය තුළ තිරසර සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සහ උපාය මාර්ගයට අදාළ තිරසර සංවර්ධන උපාය මාර්ගී සැකසිය යුතුය. මෙය සිදු කිරීමට අපේක්ෂා කරන්නේ තිරසර සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සහ උපාය මාර්ගය

පාර්ලිමේන්තුව තුළ සම්මත වී වර්ෂයක් ඇතුළතදීය.

- තිරසර සංවර්ධන උපාය මාර්ග සැකසූ සියලු රාජ්‍ය ආයතන තම විෂය ක්ෂේත්‍රය තුළ තිරසර සංවර්ධන උපායමාර්ගය ක්‍රියාත්මක කළ යුතුය. ඔවුන් පහත බැඳීම් සම්පූර්ණ කළ යුතුව ඇත.

- තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය විසින් නිශ්චය කරන කාල සීමාව තුළ තිරසර සංවර්ධන උපාය මාර්ගය පිළිබඳ ප්‍රගති වාර්තා ඉදිරිපත් කළ යුතුය.

- පාරිසරික සහ සමාජ ආරක්ෂාව සහතික කිරීම පිණිස නව සංවර්ධන ව්‍යාපෘති සඳහා පාරිසරික සහ සමාජ විගණනයන් සිදු කිරීම

- වාර්ෂික වාර්තාවල, තම සියලු කටයුතුවලදී තිරසර සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සමග අනුකූල වන බවට ප්‍රකාශයක් ඇතුළත් කිරීම

ඉහත සඳහන් කළ විධිවිධානයන් සමග, ජාතික සහ උප ජාතික මට්ටම්වල පවතින රාජ්‍ය ආයතන ධූරාවලිය තුළින් ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම සඳහා හොඳින් සැලසුම් කළ ආයතනික යාන්ත්‍රණයක් සැකසේ.

තිරසර සංවර්ධන ඉලක්ක සඳහා මූල්‍යයනය කිරීම

මුඛ්‍ය ධාරාගත කිරීමේ එළඹුම පවතින රාජ්‍ය මූල්‍යයනය (අයවැය) භාවිතා කිරීමේ සහ තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම සඳහා වන අධීක්ෂණ සහ ඇගයීම් පටිපාටීන් භාවිතා කිරීමේ වාසිය ලබාදෙයි. ශ්‍රී ලංකාවට, අයවැය සැලසුම්කරණය, පාර්ලිමේන්තු අනුමැතිය, ක්‍රියාත්මක කිරීම සහ වගවීම යන පියවර සතර ඇතුළත් හොඳින් ස්ථාපිත වූ අයවැය ක්‍රියාවලියක් ඇත. අයවැය සැලසුම්කරණ පියවරේ සිට විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිග්‍රාහක ගිණුම් විගණනය කිරීම දක්වා සෑම පියවරක්ම මුදල් අමාත්‍යාංශය සහ ප්‍රතිග්‍රාහක නියෝජිතායතන අතර සමීප සම්බන්ධතාවක් ඇතිව සිදු කෙරේ. ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව (ERD), ජාතික අයවැය දෙපාර්තමේන්තුව,

ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව (ERD), ජාතික අයවැය දෙපාර්තමේන්තුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වැනි භාණ්ඩාගාරයේ දෙපාර්තමේන්තු ගණනාවක් භාණ්ඩාගාර චක්‍රයට සම්බන්ධ වේ.

සියලුම භාණ්ඩාගාර මෙහෙයුම් කටයුතු සිදු කෙරෙන්නේ ලිත් වර්ෂයක කාල රාමුවක් තුළයි. අයවැය මූල්‍යයන මූලාශ්‍රයන් වන්නේ රජයේ බදු හා බදු නොවන ආදායම් මෙන්ම දේශීය සහ විදේශීය ණය වේ. මෙම ක්‍රියාවලියට රාජ්‍ය නියෝජිතායතන (රේඛීය අමාත්‍යාංශ සහ රේඛීය නියෝජිතායතන) දිස්ත්‍රික් පරිපාලන ඒකක (දිස්ත්‍රික්ක, කොට්ඨාස) සඳහා පුනරාවර්තන සහ ප්‍රාග්ධන අරමුදල් වෙන් කිරීම මෙන්ම අදාළ රේඛීය අමාත්‍යාංශ සහ මුදල් කොමිෂන් සභාවේ මැදිහත්වීමෙන් උප-ජාතික රාජ්‍ය ඒකක (පළාත් සභා, පළාත් පාලන ආයතන) වෙත අතිරේක මුදල් සැපයීමේ ක්‍රියා පටිපාටීන් යනාදිය ඇතුළත් වේ. තිරසර සංවර්ධන සභාවේ සම්බන්ධීකරණය සහිතව සිදු කෙරෙන මුඛ්‍යධාරාගත කිරීමේ එළඹුම මගින් තිරසර සංවර්ධන ඉලක්ක ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමේ ලා මෙම ස්ථාවර සහ පවතින රාජ්‍ය මූල්‍යයන ක්‍රියාවලිය භාවිතා කිරීමේ අවස්ථාව ලබාදෙයි මුදල් අමාත්‍යාංශය විසින් මධ්‍ය කාලීන අයවැය රාමුව තුළ අමාත්‍යාංශ වාර්ෂික අයවැය මූල්‍යයනය කිරීමට සූදානම් කරන ලෙසට රේඛිය අමාත්‍යාංශ වෙත චක්‍රලේඛයක් නිකුත් කර ඇත. තම අමාත්‍යාංශවලට අදාළ වන තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරන ලෙසට රේඛීය අමාත්‍යාංශ වෙත උපදෙස් ලැබී ඇත.ˆනීල - හරිත˜ තේමාව යටතේ 2018 ජාතික අයවැය ඉදිරිපත් කිරීම පෙන්නුම් කරන්නේ තිරසර සංවර්ධනය සාක්ෂාත් කරගැනීමට රජයේ ඇති කැපවීමයි.

අධීක්ෂණය සහ ඇගයීම

ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව, අදාළ ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් සහ රේඛීය අමාත්‍යාංශ හරහා සියලුම සංවර්ධන ව්‍යාපෘති වෙතින් නිත්‍ය යාවත්කිරීම් ලබාගැනීමට නිසි අධීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කර ඇත. මාර්ගගත වාර්තාකරණය සහ සමාලෝචනය සඳහා පහසුකම් සැපයීමේ ලා වෙබ් පදනම් අධීක්ෂණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කරමින් ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ මෙම ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට සැලසුම් සකස් කෙරී ඇත.

මීට අමතරව, ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාව සඳහා ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය සකසමින් ඇගයීම මුඛ්‍යධාරාගත කිරීමට පියවර ගෙන ඇති අතර එය බොහෝ කාලයක් අවශ්‍යව පැවති ප්‍රතිපත්තිමය මූලාරම්භයකි. වර්තමානයේදී, ජාතික ඇගයීමේ ප්‍රතිපත්තියේ අවසන් කෙටුම්පත පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසීමේ පුළුල් ක්‍රියාවලියක් තුළින් සම්පූර්ණ කර ඇති අතර, ඒ සම්බන්ධ මහජන අදහස් ලබාගැනීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය (යඑඑචඃ//අඅඅ.චපප.ටැඩ.කන) තුළ සහ පුවත්පත්වල භාෂා ත්‍රිත්වයෙන්ම පල කර ඇත. ජාතික ඇගයීමේ ප්‍රතිපත්තිය 2019 සිට ක්‍රියාත්මක වෙනු ඇත. ජාතික ඇගයීමේ ප්‍රතිපත්තිය, සංවර්ධන ව්‍යාපෘතිවල සහ වැඩසටහන්වල ප්‍රතිඵලයන් ග්‍රහණය කර සහ තිරසර සංවර්ධන ඉලක්ක න්‍යාය පත්‍රයට අනුකූලව අනාගත සැලසුම් සංවර්ධනය සඳහා වන පාඩම් ලබාදෙන අවුරුදු තුනක පිරිවටන සැලසුමක් ලෙස සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරයි.

ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කළ හැකි අධීක්ෂණ සහ ඇගයීම් පටිපාටීන් ශක්තිමත් කිරීමට ගෙන ඇති පියවරයන්ට අමතරව ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව සහ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් පහත ක්‍රියාමාර්ගයන්ද ගෙන ඇත.

- ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව සියලුම රාජ්‍ය ආයතන වෙතින් තමන්ට අදාළ විෂය ක්ෂේත්‍රයන් තුළ තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගන්නා ලෙසට ඉල්ලීමක් කර ඇත.
- ශ්‍රී ලංකා විගණකාධිපති දෙපාර්තමේන්තුව, සියලුම රජයේ ආයතන තිරසර සංවර්ධන ඉලක්ක සමග සම්බන්ධ වන ආකාරය විමසන ප්‍රශ්නාවලියක් යවා තිරසර සංවර්ධන ඉලක්ක රජයේ විගණන ක්‍රියාවලිය යටතට ගෙන ඒමට මූලික පියවරක් තබා ඇත.
- අදාළ තිරසර සංවර්ධන ඉලක්ක යටතේ මුදල් කොමිෂන් සභාව තුළින් වෙන් කරන ලද මධ්‍යම රජයේ මුදල් භාවිතා කරමින් පළාත් සභා විසින් සිදු කරන සංවර්ධන ක්‍රියාකාරකම් වාර්තා කිරීම සඳහා මුදල් කොමිෂන් සභාව ව්‍යුහාත්මක රාමුවක් සංවර්ධනය කර ඇත

3.4

කිසිවෙකු මඟ නොහැරීම

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යායපත්‍රය තුළ ප්‍රධානතම කරුණ වන්නේ සියලු දෙනා බලගැන්වෙන සහ කිසිවෙකු මග නොහැරෙන සියලු දෙනා ඇතුළත් කරගැනීමයි. කිසිවෙකු මග නොහැරීම යන මූලධර්මය තිරසර සංවර්ධන ඉලක්කවල මධ්‍යය වන අතර එනිසාම තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා සියලු දෙනා ඇතුළත් වන විධි නියෝගයක් සකසා ගත යුතු වන්නේය. මේ සඳහා ශ්‍රී ලංකා රජය විසින් සැලකිය යුතු ක්‍රියාමාර්ග රැසක් - අණපනත්, ප්‍රතිපත්ති සහ වැඩසටහන්- ගෙන ඇත

සියලු දෙනා ඇතුළත් කරගැනීම සඳහා වන මෙරට පදනම, සියලු පුරවැසියන්ට මූලික අයිතිවාසිකම් එනම්; සිතීමේ, විඥානයේ සහ ආගම ඇදහීමේ නිදහස, වධ බන්ධන නොමැතිව සිටීමේ අයිතිය, සමානාත්මතාව සඳහා ඇති අයිතිය, අභිමතානුසාරී ලෙස අත් අඩංගුවට පත් නොවී සිටීමේ, රඳවා තබා නොගැනීමේ සහ දඬුවම් නොලැබ සිටීමේ නිදහස, අතීතයට බලපාන දණ්ඩන නීති තහනම් කිරීම; භාෂණයේ, රැස්වීමේ, සමාගමයේ යෙදීමේ, රැකියාවේ සහ සංචරණය යෙදීමේ නිදහස ලබාදෙන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාව තුළ දැකිය හැකිය.

රටේ දීර්ඝ කාලයක් තිස්සේ පවතින සුබසාධන ප්‍රතිපත්ති සහ වැඩසටහන් මගින් කිසිවෙකු මග නොහැර සිටීම තහවුරු කරනු ලබයි. මෙයට රටේ සෞඛ්‍ය ක්‍රමය, අධ්‍යාපන ක්‍රමය සහ සමාජ ආරක්ෂණ වැඩසටහන් ඇතුළත් වේ.

අධ්‍යාපනයඃ

නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලැබුවේ (1945 සිට) ප්‍රාථමික මට්ටමේ සිට තෘතියික අධ්‍යාපනය දක්වා මුදල් නොගෙවා ගනු ලබන අධ්‍යාපනය වෙත වන ප්‍රවේශය වෙතින් කිසිදු දරුවෙකු මග නොහරින පරිද්දෙනි. එමෙන්ම අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ගේ අධ්‍යාපන අවස්ථා වැඩි කිරීම සඳහා වෙනත් වැඩසටහන් ගණනාවක්ද හඳුන්වා දී ඇතඃ රජයේ පාසල්වල 1-11 ශ්‍රේණිය දක්වා ශිෂ්‍යයන්ට නොමිලේ පෙළපොත් ලබාදීම; රජයේ පාසල්වල ශිෂ්‍යයන්ට නොමිලේ පාසල් ඇඳුම් ලබාදීම, උසස් අධ්‍යාපන මට්ටමේ ශිෂ්‍යයන් ඇතුළු සියලුම සිසුවන්ට සහනදායී පොදු ප්‍රවාහන සේවා සැපයීම; අඩු ආදායම් පසුබිම්වලින් එන ශිෂ්‍යයන්ට ශිෂ්‍යත්ව ලබාදෙන ශිෂ්‍යත්ව විභාග ක්‍රමය හඳුන්වා දීම; සහ තෝරාගත් පාසල්වල 1-5 ශ්‍රේණියේ දරුවන්ට දිවා ආහාරය ලබාදීම.

අධ්‍යාපන නිමැවුම්වල ප්‍රාදේශීය විෂමතාවන් විසඳීම සඳහා ගන්නා ලද වැදගත් පියවරක් වූයේ (අඩු අසමානතාවයන් පිළිබඳ තිරසර සංවර්ධන ඉලක්ක 10 යටතේ වැඩි විස්තර දක්වා ඇත) 20116-2020 මධ්‍ය කාලීන උපාය මාර්ගික සංවර්ධන වැඩසටහන් යටතේ ළඟම පාසල - හොඳම පාසලී ජාතික වැඩසටහනයි. මෙම මූලාරම්භය මගින් අරමුණු කෙරෙන්නේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල තෝරාගන්නා ලද පාසල්, වැඩි දියුණු කළ යටිතල පහසුකම් සහ මානව සම්පත් තුළින් සුපිරි පාසලී බවට පත් කිරීමයි. මීට අමතරව, යෝජිත වසර 13 ක අනිවාර්ය අධ්‍යාපනය මූලාරම්භය මගින් රටේ කිසිවෙකු මග නොහැරෙන අධ්‍යාපන ක්‍රමයක විභවයක් සනිටුහන් කරයිඃ මේ යටතේ අඩු කාර්ය සාධනයක් පෙන්නුම් කරන ශිෂ්‍යයන්ට වෘත්තීය ධාරාවකින් අධ්‍යාපනය කරගෙන යාමට අවස්ථාව ලැබෙන අතර ඔවුන්ගේ රැකියා කළ හැකි බව සහ මුදල් ඉපයීමේ ධාරිතාව වැඩි කෙරේ.

. සෞඛ්‍යයඃ

සැමට නොමිලේ සෞඛ්‍ය ලබාදීමේ ප්‍රතිපත්තිය මගින් ගාස්තු ගෙවීමකින් තොරව සියලුම පුරවැසියන්ට සෞඛ්‍ය සේවා ලබාගැනීමට හැකියාව ලබාදෙන අතර සෞඛ්‍යය වෙත පිවිසීම සඳහා සමානාත්මතාවය යන මූලධර්මය සඳහා පදනම සපයයි. මෙය, සියලුම රෝගීන්ට සමානව සේවාව ලබාදීම, සෑම රෝගියෙකුටම ප්‍රවේශ්‍යතාවය, ගුණාත්මක සේවය සහ මූල්‍ය ආරක්ෂාව ලබාදීම තහවුරු කිරීමට අරමුණු කරන 2016-2025 ජාතික සෞඛ්‍ය උපායමාර්ගික ප්‍රධාන සැලසුම තුළ පිළිබිඹු කෙරේ.10 මෙරටට එන, බැහැරට යන, අභ්‍යන්තර සංක්‍රමණිකයින් සහ ඔවුන්ගේ පවුල්වල සෞඛ්‍ය ගැටළු විසඳීමේ අරමුණින් ශ්‍රී ලංකා ජාතික සංක්‍රමණ සෞඛ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හරහා සංක්‍රමණික සුබසාධනය තහවුරු කිරීමට ප්‍රශංසනීය පියවරක් තබා ඇත.11 මීට අමතරව ගර්භණී සහ කිරිදෙන මව්වරුන් සහ දරුවන් සඳහා විවිධ අමාත්‍යාංශ මගින් සිදු කරන පෝෂණ වැඩසටහන්ද වේ.

සමාජ ආරක්ෂණයඃ

දිළිඳු ජනයා සහ වයෝවෘද්ධ පුද්ගලයන්, ආබාධිත පුද්ගලයන් සහ අභ්‍යන්තරිකව අවතැන් වූ පුද්ගලයන් වැනි අවදානමට ලක් වූ කණ්ඩායම් ඉලක්ක කරගෙන රාජ්‍ය ආයතනවලින් සමාජ ආරක්ෂණ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කෙරේ. මෙයට, දිළිඳු බව තුරන් කිරීමේ ප්‍රධාන වැඩසටහන වන සමෘද්ධි වැඩසටහන, වැඩිහිටි සහය වැඩසටහන සහ ආබාධිත සහය වැඩසටහන අයත් වේ. 2016 වසරේදී සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය පිහිටුවීම අවශ්‍යතා සහිත කණ්ඩායම් අතර සමාජ ආරක්ෂණය තහවුරු කිරීම සඳහ ගන්නා ලද සැලකිය යුතු පියවරකි. සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලයට පවරන ලද වගකීම වනුයේ ඒකීය සමාජ ලේඛනයක් සමග අනුකලිත සමාජ ආරක්ෂණ ජාලයක් ඇති කිරීම සහ එක් එක් සමාජ ආරක්ෂණ වැඩසටහන සඳහා සුදුසු තේරීම් නිර්ණායක ඇති කිරීමයි; මෙම මූලාරම්භය මගින් ඉලක්කගත කිරීමේ දෝෂ අවම කිරීමට සහ රටේ වැඩි වශයෙන්ම අවදානමට ලක් වූ ජනතාවට සමාජ ආරක්ෂණය සැපයීමට අපේක්ෂා කෙරේ.

---

10 MOH (2016), ‘සෞඛ්‍ය සේවා සංවර්ධනය සඳහා වන ජාතික උපායමාර්ගික රාමුව 2016-2025’, සෞඛ්‍ය අමාත්‍යාංශය. http://www.health.gov.lk/enWeb/HMP2016-2025/National%20%20Strategic%20%20Framework%20%20.pdf වෙතින් ලද හැකිය

11 MOH (2012), ‘සෞඛ්‍ය සේවා සංවර්ධනය සඳහා වන ජාතික උපායමාර්ගික රාමුව 2016-2025’, සෞඛ්‍ය අමාත්‍යාංශය.

12 https://www.unescogym.org/wp-content/uploads/2017/05/SRI-LANKA-HEALTH-POLICY-2012.pdf වෙතින් ලද හැකිය

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ඉහළ මානව සංවර්ධනයක් සහිත රටවල් ප්‍රවර්ගයට ශ්‍රී ලංකාව එක් කිරීම මගින් මෙවැනි වැඩසටහන් සහ මූලාරම්භයන්ගේ වැදගත් බව පිළිබිඹු කෙරේ. එහෙත් දිළිඳු බව පවතින ප්‍රදේශ තුළින් පෙනෙන පරිදි, ආදායම් විෂමතාවයන් සහ සේවාවන් හා අවස්ථාවන් වෙත පිවිසීමේ විෂමතාවය පවතී. ආන්තීකරණය වූ කණ්ඩායම්වල සහ පසුගාමී ප්‍රදේශවල අවශ්‍යතා කෙරෙහි අවධානය කිරීම කෙරෙහි වන සවිඥානික ව්‍යායාමයක් ලෙස ශ්‍රී ලංකා රජය දිළිඳු සහ අවදානමට ලක් වූ පුද්ගලයන්ගේ ජීවන මට්ටම් වැඩි දියුණු කිරීමට වැඩසටහන් සහ ව්‍යාපෘති කිහිපයක් දියත් කර ඇත.

මීට අමතරව, රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020 මගින් ප්‍රධාන අවදානමට ලක් වූ කණ්ඩායම් හඳුනාගන්නා ලද අතර එම කණ්ඩායම් මග නොහැරීමට වැඩසටහන්ද සැලසුම් කර ඇත. කාන්තාවන්ගේ අඩු දේශපාලන සහභාගීත්වය හේතුවෙන් දේශපාලන් ආයතනවල කාන්තා නියෝජනය සඳහා ප්‍රතිශතයක් හඳුන්වා දීමෙන් කාන්තාව සවිබලගැන්වීමට පියවර ගෙන ඇත.12 මීට අමතරව අවදානමට ලක් වූ කාන්තාවන් ඉලක්ක කරගෙන ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ගණනාවක්ද ක්‍රියාත්මක කර ඇත. 13 දරුවන්ගේ සුබසාධනය වැඩි දියුණු කිරීමට මන්දපෝෂණය අඩු කිරීම කෙරෙහි රටේ අවධානය යොමු වී ඇති අතර දරුවන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩත්වය වැඩි වන තත්වයක් තුළ ළමා ආරක්ෂාව තහවුරු කිරීමට පියවර ගනිමින් ඇත. 14.ශීඝ්‍රයෙන් වර්ධනය වන වයස්ගත ජනගහනය පිළිබඳ අභියෝගය ශ්‍රී ලංකාව හඳුනාගෙන ඇති අතර අවදානමට ලක් වූ ඇති වයස්ගත ජනතාවට ආරක්ෂාව තහවුරු කිරීමේ නව වැඩිහිටි රැකවරණ මාදිලියක් සංවර්ධනය කෙරෙමින් ඇත. 15 ආබාධිත පුද්ගලයන්ගේ යහපැවැත්ම වැඩි වර්ධනය කිරීම සඳහා දිළිඳු සහ ආබාධිත පුද්ගලයන් සඳහා සුබ සාධන වැඩසටහන් සහ ප්‍රජා පදනම් පුනරුත්ථාපනය තුළින් ජීවනෝපාය සංවර්ධනය සඳහා කටයුතු කරමින් පවතී.

කිසිවෙකු මඟ නොහැරීම යන මූලධර්මය රටේ නීති සහ ප්‍රතිපත්ති රාමුවල හොඳින් ස්ථාපිත වී පවතී. එය ශ්‍රී ලංකාවේ සංවර්ධන න්‍යාය පත්‍රයේ ප්‍රධාන ලක්ෂණයයි. මෙනිසා 2030 න්‍යාය පත්‍රය තුළ සැලකිය යුතු ප්‍රගතියක් ලබාගැනීමට අවශ්‍ය පදනම සැකසී ඇත. රජයේ ප්‍රතිපත්ති සම්පාදනයේදී සහ පළාත් සහ ජාතික මට්ටමේ සැලසුම් සකස් කිරීමේදී ආන්තීකරණය වූ කණ්ඩායම් ඇතුළත් කිරීම සඳහා රජය තවදුරටත් කටයුතු කරමින් සිටී. මීට අමතරව, පොදු ජනතාව සහ විශේෂයෙන් අවදානමට ලක් වූ සහ ආන්තීකරණය වූ ප්‍රජාවන් ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් 17අතර දැනුවත්භාවය ඇති කිරීමද අත්‍යවශයය. එමෙන්ම, කිසිවෙකු මඟ නොහරින බව තහවුරු කරගැනීම සඳහා සාක්ෂ්‍ය පදනම් ප්‍රතිපත්ති සැකසීමක් සිදු කිරීමට සංරචකයන්ට වෙන් කරන ලද දත්ත සඳහාද අවශ්‍යතාවයක් ඇත- උදාහරණයක් ලෙස ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ආබාධිත තත්වය, සංක්‍රමණික තත්වය වැනි.

---

12 UN (2018), ලංකාව තුළ තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ MAPS එළඹුම
13 PIP 2017-2020
14 Ibid
15 Ibid
16 Ibid
17 Ibid

04

ඉලක්ක සහ අරමුණු

මෙම පරිච්ඡේදය මගින් අරමුණු කෙරෙන්නේ ශ්‍රී ලංකාව තුළ එක් එක් තිරසර සංවර්ධන ඉලක්ක හා සම්බන්ධව පවතින ප්‍රවණතා සහ වර්තමාන තත්වය, සපුරාගැනීම්/සාර්ථකත්වයන්, පරතරයන් සහ අභියෝගයන් හා අනාගතය පිළිබඳව ඇගයීමයි. මෙම පරිච්ඡේදය උප කොටස් දෙකක් යටතේ සංවිධානය කර ඇත. පළමු උප කොටස මගින් ඉහළ මට්ටමේ දේශපාලන සංසදය 2018 තුළ ගැඹුරු සමාලෝචනයට ලක් කිරීම සඳහා තෝරාගත් තිරසර සංවර්ධන ඉලක්ක ආවරණය කෙරේ. දෙවන උප කොටස මගින් ඉතිරි තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳව සාකච්ඡා කෙරේ.

4.1

ඉහල ඉහළ මට්ටමේ දේශපාලන සංසදය 2018 තුළ ගැඹුරින් සමාලෝචනය කිරීම සඳහා තෝරාගත් තිරසර සංවර්ධන ඉලක්ක

උප කොටස මගින් 2018 ඉහළ මට්ටමේ දේශපාලන සංසදය තුළ ගැඹුරු සමාලෝචනයට ලක් කිරීම සඳහා තෝරාගත් තිරසර සංවර්ධන ඉලක්ක ආවරණය කෙරේ. මෙයට ඇතුළත් වන්නේ,

ඉලක්කය 6: ජලය සහ සනීපාරක්ෂාව සියලු දෙනාටම ලබාදීම සහතික කිරීම සහ තිරසර කළමනාකරණය

ඉලක්කය 7: සියලු දෙනාට දැරිය හැකි, විශ්වසනිය, තිරසර සහ නවීන් බලශක්තිය වෙත පිවිසුම සහතික කිරීම

ඉලක්කය 11: නගර සහ මානව ජනාවාස ආරක්ෂිත, ප්‍රත්‍යාස්ථ සහ තිරසර කිරීම

ඉලක්කය 12: තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටා සහතික කිරීම

ඉලක්කය 15: භෞමික පරිසර පද්ධතීන් තිරසර ලෙස භාවිතා කිරීම ආරක්ෂා කිරීම, ප්‍රතිස්ථාපනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීමේ, වනාන්තර තිරසර ලෙස කළමනාකරණය කිරීම, කාන්තාරකරණයට එරෙහිව සටන් කිරීම සහ බිම් හායනය නැවැත්වීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සහ ජෛව විවිධත්වය අහිමිවීම නැවැත්වීම

වර්තමානයේදී ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධන න්‍යාය පත්‍රය තුළ වැදගත් සංරචකයන් දෙක වන්නේ තිරසර බව සහ ප්‍රත්‍යාස්ථ බවයි. සංවර්ධනය හේතුවෙන් පරිසරය වැය වීම අඩු කිරීම කෙරෙහි සහ තම ස්වභාවික සම්පත් තිරසරව කළමනාකරණය කිරීම කෙරෙහි ශ්‍රී ලංකාව අඛණ්ඩවම අවධානය යොමු කරමින් සිටී. එමෙන්ම, කාලගුණ සහ ස්වභාවික ආපදා අවදානම් වැනි

විවිධ කම්පනයන් සඳහා ප්‍රත්‍යාස්ථ බව ගොඩනැගීම දැන් අවධාරණය කෙරෙමින් පවතී. එබැවින් 2018 වසර සඳහා වන ඉහළ මට්ටමේ දේශපාලන සාකච්ඡාවේ තේමාව සහ එහිදී ගැඹුරු සමාලෝචනයකට ලක් කිරීමට තෝරාගත් ඉලක්ක ජාතික වශයෙන් වැදගත් වේ. මෙම ඉලක්ක සමාලෝචනය, වර්තමාන තත්වය සහ ජයග්‍රහණයන්, පරතරයන් සහ අනාගත ප්‍රතිපත්ති දිශාවන් අවබෝධ කරගැනීමට උපකාර වෙයි.

වර්තමාන තත්වය සහ ප්‍රවණතා

වසර කිහිපයක් තුළ ආරක්ෂිත පානීය ජලය වෙත ප්‍රවේශය සම්බන්ධව ශ්‍රී ලංකාව යහපත් ප්‍රගතියක් අත්පත් කරගෙන සිටී. 2016 වන විට ගෘහ ඒකක 88.8% ක් පමණ ප්‍රමාණයකට ආරක්ෂිත පානීය ජලය වෙත ප්‍රවේශය ලැබී තිබිණි (ඉලක්කය 6.1). පරිශ්‍රයන් තුළ ආරක්ෂිත ළිං, පරිශ්‍රයන්ගෙන් පිටත ආරක්ෂිත ළිං, නිවාස තුළ කරාම, ඒකක/පරිශ්‍රය තුළ කරාම (ප්‍රධාන ජල සැපයුම), පරිශ්‍රයන්ගෙන් පිටත කරාම (ප්‍රධාන ජල සැපයුම), ගම්මානවල ජල ව්‍යාපෘති, නල ළිං, බවුසර සහ බෝතල් කළ ජලය පානීය ජලය සඳහා වන මූලාශ්‍ර ලෙස වර්ග කෙරේ. සියලුම දිස්ත්‍රික්කවල නිවාස 50% කට වැඩි ප්‍රමාණයකට ආරක්ෂිත පානීය ජලය ඇති බවට වාර්තා වේ. ආරක්ෂිත පානීය ජලය වෙත වන පිවිසුම සාපේක්ෂව අඩු මට්ටමක පවතින්නේ නුවරඑළිය දිස්ත්‍රික්කය වන අතර (54%) අනාගත මැදිහත්වීම්වලදී ඒ වෙත ප්‍රමුඛ අවධානය යොමු විය යුතුව ඇත. නුවරඑළිය ප්‍රදේශයේ සැලකිය යුතු තරමේ ජනගහනයක් වතුවල ජීවත් වන අතර ඔවුන් භාවිතයට ගන්නා පොදු ජල මූලාශ්‍ර ආරක්ෂිත ජල මූලාශ්‍ර ලෙස වර්ගීකරණය කළ නොහැක

4.1 රූපය : 2016 වසරේදී දිස්ත්‍රික්ක අනුව ආරක්ෂිත පානීය ජලය වෙත පිවිසුම



මූලාශ්‍රය: ගෘහ ආදායම් සහ වියදම් සමීක්ෂණය 2016, සංගණන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සනීපාරක්ෂක පහසුකම් සම්බන්ධව සැලකූ විට, ජනගහනයෙන් 87% කට තම ස්ථානයේම සනීපාරක්ෂක පහසුකම් ඇති අතර එය සැලකිය යුතු තරමේ ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකිය (රූප සටහන 4.2) (ඉලක්කය 6.2). කෙසේ වෙතත්, අපජලය අපහරණය සම්බන්ධව සැලකූ විට නල මගින් අපද්‍රව්‍ය බැහැර කරන සම්බන්ධතා සහිත නිවාස ඇත්තේ 2% ක් පමණි. අනෙකුත් ගෘහයන් අපජලය බැහැර කරනුයේ තම පරිශ්‍රය තුළම පිහිටි වලවල්වලට වන අතර එමගින් විවිධ පාරිසරික සහ සෞඛ්‍ය ගැටළු ඇති විය හැකිය. මෙහිදී විශේෂයෙන් භූජලය දූෂණය වීම ප්‍රධාන වේ. ජනගහන ගනත්වය වැඩි නාගරික සහ උප නාගරික ප්‍රදේශවල මෙම තත්වය වැඩියෙන් ගැටළුකාරී වේ.



මූලාශ්‍රය: ජාතික ජල සැපයුම් සහ ජලාපවහන මණ්ඩලය

කොළඹ, ඒකල, ජා ඇල, මොරටුව සහ රත්මලාන ප්‍රදේශ සඳහා ප්‍රධාන පල්දෝරු පහසුකම් ඇත. මීට අමතරව, හලාවත, මන්නාරම, පුත්තලම සහ වවුනියාව ඇතුළු නගර කිහිපයකට පූතික පිරිපහදු පද්ධති හඳුන්වා දෙමින් ඇත. 2020 වසර වන විට සියලුම විශාල උපාය මාර්ගික නගර සඳහා මධ්‍යගත පල්දෝරු පද්ධතියක් ඇති කිරීමට රජය ඉලක්ක කරයි.

ජල අංශයේ සහ රටේ වෙනත් පාරිසරික උප අංශවල ජාතික මට්ටමේ ප්‍රමුඛතා අනුව ජල පරිහරණ කාර්යක්ෂමතාව වැඩි කිරීම සහ ආශ්‍රිත පරිසර පද්ධතීන් තිරසරව කළමනාකරණය වැදගත් කටයුත්තකි. වර්තමානයේදී, ශ්‍රී ලංකාව තුළ ජලය ලැබෙන ආකාරයන් සියල්ල ආවරණය වන පරිදි ජල පරිහරණ කාර්යක්ෂමතාව පිළිබඳ විස්තීර්ණ ඇගයීමක් සිදු කර නැත (ඉලක්කය 6.4) කෙසේ වෙතත්, ජල පරිහරණ කාර්යක්ෂමතාව පිළිබඳ තක්සේරු කිරීම් නිශ්චිත ස්ථානවල වාරිමාර්ග ජලය සඳහා ලද හැකිය. එමෙන්ම, ජාතික පරිසර පනතට පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් තුළින් මූලාශ්‍ර ජල දූෂණය නියාමනය කිරීමට අදාළ විධි විධාන අයත් වේ. නමුත් උත්පාදනය වන අපජලය ප්‍රමාණයන් පිළිබඳව තොරතුරු මඳකමක් ඇත.

ශ්‍රී ලංකාවේ පානීය ජලය සහ සනීපාරක්ෂාවට අදාළ ගැටළු සම්බන්ධව කටයුතු කරන ප්‍රධාන රජයේ නියෝජිතායතනය වන්නේ නගර සැලසුම් සහ ජල සැපයුම් අමාත්‍යාංශයයි. එය තම රේඛීය ආයතන වන ජාතික ජල සැපයුම් සහ ජලාපවාහන මණ්ඩලය සහ ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව හරහා කටයුතු කරයි. ජාතික ජල සැපයුම් සහ ජලාපවාහන මණ්ඩලය විසින් නල ජලය සැපයීමේ ප්‍රමුඛතා ලබාදීමේදී පානීය ජලය හෝ සනීපාරක්ෂක පහසුකම් නොමැති වීම හේතුවෙන් සෞඛ්‍ය උවදුරුවලට ගොදුරු වීමේ අවදානම සහිත ප්‍රදේශ සහ පුද්ගලයන් හඳුනාගනු ලැබේ. ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව ජාතික ජල සැපයුම් සහ ජලාපවාහන මණ්ඩලය විසින් ආවරණය නොකළ ප්‍රදේශ දෙස අවධානය යොමු කරයි. උප ජාතික මට්ටමින් ගත් විට ප්‍රාදේශීය අධිකාරීන්, ප්‍රජා පදනම් සංවිධාන, වැවිලි සමාගම් සහ පුද්ගලික අංශයේ ආයතන පානීය ජල සැපයු ලබාදීම සමග සම්බන්ධ වේ. ශ්‍රී ලංකාව් විසින් ජලය සහ සනීපාරක්ෂාව අංශයේ නිශ්චිත උප අංශ ආවරණය කිරීම පිණිස, ජාතික පානීය ජල ප්‍රතිපත්තිය 2008, සනීපාරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, ග්‍රාමීය ජල සැපයිම් සහ සනීපාරක්ෂක ප්‍රතිපත්තිය සහ වැසි ජලය නෙලාගැනීමේ ප්‍රතිපත්තිය යනාදී වූ සැලසුම්, ප්‍රතිපත්ති සහ වැඩසටහන් ගණනාවක් සකස් කර ඇත. ස්වේච්ඡා ජාතික සමාලෝචනය සඳහා අදහස් විමසීමේදී පාර්ශ්වකරුවන් ශ්‍රී ලංකාව තුළ ජල කළමනාකරණය සඳහා අනුකලිත ප්‍රතිපත්ති රාමුවක් සැකසීමේ අවශ්‍යතාවය (ඉලක්කය 6.5) අවධාරණය කර ඇත.

වෙනස්වන කාලගුණ රටාවන් හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ පානීය ජලය ලද හැකි බවද සැලකිය යුතු අභියෝගයක් බවට පත්ව ඇත. එබැවින් ශ්‍රී ලංකාව තුළ කාලගුණ බලපෑම් සඳහා ජාතික ගැලපුම් සැලසුම 2016 -2025 විසින් කාලගුණ ගැලපුම් ක්‍රියාකාරකම් සඳහා ජල අංශය ප්‍රධාන තේමාවක් ලෙස හඳුනාගනී.

ජල අංශය සඳහා ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයන් (NDCs) මගින්ද කාලගුණ විපර්යාසයන් හේතුවෙන් තර්ජනයට ලක් වෙමින් ජලය හිඟවීමේ ප්‍රවණතාව සඳහා විසඳුම් ලබාදීමට ක්‍රියා මාර්ග කිහිපයක් ගනිමින් ඇත. ජල අංශය තුළ කාලගුණ විපර්යාස ගැටළු විසඳීම සඳහා යෝජිත ප්‍රධාන ගැලපුම් ක්‍රියාමාර්ගයන්ට ඇතුළත් වන්නේ; ජලය හිඟ ප්‍රදේශවල නව ජල සැපයුම් ව්‍යාපෘති සහ යෝජනා ක්‍රම, දූෂණය සහ කාලගුණ විපර්යාස බලපෑම් ජයගැනීමට සමස්ත රටටම අදාළව ජල ආරක්ෂණ කළමනාකරණ සැලසුම්, පානීය ජල් පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම, ජල සැපයුම අතර ආරක්ෂාව තහවුරු කිරීමට ජංගම විද්‍යාගාර,නියං කාලවලදී පානීය ජලයට ලවණ සහිත ජලය ඇතුළු වීම අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම සහ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ජල සැපයුම් සැලසුම් වෙත කේන්ද්‍රගත වෙමින් නව කළමනාකරණ පද්ධති හඳුන්වා දීම.

පරතරයන් සහ අභියෝග

ජාතික මට්ටමින් ගත් විට ආවරණ ප්‍රතිශතය සතුටුදායක වුවද පානීය ජල සැපයුම සහ සනීපාරක්ෂාව වෙත වන පිවිසුම ප්‍රාදේශීය විෂමතාවයන් පෙන්වයි. පානීය ජලය සහ සනීපාරක්ෂක පහසුකම් අතින් දිළිඳු ප්‍රදේශ සඳහා අනාගත මැදිහත්වීම්වලදී විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

රටේ සමහර කොටස් තුළ ආරක්ෂිත පානීය ජලයේ පවතින ගුණාත්මක බවද ගැටළුවකි. උතුරුමැද සහ උතුරු පළාත්වල කෘෂිකාර්මික ප්‍රදේශවල ජලය පානයට නුසුදුසු ජලය ඇතිවීමට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ ලෝහ සහ කෘෂි රසායන ද්‍රව්‍ය ජලයට එක් වීම බව සොයාගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, නොදන්නා හේතු මත ඇතිවන නිදන්ගත වකුගඩු රෝග බහුලව වාර්තා වෙමින් ඇත. ජල ගුණාත්මක මට්ටම් අධීක්ෂණය කිරීමේ හැකියාව සම්බන්ධවද පරතරයන් දක්නට ලැබේ.

මීට අමතරව, වෙනත් අංශ ගණනාවකට සමාන ලෙස ආයතනික සම්බන්ධීකරණයේ මඳකමද ජල අංශයට මුහුණ පෑමට සිදුවෙන අභියෝගයකි. පානීය ජලය සහ ජලාපවහන පහසුකම් සැපයීමට සම්බන්ධවන ප්‍රධාන ජාතික සහ උපජාතික ආයතන ඇත. ජාතික ඉලක්ක සාක්ෂාත් කරගැනීමේ ලා ඒවා අතර මනා සම්බන්ධීකරණය වැදගත් වේ.

ඉදිරි ගමන් මග

ආරක්ෂිත පානීය ජලය සඳහා වන ජාතික මට්ටමේ ඉලක්ක එම අංශයේ ගැටළු සහ අභියෝගයන් බොහොමයක් ආවරණය කිරීමට අපේක්ෂා කරයි. මේවායේ ඉලක්කය වනුයේ 2020 වන විට සියලු පුරවැසියන්ට ආරක්ෂිත පානීය ජලය සැපයීමයි. මෙයට, 2020 වන විට 60% ක් දක්වා නල ජල සැපයුම් ආවරණය වැඩි කිරීම, වකුගඩු රෝගවලින් බලපෑමට පත්වූ ප්‍රදේශ සඳහා නල ජල පහසුකම් ලබාදීම, 1005 කින් ජලයේ ගුණාත්මක බව ආරක්ෂා කිරීම, කර්මාන්තවල ජල අවශ්‍යතාවය 100% කින් සැපිරීම සහ පානීය ජල පහසුකම් සැපයීමේ ආයතනික ව්‍යුහය තුළ වන කාර්යක්ෂමතාව සහතික කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. හේතුව නොදන්නා නිදන්ගත වකුගඩු රෝග පවතින ප්‍රදේශවලට පිරිසිදු කළ ජලය ලබාදීම සඳහා ප්‍රත්‍යවර්ත ආසෘති අංගන ස්ථාපනය කිරීමද වැදගත් මැදිහත්වීමකි.

ඉලක්කයේ දර්ශකයන්, ශ්‍රී ලංකාවේ පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව සම්බන්ධව ගත් විට ජාතික ප්‍රතිපත්ති ප්‍රමුඛතා සමග හොඳින් අනුකූල වේ. අරමුණුවල ඉලක්ක සහ ආංශික ප්‍රතිපත්ති අතරහරස් සම්බන්ධතා කිහිපයක් පවතී; ඉලක්ක සපුරාගැනීම සඳහා මේ හා සම්බන්ධ සියලුම ආයතනවල සම්බන්ධීකරණය අවශ්‍ය වේ. ප්‍රාදේශීය විෂමතාවයන් අවම කිරීමට මෙම මූලාරම්භයන් ආරක්ෂිත පානීය ජලය සහ සනීපාරක්ෂක පහසුකම් අඩු ප්‍රදේශ කෙරෙහි ප්‍රමුඛ අවධානයක් යොමු කළ යුතුය.

සනීපාරක්ෂක අංශයේ උපාය මාර්ගයන් හරහා විශේෂයෙන් ග්‍රාමීය සහ වතු අංශයේ සනීපාරක්ෂ පහසුකම් භාවිතය වැඩි කිරීම, සනීපාරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, ප්‍රධාන නගරවල ජලාපවහන පහසුකම් වැඩි දියුණු කිරීම සහ ජාතික ජල සම්පාදන සහ ජලාපවහන් මණ්ඩලයේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා ක්‍රියාකාරීත්වයන් ප්‍රතිව්‍යුහගත කිරීම යනාදිය කෙරෙහි යොමු වී ඇත එහි අරමුණ වන්නේ 2020 දී රට පුරා 100% ආරක්ෂිත සනීපාරක්ෂාවක් සහතික කිරීමයි. එමෙන්ම 2020 වන විට 3.3% ක නාගරික ජනතාවක් සඳහා නල මාර්ගික මලාපවහන ක්‍රමයක් සැපයීමද එයට ඇතුළත් වේ. ආදායම් නොලබන ජලය (පාරිභෝගිකයෙකු වෙතට නොපැමිණ අපතේ යන ජලය) අඩු කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් ඇත. මහ කොළඹ ජලය සහ අප ජලය කළමනාකරණය වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩසටහන මෙයට එක් උදාහරණයකි.

වර්තමානයේදී තක්සේරු කර නොමැති ඉලක්ක සඳහා පදනම් රේඛා දර්ශකයන් සකසා ගැනීම වැදගත් වේ. පර්යේෂණ තුළින් අදාළ ගැටළු ඉස්මතු කර ඇතත් ප්‍රගති මැනීම් ලබාගැනීම සඳහා නිසි ලෙස ක්‍රියාත්මක වන යාන්ත්‍රණයක් නැත. ජනගහන සහ ජන සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් අදාළ දර්ශකයන් ජාතික දත්ත සංඛ්‍යාලේඛන පද්ධතියට ඇතුළත් කිරීම වැදගත් වේ.

ජලය සහ සනීපාරක්ෂාව පිළිබඳ අංශවල සැලසුම්කළ අරමුණු සාක්ෂාත් කරගැනීමට අන්තර් නියෝජිතායතන සහයෝගීතාවය අවශ්‍ය වේ. එමෙන්ම කළමනාකාරීත්ව, තාක්ෂණික සහ මූල්‍ය හැකියාවන් සම්බන්ධව ගත් විටද පළාත් සහ ප්‍රාදේශීය ආයතනවල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමද අත්‍යවශ්‍යය.

7 AFFORDABLE AND CLEAN ENERGY

වර්තමාන තත්වය සහ ප්‍රවණතා

ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනය සම්බන්ධව බලශක්ති අංශය වැදගත් භූමිකාවක් දරයි. මෙම අංශයේ කාර්ය සාධනය ජයග්‍රහණ සහ අභියෝගයන් ගණනාවක් සමග මිශ්‍රව පවතී. බලශක්ති අංශයේ ප්‍රධාන ජයග්‍රහණයක් වන්නේ සෑම නිවසකටම පාහේ විදුලිය ලබාදී 100% ක සැපයුමක් සිදු කිරීමට හැකි වීමයි (ඉලක්කය 7.1) මෙම් ජයග්‍රහණය ලබාගනු ලැබුවේ බලශක්ති උත්පාදනය සහ බෙදාහැරීම සම්බන්ධව වගකීම දරන රජයට හිමි ව්‍යාපාරයක් වන ලංකා විදුලි බල මණ්ඩලයේ ග්‍රාමීය විද්‍යුතන වැඩසටහන හරහා රජය දැරූ නිරන්තර ව්‍යායාමයක ප්‍රතිඵලයක් ලෙසයි.

ගෘහ, කාර්මික, වාණිජ, ප්‍රවාහන සහ කෘෂිකාර්මික අංශවල බලශක්ති අවශ්‍යතාව පිරවීම පිණිස බලශක්ති සම්පත් ගණනාවක් භාවිතා කෙරේ. වගුව 4.1 මගින් ප්‍රධාන පරිශීලක වර්ග අනුව බලශක්ති සංයුතිය පෙන්නුම් කරයි. ඉවුම් පිහුම් සඳහා භාවිතා කරන ප්‍රධාන බලශක්ති ප්‍රභවය වන්නේ දර වන අතර විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල ගෘහ බලශක්ති අවශ්‍යතාවයන් තවමත් සැපිරෙන්නේ ජීව ඉන්ධන මගිනි. විශේෂයෙන් කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල කාර්මික බලශක්ති අවශ්‍යතාවයන් සැපිරෙන්නේද බොයිලේරු, වියළන සහ උඳුන් යනාදිය සඳහා භාවිතා වෙන දර මගිනි. විදුලි බලය සම්බන්ධයෙන් ගත් විට එහි ප්‍රධාන පරිශීලකයන් වන්නේ මුළු බලශක්ති උත්පාදනයෙන් 38% ක් භාවිතා කරන ගෘහයන්ය. ඛනිජ තෙල් භාවිතා කරන ප්‍රධාන අංශය වන්නේ ප්‍රවාහන අංශයයි. ප්‍රධාන ජල විදුලි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ක්‍රමිකව අපහසු වූ පසු 1990 මැද සිට විදුලි බලය උත්පාදනයේ ප්‍රධාන මූලාශ්‍රය බවට තාප බලශක්තිය පත් වූ අතර එය ජල විදුලි බලය පරයා නැගී සිට තවදුරටත් ඛනිජ් තෙල් අවශ්‍යතාවය වැඩි කරනු ලැබීය. විදුලි බලය සඳහා වැඩිවෙන ඉල්ලුම සහ ඛනිජ තෙල්වල මිල ඉහළ යාම නිසා 2010 සිට තවත් ෆොසිල ඉන්ධන බලශක්තියක් වන ගල් අඟුරු භාවිතය බලශක්ති ජනන මුසුවට එක් වූ අතර පුත්තලම් දිස්ත්‍රික්කයේ නොරොච්චෝලේ ප්‍රදේශයේ පළමු ගල් අඟුරු බලාගාරය ඉදිකරනු ලැබීය.

සියලුම අංශ වෙතින් විදුලි බලය සඳහා වන ඉල්ලුම වැඩි වෙමින් පවතී. අනෙක් අංශවලට වඩා ගෘහ අංශයෙන් මේ සඳහා වැඩි ඉල්ලුමක් ලැබෙන අතර කාර්මික අංශය වෙතින් වන ඉල්ලුම දෙවන තැනට පත් විය (රූප සටහන 4.4) ගෘහ සහ වාණිජ අංශවලින් එන ඉල්ලුම ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කරන අතර කාර්මික අංශයේ ඉල්ලුම තුළ කාලානුරූප උච්චාවචනයන් පෙන්නුම් කෙරේ. එහි ප්‍රතිඵලයක් ලෙස, කාර්මික අංශය වෙතින් එන සාපේක්ෂ විදුලි ඉල්ලුම කාලයත් සමග අඩුවී ඇති නමුත් සත්‍ය පරිභෝජනය වැඩි වී ඇත (රූප සටහන 4.3. (ආ)).

වගුව 4.1: ප්‍රධාන පරිශීලකයින් අනුව බලශක්තිය සඳහා වන ඉල්ලුම 2016

ඉල්ලුම් මූලාශ්‍රය	සලකා බලන ලද									
	විදුලිය	LPG	පෙට්‍රල්	භූමිතෙල්	ඩීසල්	ඉන්ධන තෙල්	ගල් අඟුරු	බැගෑස්	or	එකතුව
නිවාස, වාණිජ සහ වෙනත්	736.7	301.9	w$fkd	175.1	අ/නො	අ/නො	අ/නො	අ/නො	2829.5	4043.1
කර්මාන්ත	356.8	74.4	N/A	6.0	22.7	368.1	49.1	96.4	1714.0	2687.4
ප්‍රවාහන	අ/නො	1.1	1594.7	අ/නො	2088.7	අ/නො	අ/නො	අ/නො	අ/නො	3,687.5
කෘෂිකර්මය	අ/නො	අ/නො	අ/නො	අ/නො	0.6	0.2	අ/නො	අ/නො	අ/නො	0.8
එකතුව බලශක්ති භාවිතය	1093.5	377.4	1594.7	181.0	2112.0	368.3	49.1	96.4	4543.4	10418.0

මූලාශ්‍රය: තිරසර බලශක්ති අධිකාරිය (2017)

4.3 රූපය : අංශය අනුව විදුලි බල පරිභෝජනය (සාපේක්ෂ කොටස්වලින් (%): 1970-2016)



මූලාශ්‍රය: තිරසර බලශක්ති අධිකාරිය (2017)

ප්‍රවාහන සහ බලශක්ති උත්පාදන අංශ වෙතින් වැඩිවෙන ඉල්ලුම හේතුවෙන් ෆොසිල ඉන්ධන බලශක්ති මූලාශ්‍ර මත රටේ රඳා පැවතීම වැඩි වී ඇත. එහෙත්, පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රද රටේ මුළු බලශක්ති සැපයුම් තුළ ප්‍රධාන භූමිකාවක් දරයි. මූලික සැපයුම් මට්ටමේදී, පුනර්ජනනීය සහ දේශීය මූලාශ්‍රවලින් සැලකිය යුතු බලශක්ති කොටසක් පැමිණේ. රූප සටහන 4.4 පෙන්නුම් කරන පරිදි මූලික සැපයුමෙන් 36% ක් ජීව ඉන්ධන මූලාශ්‍රයන්ගෙන් ලැබේ. ජල විදුලිය (6%) සහ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය (භඛඍෑ, 2%) එක්ව ගත් විට මුළු බලශක්ති සැපයිමෙන් 44% ක් සඳහා පුනර්ජනනීය බලශක්තිය යොදා ගැනේ. (ඉලක්කය 7.2) 18 ෆොසිල ඉන්ධන මූලාශ්‍ර 56% ක දායකත්වයක් දරයි. ගෘහස්ථ සහ කාර්මික ආයතනයන් තුළ පුළුල් වශයෙන් භාවිතා කෙරෙන ජීව ඉන්ධනය වන්යේ දර වන අතර අනෙක් ආකාරයන් වන පොල් කටු, බැගෑස් සහ දහයියා ද සීමිත කාර්යයක් කරනු ලැබේ'



4.4 රූපය
මූලික බලශක්ති සැපයුම තුළ ප්‍රධාන බලශක්ති මූලාශ්‍ර කොටස (%)

මූලාශ්‍රය: තිරසර බලශක්ති අධිකාරිය (2017)

විදුලි සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් නිවාස, ආගමික ස්ථාන, හෝටල්, වාණිජ ආයතන සහ කර්මාන්තවල වහල මත සවි කරන කුඩා සූර්ය බලශක්ති අංගන ප්‍රවර්ධනය කිරීමේ ලා ශ්‍රී ලංකා තිරසර බලශක්ති අධිකාරිය, ලංකා විදුලි බල මණ්ඩලය සහ ලංකා ඉලෙක්ට්‍රිකල් සමාගම සමග සහයෝගයෙන් "සූර්ය බල සංග්‍රාමය" නමැති නව ප්‍රජා පදනම් බලශක්ති උත්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. මෙමගින් 2020 වන විට මෙවො 200 ක පමණ සූර්ය බලශක්ති ප්‍රමාණයකුත් 2025 වන විට මෙ වො 1000 ක ප්‍රමාණයකුත් ජාතික ජාලයට එක් කිරීමට අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහන යටතේ, පාරිභෝගිකයින්ට තම පරිශ්‍රයන් තුළම විදුලිය උත්පාදනය කිරීමට සහ භාවිතා කිරීමට හැකි වේ. ඔවුන්ට තමන් නිපදවන අතිරික්තය ජාතික ජාලයට අලෙවි කිරීමට හෝ පසුව භාවිතා කිරීමට තැන්පත් කළ හැකිය. විදුලිය භාවිතාව අනුව පාරිභෝගිකයින්ට ක්‍රමයන් තුනක් ඔස්සේ කැමති විකල්පයක් තෝරාගත හැකිය; අතිරික්ත බලශක්තිය ගබඩා කරගැනීම, ලබාගන්නා අතිරික්තය අලෙවි කිරීම හෝ තමන් වැඩියෙන් පරිභෝජනය කරනු ලබන විදුලියට මුදල් ගෙවීම සහ ක්ෂුද්‍ර සූර්ය බලශක්ති නිෂ්පාදක.

තවත් වැදගත් ප්‍රදේශයක් වන්නේ බලශක්ති කාර්යක්ෂමතාව වැඩි කිරීමයි. ඉල්ලුම් පැති කළමනාකරණ ක්‍රියාමාර්ග ඔස්සේ බලශක්ති කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා වැදගත් පියවර කිහිපයක් ගෙන ඇත (ඉලක්කය 7.3) විදුලි බලය සඳහා මුදල් අය කෙරෙනුයේ වැඩිවෙන කාණ්ඩ අය කිරීම් මතයි; කාණ්ඩ ව්‍යුහය සැලසුම් කර ඇත්තේ විදුලි බලය ප්‍රමාණය ඉක්මවා භාවිතා කිරීම අධෛර්යයට පත් කර කාණ්ඩ සීමාවන්ගෙන් පිට විශාල වශයෙන් භාවිතා කරන්නන්ගෙන් වැඩි ඒකක මිලක් අය කෙරෙන ලෙසයි. එබැවින් මිල ව්‍යුහය මගින් විදුලි බලය සංරක්ෂණය කිරීම සඳහා යම් පිටිවහලක් ලැබේ

---

18 තිරසර බලශක්ති අධිකාරිය (2017) බලශක්ති තුලන දත්ත

මෙනිසා CFL විදුලි බුබුළු" LED ආලෝක සූර්ය බලශක්තිය ගබඩා කරගැනීම වැනි බලශක්ති සුරැකුම් තාක්ෂණයන් භාවිතා කිරීම වැඩි වී ඇත. එමෙන්ම, මෙම ව්‍යුහය මගින් කුඩා පරිමාණ පරිශීලකයින්ට, විශේෂයෙන් අඩු ආදායම් ලාභීන්ට සාපේක්ෂව අඩු මට්ටමකින් විදුලි බිල කළමනාකරණය කිරීමට උපකාර කරයි.

රජය විසින් ඉහළ ඉන්ධන කාර්යක්ෂමතාවක් සහිත වාහන වැඩි කිරීම සඳහා බදු ව්‍යුහය භාවිතා කරමින් ප්‍රවාහන අංශය තුළට ෆිස්කල් ප්‍රතිපත්ති හඳුන්වා දී ඇත. මෙයට එන්ජින් ධාරිතාව මත පදනම්වූ බදු අය කිරීම (ඉහළ එන්ජින් ධාරිතාවක් සහිත වාහන සඳහා ඉහළ බදු/ජප3), නිපදවූ දින සිට වාහනයේ කාලය මත පදනම් වූ ආනයන සීමාවන් (වසර 3 කට වඩා අඩු විය යුතුය) සහ වඩා අඩු අනුපාතයකට දෙමුහුන් සහ විද්‍යුත් මෝටර් රථ සඳහ බදු අය කිරීම යනාදිය අයත් වේ. එහි ප්‍රතිඵලයක් ලෙස, 2012 වසරේදී ආනයනය කෙරුණු දෙමුහුන් මෝටර් රථ සංඛ්‍යාව වැඩි වූ ප්‍රවණතාවක් දක්නට තිබිණි.

පරතරයන් සහ අභියෝග

බලශක්ති අංශයේ තිරසර අනාගතය සම්බන්ධ අභියෝගයන් ලෙස පවතින පරතරයන් ගණනාවක් ප්‍රතිපත්ති ලේඛන සහ පාර්ශ්වකරුවන් විසින් හඳුනාගෙන ඇත.

පුළුල්ව ගත් කළ ඒ සියල්ල ප්‍රධාන අභියෝගයන් තුනකට සම්බන්ධ බව පෙනී යයි:ෆොසිල ඉන්ධන බලශක්ති සම්පත් මත බලශක්ති උත්පාදනය සම්බන්ධව වැඩි වශයෙන් රඳා පැවතීම; බලශක්තිය කාර්යක්ෂමව භාවිතා කිරීමට සීමාවන් ඇති කරන ගෘහ සහ ප්‍රවාහන සහ ඉදිකිරීම් යන ප්‍රධාන අංශවල බලශක්තිය භාවිතා කිරීම සම්බන්ධ අභියෝගයන්;මහා පරිමාණයෙන් රජයට හිමි ව්‍යාපාර මගින් පාලනය කරන විදුලි බලය සහ ඛනිජ තෙල්වල දේශීය බලශක්ති අගය දාමයන් හා බැඳි අකාර්යක්ෂමතා.

විදුලි බලය සඳහා වන ඉහළ යන ඉල්ලුම සහ වර්ෂාපතනයේ අවිනිශ්චිතතාවන් නිසා එම ඉල්ලුම සැපයීමට ප්‍රධාන ජල විදුලි බලාගාරවල උත්පාදන පහසුකම්වල සීමාවන් හේතුවෙන් 1990 සිට තාප බලශක්තිය නිපදවීමට සිදු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, තාප උත්පාදනය 60% කට වඩා වැඩි වී ඇති අතර එය වාර්ෂිකව තවත් වැඩි වෙනු ඇති බව පෙනෙන්නට තිබේ. රූප සටහන 4.5 මගින් පෙන්වන පරිදි සමස්ත බලශක්ති මුසුව තුළ ඛණිජ තෙල් මගින් අත්පත් කරගෙන ඇති ප්‍රමාණය 1990 මැද භාගයේ සිට වැඩි වී ඇති බවත් පුනර්ජනනීය බලශක්ති ප්‍රමාණය ක්‍රමිකව අඩු වී ඇති බවත් පෙනී යයි.

4.5 රූපය : මූලික බලශක්ති මුසුව තුළ විවිධ මූලාශ්‍රවල කොටස (1976-2016)



මූලාශ්‍රය: තිරසර බලශක්ති අධිකාරිය (2017)

දැරිය හැකි සහ පිරිසිදු බලශක්තිය සම්බන්ධ පරතරයන් සහ අභියෝග විදුලි සහ බලශක්ති ක්ෂේත්‍රයන්ගේ සීමාවන්ට ඔබ්බෙන් ගමන් කරන බව පාර්ශ්වකරුවන් අවධාරණය කර ඇත. බලශක්තිය පිළිබඳ සමස්ත දර්ශනය තුළ ප්‍රවාහන අංශය විදුලි බල අංශයටත් වඩා වැදගත්ව මතුවන බව පෙනේ. ශ්‍රී ලංකාවේ වාහන ප්‍රමාණය ශීඝ්‍රයෙන් වැඩි වෙන අතර 2000 වසරට වඩා මේ වන විට වාහන තුන්ගුණයකින් වැඩි වී ඇත. එබැවින් ප්‍රවාහන අංශය තුළ ඛණිජ තෙල් සඳහා විශාල ඉල්ලුමක් ඇතිවෙමින් ඇත. සමහර වසරවලදී වාර්ෂික වර්ධනය 12% ක් පමණ වී ඇත. විස්තරවලින් පෙනී යන පරිදි වර්ධනය වාර්තා වන්නේ පුද්ගලික ප්‍රවාහනය තුළයි. පොදු ප්‍රවාහන පද්ධතිය තුළ වන අකාර්යක්ෂමතා, දුම්රිය වැනි විකල්ප ප්‍රවාහන මාදිලි සීමා සහිතව සංවර්ධනය වීම සහ නාගරික ප්‍රදේශවල වැඩිවෙන වාහන තදබදය මෙම තත්වය සඳහ හේතු වී ඇති බව පෙනේ.

තෙල් සහ වායු ගවේෂණය සඳහා අඛණ්ඩ උත්සාහයන් ගනු ලැබුවද ඛණිජ තෙල් සඳහා සහ ගල් අඟුරු සඳහා වැඩි වෙන ඉල්ලුම හමුවේ රට සම්පූර්ණයෙන් රඳා පවතින්නේ ආනයනයන් මතයි. ෆොසිල ඉන්ධන බලශක්ති මූලාශ්‍රයන් මත වැඩි වශයෙන් රඳා පැවතීම ආර්ථිකයට සැලකිය යුතු බරක් ඇති කරන අතර නිත්‍ය පදනමින් ගෙවුම් ශේෂ පීඩන යක් ඇති කරයි. ෆොසිල ඉන්ධන ප්‍රමාණය වැඩි වීම හේතුවෙන් ආනයනයන් සඳහා ඉහළ යන වියදම මෙන්ම මිල වැඩි කිරීමද ආර්ථිකය තුළ ගෙවුම් ශේෂ පීඩනයක් ඇති කරයි. රූප සටහන 4.6 මගින් පෙන්වන්නේ 2007-2016 කාලය තුළ ෆොසිල ඉන්ධන ආනයනයන් ය. ෆොසිල ඉන්ධන ආනයන කිරීම සඳහා වන වියදම වාර්ෂික ආනයන පිරිවැයෙන් 20% ක් වේ. මුළු අපනයන ඉපයුම්වල කොටසක් ලෙස ෆොසිල ඉන්ධන ආනයනය සඳහා වන පිරිවැය සමහර වසරවල අපනයන ඉපයුම්වලින් 50% කට ආසන්න වෙන අතර එමගින් විදේශ ඉපයුම්වලින් අර්ධයක් වැය වන බව පෙන්නුම් කරයි.

4.6 රූපය : ෆොසිල ඉන්ධන ආනයනය (2007-2016)



මූලාශ්‍රය: තිරසර බලශක්ති අධිකාරිය (2017)

.

සමස්තයක් ලෙස, දැරිය හැකි බව සහ පිරිසිදු බව යන ගුණාංග දෙකම
විශේෂයෙන් බලශක්ති උත්පාදන අංශය තුළ ළඟා කරගැනීම
ශ්‍රී ලංකාව තුළ අභියෝගයකි.
මෙම පරතරයන් සහ අභියෝගයන් ජයගැනීමට
ප්‍රවාහන සහ ඉදිකිරීම් අංශ ඇතුළු
ආශ්‍රිත වෙනත් අංශද
ආවරණය කරන විස්තීර්ණ උපාය මාර්ගයන් අවශ්‍ය කෙරේ.

ඉදිරි ගමන් මග

2008 වසරේදී ශ්‍රී ලංකාව විසින් ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සම්පාදනය කරන ලද අතර නව යථාර්ථයන් සැපිරීම සඳහා එය වර්තමානයේ යාවත්කාලීන කෙරෙමින් පවතී. ශ්‍රී ලංකාවේ බලශක්ති අංශය තිරසර සංවර්ධන ඉලක්ක 7 සමග ගැළපීම සඳහා මෙම ප්‍රතිපත්ති කෙටුම්පත සම්පාදනය කෙරී ඇති අතර අදාළ තිරසර සංවර්ධන ඉලක්ක අත් කරගැනීම සඳහා සකස් කර තිබෙන උපාය මාර්ග කිහිපයක් එයට ඇතුළත් වේ. මෙම ජාතික ප්‍රතිපත්තිය මගින් බලශක්ති සුරක්ෂිතතාව, බලශක්ති වෙත ප්‍රවේශය, බලශක්ති කාර්යක්ෂමතාව සහ සංරක්ෂණය, පරිසරය ආරක්ෂා කිරීම, තිරසර බලශක්ති ඉලක්ක අත්කරගැනීම සඳහා ප්‍රධාන ආකාරයකට දායක විය හැකි පුනර්ජනනීය දෑ ප්‍රවර්ධනය කිරීම යනාදී වශයෙන් පුළුල් ක්ෂේත්‍ර ගණනාවක ප්‍රතිපත්තියක් ආවරණය කෙරේ.

සමස්තයක් වශයෙන් ගත් කළ, බලශක්ති අංශය තිරසර මගක් වෙත යොමු කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික යන අංශ දෙකෙහිම පාර්ශවකරුවන් විසින් ගෙන ඇති ධනාත්මක ප්‍රායෝගික පියවර කිහිපයක් පවතී. රජය විසින් ගෙන ඇති මූලාරම්භයන් තුළ පහත දෑ ඇතුළත් වේ: සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සම්පත් ප්‍රවර්ධනය කිරීම හා ඒවා වෙත අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් දරනු ලබන ප්‍රයත්නයන්; විශාල රාජ්‍ය ව්‍යාපාර විසින් පාලනය කරනු ලබන විදුලිය හා ඛනිජ තෙල් නිෂ්පාදන වෙළඳපොල නියාමනය කිරීම සඳහා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් කරනු ලබන මැදිහත්වීම්; ලංකා විදුලිබල මණ්ඩලයේ බලශක්ති ජනන මුසුවට සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය එකතු කරන දායකත්වයේ මන්දගාමී, එහෙත් ක්‍රමානුකූල ප්‍රසාරණය; සැපයුම් කාර්යක්ෂමතාව වර්ධනය කිරීම හා නාස්තිය පහත හෙළීම සඳහා ජාතික බලශක්ති උත්පාදන හා බෙදාහැරීම් පහසුකම්වල යටිතල සම්පත් වැඩි දියුණු කිරීම; තෝරාගත් ක්ෂේත්‍රයන්හි (උදා: මෙහෙයුම් ඉල්ලුම් පැති කළමනාකරණය) බලශක්ති භාවිතයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ඉල්ලුමට අදාළව කළමනාකරණ ක්‍රියාමාර්ග ගැනීම; රට තුළ වේගයෙන් ජනප්‍රිය වෙමින් පවතින හයිබ්‍රිඩ් හා විදුලි බලයෙන් ක්‍රියා කරන වාහන වැනි ඉන්ධන පිරිමැසුම් වාහන සඳහා බදු සහන ලබාදීම සහ; ආලෝකය සපයන බලශක්ති පිරිමැසුම් උපකරණ හා වහල මත සවිකරණ සූර්ය බල පද්ධති (උදා: සූර්ය අතිරික්ත බලශක්තිය ගබඩාකර ගැනීම)වැනි පුනර්ජනනීය බලශක්ති විසඳුම් යොදා ගැනීම පිළිබඳ දැනුවත් කිරීම හා ඒ සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීම.

විවිධ ක්‍රියාමාර්ග තුළින් ගෘහස්ථ සූර්ය බලය සහ සුළං බලශක්තිය වැනි සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කිරීමේ වත්මන් උපායමාර්ගය තිරසර බලශක්ති අරමුණු වෙතට දායක වේ. එයට අමතරව, කාර්යක්ෂම ගෘහස්ථ උපකරණ ප්‍රවර්ධනය කිරීම, ප්‍රමිති හා අනුගත වීම, රෙගුලාසි හඳුන්වාදීම, බලශක්ති නාමාංකනය සහ හරිත ගොඩනැගිලි වැනි ක්‍රියාමාර්ග තුළින් 2020 වසරේදී ගිගා වොට් 1,985 ක් ඉතිරිකර ගැනීම සඳහා මෙහෙයුම් ඉල්ලුම් පැති කළමනාකරණය පිළිබඳ වැඩසටහනක් රජය විසින් දියත් කරන ලදී.

ආනයන කිරීම් හා දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම තුළින් බලශක්ති පිරිමැසුම් නිෂ්පාදන හඳුන්වාදීම (උදා: ආලෝකය සපයන බලශක්ති පිරිමැසුම් උපකරණ, ගෘහස්ථ සූර්ය බලශක්ති පද්ධති) සහ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සම්පාදන පහසුකම් (උදා: සූර්ය බලශක්තිය, කුඩා ජල විදුලි පද්ධති) මත ආයෝජනය කිරීම සඳහා පුද්ගලික අංශය විසින් දරනු ලබන ප්‍රයත්නයන් විසින් ඉහත ක්‍රියාමාර්ග විශාල ප්‍රමාණයකට අනුපූරණය කෙරී ඇත. ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන්ද මෙම තිරසර බලශක්ති භාවිතයේ වටිනාකම පිළිබඳ හඬ නැගීමට ඉදිරිපත්ව සිටිති. මෙවැනි ප්‍රයත්නයන් විශාල පරිවර්තනයක් ඇතිකිරීමට තරම් ප්‍රමාණවත් විය නොහැකි වුවද, තිරසර සංවර්ධන ඉලක්ක 7 ජය ගැනීම සඳහා ඒවා පැහැදිලිවම සතුටුදායක මට්ටමක දායකත්වයක් සපයයි.

මෙවැනි සාධනීය ක්‍රියාමාර්ග පැවතියදීද, තවමත් සමස්ත ප්‍රවණතාව පවතිනුයේ ෆොසිල ඉන්ධන මත වැඩි වැඩියෙන් යැපෙන තත්වයක් දෙසටය. ඒ, ප්‍රධාන වශයෙන්ම, ප්‍රවාහන අංශය වෙතින් වන ඉල්ලුම හේතුවෙනි. එබැවින්, තිරසර සංවර්ධන ඉලක්ක 7 අත්කර ගැනීම සඳහා ප්‍රවාහන අංශය තුළ බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම් අනිවාර්යයෙන් කළ යුතු වේ. ජාතික ප්‍රවාහන ප්‍රතිපත්ති කෙටුම්පත තුළ ප්‍රතිපත්ති මූලධර්ම පහ අතරින් එකක් වශයෙන් බලශක්ති කාර්යක්ෂමතාව සහ පරිසරය ආරක්ෂා කිරීම සැලකිල්ලට ගෙන ඇත්තේ මේ අයුරිනි, "......තිරසර අයුරින් හා පරිසරයට ඇති කරන හානි අවම වන අයුරින් සියලුම ප්‍රවාහන මාධ්‍ය කාර්යක්ෂම හා පිරිවැය පිරිමැසුම් බලශක්ති ප්‍රතිපත්තියක් වෙත මෙහෙයවිය යුතුය." රජය විසින් 2016 වසරේදී බස්නාහිර පළාත් මහ නගර ප්‍රවාහන කටයුතු පිළිබඳ ප්‍රධාන සැලැස්ම සකස් කොට ඇත. දුර්වල තත්වයක පවතින පොදු ප්‍රවාහන පහසුකම් හේතුවෙන් මගීන්ට ඇතිවන අපහසුතා මග හැරීම සඳහා ශීඝ්‍රගාමී සංක්‍රමණික පද්ධතියක් පිහිටුවීමට එමගින් යෝජනා කෙරී ඇති අතර මධ්‍යම ව්‍යාපාරික ප්‍රදේශ නගරබද ප්‍රදේශ හා යාකරන සැහැල්ලු දුම්රිය සේවා ජාලයක්ද එයට ඇතුළත් වේ. තවද, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශය විසින් ශ්‍රී ලංකාව සඳහා ඉන්ධනවල ගුණාත්මකභාවය පිළිබඳ සැලසුම් කෙටුම්පතක් සකස් කොට ඇති අතර යූරෝ 4 ප්‍රමිතීන් හා අනුකූලවන පරිදි ශ්‍රී ලංකාවේ ඉන්ධනවල ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රමිතීන් ඉහළ නැංවීමට එමගින් යෝජනා වී ඇත. තිරසර බලශක්ති අරමුණු ජයගැනීමේ අරමුණද ඇතිව උපායමාර්ගික වශයෙන් සැලසුම් කර තිබේ නම්, පොදු ප්‍රවාහන සේවා අංශය තුළට කරනු ලබන එවැනි ආයෝජන මගින් දෙපාර්ශවයටම ජය ලැබෙන විසඳුම් ලැබිය හැකිය.

හරිත ගොඩනැගිලි යනු, උපායමාර්ගික වශයෙන් වැදගත් වන තවත් අංශයකි. නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෑතකදී හරිත ගොඩනැගිලි පිළිබඳ මෙහෙයුම් නිර්ණායක සංවර්ධනය කර ඇත. අනාගතයේදී රජයේ ගොඩනැගිලි සංවර්ධන කටයුතුවලදී හරිත ගොඩනැගිලි සංකල්ප යොදාගැනීමේ අභිලාෂය රජය විසින් ප්‍රකාශයට පත් කර ඇත. සමස්තයක් වශයෙන් ගත් කළ, තිරසර බලශක්ති උපායමාර්ගයක් වෙත යොමු වූ උපායමාර්ගික අංග කිහිපයක් ක්‍රමයෙන් ක්‍රියාවට නැංවෙන තත්වයක් දක්නට ඇත. මෙහිදී මතුවන අභියෝගය වනුයේ බලශක්ති ක්ෂේත්‍රය තුළ සැබැවින්ම තිරසර පරිවර්තනයක් අත්කරගැනීමට හැකි වන අයුරින් එවැනි සියලුම උපායමාර්ගික ක්‍රියාමාර්ගවල ශක්තිය වර්ධනය කිරීම වේ.

වත්මන් තත්වය සහ ප්‍රවණතා

නිල සංඛ්‍යාලේඛනවලට අනුව, ශ්‍රී ලංකාව තුළ නාගරීකරණය සිදුවන්නේ මන්දගාමී අයුරිනි.[19] කෙසේවුවද, ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ 2050 සැලැස්ම (කෙටුම්පත) මගින් ඉදිරිපත් කෙරෙන අදහස වනුයේ, ශ්‍රී ලංකාවේ නාගරීකරණය එයටම අනන්‍ය වූ ආකාරයකට සිදුවන බවත් නාගරික ප්‍රදේශ වශයෙන් නිශ්චිතව නම් කළ ප්‍රදේශවලින් දුර බැහැරව වාසය කරන බොහෝ ජනතාව නාගරික ජීවන රටාවන් වැළඳගෙන ඇති බවත් වේ. ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියෙහි සහ 2050 සැලැස්මෙහි (කෙටුම්පත) තක්සේරුවලට අනුව,රටේ ජනගහනයෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් 60% කට වඩා නාගරීකරණය වී ඇති අතර මුළු භූමි ප්‍රදේශයෙන් දහයෙන් එකක පමණ ප්‍රදේශයක් තුළ ඒකරාශි වී සිටිති.[20]

පූර්වානුමානයන්ට අනුව, 2030 වසර වන විට ජනගහනයෙන් 80% ක් පමණ 80% කට වඩා වැඩි ප්‍රමාණයකට නාගරීකරණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.[21] (11.3 ඉලක්කය). අනෙකුත් බොහෝ රටවල මෙන්, ශ්‍රී ලංකාව තුළද නාගරීකරණය හේතුවෙන් ප්‍රධාන වශයෙන් නිවාස පහසුකම් සැපයීම, ප්‍රවාහනය සහ පාරිසරික කළමනාකරණය හා ආශ්‍රිතව අභියෝග පැන නැගී ඇත.

රජය සහ පෞද්ගලික අංශය විසින් ක්‍රියාවට නංවනු ලබන නිවාස පහසුකම් සැපයීමේ ව්‍යාපෘති හේතුවෙන් ස්ථිර නිවාසවල ජීවත්වන ජනගහන ප්‍රතිශතය අතින් ශ්‍රී ලංකාව මනා ප්‍රගතියක් අත්කර ගෙන තිබේ. සංගණනවලට අනුව, මෙම ප්‍රතිශතය 1981 වසරේදී 42% ක ප්‍රමාණයක සිට 2012 වසරේදී 81% ක ප්‍රමාණයක් දක්වා ඉහළ ගොස් ඇත. 2012 වසරේ ජන හා නිවාස සංගණනයට අනුව ,ජනගහනයෙන් 17.8% සහ 0.8% ක ප්‍රමාණයක් අර්ධ ස්ථිර හෝ තාවකාලික ද්‍රව්‍ය භාවිතා කොට ඉදිකරනු ලබන නිවාසවල ජීවත් වෙති.[22] 11.1 ඉලක්කය අනුව, මුඩුක්කු නිවාසවල ජීවත්වන්නේ ජනගහනයෙන් 0.8% ක් පමණි.

ඒ අනුව, 2016 වසරේදී පවත්වන ලද නිවාස අවශ්‍යතා තක්සේරුව හා දත්ත සමීක්ෂණය[23] මගින් තාවකාලික නිවාස සංඛ්‍යාව (80,615) ඉහළම අගයක් ගන්නේ කොළඹ දිස්ත්‍රික්කය තුළ බව දක්වනු ලබයි. එයට අමතරව, ඉඩම් හිමිකාරීත්වයක් නොමැති නිවාස නොමැති පවුල් සංඛ්‍යාවද ඉහළම අගයක් ගන්නේ කොළඹ දිස්ත්‍රික්කයේ වන අතර ගම්පහ සහ යාපනය දිස්ත්‍රික්ක දෙවන හා තෙවන ස්ථාන හිමි කර ගනී. (සටහන 4.7)

---

19 Ellis, Peter; Roberts, Mark. 2016. Leveraging Urbanization in South Asia: Managing Spatial Transformation for Prosperity and Livability. Washington, DC: World Bank

20 යාවත්කල ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම 2050 (කෙටුම්පත), ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, 2018 පෙබරවාරි

21 යාවත්කල ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම 2050 (කෙටුම්පත), ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, 2018 පෙබරවාරි

22 ශ්‍රී ලංකාවේ තිරසර ඉලක්ක දර්ශකයන්හි තත්වය 2017, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

23 නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය (2016), නිවාස අවශ්‍යතා තක්සේරුව සහ දත්ත සමීක්ෂණය 2016

නාගරික ප්‍රදේශවල නිවාස සඳහා පවතින ඉහළ යන ඉල්ලුම සැපිරීම සඳහා 2016 වසරේ සිට වසර පහක් ඇතුළත පහළ හා මධ්‍යම මට්ටමේ ආදායම් ලබන කණ්ඩායම් වෙත නිවාස ඒකක 50,000 ක් සැපයීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් ව්‍යාපෘතියක් දියත් කොට ඇත. 2018 අප්‍රේල් මාසය වන විට නිවාස 6,953 ක් ඉදිකොට ඒවායේ අයිතිකරුවන් වෙත භාර දී ඇත. නාගරික සංවර්ධන අධිකාරියට අනුව, 2018 වසරේදී තවත් නිවාස ඒකක 5,680 ක ඉදිකිරීම් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. මෙම මුල පිරීම යටතේ නිවාස ව්‍යාපෘති කිහිපයක් දියත් කොට ඇති අතර රජයේ සේවකයින් සඳහා වන නිවාස යෝජනා ක්‍රමය ඒ අතරින් එකකි.

4.7 රූපය: ශ්‍රී ලංකාවේ නිවාස නොමැති සහ ඉඩම් නොමැති පවුල් සංඛ්‍යාව



මූලාශ්‍රය: නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය

ප්‍රවාහනය යනු යටිතල පහසුකම් සහ සේවා සැපයුම යන අංශ දෙකම විශාල ලෙස වැඩි දියුණු කළ යුතු ඉතා වැදගත් ක්ෂේත්‍රයකි. මුළු මෝටර් ප්‍රවාහනයෙන් 47% කට ආසන්න ප්‍රමාණයක් (11.2 ඉලක්කය) අත් කර ගන්නා බස් රථ මගින් කෙරෙන ප්‍රවාහන කටයුතු මෙහිදී වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර රජයේ බස් රථ මගින් කෙරෙන ප්‍රවාහන කටයුතු 8.4% ක දායකත්වයක් සපයයි. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් රට තුළ රජයේ බස් රථ මගින් කෙරෙන ප්‍රවාහන කටයුතු හසුරුවනු ලබයි. පුද්ගලික බස් රථ නියාමනය කිරීම ජාතික ගමනාගමන කොමිෂන් සභාව සහ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරීන් විසින් සිදු කරනු ලබයි. පසුගිය වසර කිහිපය තුළ පොදු ප්‍රවාහන සේවා භාවිතා කරන මගීන් සංඛ්‍යාව ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කරන අතර ඒ සම්බන්ධ සංඛ්‍යාලේඛන දැක්විය හැකිය (සටහන 4.8)

4.8 රූපය: පොදු ප්‍රවාහන සේවා භාවිතා කරන මගීන් සංඛ්‍යාවේ වර්ධනය



මූලාශ්‍රය: ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛන 2016

මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් මාර්ග තදබදය, නිවාස පහසුකම්, භෞතික යටිතල පහසුකම්, පොදු පහසුකම්, විනෝදාස්වාද කටයුතු සහ නගර ආර්ථිකය හා සම්බන්ධ ගැටළු කෙටි කාලීන පදනමකින් විසඳීම සඳහා වැඩසටහන් ක්‍රියාවට නංවනු ලබයි. රටේ බස්නාහිර පළාතේ උපායමාර්ගික වශයෙන් වැදගත් නගර ප්‍රදේශ 21 ක් සංවර්ධනය කිරීම සඳහා මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් "සුකිත පුරවර" වැඩසටහන ආරම්භ කොට තිබෙන අතර මේ වනවිට රට පුරා තවත් නගර ප්‍රදේශ සංවර්ධනය කිරීම සඳහා එම වැඩසටහන පුළුල් කොට ඇත.

පොදු ප්‍රවාහන සේවා භාවිතා කරන්නන් සංඛ්‍යාව ඉහළ යන තත්වයක් පැවතියදීද පොදු ප්‍රවාහන සේවාවන්හි ගුණාත්මක භාවයේ පවතින අඩුපාඩු වත්මන් ක්‍රමය තුළ පවතින විවිධ අකාර්යක්ෂමතාවන්ට හේතු වන බව පාර්ශවකරුවන් වෙතින් අදහස් විමසා බැලීමේදී පෙන්වා දෙන ලද කාරණයක් විය. ප්‍රවාහන සේවාවන්හි ගුණාත්මකභාවය දුර්වල මට්ටමක පැවතීම, මධ්‍යම මට්ටමේ ආදායම් ලබන පවුල් පුද්ගලික ප්‍රවාහන මාධ්‍ය භාවිතය වෙත තල්ලු කර දමන ප්‍රධාන සාධකයක් වේ යැයි පාර්ශවකරුවෝ සඳහන් කළහ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, නාගරික ප්‍රවාහන ගැටළු රාශියකට තුඩු දෙමින් 2000 වසරේ සිට රට තුළ වාහන සංඛ්‍යාව තුන් ගුණයකින් ඉහළ ගොස් තිබේ. මෙම තත්වය හඳුනාගත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සමාජයේ විවිධ කොටස් වෙත විශ්වසනීය ප්‍රවාහන සේවාවන් සැපයීම සඳහා වැඩසටහන් කිහිපයක් පහත පරිදි දියත් කර ඇත.

i. ගැමි සැරිය ව්‍යාපෘතිය: 2008 වසරේදී ආරම්භ කරන ලද මෙම ගැමි සැරිය ව්‍යාපෘතියෙහි අරමුණ වනුයේ ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රවාහන පහසුකම් නොමැති ජනතාව වෙත විශ්වසනීය හා ලාබදායී මගී ප්‍රවාහන සේවාවන් සැපයීමයි.

ii. නිසි සැරිය ව්‍යාපෘතිය: රාත්‍රී කාලයේදී විශ්වසනීය හා අඛණ්ඩ පොදු බස් රථ සේවාවක් සැපයීම මෙහි අරමුණ වේ.

iii. සිසු සැරිය: පාසල් දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක වන මෙම සිසු සැරිය ව්‍යාපෘතිය මගින් විශ්වසනීය හා සහනදායී බස් රථ සේවාවක් සැපයීම අරමුණ කෙරේ.

තවද, මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් තෝරාගත් මාර්ගවල බෙහෙවින් තදබදය පවතින වේලාවන් සඳහා බස් රථ ප්‍රමුඛතා මං තීරු ක්‍රමය හඳුන්වා දී තිබේ.

ස්වභාවික ආපදා නිතර සිදු වීම හා ඒවායේ ප්‍රබලතාව ඉහළ යාමද රටෙහි බොහෝ ආර්ථික අංශ විසින් මුහුණදෙනු ලබන ප්‍රධාන ගැටළුවකි. උදාහරණ ලෙස, 2016 වසරේ මැයි මස මැද භාගයේදී ශ්‍රී ලංකාවට ඇද හැළුණු අධික වර්ෂාව දිස්ත්‍රික්ක 25 න් දිස්ත්‍රික්ක 24කටම බලපෑවේය. 2016 මැයි මස සිදුවූ ආපදා සම්බන්ධයෙන් සිදු කරන ලද පශ්චාත් ආපදා අවශ්‍යතා තක්සේරුව මගින් පෙන්නුම් කරනුයේ රටට සිදුවූ හානි සහ පාඩුවල සමස්ත තක්සේරුව පිළිවෙලින් රු. මිලියන 87,027 හා රු. මිලියන 12,816 කට අධික වූ බවයි. භෞතික වත්කම්වලට සිදු වූ හානිය සහ නිෂ්පාදන ප්‍රවාහවල පාඩු වශයෙන් මිනුම් කරනු ලබන ආර්ථික බලපෑම 2015 වසරේදී දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.11% ක් සහ 0.78% ක් ලෙස තක්සේරු කර ඇත. හානි සහ පාඩු එක්ව ඇති කරන බලපෑම්වල ඉහළම අගය සාමාජීය අංශ තුළ වූ අතර අනතුරුව නිෂ්පාදන අංශ හා යටිතල පහසුකම් අංශ තුළ විය. මෙම සිදුවීම හේතුවෙන් මරණ 93 ක්ද පුද්ගල අතුරුදහන් වීම් 117 ක්ද සිදුවිය (ඉලක්කය 11.5).[24] මිනිස් ක්‍රියාකාරකම් සහ නිර්මිත පරිසරය දැඩි ලෙස ඒකරාශී වී පැවතීම හේතුවෙන්, කාලගුණික වෙනස්කම් මගින් ඇතිවන ආපදාවන්ට නාගරික ප්‍රදේශ වැඩි වශයෙන් ගොදුරු වේ. මේ අනුව, ආපදා මගින් මිනිස් ජීවිත සහ ආර්ථිකමය දේපළවලට බරපතල ඵල විපාක ගෙනදිය හැකිය. මෙට්‍රෝ කොළඹ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ, මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් කොළඹ ජල ද්‍රෝණිය තුළ ගං වතුර හා ජලාපවාහන කළමනාකරණය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රමුඛතාව දී කටයුතු කරයි.

වායු දූෂණය, ශ්‍රී ලංකාවේ කොළඹ සහ මහනුවර වැනි ඇතැම් නාගරික ප්‍රදේශවල මතුවිය හැකි පාරිසරික ගැටළුවක් වශයෙන් හඳුනාගැනීම ඉහළ යමින් පවතී. කෙසේවුවද, වායු තත්ව කළමනාකරණ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කිරීම හේතුවෙන්, ඇතැම් දර්ශක අතින් ගත්විට වායු තත්ත්වයේ වැඩි දියුණු වීමක් පවතී. 2008 වසරේදී දියත් කරන ලද වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන වාතයේ PM 10 අන්තර්ගතය 62-65 µg/m3.[25] දක්වා අඩු කිරීමට උපකාරී වී ඇත. වර්තමානයේදී, ශ්‍රී ලංකාවේ මනිනු ලබන්නේ PM 10 මට්ටම පමණක් වන අතර මිනුම් කොළඹ නගරයට සීමා වේ. අවශ්‍ය උපකරණ නොමැති වීම හේතුවෙන් වර්තමානයේදී PM 2.5 අගය මනිනු ලබන්නේ නැත. තෝරාගත් ස්ථානවල පරිවේෂී වායු තත්වය (PM 10 සහ PM 2.5 යන දෙකම ඇතුළත්) මැනීම සඳහා ජංගම අධීක්ෂණ මධ්‍යස්ථානයක් පවතින නමුත් වායු දූෂණය පිළිබඳ විධිමත් දත්ත උත්පාදනය කිරීම සඳහා එය ප්‍රමාණවත් නොවේ. මේ අයුරින් අවශ්‍ය උපකරණ නොමැති වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ නාගරික වායු තත්වය මැනීම විශාල වශයෙන් සීමා වී ඇත (ඉලක්කය 11.6). වායු දූෂණය පහත හෙළීම සම්බන්ධයෙන් පිරිසිදු වාතය 2025 ක්‍රියාකාරී සැලැස්ම මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් සකස් කොට දියත් කොට තිබේ. මෙම ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීමේ වගකීම වායු සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය විසින් දරනු ලබයි.

නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය ශ්‍රී ලංකාව තුළ බරපතල පාරිසරික ගැටළුවක් වශයෙන් මතුවී තිබේ. අධික ජනගහනයක් පවතින නාගරික ප්‍රදේශ තුළ ඝන අපද්‍රව්‍ය විශාල ප්‍රමාණවලින් හා අධික වේගයකින් ජනනය වන අතර මෙම කසල තොගය බැහැර කිරීම රට පුරා සියලු නගර හා මහනගර බල ප්‍රදේශවලට විශාල බරක් වී ඇත. ශ්‍රී ලංකාව තුළ ජනනය වන අපද්‍රව්‍ය ප්‍රමාණය 1999 වසරේදී දිනකට ටොන් 6,400 පමණ ප්‍රමාණයක සිට 2009 වසරේදී දිනකට ටොන් 10,786 පමණ දක්වා ඉහළ ගොස් තිබේ. රට තුළ එකතු වන අපද්‍රව්‍ය ප්‍රමාණයට වැඩි වශයෙන්ම (33%) දායක වනුයේ බස්නාහිර පළාතයි. එම පළාත තුළ අපද්‍රව්‍ය එක් රැස් කිරීමේ වේගය 51% ක් ලෙස වාර්තා වේ (ඉලක්කය 11.6).[26] මෙට්‍රෝ කොළඹ කලාපය, නගර අවට ප්‍රදේශ සහ පුත්තලම දිස්ත්‍රික්කයේ එක් රැස් කෙරෙන අපද්‍රව්‍ය අවසන් වරට බැහැරකරලීමේ පහසුකම් සැපයීම සඳහා මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය අරුවක්කලු හි ආරම්භ කොට තිබේ.

පරතරයන් සහ අභියෝග

සැලසුමකට අනුව සිදු නොකෙරෙන නාගරික සංවර්ධන කටයුතු ශ්‍රී ලංකාව තුළ ගැටළු හා අභියෝග පෙළක්ම ඇතිවීමට හේතු වී තිබේ. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ 2050 සැලැස්ම වර්තමානයේදී සංශෝධනය කෙරෙමින් පවතී. සංවර්ධන ක්‍රියාකාරකම් සැලසුම්කිරීම හා ක්‍රියාවට නැංවීම සඳහා ජාතික මට්ටමේ පුළුල් මාර්ගෝපදේශනයක් සියලු සංවර්ධන නියෝජිතායතන වෙත සැපයීම මෙම ප්‍රතිපත්තිය මගින් අරමුණු කෙරේ. ආපදා අවදානම පහත හෙළීම සඳහා, නාගරික සැලසුම් ප්‍රතිපත්තිය, කාලගුණ විපර්යාස පිළිබඳ ප්‍රතිපත්තිය සහ ආපදා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය තුළට කාලගුණික විපර්යාස පිළිබඳ සැලකිලිමත් වීම්ද ඇතුළත් කිරීමට වහාම පියවර ගත යුතු වේ.

24 ශ්‍රී ලංකා පශ්චාත් ආපදා අවශ්‍යතා තක්සේරුව, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය, කොළඹ

25 පිරිසිදු වාතය 2025: වායු තත්ව කළමනාකරණය සඳහා වන ක්‍රියාකාරී සැලැස්මක්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, 2016 මැයි

26 ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (2016), ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දත්ත රැස්කිරීමේ සමීක්ෂණයේ අවසන් වාර්තාව

නිවාස පහසුකම් සැපයුම් අංශය සැලකිල්ලට ගත් විට, නිවාස ජනතාවට මිලට ගත හැකි සාධාරණ මිල ගණන් සහිත වීම හා ගුණාත්මක තත්වයේ පැවතීම සහතික කරන අතරම ශීඝ්‍ර නාගරීකරණය සහ වර්ධනය වන මධ්‍යම පන්තිය හේතුවෙන් ඇතිවන ඉල්ලුම සැපිරීම එම අංශය තුළ ප්‍රධාන අභියෝගයක් බවට පත්ව ඇත. තවද, සුදුසු තත්වයේ පවතින ඉඩම් සීමා සහිත වීම, පුහුණු කම්කරුවන්ගේ හිඟය සහ නිවාස ඉදිකිරීම සඳහා වැයවන අධික පිරිවැය යනාදී ගැටළුද ඒ හා බැඳී තිබේ. බස්නාහිර පළාත් මහනගර සංවර්ධන ව්‍යාපෘතිය, උපායමාර්ගික නගර සංවර්ධන වැඩසටහන සහ නාගරික පුනර්ජීවන වැඩසටහන යනාදිය නාගරීකරණය හා ආශ්‍රිත ගැටළු බොහොමයකට විසඳුම් ලබාදීමේ අරමුණින් ක්‍රියාත්මක වන වැදගත් ව්‍යාපෘතීන් වේ.

නාගරික ප්‍රදේශයන්හි පවතින රථ වාහන තදබදය, පොදු ප්‍රවාහන සේවය ප්‍රවර්ධනය කිරීම, මාර්ග හදිසි අනතුරු අවම කිරීම මගින් මාර්ග ආරක්ෂාව වැඩි දියුණු කිරීම, රට තුළ ඉහළ යන වාහන සංඛ්‍යාව කළමනාකරණය කිරීම සහ රථ වාහන වායු විමෝචනය පහත හෙළීම යනාදිය ප්‍රවාහන අංශය තුළ පවතින ප්‍රධාන අභියෝග වේ. ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රවාහන ප්‍රතිපත්ති කෙටුම්පතෙහි (2018 ජනවාරි) ඉලක්ක 11.2 ඉලක්කය හා අනුකූල වේ. එමෙන්ම, ප්‍රවාහන අංශයේ සිදුකරන සංවර්ධනයන්හිදී කාලගුණය හා ආපදාවකින් පසු නැවත යථා තත්වයට පත්වීම යන කාරණාද මෙම ප්‍රතිපත්තිය මගින් සැලකිල්ලට ගනී.

එයට අමතරව, මෙහෙයුම් වේගය ඉහළ දැමීම, නව දුම්රිය මාර්ග ඉදිකිරීම ආදී ක්‍රම මගින් දුම්රිය ප්‍රවාහන අංශය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාත්මක වන වැඩසටහන් කිහිපයක් පවතී. මාර්ග ආරක්ෂාව, ශ්‍රී ලංකාවේ ප්‍රවාහන අංශය තුළ තවමත් ප්‍රධාන වශයෙන් සැලකිල්ලට ලක්වන කරුණකි. 2013 වසරේදී, ශ්‍රී ලංකාවේ තක්සේරු කරන ලද මාර්ග රථවාහන මරණ අනුපාතය (ජනගහනය 100 000 කට) 17.4 ක් වුණු අතර ඒ අනුව රටවල් 179 ක් අතරින් ශ්‍රී ලංකාව 99 වන ස්ථානයේ සිටී. 2015 වසර තුළදී මාර්ග හදිසි අනතුරු 38,107 ක් පමණ වාර්තා වී ඇති අතර ඉන් 2600 ක් මාරාන්තික අනතුරු විය.

අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ගත් විට, බොහෝ ප්‍රාදේශීය අධිකාරීන් විසින් යොදා ගනු ලබන බැහැර කිරීමේ සාමාන්‍ය ක්‍රමය 'විවෘත භූමියකට කසල ගෙනැවිත් දැමීම' වේ. අපද්‍රව්‍ය මෙලෙස විවෘත භූමියකට ගෙනැවිත් දැමීම හේතුවෙන් ඇතිවන පාරිසරික හා සනීපාරක්ෂක උපද්‍රව සහ නාගරික සීමාවන් තුළ වැඩි වැඩියෙන් ජනගහනය ඇතිවීම නිසා කසල බැහැර කිරීමට සුදුසු ප්‍රදේශ සොයාගැනීමේ දුෂ්කරතාව මෙහිදී මතුවන සැලකිය යුතු මට්ටමේ ගැටළු වේ. මෙසේ නගර වාසීන් විසින් අක්‍රමවත් අන්දමින් කසල බැහැර කිරීම හේතුවෙන් ජල දේහ සහ අනෙකුත් පාරිසරික වශයෙන් වැදගත් වාසස්ථාන දූෂණය වීම සිදු වේ. තම ප්‍රදේශ තුළ කසල කළමනාකරණය සිදු කරගැනීම සඳහා ප්‍රාදේශීය අධිකාරීන් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවක් මේ අනුව පැන නැගී තිබේ.

ඉදිරි ගමන්මග

ශ්‍රී ලංකාවේ නගරවල තිරසර බව ඉහළ නැංවීම සඳහා, සංකලිත ප්‍රවේශයක් තුළින් විසඳුම් සෙවිය යුතු අංශ ගණනාවක වැඩි දියුණු කිරීම් සිදු කිරීම අවශ්‍ය වේ. එවැනි සංකලිත ප්‍රවේශයක මූලිකාංග විය යුත්තේ, අවකාශමය හා භෞතික සැලසුම්කරණ ක්‍රියාවලිය සුසංවිධිත කිරීම, පොදු ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ යටිතල පහසුකම් හා සේවයේ ගුණාත්මක බව සංවර්ධනය කිරීම, ආපදාවකට පසු යළි යථා තත්වයට පත්වීමේ හැකියාව ඉහළ නංවීම සහ අපද්‍රව්‍ය කළමනාකරණය වැනි නාගරික සේවා වැඩි දියුණු කිරීම යනාදියයි.

පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතිව ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ 2050 සැලැස්ම වර්තමානයේදී යාවත්කාලීන කෙරෙමින් පවතී. ඒවා නිල වශයෙන් භාවිතා කිරීමට ගත් විට, රට තුළ සියලු සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා සමස්ත මෙහෙයුම් නිර්ණායකයක් ඒවා මගින් සැපයෙනු ඇත. ප්‍රාදේශීය හා ආංශික අනාගත සැලසුම් සියල්ලම ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය අනුව සංවර්ධනය කළ යුතු අතර පවතින ඒවා ඒ අනුව නැවත ගැළපුම් කළ යුතු වේ. සියලු සංවර්ධන නියෝජිතායතනයන්ට සැලසුම හා ප්‍රතිපත්තිය තුළ දක්වා තිබෙන උපදෙස් අනුව කටයුතු කිරීමට සිදු වනු ඇත. සැලසුම්කරණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අදාළ නියෝජිතායතන තුළ අවශ්‍ය ධාරිතා සංවර්ධනයන්ද සිදු කළ යුතු වේ.

පොදු ප්‍රවාහන පද්ධතිය තුළ සැලකිය යුතු මට්ටමේ වැඩිදියුණු කිරීම් සිදුකිරීම පද්ධතිය තුළ පවතින වත්මන් අකාර්යක්ෂමතා මැඩපැවැත්වීම සඳහා අත්‍යවශ්‍ය වේ. මෙය වනාහී ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ මෙන්ම මහ ජනතාවගේද අවධානය යොමු වූ අංශයකි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පසුගිය දශකය තුළ ප්‍රවාහන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා මහා පරිමාණ රාජ්‍ය ආයෝජන සිදු කෙරී ඇති අතර රට තුළ ප්‍රවාහනය, මාර්ග හා මහා මාර්ග සහ නාගරික සංවර්ධනය යන අංශ සම්බන්ධයෙන් වගකීම දරන අමාත්‍යාංශ සහ රේඛීය නියෝජිතායතන විසින් සැලසුම්/ ව්‍යාපෘතීන්/ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කෙරෙමින් පවතී.

ප්‍රවාහන සේවාවන් සහ යටිතල පහසුකම් ආන්තික ස්වරූපයක් ගන්නා බවක් පෙනේ. එබැවින්, පොදු ප්‍රවාහන පද්ධතියෙහි සමස්ත කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහාත් පාරිසරික හායනය වැනි අහිතකර බලපෑම් පහත හෙළීම සඳහාත්, දැනට ගනු ලබමින් පවතින ප්‍රයත්නයන් වඩාත් යහපත් අන්දමින් සම්බන්ධීකරණය කිරීම හා අනුකලනය කිරීම අවශ්‍ය වේ. මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් කොට්ටාව නගරයෙහි බහු මාදිලි ප්‍රවාහන මධ්‍යස්ථානයක් ඉදි කොට ඇති අතර තවත් ප්‍රධාන නගර කිහිපයකද එවැනි මධ්‍යස්ථාන කිහිපයක් පිහිටුවීමට සැලසුම් කොට ඇත. තවද, සැහැල්ලු දුම්රිය මාර්ග හතරක්ද රට අභ්‍යන්තර ඒකාබද්ධ ජල ප්‍රවාහන පද්ධතීන් කිහිපයක්ද කොළඹ අගනගර ප්‍රදේශය තුළ ඉදිකිරීමට සැලසුම් කොට තිබේ.

නාගරික සැලසුම් ප්‍රතිපත්තිය තුළට ආපදා කළමනාකරණය සහ දේශගුණික විපර්යාස බලපෑම් ඇතුළත් කළ යුතුව තිබේ. මේ සඳහා දේශගුණික විපර්යාස පිළිබඳ සලකාබැලීම් සියලු මට්ටම්වලදී නාගරික සැලසුම්කරණය තුළට අනුකලනය කිරීම අවශ්‍ය වේ. ජාතික පාර්ශවකරුවන් සහ ප්‍රාදේශීය අධිකාරීන් සතුව ප්‍රාදේශීය මට්ටම්වලින් දේශගුණික විපර්යාසවල බලපෑම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා පවතින ධාරිතාව ශක්තිමත් කළ යුතුය. ආපදා ආශ්‍රිත හානි සහ පාඩු අවම කිරීම සඳහා ආපදාවන්හි බලපෑම අඩු කිරීම සහ ආපදාවලට මුහුණ දීම සඳහා පවතින සූදානම වැඩි දියුණු කළ යුතු වේ. සියලු යටිතල පහසුකම් සංවර්ධන ක්‍රියාකාරකම්වලදී, ආපදාවකට පසු නැවත යථා තත්වයට පත්වීමේ හැකියාව පිළිබඳ සලකා බැලිය යුතු අතර ඒ, ආපදාවන්හි ආර්ථිකමය අලාභ අවම කිරීමේ සඳහා වේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2018 - 2030 සකස් කර තිබෙන අතර එය කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය. එම සැලස්ම ප්‍රධාන විෂයය පථ හතරක් මත පදනම් වී තිබේ. ඒවා නම්, (1) ආපදා අවදානම අවබෝධකරගැනීම (2) ආපදා අවදානම කළමනාකරණය කිරීම සඳහා පාලනය ශක්තිමත් කිරීම (3) ආපදාවකින් පසු නැවත යථා තත්වයට පත්වීම සඳහා ආපදා අවදානම මත ආයෝජනය කිරීම (4) "වඩාත් යහපත් අන්දමින් නැවත ගොඩනැගීම" සඳහා ප්‍රකෘති තත්වයට පත්වීම, නැවත ඉදිකිරීම සහ පුනරුත්ථාපනය සම්බන්ධයෙන් ඵලදායී අන්දමින් ප්‍රතිචාර දැක්වීම සඳහා ආපදාවන්ට මුහුණ දීමේ සූදානම ඉහළ නැංවීම.

ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ 2050 සැලැස්ම මගින් සියලු සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා මෙහෙයුම් නිර්ණායක සැපයෙනු ඇති අතර සියලු සංවර්ධන නියෝජිතායතන ඒ අනුව කටයුතු කළ යුතු වේ. එමෙන්ම, අදාළ නියෝජිතායතනයන්හි සියලුම නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනයද සිදු කිරීම අවශ්‍ය වේ.

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මිනින්දෝරු දෙපාර්තමේන්තුව සමග එක්ව නාගරික මධ්‍යස්ථාන සඳහා 1: 5000 පරිමාණයේ ඩිජිටල් පාදක සිතියම් සකස් කොට තිබේ. නාගරික මධ්‍යස්ථාන තුළ සංවර්ධන සැලසුම් සකස්කිරීමේදී ආපදා තොරතුරු එයට ඇතුළත් කිරීම සඳහා මෙම සිතියම් භාවිතා කළ හැකිය.

ශ්‍රී ලංකාවේ නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා බහු උපායමාර්ග ප්‍රවේශයක් අවශ්‍ය වේ. එහිදී අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සුදුසු නෛතික රාමු, ආයතනික නිල නියෝග සහ තාක්ෂණික ප්‍රමිතීන් ස්ථාපිත කිරීම අවශ්‍ය වේ. ජනනය වන ස්ථානවලදීම කසල විධිමත්ව හැසිරවීම කෙටි කාලීන උපායමාර්ගයක් වශයෙන් යොදාගත යුතුය. සනීපාරක්ෂක අයුරින් කසල දමා ඉඩම් ගොඩ කිරීම, අපද්‍රව්‍යවලින් වෙනත් දෑ නිපදවීම සඳහා වන ප්‍රවේශයන් සහ තිරසර අන්දමින් පරිභෝජනය සිදු කිරීම සඳහා චර්යාමය වෙනස්කම් ඇති කරගැනීම පිළිබඳ මධ්‍ය කාලීන හා දිගු කාලීන ප්‍රතිපත්ති කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION

වත්මන් තත්ත්වය සහ ප්‍රවණතා

තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය ආර්ථික හා සාමාජීය ජීවිතයේ බොහෝ අංශ පුරා පැතිර යන්නකි. එබැවින්, තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය යනු තනි අමාත්‍යාංශයක් හෝ රේඛීය නියෝජිතායතනයක් විසින් සිදු කරනු ලබන මැදිහත්වීම් තුළින් පමණක් අත්කරගත නොහැක්කකි. සියලු ආර්ථික අංශ තුළ තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය හා සම්බන්ධයෙන් සමස්ත මගපෙන්වීම සිදු කරන, තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති කෙටුම්පත සකස් කිරීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය නායකත්වය ගෙන කටයුතු කරයි. මේ යටතේ, අදාළ ජාතික ප්‍රතිපත්ති 46 ක් පමණ සමාලෝචනය කර ඇති අතර පරතරයන් හඳුනාගෙන තිබේ.[27] ප්‍රතිපත්ති කෙටුම්පත ප්‍රධාන විෂයය පථයන් 12 ක් ආවරණය කරයි; ඒවා නම්, වාතය, ජලය, ආහාර, නිර්මිත පරිසරය, බලශක්තිය, සෞඛ්‍යය, ප්‍රවාහනය, අධ්‍යාපනය හා සන්නිවේදනය, විද්‍යාව හා තාක්ෂණය, කර්මාන්ත, සංචාරක කර්මාන්තය සහ අපද්‍රව්‍ය වේ. තිරසර සංවර්ධන ඉලක්ක 12 යටතේ හඳුනාගෙන තිබෙන අංශ ගණනාවක් මෙම ප්‍රතිපත්ති කෙටුම්පත මගින් ආවරණය කෙරේ. මේ අනුව, එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන මගින් සිදු කරනු ලබන තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය පිළිබඳ වැඩසටහන්වල (ඉලක්ක 12.1 සහ 12.2) දස වසරක රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා වන කේන්ද්‍රීය ලක්ෂය වශයෙන් අමාත්‍යාංශය කටයුතු කරයි.

තිරසර සංවර්ධනය හා නිෂ්පාදනය පිළිබඳ ව්‍යාපෘතියක් වන SWITCH Asia හි සහාය ඇතිව ශ්‍රී ලංකාව සඳහා ජාතික ප්‍රතිපත්ති ආධාරක සංරචකය ක්‍රියාත්මක කෙරෙමින් පවතී. තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා සුදුසු ආර්ථික හා නියාමන ප්‍රතිපත්ති උපකාරක තෝරාගැනීම, යොදාගැනීම හා ක්‍රියාත්මක කිරීම සිදුකිරීමේදී ශ්‍රී ලංකා රජයට සහාය වීම හා එමගින් පරිභෝජන හා නිෂ්පාදන රටාවන්ගේ දිගු කාලීන තිරසරභාවය වර්ධනය කිරීම මෙම ව්‍යාපෘතිය මගින් අරමුණු කෙරේ. ශ්‍රී ලංකාව තුළ තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය සම්බන්ධයෙන් ඒකාබද්ධ සහ ඵලදායී ප්‍රයත්නයක් සහතික කරමින් ආයතනික ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීම මෙහි සමස්ත අරමුණ වේ.

ජාතික සුපිරිසිදු නිෂ්පාදන වැඩසටහන ශ්‍රී ලංකාව තුළ වසර 15කට අධික කාලයක් පුරා ක්‍රියාත්මක වෙමින් පවතී. තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය පිළිබඳ සම්පත් කට්ටලයක් විශ්වවිද්‍යාල සහ තෘතීය අංශය වෙත මොඩියුල/ ණය හෝ නම්නීකරණ වැඩසටහන් වශයෙන් හඳුන්වා දී තිබේ. එයට අමතරව, ක්‍රියාශීලී නිරෝගී ජීවනරටාව පිළිබඳ වැඩසටහන පෙර පාසල් දරුවන් හා ඔවුන්ගේ පවුල්වල් සාමාජිකයන් වෙත හඳුන්වාදෙන ලදී. මෙම මූලාරම්භයන් මගින් තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය පිළිබඳ පුරවැසියන්ට ඉගැන්වීමටත් එමගින් ධනාත්මක චර්යාමය වෙනස්කම් ඇතිකරගැනීම සඳහා ඔවුන් දිරිගැන්වීමටත් අපේක්ෂා කෙරේ.[28] (ඉලක්කය 12.8).

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් හරිත වාර්තාකරණ පද්ධතියක් හඳුන්වාදෙමින් තිබේ. මෙම හරිත වාර්තාකරණ පද්ධතිය දර්ශක 50 ක් සමග කටයුතු කරන අතර එය ආර්ථික දර්ශක 06, සාමාජීය දර්ශක 20 හා පාරිසරික දර්ශක 24 කින් සමන්විත වේ. පළමු ආර්ථික දර්ශකය මගින් ගනුදෙනු කෙරෙනුයේ සංවිධානය විසින් ජනනය කරනු ලබන සෘජු ආර්ථික අගය සමගය (ඉලක්කය 12.6).

පශ්චාත් අස්වනු හානි සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තවමත් ආහාර හානි දර්ශකය සකස් කොට නොමැත. කෙසේවුවද, පශ්චාත් අස්වනු හානි, බොහෝ කෘෂිකාර්මික වෙළඳ භාණ්ඩ සඳහා බලපාන බරපතල ගැටළුවක් වශයෙන් සැලකේ. පශ්චාත් අස්වනු හානි, කල් තබා ගත නොහැකි ඇතැම් කෘෂිකාර්මික නිෂ්පාදනවල නිමැවුමෙන් 40% ක් තරම් ඉහළ අගයක් ගනු ඇතැයි තක්සේරු කෙරී ඇත. අනෙකුත් දෑ අතර එළවළු, පලතුරු සහ මාළු පශ්චාත් අස්වනු හානිවලට පහසුවෙන්ම ගොදුරුවන ආහාර කාණ්ඩ වේ. හෙක්ටර් කොබ්බෑකඩුව කෘෂි පර්යේෂණ හා පුහුණු ආයතනය විසින් වාර්ෂික පදනමකින් ශ්‍රී ලංකාවේ වැදගත් ආහාර බෝග සියල්ලලේම මෙන් පශ්චාත් අස්වනු හානි පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වාගෙන යනු ලබමින් පවතී. ශ්‍රී ලංකාව විසින් දර්ශකයක් වශයෙන් පශ්චාත් අස්වනු හානි හා සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කරන්නේ නොමැති වුවද, අනාගතයේදී එවැනි දර්ශකයක් සංවර්ධනය කිරීම සඳහා දත්ත ලබාගැනීමට තිබෙන අතර එමගින් පශ්චාත් අස්වනු හානි පහත හෙළීමේ ප්‍රගතිය අධීක්ෂණය කළ හැකි වේ. කෙසේවුවද, පූර්ව අස්වනු හානි පහසුවෙන් ලබාගැනීමට නොපවතී. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් විට, දත්ත සුලභතාව අනුව පශ්චාත් අස්වනු ආහාර හානි දර්ශකයක් සංවර්ධනය කිරීමේ හැකියාව පවතී (ඉලක්කය 12.3).

ශ්‍රී ලංකාවේ හානිකර අපද්‍රව්‍ය, උපලේඛනගත අපද්‍රව්‍ය වශයෙන් වර්ගීකරණය කෙරෙන අතර උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වන මෙහෙයුම් නිර්ණායක මගින් නියාමනය කෙරේ. උපලේඛනගත අපද්‍රව්‍ය උත්පාදකයන් විසින් උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රය ලබාගත යුතුය. උපලේඛනගත අපද්‍රව්‍ය උත්පාදනය කරන සමාගම් අධීක්ෂණය මගින් ඉලක්ක කෙරෙනුයේ උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රය සහිත සමාගම් පමණි. එම සමාගම් විසින් ඔවුන්ගේ උපලේඛනගත අපද්‍රව්‍ය වර්ග සහ ප්‍රමාණයන් පිළිබඳ මධ්‍යම පරිසර අධිකාරිය වෙත වාර්තා කළ යුතුය.

---

27 පාර්ශවකරුවන්ගෙන් අදහස් විමසීම් මගින් අනාවරණය කරගත් කරුණු.
28 එම

2016 වසර වන විට අස්තිත්වයන් 350 ක් පමණ උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රය ලබා තිබුණි. 2003 වසරේදී ජනනය කරන ලද උපලේඛනගත අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 53,000 ක් විය (ඉලක්කය 12.4).[29] ශ්‍රී ලංකාව 2005 වසරේදී චිරවර්තී කාබනික දූෂක පිළිබඳ ස්ටොක්හෝම් සම්මුතියට අත්සන් තබා ඇත. එම සම්මුතිය යටතේ සංශෝධිත ජාතික ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් 2015 වසරේ සිට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කෙරේ.

හරිත රාජ්‍ය ප්‍රසම්පාදන ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකාව තුළ කෙටුම්පත් කෙරෙමින් පවතින අතර එමගින් දැක්වෙනුයේ හරිත රාජ්‍ය ප්‍රසම්පාදනය ශ්‍රී ලංකාව තුළ ජාතික වශයෙන් වැදගත් අංශයක් වන බවයි. හරිත ලංකා වැඩසටහන සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළ, කර්මාන්ත හරිතකරණය පිළිබඳ එහි 9 වන ඉලක්කය යටතේ, රාජ්‍ය ප්‍රසම්පාදනයට අදාළව කාර්ය අයිතම දෙකක් ලැයිස්තුගත කර තිබේ. එම අයිතම දෙක නම්; (අ) පරිසර හිතකාමී අමු ද්‍රව්‍ය තෝරාගැනීමට හා ප්‍රසම්පාදනය කිරීමට කර්මාන්ත වෙත පහසුකම් සැලසීම සඳහා මෙහෙයුම් නිර්ණායක සංවර්ධනය කිරීම සහ (ආ) හරිත නිෂ්පාදන මිලදීගැනීම ප්‍රවර්ධනය කිරීම වේ. ක්‍රියාකාරී සැලැස්ම මගින් කාර්යයන් දෙක අධීක්ෂණය සඳහා දර්ශක දෙකක්ද හඳුනාගෙන ඇති අතර, ඒවා නම්, පිළිවෙලින්, මෙහෙයුම් නිර්ණායක උපයෝජ්‍යතාව සහ හරිත නිෂ්පාදන මිලදීගැනීම් ජාලයේ උපයෝජ්‍යතාව වේ (ඉලක්කය 12.7).

ශ්‍රී ලංකාවේ අපද්‍රව්‍ය කළමනාකරණය ප්‍රධාන වශයෙන් පළාත් පාලන නියෝජිතායතනයන්හි වගකීමක් වේ. කෙසේවුවද, මධ්‍යම රජයේ නියෝජිතායතන ගණනාවක් විසින් පළාත් පාලන නියෝජිතායතනවල ධාරිතා සංවර්ධනය සඳහා උපකාර කිරීම මගින් සහ විකල්ප අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා පහසුකම් සපයනු ලබයි. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය සහ ප්‍රදේශයේ වෙසෙන පදිංචිකරුවන් විසින් ජනනය කරනු ලබන අපද්‍රව්‍ය එක් රැස් කිරීම සහ සහ බැහැර කිරීම සඳහා වගකීම දරන මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය අධිකාරීන් එයට ඇතුළත් වේ. බස්නාහිර පළාත තුළ පමණක්, බස්නාහිර පළාත් සභාව යටතේ පිහිටුවන ලද අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මගින් සමූහ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සිදුකෙරේ. බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් සකස් කරන ලද 2015- 2020 සඳහා වන වසර පහක ක්‍රියාකාරී සැලැස්ම මගින් ප්‍රතිචක්‍රීකරණ අනුපාතය 2015 වසරේදී 17% සිට 2020 වසරේදී 38% දක්වා ඉහළ නැංවීම අරමුණු කෙරේ (ඉලක්කය 12.5).

ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් සංඛ්‍යාව ඉහළ යාම හේතුවෙන් සංචාරක කර්මාන්ත අංශය තුළ තිරසර බව ප්‍රවර්ධනය කිරීම මෑත කාලීනව බෙහෙවින් අවධානයට ලක්වූ කාරණයක් විය. එහිදී ඇතැම් හරිත සංකල්ප ඇතුළත් කිරීම සඳහා තරු ඇගයුම් ක්‍රමය මෑතකදී සංශෝධනය කරන ලදී. තිරසර සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සඳහා වන උපායමාර්ගික සැලැස්ම 2017 - 2020 සකස් කොට තිබේ. එක් එක් උපායමාර්ගය සඳහා වන ක්‍රියා මාර්ග, වගකීම් දරණ නියෝජිතායතන, කාල රාමුව සහ ප්‍රතිඵල හඳුනාගෙන තිබේ.

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් මුළු ෆොසිල ඉන්ධන සහනාධාර ප්‍රමාණය සම්බන්ධයෙන් යාවත්කාලීන තොරතුරු ශ්‍රී ලංකාව සතුව නොපවතී. කෙසේවුවද, 2005 වර්ෂය සම්බන්ධයෙන් කළ තක්සේරුවක් මගින් පෙන්නුම් කෙරෙනුයේ ප්‍රකාශිත සහනාධාර සඳහා ප්‍රතිශතය 0.8 ක්ද අප්‍රකාශිත සහනාධාර සඳහා ප්‍රතිශතය 1.0 ක්ද වූ බවයි.[30]

විශේෂඥ උපදෙස් අනුව ඇතැම් නිෂ්පාදන සඳහා පරිසර නාමාංකනය හඳුන්වාදීමට ප්‍රතිපත්ති මූලාරම්භයන් සමහරක් සිදු කොට ඇත. (උදාඃ CFL බල්බවල - බල්බවල බලශක්ති කාර්යක්ෂමතා මට්ටම මත පදනම්ව).

"යහපත් කෘෂිකාර්මික භාවිතයන් තුළින්, දේශීය හා අපනයන වෙළඳපොල වෙත සැපයෙන කෘෂිකාර්මික වෙළඳ භාණ්ඩවල තත්වය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමේ" ව්‍යාපෘතිය කෘෂිකර්මාන්ත දෙපාර්තමේන්තුවේ කෘෂි ව්‍යාපාර උපදේශන අංශය මගින් ක්‍රියාවට නංවනු ලැබේ. ඒ අනුව, බෝග පදනමින් එළවළු හා පළතුරු සඳහා යහපත් කෘෂිකාර්මික භාවිතයන් හඳුන්වාදෙනු ලැබේ.

පරතරයන් සහ අභියෝග

තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේදී ස්වේච්ඡාවෙන් කැපවී කටයුතු කිරීම මත පදනම් වුණු, පෙළඹවීම ඇතිකරවන ප්‍රතිපත්ති වැඩි වශයෙන් යොදා ගැනෙන අතර ඇතැම් අංශ සඳහා නිල නියෝග මගින් මැදිහත්වීම සිදු කෙරේ (උදාඃ උපලේඛනගත අපද්‍රව්‍ය). ස්වේච්ඡාවෙන් කැපවී කටයුතු කිරීම සම්බන්ධයෙන් වන ප්‍රධාන අභියෝගය වනුයේ අනුගත වීම මන්දගාමී අයුරින් සිදුවීමයි. එය තිරසර පරිභෝජනයේ හා නිෂ්පාදනයේ ප්‍රතිලාභ පිළිබඳ පාර්ශවකරුවන්ගේ දැනුමේ හා දැනුවත්භාවයේ මට්ටම මත විශාල වශයෙන් රඳා පවතී. තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය සඳහා වන ඇතැම් මූලාරම්භයන් මගින් ඒවාට සහභාගීවන්නන් වෙත වෙළඳපොල වාසි උත්පාදනය කළ හැකි අතර (උදාඃ පරිසර නාමාංකනය, යහපත් කෘෂිකාර්මික භාවිතයන්) එහිදී ඒවාට අනුගත වීම සඳහා පාර්ශවකරුවන් වෙත දිරිගැන්වීම් ලැබේ. අනෙකුත් අවස්ථාවන්හිදී ගත හැකි ප්‍රධාන පියවර වනුයේ දැනුවත්භාවය ඉහළ නැංවීම සහ අනුගත වීම සඳහා දිරිදීමනා ව්‍යූහයන් ඇතිකිරීමයි.

උදාහරණ වශයෙන්, ශ්‍රී ලංකාවේ හරිත වාර්තාකරණ පද්ධතිය ස්වේච්ඡා පදනමකින් ක්‍රියාත්මක වේ.

---

29 ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (2016), ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දත්ත රැස්කිරීමේ සමීක්ෂණයේ අවසන් වාර්තාව

30 Baig, T., A. Mati, D. Coady, and J. Ntamatungiro (2007), Fiscal Affairs Department Domestic Petroleum Product Prices and Subsidies: Recent Developments and Reform Strategies, IMF Working Paper, International Monetary Fund

ඒ අනුව, සංවිධාන විසින් අනුකූලව කටයුතු කිරීමට කැමැත්ත දක්වන වාර්තාකරණ මට්ටම ස්තර පහක් යටතේ සිදු කළ හැකිය. පළමු ස්තරය යටතේ වසර දෙකක් ගතවන තුරු වාර්තාකරණය අනිවාර්ය නොවේ. දෙවන ස්තරය සඳහා වාර්තාකරණය ස්වේච්ඡාවෙන් කළ යුත්තකි. තුන්වන ස්තරයේ සිට පස්වන ස්තරය දක්වා වාර්තාකරණය අනිවාර්යයෙන් කළ යුතු වේ.

අනිවාර්යයෙන් සිදු කිරීමට නියෝග කෙරෙන විටදී, පවතින ප්‍රධාන අභියෝගය වනුයේ අනුකූලතාව තහවුරු කිරීමයි. ශ්‍රී ලංකාවේ බලාත්මක කරන බලධරයන්ගේ අවේක්ෂණය හා අධීක්ෂණ ධාරිතාව දුර්වල මට්ටමක පැවතීම මෙහිදී බාධකයක් වෙයි.

තවද, තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය සම්බන්ධයෙන් ඵලදායී තීරණ ගැනීමේදී තොරතුරු හිඟවීම විශේෂයෙන්ම ගැටළුවක් වේ. හානිකර අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ගත් විට ජනනය වන අපද්‍රව්‍ය ප්‍රමාණය පිළිබඳ සංඛ්‍යා ලේඛන නොමැති අතර හානිකර අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේදී එය ගැටළු රැසක් ඇති කරයි.

අඩුම පිරිවැය යටතේ මිලදීගැනීම අරමුණු කොට සකස් කරන ලද රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටීන් ඉඳුරාම තිරසර නොවිය හැකිද වේ. ඇතැම් අවස්ථාවන්හිදී ඒවා හරිත ප්‍රසම්පාදනයේ අරමුණු හා අනුකූල නොවිය හැකිය. එබැවින්, කෙටි කාලීන ආර්ථික ප්‍රතිලාභ මෙන්ම දිගු කාලීන තිරසර සංවර්ධන අරමුණු සංතුලනය කළ හැකි උපායමාර්ගික ප්‍රසම්පාදන ප්‍රතිපත්තියක් සකස් කිරීම අවශ්‍ය වේ.[31]

ඉදිරි ගමන් මග

තිරසර පරිභෝජන හා නිෂ්පාදන ප්‍රතිපත්ති ඵලදායී අන්දමින් ක්‍රියාවට නැංවීම සඳහා ඒවා සියලු ජාතික ප්‍රතිපත්ති හා සැලසුම්වලට නිසි පරිදි අනුකලනය කළ යුතු වේ. තවද සියලු පාර්ශවකරුවන් වෙත ඒ සම්බන්ධ අධ්‍යාපනය ලබාදීම හා ඔවුන්ගේ දැනුවත්භාවය නිසි පරිදි ඉහළ නැංවීම සිදුකොට ඒ සඳහා සහාය විය යුතුය. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් බාහිර ආධාර සහිතව ඒ සඳහා මේ වනවිටත් මුල් පියවර තබා ඇති අතර තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය මධ්‍යකාලීන හා දිගු කාලීන වශයෙන් ප්‍රවර්ධනය කිරීමේදී එවැනි ප්‍රයත්නයන් අඛණ්ඩව ගැනීම ඉතා වැදගත් වේ.

නීල නියෝග මගින් කෙරෙන මැදිහත්වීම්වලදී බලාත්මක කරන බලධරයන්ගේ අවේක්ෂණ හා අධීක්ෂණ ධාරිතාව සංවර්ධනය කිරීමද අත්‍යවශ්‍ය වේ. ඉහළ වේගයකින් අනුකූල වන බව තහවුරු කිරීම සඳහා දත්ත මගින් ඵලදායී සහායක් ලබාගත යුතු වේ. එබැවින්, දත්ත කළමනාකරණ පද්ධතීන් ස්ථාපිත කිරීම තවත් වැදගත් අංශයකි.

තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේදී පුද්ගලික අංශයටද වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමට තිබේ. එහිදී පුද්ගලික අංශය සමග සම්බන්ධතා ඇතිකරගැනීම සහ ඒවා අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා නිසි මාර්ග ඇති කිරීම කළ යුතු වේ. ජනතාව වෙත මේ සම්බන්ධව අධ්‍යාපනය ලබාදීම සහ ඔවුන් දැනුවත් කිරීම, තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා වන දිගු කාලීන ප්‍රවේශයන්හී මූලිකාංග විය යුතුය..

---

31 ස්වේච්ඡා ජාතික සමාලෝචන වලංගුකරණ වැඩමුළුවේදී පාර්ශවකරුවන් ඉදිරිපත් කළ කරුණු.

15 LIFE ON LAND

වත්මන් තත්වය සහ ප්‍රවණතා

ශ්‍රී ලංකාව (ඉන්දියාවේ බටහිර ඝාත් ප්‍රදේශයද ඇතුළුව) ලෝකයේ ජෛවවිවිධත්වය අති සංකේන්ද්‍රිත ස්ථාන 35 අතරින් එකක් වශයෙන් හඳුනාගැනේ. ශ්‍රී ලංකාවේ වනාන්තර ප්‍රදේශ හෙක්ටෙයාර 1,951,472 ක් පමණ[32] ප්‍රදේශයක පැතිර පවතින අතර එය 2016 වසර වන විට මුළු භූමි ප්‍රදේශයෙන් 29.7% ක් විය. මෙය අවසන් වරට 2010 වසරේදී සිදු කරන ලද වන ආවරණ තක්සේරුව මත පදනම් වන අතර එයට හෙක්ටෙයාර මිලියන 1.44 ක ආවෘත වන වියන සහ හෙක්ටෙයාර මිලියන 0.44 ක ඝන නොවූ වනාන්තර ඇතුළත් වේ.

ඉහළම ජෛවවිවිධත්වයක් පවතිනුයේ නිරිත ප්‍රදේශයේ වනාන්තරවලය.[33] එයට හෙක්ටෙයාර 49,098 ක ලෝක උරුම රක්ෂිතයන් සහ හෙක්ටෙයාර 41,823 ක ජෛවගෝලීය රක්ෂිත ඇතුළත් වේ. ශ්‍රී ලංකාවේ ආරක්ෂිත ප්‍රදේශය හෙක්ටෙයාර මිලියන 2.3 කි (4.2 වගුව). භූමි ප්‍රමාණයෙන් 35% ක් පමණ ආරක්ෂිත ප්‍රදේශ යටතේ පවතී (ඉලක්කය 15.1).

ශ්‍රී ලංකාවේ ස්වභාවික පරිසර පද්ධතීන් ශාක හා සත්ව විශේෂ ගණනාවකට නිවහන වන අතර බොහෝ වර්ගීකරණ කණ්ඩායම් තුළ ඒකදේශීය වර්ග ඉහළ මට්ටමකින් දැකිය හැකි වේ (4.3 වගුව). කෙසේවුවද, ශ්‍රී ලංකාව තුළ විශේෂ සැලකිය යුතු ප්‍රමාණයක් තර්ජනයට ලක්වූ විශේෂ ලෙස හඳුනාගැනේ. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් 2012 වසරේදී ස්වභාව සංරක්ෂණය සඳහා වන අන්තර්ජාතික සංගමයේ සහාය ඇතිව ජාතික රතු දත්ත ලැයිස්තුව කලින් කලට සකස් කරනු ලබයි (ඉලක්කය 15.5). ජාතික රතු දත්ත ලැයිස්තුවට අනුව, සපුෂ්ක ශාක 44% ක්, සියලු පර්ණාංග ශාක හා භෞමික පෘෂ්ඨවංශිකයින් - මිරිදිය මසුන් (50%), උභයජීවීන් (65%), උරගයින් (50%), දේශවාසී පක්ෂීන් (27%) සහ ක්ෂීරපායීන් (55%) තර්ජනයට ලක්ව ඇති විශේෂ ලෙස ලැයිස්තුගත කරන ලදී.

4.2 වගුව: ශ්‍රී ලංකාවේ ආරක්ෂිත ප්‍රදේශ සහ ප්‍රමාණය

ආරක්ෂිත ප්‍රදේශ කාණ්ඩය	ප්‍රමාණය (හෙක්ටෙයාර)	මුළු භූමි ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස	ආරක්ෂිත ප්‍රදේශ ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව			
දැඩි ස්වභාවික රක්ෂිත	**31,574**	**0.5**	1
ජාතික උද්‍යාන (භූමිය)	**685,979**	**10**	**30**
ජාතික උද්‍යාන (සාගර)	**19,563**	**0.3**	1
ස්වභාවික රක්ෂිත	**65,485**	1	**3**
අභයභූමි	**262,911**	**4**	11
වන පිවිසුම්	**8,777**	0.1	**0**
එකතුව	**1,074,290**	16	**47**
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව			
සංරක්ෂිත වනාන්තර	**137,307**	**2**	**6**
රක්ෂිත වනාන්තර	**1,092,700**	17	**47**
එකතුව	**1,227,007**	19	**53**

මූලාශ්‍රය : ජාතික ජෛවවිවිධත්ව උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම 2016 - 2022

32 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2016), සංඛ්‍යාන නිබන්ධනය

33 ස්වේච්ඡා ජාතික සමාලෝචන වලංගුකරණ වැඩමුළුවේදී පාර්ශවකරුවන් ඉදිරිපත් කළ කරුණු: වැවිලිද ඇතුළත් වන බැවින් සැබෑ වන ආවරණය, වාර්තාගත වන ආවරණයට වඩා වෙනස් විය හැකි බව පාර්ශවකරුවන්ගේ අදහස විය.

4.3 වගුව: ශ්‍රී ලංකාවේ ප්‍රධාන වර්ගීකරණ කණ්ඩායම්වල ඒකදේශීය භාවය

වර්ගීකරණ කණ්ඩායම	ඒකදේශීය භාවය (%)
පක්ෂීන්	**06.83**
සමනලුන්	**10.57**
ක්ෂීරපායීන්	**19.44**
සපුෂ්ක ශාක	**21.21**
බත් කුරන්	**38.40**
මිරිදිය මත්ස්‍යයින්	**64.22**
උරගයින්	**59.45**
ගොළුබෙල්ලන්	**79.92**
උභය ජීවීන්	**87.39**
මිරිදිය කකුළුවන්	**98.04**

මූලාශ්‍රය : ජාතික ජෛවවිවිධත්ව උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම 2016 - 2022.

ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය නැති වී යාම සඳහා බලපාන ප්‍රධාන හේතුව වශයෙන් වන විනාශය හඳුනාගෙන තිබේ. ශ්‍රී ලංකාව තුළ වන විනාශය සහ වන හායනය සිදු වීමට බලපා ඇති ප්‍රධාන කාරණා කිහිපයක් තිබේ. තෙත් කලාපය තුළ අපනයන වැවිලි ආර්ථිකය වර්ධනය වීම, වාණිජ අරමුණු සඳහා දැව නිස්සාරණය කිරීම පිළිබඳ යටත් විජිත ප්‍රතිපත්තිය, වියළි කලාපය තුළ ජනපද යෝජනාක්‍රම හා වාරිමාර්ග සංවර්ධන කටයුතු සහ කෘෂිකාර්මික ප්‍රසාරණය එයට ඇතුළත් වේ.34 4.9 සටහනෙහි දැක්වෙන පරිදි, වසර ගණනාවක සිට ජනගහනයේ සිදුවන වර්ධනය සහ වන විනාශය අතර පැහැදිලි සම්බන්ධතාවක් පවතින බව පෙනේ.

4.9 රූපය: ශ්‍රී ලංකාව තුළ වන ආවරණයේ සහ ජනගහනයේ සිදු වූ වෙනස



මූලාශ්‍රය: UN-REDD වැඩසටහන (2014), ශ්‍රී ලංකාවේ වන විනාශය සහ වන හායනය ඇතිකරන සාධක : මූලික ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග ඇගයුම.

ශ්‍රී ලංකාවේ වනාන්තර සම්පත් කළමනාකරණය කරනු ලබන්නේ රාජ්‍ය නියෝජිතායතන දෙකක් වන, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසිනි. ජෛව විවිධත්වය පිළිබඳ සම්මුතිය, ජාත්‍යන්තර ශාක ආරක්ෂණ සම්මුතිය සහ නැව් මගින් සිදුවන දූෂණය වැළැක්වීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (MARPOL 73/78) යනාදී ජාත්‍යන්තර සම්මුතීන්වලට ශ්‍රී ලංකාව අත්සන් තබා ඇත.

ශ්‍රී ලංකාවේ වනාන්තර සහ වන ජීවී සම්පත් කළමනාකරණය සඳහා ප්‍රතිපත්තීන් සහ නීති කිහිපයක් අදාළ කරගත හැකි වේ. වන සංරක්ෂණ ආඥාපනත, වනාන්තර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, සත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥාපනත, මිනිසා සහ ජෛවගෝලය වැඩසටහන, ජාතික උරුම මහ කැලෑ පනත සහ වනජීවී සංරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය එයට ඇතුළත් වේ. ජාතික ජෛව විවිධත්ව උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම 2016 - 2022 මගින් ජාතික ඉලක්ක, උපායමාර්ගික අරමුණු, ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම (ධාරිතා සංවර්ධනය, සන්නිවේදනය හා විහිදුම් ප්‍රමාණය, සම්පත් සචලීකරණය සඳහා) හා සම්බන්ධීකරණ යාන්ත්‍රණය, අධීක්ෂණ පද්ධතිය සහ ජෛව විවිධත්වයේ වටිනාකම් ක්‍රමානුකූලව ප්‍රවර්ධනය කරන උපායමාර්ගය අවධාරණයට ලක් කෙරේ (ඉලක්කය 15.2). මෙම සැලැස්ම පරිසර පද්ධති ප්‍රවේශය මත පදනම්ව තිබෙන අතර් අයිචි ඉලක්ක සහ තිරසර සංවර්ධන ඉලක්ක හා අනුකූල වේ (15.9 ඉලක්කය).

වන විද්‍යා අංශයේ ප්‍රතිපත්තීන් අනෙකුත් ආංශික ප්‍රතිපත්තීන් සමග සම්බන්ධ වේ. ජාතික භෞතික සැලැස්ම හා ප්‍රතිපත්තිය (2011-2030), දිගු කාලීන විදුලි බල ජනන ප්‍රසාරණ සැලැස්ම (2013-2032), සංචාරක කර්මාන්ත සංවර්ධන උපායමාර්ගය (2011-2016) සහ ජාතික මහා මාර්ග පිළිබඳ ප්‍රධාන සැලැස්ම (2007-2017) යනාදිය ශ්‍රී ලංකාවේ වන සම්පත් පිළිබඳ වැදගත් කරුණු පෙන්නුම් කරන ප්‍රතිපත්ති ලේඛන සමහරක් වේ. ජාතික REDD+ ආයෝජන රාමුව හා ක්‍රියාකාරී සැලැස්ම මගින් REDD+ වශයෙන් හඳුනාගෙන තිබෙන වැඩසටහන්වල (වන විනාශය සහ වන හායනය හේතුවෙන් සිදුවන විමෝචන පහත හෙළීම සඳහා වන වැඩසටහන්) පුළුල් ඉලක්ක ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය වන යාන්ත්‍රණ සහ ක්‍රියාවලීන් ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා රජයටත් ප්‍රධාන පාර්ශවකාර නියෝජිතායතනවලටත් සහාය වීම අරමුණු කෙරේ.

ජෛව සම්පත් සංරක්ෂණය කිරීම, පුනරුදය - ජාතික පරිසර සංරක්ෂණ වැඩසටහන 2016- 2018 හි ප්‍රධාන උපායමාර්ගික වැඩසටහන්වලින් එකක් වශයෙන් හඳුනාගැනේ. තර්ජනයට ලක්ව සිටින විශේෂ සංරක්ෂණය කිරීමේ හා ජෛව සම්පත් කොල්ලය වැළැක්වීමේ අවශ්‍යතාව එම වැඩසටහන මගින් හඳුනාගැනේ. තවද එය, ජෛව සම්පත් කොල්ලය වැළැක්වීම සඳහා නෛතික රාමුවක් සකස් කිරීමටත් ජෛව විවිධත්ව ගවේෂණය සඳහා ආයතනික රාමුවක් සකස්කිරීම ඇරඹීමටත් යෝජනා කරයි.

ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂ මගින් ජෛව විවිධත්වය කෙරෙහි හා කෘෂිකර්මාන්තය ඇතුළු ආර්ථික අංශ කිහිපයක් කෙරෙහි දැඩි බලපෑම් එල්ල වී ඇත. 2016 වසරේ සිදු කරන ලද ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂ මගින් ඇතිවන අවදානම ඇගයුම මගින් ශාක විශේෂ 32 ක් සහ සත්ව විශේෂ හතක් වර්තමානයේදී ශ්‍රී ලංකාවේ පවතින ප්‍රමුඛ පෙළේ ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂ වශයෙන් සැලකෙන බව අනාවරණය කර ඇත. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් 2016 වසරේදී ශ්‍රී ලංකාවේ ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂ පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, උපායමාර්ග සහ ක්‍රියාකාරී සැලැස්ම සකස් කොට තිබේ. එම ප්‍රතිපත්තිය මගින් ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂ කළමනාකරණය කිරීම සඳහා ප්‍රධාන විෂයය පථ හතරක් හඳුනාගැනේ. ඒවා නම්, ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂ ඕනෑකමින් හෝ ඕනෑකමින් තොරව හඳුන්වාදීම වැළැක්වීම, නව ආක්‍රමණිකයින් කලින් හඳුනාගැනීම හා ඒවාට ඉක්මණින් ප්‍රතිචාර දැක්වීම, ස්ථාපිත වූ සහ ව්‍යාප්ත වෙමින් පවතින ආක්‍රමණිකයින් සීමා කිරීම, පාලනය හා කළමනාකරණය සහ ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂවල බලපෑම් හේතුවෙන් හායනයට ලක්වූ පරිසර පද්ධතීන් යළි ගොඩනැංවීම වේ (ඉලක්කය 15.8).

කෘෂිකාර්මික හා මානව ජනාවාසවල දේශ සීමා පුළුල් වීමේ ප්‍රතිඵලයක් ලෙස, රටේ බොහෝ ප්‍රදේශ තුළ මිනිසුන් හා වන සතුන් අතර බරපතල ගැටුම් මතු වී තිබේ. ඒ අතරින් අලි-මිනිස් ගැටුම වඩාත්ම බරපතල ගැටළුව බවට පත්ව තිබේ.[35] මෙම ගැටුම් හේතුවෙන් 2014-2016 වසරවලදී මිනිස් ජීවිත 212 ක් අහිමි වී ඇති අතර දේපළ හානි සිදුවීම් 4070 ක් සිදු වී තිබේ. ඒ හේතුවෙන් සිදු වූ අලින්ගේ මරණ සංඛ්‍යාව 715 කි.[36] එම සිදුවීම් වැඩිම සංඛ්‍යාවක් වාර්තා වූයේ වයඹ පළාතෙන් සහ මහවැලි කලාපවලිනි. මෙම ගැටළුව විසඳීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වැඩසටහන් ගණනාවක් හඳුන්වා දී ඇති අතර එයට, ගම් වදින අලීන් අල්ලා වෙනත් ස්ථාන වෙත ගෙන යාමද ඇතුළත් වේ.

34 UN-REDD වැඩසටහන (2014), ශ්‍රී ලංකාවේ වන විනාශය හා වන හායනය ඇතිවීමට බලපාන කරුණු: ප්‍රධාන ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ඇගයුම.

35 ස්වේච්ඡා ජාතික සමාලෝචන වලංගුකරණ වැඩමුළුවේදී පාර්ශවකරුවන් ඉදිරිපත් කළ කරුණු.

36 වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (2016) වාර්ෂික කාර්යසාධන වාර්තාව

4.10 රූපය: ශ්‍රී ලංකාවේ ඉඩම් පරිහරණයේ සිදු වූ වෙනස්කම්



මූලාශ්‍රය: ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ දෙපාර්තමේන්තුව.

කෘෂිකර්මාන්තය, වන වගාව, වාර්මාර්ග සහ වැවිලි කර්මාන්ත යනාදී රටේ ආර්ථික අංශ ගණනාවක් විසින් ඉඩම් සම්පත් භාවිතයට ගැනෙමින් පවතී. වසර ගණනාවක සිට ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ඉඩම් උපයෝජ්‍යතාව පහත යමින් පවතින අතර ඉඩම් හිඟය සැලකිය යුතු ගැටළුවක් බවට පත්ව තිබේ. ශ්‍රී ලංකාවේ භූමි හායනය වැළැක්වීමේ ජාතික ක්‍රියාකාරී වැඩසටහන 2015 - 2024 අනුව, ඒක පුද්ගල ඉඩම් සම්පත් උපයෝජ්‍යතාව 1900 වසරේ හෙක්ටෙයාර 1.8 සිට 2010 වසරේ හෙක්ටෙයාර 0.3 දක්වා අඩු වී තිබේ.

භූමිය මත පීඩනය ඉහළ දැමීම, තිරසර නොවන අන්දමින් භූමිය භාවිතාවීම් සිදු වීමට හේතු වී ඇති අතර එය අවසානයේදී භූමි හායනය සිදු වීම හා ඵලදායිතාව අහිමිවීමට හේතු වේ. පාංශු ඛාදනය සහ පසේ සාරවත් භාවය අඩු වීම භූමි හායනයේ ප්‍රධාන බලපෑම් අතර වේ.

භූමි හායනය ශ්‍රී ලංකාවේ බරපතල පාරිසරික ගැටළුවක් බවට පත්ව ඇති අතර එය වන විනාශය හා ආශ්‍රිතව සිදු වේ. දළ බෑවුම් සහිත, අධික වර්ෂාපතනයක් ලැබෙන සහ භූමිය දැඩි ලෙස හායනයට ලක්වීමට තුඩු දෙන ලෙස නුසුදුසු අන්දමින් භූමිය භාවිතා කිරීම් සිදුවන උඩරට ප්‍රදේශය වැනි සංවේදී ප්‍රදේශවල විශේෂයෙන්ම මෙය ගැටළුවක්ව තිබේ. තිරසර නොවන අන්දමින් භූමිය භාවිතා වීම, රටේ බොහෝ ප්‍රදේශවල භූමි හායන ගැටළුව උග්‍ර කොට ඇත. නිසි පාංශු කළමනාකරණ ක්‍රියාමාර්ග යොදාගැනීමෙන් තොරව බෑවුම් සහිත ඉඩම්වල අර්තාපල්, දුම්කොළ, එළවළු සහ තේ වැනි බෝග වගාකිරීම හේතුවෙන් බරපතල හායන ගැටළු ඇති වී තිබේ.[37] ඉඩම් පරිහරණ රටාවන්හි වෙනස්කම් (සටහන 4.10) භූමි හායනය සිදුවන ප්‍රමාණයට බලපා ඇත.

පසේ සාරවත්භාවය නැතිව යාම, භූමි හායනයේ සෘජු ප්‍රතිඵලයක් වන අතර එය කෘෂිකාර්මික ඵලදායිතාව කෙරෙහි බරපතල ගැටළු ඇති කරවයි. පාංශු ඛාදනය සැලකිය යුතු අන්දමේ ස්ථානීය හා ස්ථානීය නොවන පිරිවැය ගෙන දෙයි (4.4 වගුව). මෙම ගැටළුව විසඳීම සඳහා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් 2007 වසරේදී ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සකස් කොට ඇත. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාව තුළ භූමි හායනය වැළැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී වැඩසටහන (2015-2024) සංවර්ධනය කොට ඇත. එමගින් අදාළ ප්‍රතිපත්ති ලේඛන හා අනුකූල වන වැඩසටහන් 25 ක් හඳුනාගෙන තිබේ (ඉලක්කය 15.3).

කෘෂිකර්මාන්තය, වන වගාව, වාරිමාර්ග, වැවිලි කර්මාන්ත ආදී රටේ ආර්ථික අංශ ගණනාවක් විසින් ඉඩම් සම්පත් භාවිතයට ගැනෙමින් පවතී. නීතිමය මැදිහත්වීම් ප්‍රමාණවත් නොවන බැවින්, තිරසර නොවන අන්දමින් භූමිය භාවිතා කෙරෙමින් පවතී.

4.4 වගුව: ශ්‍රී ලංකාවේ පාංශු ඛාදනයේ ආර්ථික පිරිවැය

පිරිවැය කාණ්ඩය	පිරිවැය
ස්ථානීය පිරිවැය	
අහිමි වන ඵලදායිතාවේ වටිනාකම	රු. **3529 ha/yr**
අහිමි වන පෝෂකවල වටිනාකම	රු.**5068 ha/y**
ඉහළ මහවැලි ජලාධාරයේ පෝෂක අහිමිවීම හේතුවෙන් ඇතිවන තක්සේරු කළ පිරිවැය	රු. මිළියන **953.0**
ස්ථානීය නොවන පිරිවැය	
අහිමි වන ඵලදායිතාවේ වටිනාකම මත පදනම්ව	රු. **3952 ha/yr**
අහිමි වන පෝෂකවල වටිනාකම මත පදනම්ව	රු. **5481 ha/yr**
ඉහළ මහවැලි ජලාධාරයෙන් ජල විදුලි නිෂ්පාදනය සහ වාරිමාර්ග කටයුතු වලින් ඇතිවන තක්සේරු කළ අහිමි වීම	**වසරකට රු. මිළියන 15.0**

මූලාශ්‍රය: ශ්‍රී ලංකාවේ කාන්තාරකරණය/ භූමි හායනය පිළිබඳ ජාතික වාර්තාව

පරතරයන් සහ අභියෝග

මානව ක්‍රියාකාරකම් හේතුවෙන් ශීඝ්‍ර ලෙස හායනයට ලක්වීමේ තර්ජනයට ලක්ව තිබෙන, පරිසර පද්ධති සේවාවන් රැසක් සපයන ඉතා වැදගත් පරිසර පද්ධතීන් පවතී. හෙක්ටෙයාර 274,000[1][38] ක මුළු භූමි ප්‍රදේශයක් ආවරණය කරන දේශාභ්‍යන්තර සහ වෙරළබඩ තෙත් බිම් ඒ සඳහා උදාහරණ වන අතර ජාත්‍යන්තර වැදගත්කම හේතුවෙන් රැම්සාර් සම්මුතිය යටතේ හඳුනාගැනෙන තෙත් බිම් 41 ක් එයට ඇතුළත් වේ. නාගරික හා කර්මාන්ත පහසුකම්, යටිතල පහසුකම් හා සංචාරක කර්මාන්තය සංවර්ධනය, අපද්‍රව්‍ය බැහැර කිරීම, කූනිස්සන් වගාව සහ භූමිය අනවසරයෙන් අත්කර ගැනීම යනාදිය හේතුවෙන් සිදුවන දූෂණයේ බලපෑමට තෙත් බිම් භාජනය වේ.[39]

සීමිත ප්‍රජා සහභාගීත්වයක් පවතින ශ්‍රී ලංකාවේ වනාන්තර කළමනාකරණය සඳහා අණ හා පාලනය කිරීම් ප්‍රවේශයක් යොදා ගැනේ. මේ සඳහා ප්‍රජාව සම්බන්ධ වීම ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රයත්න කිහිපයක් ගෙන ඇතත් ඒවා සැලකිය යුතු මට්ටමේ සාර්ථකත්වයක් අත් කරගෙන නොමැත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වන සංරක්ෂණය බෙහෙවින්ම නීතිමය පියවර මත රඳා පවතී. අදාළ නීති බලාත්මක කිරීම සඳහා පවතින ධාරිතාව සීමා සහිත වීම, ශ්‍රී ලංකාවේ වනාන්තර තිරසර අන්දමින් කළමනාකරණය කිරීමේදී පවතින ප්‍රධාන අභියෝගයක් බවට පත්ව තිබේ. බලාත්මක කිරීමේ ධාරිතාව සීමා සහිත වීමේ ගැටළුව ප්‍රධාන වශයෙන් පැන නගිනුයේ කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම, රේඛීය නියෝජිතායතන අතර සහයෝගීතාව හා සම්බන්ධීකරණය නොමැති වීම සහ අදාළ තොරතුරු හිඟ වීම යනාදිය හේතුවෙනි.[40]

ශ්‍රී ලංකාවේ භූමි හායන ගැටළුවට විසඳුම් සෙවීම සඳහා නීති පද්ධති කිහිපයක් පැවතියද, එමගින් ගැටළුවට නිසි විසඳුමක් දීමට අපොහොසත්ව ඇත්තේ ඒවා ක්‍රියාවට නැංවීමේ දුර්වලතාව හේතුවෙනි. ඉඩම් කළමනාකරණයේ සංකීර්ණ ස්වභාවය හේතුවෙන් මෙම ප්‍රතිපත්ති ඵලදායී අන්දමින් ක්‍රියාවට නැංවීමේදී අභියෝග මතුවේ. ඒ අතරින් ප්‍රධාන ගැටළු දෙකක්, එනම්, ඉහළ ජලාධාර සහ ජලාශ පෝෂක ප්‍රදේශ විනාශ වීම වඩාත්ම බරපතල වේ. මධ්‍යම කඳුකරයේ (ඉහළ ජලාධාර) සහ ජලාශ පෝෂක ප්‍රදේශවල (එල්ලංගාව පද්ධති) වෘක්ෂලතා ආවරණය මගින් පරිසර පද්ධති සේවාවන් රැසක් සැපයේ. තේ, දුම්කොළ, අර්තාපල් සහ එළවළු වැනි දෑ වගා කරන භූමි ප්‍රදේශ පුළුල් වීම, මෙම පද්ධති ශීඝ්‍ර ලෙස හායනය වීමට තුඩු දේ.

ඉඩම් භාවිතය පිළිබඳ නිසි තොරතුරු නොමැති වීමද සැලකිය යුතු ගැටළුවකි. නිසි තොරතුරු නොමැති වීම, ඵලදායී අන්දමින් ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සීමා කරන අතර විනාශකාරී මානව ක්‍රියාකාරකම් දිරි ගන්වයි.

තොරතුරු සීමිත වීම, ඉහත සාකච්ඡා කරන ලද අනෙකුත් සියලු අභියෝග උග්‍ර කරවන, අනෙත් අංශවලටද බලපාන ගැටළුවක් වශයෙන් සැලකිය හැකිය.

---

37 UN-REDD වැඩසටහන (2014), ශ්‍රී ලංකාවේ වන විනාශය හා වන හායනය ඇතිවීමට බලපාන කරුණුඃ ප්‍රධාන ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ඇගයුම.

38 මධ්‍යම පරිසර අධිකාරිය (2007) ශ්‍රී ලංකාවේ තෙත් බිම් නාමාවලිය

39 ස්වේච්ඡා ජාතික සමාලෝචන වලංගුකරණයේදී පාර්ශවකරුවන් ඉදිරිපත් කළ කරුණු.

40 ජාතික ජෛව විවිධත්ව උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම 2016 - 2022

ඉදිරි ගමන්මග

ඉඩම් පරිහරණ සැලසුම්කරණ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම, ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් කළමනාකරණය හා ආශ්‍රිත ගැටළු බොහොමයක් විසඳීම සඳහා වන ප්‍රධාන ක්‍රියාමාර්ගය වේ. ජාතික භෞතික සැලසුම්කරණ ප්‍රතිපත්තිය සහ 2050 සැලැස්ම නිසි පරිදි ක්‍රියාවට නැංවීම මෙහිදී ඉතා වැදගත් වේ. තිරසර සම්පත් කළමනාකරණයේදී අත්‍යවශ්‍ය වන පියවර අතරට කලාපකරණය සහ සම්පත් අනුරූපණය ඇතුළත් වේ.

අදාළ නීති නිසි පරිදි බලාත්මක කිරීම, වන හායනය සහ වන විනාශය අවම කිරීම සඳහා වැදගත් වේ. වනාන්තර සීමා පැහැදිලිව නිර්ණය කිරීම, වන කළමනාකරණ නියෝජිතායතනවල (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව) ධාරිතාව ශක්තිමත් කිරීම සහ ජනතාවගේ දැනුවත්භාවය ඉහළ නැංවීම යනාදිය තුළින් ඒ සඳහා සහාය ලබා දිය යුතුය.

ස්වභාවික සම්පත් කළමනාකරණයේදී සහභාගිත්ව පාලනය යනු ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය වැඩි වශයෙන් යොමු විය යුතු තවත් ක්ෂේත්‍රයකි.[41] වනාන්තර කළමනාකරණයේදී ප්‍රජා සහභාගීත්වය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව ප්‍රයත්න දරා ඇති අතර ඉන් මිශ්‍ර ප්‍රතිඵල ලැබී තිබේ. එම ප්‍රයත්නයන් තුළින් උගත් පාඩම් අනාගත ප්‍රතිපත්තිමය මැදිහත්වීම් සැලසුම්කිරීමේදී යොදාගත යුතු වැදගත් අංග වේ. වනාන්තර සහ ඉඩම් කළමනාකරණය හා සම්බන්ධ ඇතැම් ගැටළු පහත හෙළීම සඳහා වෙළඳපොල පාදක උපකරණද උපකාරී විය හැකිය.

රට තුළ තිරසර ඉඩම් කළමනාකරණය ඇති කිරීමට පහසුකම් සැලසීම වෙනුවෙන් ඉඩම් ප්‍රතිපත්ති ඵලදායී අන්දමින් ක්‍රියාවට නැංවීම සඳහා ශ්‍රී ලංකාව අවශ්‍ය පියවර ගත යුතු වේ. අදාළ ප්‍රතිපත්ති සහ නීති ඵලදායී ලෙස ක්‍රියාත්මක වීම ප්‍රවර්ධනය කිරීම සඳහා ආයතනික ධාරිතාව ශක්තිමත් කළ යුතු වේ. එය තිරසර ඉඩම් පරිහරණය සඳහා පහසුකම් සලසනු ඇති අතර භූමි හායනට තුඩු දෙන විනාශකාරී ක්‍රියාකාරකම් අධෛර්යයමත් කරනු ඇත.

වැඩිදියුණු කළ යුතු තවත් ක්ෂේත්‍රයක් වනුයේ ඉඩම් හා වනාන්තර කළමනාකරණය සඳහා දත්ත හා තොරතුරු පද්ධති ස්ථාපිත කිරීමයි. ශ්‍රී ලංකාව මේ වනවිට ඉඩම් පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කරමින් සිටින අතර එයට ඉඩම් පිළිබඳ බිම් කැබලි මට්ටමේ දත්ත ඇතුළත් වනු ඇත. ශ්‍රී ලංකා REDD+ වැඩසටහන මගින් ජාතික වනාන්තර අධීක්ෂණ පද්ධතිය දියත් කොට තිබෙන අතර එය සැලකිය යුතු සංවර්ධනයක් වශයෙන් සැලකිය හැකිය.

41 ස්වේච්ඡා ජාතික සමාලෝචන වලංගුකරණ වැඩමුළුවේදී පාර්ශවකරුවන් ඉදිරිපත් කළ කරුණු.

4.2

අනෙකුත් තිරසර සංවර්ධන ඉලක්ක

වත්මන් තත්වය සහ ප්‍රවණතා

දරිද්‍රතාව පහත හෙළීම අතින් ශ්‍රී ලංකාව පසුගිය දශකය තුළ සැලකිය යුතු ප්‍රගතියක් අත්කරගෙන සිටින අතර එහිදී ජාතික සහ උප ජාතික මට්ටම්වල මෙන්ම විවිධ ජනගහන කණ්ඩායම් අතරද දරිද්‍රතාවයේ සිදුවීම් පහත යමින් තිබේ.

4.11 සටහනෙහි දැක්වෙන පරිදි, ජාතික දරිද්‍රතා රේඛාවට පහළින් සිටින ජනගහනයේ ප්‍රමාණය 2006/07 වසරවලදී 15.2% සිට 2016 වසරේදී 4.1% දක්වා පහත ගොස් ඇත. දරිද්‍රතාවයේ මෙම පහත යාම අංශ සහ පළාත් මට්ටම්වලද පිළිබිඹු වේ. රටේ දිළිඳු ජනගහනයෙන් 80% ක් පමණ වන ග්‍රාමීය අංශයේ දරිද්‍රතා සිදුවීම් ප්‍රවණතාව, ජාතික දරිද්‍රතා ප්‍රවණතාව මැනවින් පිළිබිඹු කරන අතර ඓතිහාසිකව දරිද්‍රතාවයේ වැඩිම සිදුවීම් සහිත අංශය වන වතු අංශයේ දරිද්‍රතා සංඛ්‍යා දර්ශකය පසුගිය දශකයේ කැපී පෙනෙන ලෙස 32% සිට 8.8% දක්වා අඩු වී ඇත. නාගරික අංශයේ දරිද්‍රතා සිදුවීම් ජාතික සාමාන්‍ය මට්ටමට වඩා බෙහෙවින් අඩු මට්ටමක පවතී (1.2 ඉලක්කය).

4.11 රූපය: ජාතික දරිද්‍රතා රේඛාවේදී දරිද්‍රතා සංඛ්‍යා දර්ශකයේ ප්‍රවණතාවන්



මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ගෘහ ඒකක ආදායම් වියදම් පිළිබඳ අවසන් වාර්තා 2006/07, 2009/10, 2012/13, සහ 2016, http://www.statistics.gov.lk/page.asp?page=Income%20and%20Expenditure මගින් ලබා ගත හැකිය.

4.12 සටහන මගින් වයස් හා ස්ත්‍රී පුරුෂ කණ්ඩායම් අතර පවතින දරිද්‍රතා රටාවන් පිළිබඳ සාරාංශයක් සැපයේ. සුළු වෙනසකින් වුවද, කාන්තාවන් අතර දරිද්‍රතාව පුරුෂයින්ට වඩා අඩු වීම අවධානය යොමු කරගන්නා කරුණකි. එයට අමතරව, වැඩිහිටියන්ට සාපේක්ෂව දරුවන් (වයස අවුරුදු 18 ට අඩු) අතර දරිද්‍රතාව ඉහළ අගයක් ගනී; සැබැවින්ම, ළමා දරිද්‍රතා සංඛ්‍යා දර්ශකය ජාතික මට්ටම ඉක්මවා යයි. කෙසේවුවද, 2012/13 වසර හා සැසඳීමේදී සියලු වයස් හා ස්ත්‍රී පුරුෂ කණ්ඩායම් අතර දරිද්‍රතා මට්ටම් සැලකිය යුතු අන්දමින් පහත ගොස් ඇත (1.2 ඉලක්කය).

4.12 රූපය: ජාතික දරිද්‍රතා රේඛා මට්ටමේදී වයස් හා ස්ත්‍රී පුරුෂ කණ්ඩායම් අතර දරිද්‍රතාව පිළිබඳ සාරාංශය - 2012/13 සහ 2016



මූලාශ්‍රය: 'ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන ඉලක්ක දර්ශකයන්හි තත්වය: 2017', ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, කොළඹ. http://www.statistics.gov.lk/sdg/application/publications/book.pdf මගින් ලබාගත හැකිය.

ජාත්‍යන්තර දරිද්‍රතා රේඛාවට (දිනකට ඇ. ඩො. 1.90 ට අඩු) පහළින් සිටින ජනගහනයේ ප්‍රමාණය 2016 වසරේදී 1% ට වඩා අඩු වුණු අතර එය ස්ත්‍රීන් (0.70%) හා පුරුෂයින් (0.74%) අතර මෙන්ම වයස් කණ්ඩායම් අතර සුළු විචලනයන් සහිතව පැවතුණි. 42 (1.1 ඉලක්කය). බහුමාන දරිද්‍රතා දර්ශකයද, ජාතික (ආදායම්) දරිද්‍රතා රේඛාව මත පදනම් වුණු මට්ටම්වලට වඩා අඩු දරිද්‍රතා මට්ටම් වාර්තා කළේය.

බහුමාන දරිද්‍රතා රේඛාවේ සමස්ත මට්ටම 2012/13 වසරවලදී 3.8 % ක් වුණු අතර 43 (ජාතික දරිද්‍රතා රේඛාව මත පදනම් වූ 6.7% හා සැසඳීමේදී), එය පුරුෂයින් හා ස්ත්‍රීන් සඳහා පිළිවෙලින් 3.9% හා 3.7% විය 44 (1.2 ඉලක්කය).

---

42 ගෘහ ඒකක ආදායම් සහ වියදම් පිළිබඳ සමීක්ෂණය 2016 මත පදනම්ව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සපයන ලද තක්සේරු.
43 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් බහුමාන දරිද්‍රතාව පිළිබඳ ලබාගත හැකි නවතම තොරතුරු 2012/13 වසර සඳහා අදාළ වේ.
44 DCS (2017) ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන ඉලක්ක දර්ශකයන්හි තත්වය: 2017 , ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, කොළඹ. http://www.statistics.gov.lk/sdg/application/publications/book.pdf මගින් ලබාගත හැකිය.

ඵලදායී සමාජ ආරක්ෂණ පද්ධතියක් පැවතීම, රටක ජනගහනයේ දරිද්‍රතාව සහ අවදානම් මට්ටම පහත හෙළීම සඳහා මූලික වේ (1.3 ඉලක්කය). සමස්තයක් වශයෙන් ගත් විට, වක්‍ර ප්‍රතිලාභ ලබන ගෘහස්ථ සාමාජිකයින් ඇතුළුව, ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 34% ක් පමණ සමාජ ආධාර වැඩසටහන් සහ සමාජ රක්ෂණ වැඩසටහන්වලින් ප්‍රතිලාභ ලබා ඇත. වැඩිහිටි ජනගහනයෙන් (වයස වුරුදු 60 ට වැඩි) 45% ක් පමණ සමාජ ආරක්ෂණය ආවරණය කර තිබීම, අවධානය යොමු වන කරුණකි. එහිදී වැඩිහිටි කාන්තාවන් ආවරණය මඳක් ඉහළ අගයක් ගනී (පුරුෂයින් සඳහා 41.9% ක් වන අගය හා සැසඳීමේදී එය 46.4% කි).[45]

සෞඛ්‍යය හා අධ්‍යාපනය, විදුලිය, සුරක්ෂිත පානීය ජලය හා සනීපාරක්ෂාව වැනි මූලික සේවාවන් වෙත ප්‍රවේශය සහතික කිරීම අතින් ශ්‍රී ලංකාව සැලකිය යුතු ප්‍රගතියක් අත්කරගෙන සිටී (1.4 ඉලක්කය). 2016 වසරේදී විදුලිය ඇති ගෘහ ඒකක ප්‍රමාණය 99.3% ක් වූ අතර[46] සුරක්ෂිත පානීය ජලය ලැබෙන ගෘහ ඒකක ප්‍රමාණය 88.8% ක්ද වැඩි දියුණු කරන ලද සනීපාරක්ෂක පහසුකම් ඇති ගෘහ ඒකක ප්‍රමාණය 91.7% ක්ද විය.[47] ලෝක බැංකුවේ ගෝලීය මූල්‍ය දර්ශකයේ දත්ත [48] මගින් වාර්තා කෙරෙන පරිදි ශ්‍රී ලංකාවේ වැඩිහිටි පිරිසෙන් 82.7% කට මූල්‍ය ආයතන වෙත ප්‍රවේශය (හෝ බැංකු ගිණුම් පවතින බව) පවතින අතර එහිදී කාන්තාවන් 83% කටද අන්ත දුගී 40% අතරට අයත් පිරිසෙන් 80% කට පමණද මූල්‍ය ආයතන වෙත ප්‍රවේශය පවතී. දකුණු ආසියාවේ අනෙකුත් රටවල් හා සසඳන විට, මූල්‍ය ප්‍රවේශය ශ්‍රී ලංකාවේ කැපී පෙනෙන ලෙස ඉහළ අගයක් පෙන්නුම් කරයි. තවද, 1940 වසරවලදී හඳුන්වාදෙනු ලැබූ, ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන් වෙත නිදහස් අධ්‍යාපනය ලබාදීමේ ප්‍රතිපත්තිය සහ නිදහස් සෞඛ්‍ය පහසුකම් ලබාදීමේ ප්‍රතිපත්තිය මගින් රටේ ජනතාවට,විශේෂයෙන්ම දිළිඳු හා අවදානම් සහගත ජනතාවට, අධ්‍යාපනය සහ සෞඛ්‍ය පහසුකම් ලැබෙන බව සහතික කිරීම සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කර තිබේ. පසුගිය සත් වසර පුරා ආර්ථික ක්‍රියාකාරකම්වල සිදු වූ අඛණ්ඩ වර්ධනය සහ විරැකියා අනුපාතය 5% ට වඩා පහත යාම සමග ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රජය විසින් අඛණ්ඩව මුදල් වෙන්කිරීම ද, දිළිඳු ජනතාවගේ ආදායම ඉහළ නැංවීම සඳහා දායක වී තිබේ.

පරතරයන් සහ අභියෝග

පසුගිය දශක දෙක පුරා දරිද්‍රතාව පහත හෙළීම සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකාවේ කාර්යසාධනය සමගම සැලකිය යුතු මට්ටමේ භූගෝලීය විචලනයන්ද පවතී.

දරිද්‍රතා සංඛ්‍යා දර්ශකය, කොළඹ දිස්ත්‍රික්කයේ 0.9% සිට කිලිනොච්චි දිස්ත්‍රික්කයේ 18.2% දක්වා වශයෙන් දිස්ත්‍රික්ක පුරා වෙනස් වේ. කෙසේවුවද, ඉහළ දරිද්‍රතාවක් පවතින දිස්ත්‍රික්ක බොහොමයක පවතිනුයේ අඩු ජනගහනයකි. තවද, දරිද්‍රතා මට්ටම් පහත වැටී ඇති දිස්ත්‍රික්ක තුළ වුවද, දරිද්‍රතාව සහිත හුදෙකලා ප්‍රදේශ පවතී (1.2 ඉලක්කය).

දිළිඳු ජනතාව ජනගහනයෙන් 4.1% ක් පමණක් වුවද, ස්වභාවික ආපදා වැනි (උදාඃ ගංවතුර, නියඟ සහ නාය යාම්) හදිසියේ මුහුණ දෙනු ලබන විවිධ බරපතල තත්වයන් හේතුවෙන් දරිද්‍රතාවට පත්වීමේ අවදානමට මුහුණදෙමින්, අවදානම් සහගත ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් දරිද්‍රතා රේඛාවට මඳක් ඉහළින් එක් රොක්ව සිටිති. ජීවිත සහ පවුල්වල ජීවනෝපායන්ට බලපාමින් රට තුළ ඉහළ යමින් පවතින දේශගුණික වශයෙන් අයහපත් තත්වයන් සැලකිල්ලට ගෙන, දිළිඳු සහ අවදානම් සහගත ජනතාව තුළ ඉක්මණින් ප්‍රකෘති තත්වයට පත්වීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා කටයුතු කිරීම වැදගත් වේ (1.5 ඉලක්කය).

සෞඛ්‍යය හා අධ්‍යාපනය, විදුලිය, සුරක්ෂිත පානීය ජලය සහ සනීපාරක්ෂාව වැනි මූලික සේවාවන් වෙත ප්‍රවේශය වැඩි දියුණු කිරීම අතින් ශ්‍රී ලංකාව ප්‍රගතියක් අත්කරගෙන පැවතියද, ඇතැම් දිස්ත්‍රික්ක සහ අංශ (විශේෂයෙන්ම වතු අංශය) පසුගාමී වීම හේතුවෙන් ප්‍රාදේශීය විෂමතා පවතී. එම ප්‍රදේශ තුළ මූලික සේවාවන් හා පහසුකම් වෙත ප්‍රවේශය වැඩි දියුණු කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම, දරිද්‍රතාව පිටු දැකීමටත් තිරසර සංවර්ධන ඉලක්ක අත්කර ගැනීමටත් බෙහෙවින් ඉවහල් වේ (1.4 ඉලක්කය).

දිළිඳු ජනතාව, වැඩිහිටියන්, ආබාධිත පිරිස්, දරුවන් සහ කාන්තාවන් වැනි පහසුවෙන් අවදානමට ලක්විය හැකි ජන කොටස් ඉලක්ක කොට සමාජ ආරක්ෂණ වැඩසටහන් බොහොමයක් ශ්‍රී ලංකාව විසින් ක්‍රියාවට නංවා තිබේ. එවැනි වැඩසටහන් රැසක් පැවතියදීද, වත්මන් සමාජ ආරක්ෂණ පද්ධතිය තුළ පරතරයන් නිරීක්ෂණය වේ. ඉලක්ක කිරීමේදී පවතින ගැටළු, ප්‍රතිලාභ ප්‍රමාණවත් නොවීම සහ අධික පිරිවැයක් දැරීමට හා එකම ප්‍රතිලාභීන් පිරිසක් වැඩසටහන් කිහිපයකින් ආවරණය වීමට තුඩු දෙන අන්දමින් වැඩසටහන් අතර සම්බන්ධීකරණයක් නොපැවතීම මෙයට ඇතුළත් වේ [49] (1.3 ඉලක්කය).

---

45 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2017)
46 ශ්‍රී ලංකා මහ බැංකුව (2018) මහ බැංකු වාර්ෂික වාර්තාව 2017
47 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2018), 'ගෘහ ඒකක ආදායම් සහ වියදම් පිළිබඳ සමීක්ෂණය 2016 – අවසන් වාර්තාව' ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, කොළඹ. http://www.statistics.gov.lk/HIES/HIES2016/HIES2016_FinalReport.pdf මගින් ලබාගත හැකිය.
48 ලෝක බැංකුව (2015), Little Data Bookon Financial Inclusion -15
49 ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (2016), 'ආර්ථිකයේ තත්වය 2016'. ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, කොළඹ

ඉදිරි ගමන්මග

බරපතලම ගෝලීය අභියෝගය වනුයේ දරිද්‍රතාව බවත්, දරිද්‍රතාව පිටුදැකීම, තිරසර සංවර්ධනය අත්කරගැනීම සඳහා අත්‍යවශ්‍ය කොන්දේසියක් වන බවත් තිරසර සංවර්ධනය පිළිබඳ 2030 න්‍යාය පත්‍රය මගින් තහවුරු කෙරේ. ඒ අනුව, තිරසර සංවර්ධන පළමු ඉලක්කය, තිරසර සංවර්ධන ඉලක්ක සාර්ථක අන්දමින් ඉටු කරගැනීම සඳහා ඉතා වැදගත් වේ. සැබැවින්ම, දරිද්‍රතාව දුරු කිරීම, ශ්‍රී ලංකාවේ සංවර්ධන න්‍යාය පත්‍රය තුළ මූලිකම කාරණය වේ. රජය විසින් 2017 වසර 'දිළිඳු බව පිටු දැකීමේ වසර' ලෙස නම් කිරීමෙන් එය සනාථ වේ.

ආන්තිකකරණයට ලක් කළ කණ්ඩායම් සහ දරිද්‍රතාව පවතින හුදෙකලා ප්‍රදේශ නිසි පරිදි හඳුනාගැනීම, දරිද්‍රතාව පිටු දැකීමේදී මූලික වශයෙන් වැදගත් වනුයේ, එම එක් එක් කණ්ඩායම්වල නිශ්චිත වශයෙන් අවදානමට ලක්වීමේ හැකියාවන් වෙත ඵලදායී අන්දමින් අවධානය යොමු කළ හැකි උපායමාර්ග සකස් කිරීමට එමගින් හැකියාව ලැබෙන බැවිනි. මෙහිදී, භූගෝලීය වශයෙන් දිළිඳු ජනතාවගේ ව්‍යාප්තිය හඳුනාගැනීමට පහසුකම් සැලසීම සඳහා දරිද්‍රතා අනුරූපණ ප්‍රයත්නයන්ද ගෙන තිබේ.

තවද, සමාජ ආරක්ෂණ වැඩසටහන්වල ඉලක්ක වැඩි දියුණු කිරීමත් සුදුසු කණ්ඩායම් සහ ආන්තිකකරණයට ලක් කළ කණ්ඩායම් මෙම වැඩසටහන් මගින් ප්‍රමාණවත් පරිදි ආවරණය වන බව සහතික කිරීමත් අත්‍යවශ්‍ය වේ. එයට අමතරව, මෙම වැඩසටහන් යටතේ සපයන ලද ප්‍රතිලාභවල ප්‍රමාණවත්භාවය නැවත සලකාබැලීම අවශ්‍ය වේ. ඒ සඳහා වන වැදගත් පියවරක් වශයෙන්, සංකලිත සමාජ ආරක්ෂණ පද්ධතියක් නිර්මාණය කිරීමේ කාර්යය පවරන ලද සුභ සාධන ප්‍රතිලාභ මණ්ඩලය 2016 වසරේදී පිහිටුවන ලදී. වර්තමානයේදී එම මණ්ඩලය, ප්‍රධාන වැඩසටහන් හතරක් සඳහා (සමෘද්ධි, වැඩිහිටි දීමනාව, ආබාධිත පිරිස් සඳහා ලබාදෙන දීමනාව, වකුගඩු රෝගීන් සඳහා දීමනාව) ඒකාබද්ධ දත්ත පද්ධතියක් සකස් කිරීමේ සහ එම වැඩසටහන්වල තෝරාගැනීම් නිර්ණායක පැහැදිලිව සකස් කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටී. ඉදිරි කාලයේදී රට තුළ සියලු සමාජ ආරක්ෂණ වැඩසටහන් මෙම ඒකාබද්ධ පද්ධතිය තුළට ඇතුළත් වනු ඇති බවත් එමගින් ඒවායේ ඉලක්ක වැඩි දියුණුවීමත්, වැඩසටහන් මගින් එකම පිරිසක් ආවරණය වීම අවම වීමත් සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පවතින වැඩසටහන්වල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම මෙන්ම දරිද්‍රතාව පිටුදැකීම වෙනුවෙන් මුදල් යෙදවීම සඳහා දේශීය සම්පත් සචලීකරණය කිරීමේ නව්‍ය ක්‍රම ගවේෂණය කිරීම තුළින් දරිද්‍රතාව පහත හෙළීම සඳහා කරනු ලබන වියදම් ප්‍රතිසංවිධානය කොට කාර්යක්ෂම කිරීම සඳහා රජය විසින් පියවර ගනු ලැබේ (1.අ ඉලක්කය).

2 ZERO HUNGER

වත්මන් තත්වය සහ ප්‍රවණතා

වැසි ජලයෙන් සිදු කෙරෙන හා ජලසම්පාදා කෘෂිකර්මය දේශීය ආහාර උපයෝජ්‍යතාවෙන් (මාළු හැර) 83% ක ප්‍රමාණයකට හා ශ්‍රී ලාංකීය අපනයනවලින් 25% කට වැඩි ප්‍රමාණයකට දායක වේ. ප්‍රධාන අපනයන බෝග (තේ, රබර්, පොල් හා කුළු බඩු) කෘෂිකාර්මික දළ දේශීය නිෂ්පාදිතයට විශාලතම දායකත්වය (35%) සපයන අතර අනතුරුව 29% ක දායකත්වය වී මගින් සැපයේ. ජනගහනයෙන් 25-30% පමණ ප්‍රමාණයක් කෘෂිකර්මාන්තය මත විශාල වශයෙන් යැපේ.

ඉහළ නංවන ලද දේශීය ආහාර නිෂ්පාදනය හේතුවෙන් ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ ආහාර උපයෝජ්‍යතාව ඉහළ යමින් පවතී. වර්තමානයේදී ශ්‍රී ලංකාවේ ආහාර අවශ්‍යතාවෙන් 80% ක් දේශීය වශයෙන් නිෂ්පාදනය කෙරෙන අතර ආනයනය කෙරෙනුයේ 20% කට අඩු ප්‍රමාණයකි. සහල්වලින් ස්වයංපෝෂිත තත්වයට ආසන්න වීම වනාහී ශ්‍රී ලංකාවේ ආහාර බෝග අංශය තුළ අත්කරගත් වැදගත් ජයග්‍රහණයකි. පුළුල් වන මාර්ග ජාලය සහ ඉහළ යන ගෘහස්ථ ආදායම සමග දිගු කාලීන වශයෙන් සමස්ත දරිද්‍රතා මට්ටම් පහළ යාමේ ප්‍රවණතාව, ආහාර වෙත භෞතික හා ආර්ථිකමය වශයෙන් වැඩි දියුණු වන ලද ප්‍රවේශය පෙන්නුම් කරයි.[50] 2014 වසරේදී 90% තරම් ඉහළ අගයක් ගත් රටේ ආහාර සුරක්ෂිත වූ ගෘහ ඒකක ප්‍රතිශතය මගින් මෙය මනාව පිළිබිඹු වන අතර එය පදනම්ව ඇත්තේ 0 සිට (අවම ආහාර අනාරක්ෂිතභාවය) 24 (දැඩි ආහාර අනාරක්ෂිතභාවය) දක්වා පරාසයක පැතිරෙන පරිමාණයක් වන ගෘහස්ථ ආහාර අනාරක්ෂිතභාවය වෙත ප්‍රවේශ වීමේ පරිමාණයේ 9.2 ක අගයක් හිමි කර ගැනීම මත වේ.[51]

කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකය සමස්තයක් ලෙස ඉහළ යාමේ ප්‍රවණතාවක් පෙන්නුම් කර ඇති අතර ඒ, 2007-10 පාදක කාල පරිච්ඡේදයේ 100 සිට 2016 වසරේදී 216.9 දක්වා ළඟා වෙමිනි.[52] රටේ ආහාර නිෂ්පාදන අංශයේ ඉහත සඳහන් කළ ජයග්‍රහණ සමග මෙය, 2.3 ඉලක්කය අත්කරගැනීමේදී රටේ පවතින ප්‍රගතිය පැහැදිලිව පෙන්නුම් කරයි

(2030 වසර වනවිට, කෘෂිකාර්මික ඵලදායිතාව සහ සුළු පරිමාණයේ ආහාර නිෂ්පාදකයින්ගේ ආදායම් දෙගුණ කරමින්). ආහාර උපයෝජ්‍යතාවේ වර්ධනය එසේ පැවතියදී, සහභාගීත්වය ලබාගැනීමේ වැඩමුළුවලදී පාර්ශවකරුවන් විසින් ආහාරවල ගුණාත්මකභාවය සහ ආරක්ෂාව සම්බන්ධයෙන් කරුණු අවධාරණයට ලක් කරන ලදී.[53]

එනමුත්, පෝෂණ සුරක්ෂිතතාව සම්බන්ධයෙන් රටේ වත්මන් තත්වය, තිරසර සංවර්ධන ඉලක්කය 2.2 අත්කරගැනීම සඳහා ප්‍රමාණවත් නොවේ. එම ඉලක්කය මගින් 2030 වසර වනවිට සියලු ආකාරයේ මන්දපෝෂණය තුරන් කිරීම අපේක්ෂා කෙරේ. ජන විකාශන හා සෞඛ්‍ය සමීක්ෂණය 2016 අනුව, පෝෂණ තත්වය 2006-07 සිට 2016 දක්වා වෙනස් නොවුණු තරම් වේ. 2016 වසරේදී වයස අවුරුදු පහට අඩු දරුවන්ගෙන් 17% ක් ඔවුන්ගේ වයසට වඩා මිටි වේ; 15% කට ඔවුන්ගේ උසට සරිලන පරිදි මහත නැත; එමෙන්ම 21% ක් අඩු බර දරුවන් වේ. එයට සාපේක්ෂව 2006-07 වසරවලදී, එම අගයන් පිළිවෙළින් 17.3%, 14.7% සහ 21.1% ක් විය. 2016 වසරේදී, විවාහක කාන්තාවන්ගෙන් 7% ක් සෙ.මී. 145 ක් වන කඩ ඉම් උසට වඩා පහළ වුණු අතර එය 2006-07 වසරේදී වාර්තා වූ 11% අගය හා සැසඳීමේදී වර්ධනයකි.

වයස අවුරුදු 15-49 අතර විවාහක කාන්තාවන්ගේ මධ්‍යන්‍ය ශරීර ස්කන්ධ දර්ශකය 24.8 ක් වන අතර 2006-07 වසරේ 23.1 ක් වූ එම අගය ඒ අන්දමින් වර්ධනය වී ඇත. ශරීර ස්කන්ධ දර්ශකයේ ව්‍යාප්තියෙන්, සාමාන්‍ය ශරීර ස්කන්ධ දර්ශකයක් (18.5 හා 24.9 අතර) පවතින්නේ විවාහක කාන්තාවන් 46% කට පමණි. විවාහක කාන්තාවන්ගෙන් 9% ක්, 32% ක් සහ 13% ක් පිළිවෙළින් කෘශ (ශ.ස්.ද. ළ 18.5), අධික බර (ශ.ස්.ද. 25.0 හා 29.9 අතර) සහ ස්ථූල (ශ.ස්.ද. 30 හෝ ඊට වැඩි) වශයෙන් සැලකේ.

පරතරයන් සහ අභියෝග

දිගු කාලීන හා ක්‍රමික වෙනස්කම්වලට අතිරේකව, දැඩි නියඟ හා ගං වතුර වැනි ආන්තික දේශගුණ තත්වයන් ශ්‍රී ලංකාව තුළ නිතර සිදුවන බව පැහැදිලිය (2.4 ඉලක්කය). ඒවා කෘෂිකාර්මික නිෂ්පාදනයට තර්ජනයක් එල්ල කරයි; කෘෂිකර්මාන්තය මත යැපෙන පිරිස වඩාත් අවදානමට ලක් කරයි; එමෙන්ම ආහාර හා පෝෂණ සුරක්ෂිතතා අවදානම් උග්‍ර කරවයි. අනාගත ආහාර සුරක්ෂිතතාව රඳා පවතිනුයේ, විවිධ ප්‍රභේදවලින් අස්වනු ලබා ගැනීමේ හැකියාව තවදුරටත් ඉහළ නැංවීම මත සහ ඉහළ යෙදවුම් භාවිත කාර්යක්ෂමතාවන් හා ජීවී, අජීවී පීඩනයන්ට ප්‍රතිරෝධය සහිත ආශ්‍රිත තාක්ෂණයන් මතය. මේ අනුව, ජාන සම්පත් භාවිතයේදී ප්‍රතිලාභ සාධාරණ අන්දමින් බෙදී යාම සහිතව, ප්‍රගතිශීලී, පූර්ව ක්‍රියාකාරී, ගොවීන්ට හිතකර හා විනිවිදභාවයෙන් යුත් පද්ධතියක් තුළින් බීජ, වගා කරන ලද ශාක හා ගොවිපල සතුන්ගේ ජාන විවිධත්වය පවත්වාගැනීම සහ ආශ්‍රිත සාම්ප්‍රදායික දැනුම අත්‍යවශ්‍ය වන අතර (2.5 ඉලක්කය) මෙය වනාහී අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍රයකි.

---

50 ලෝක ආහාර වැඩසටහන (2017). 'National Strategic Review of Food Security and Nutrition Towards Zero Hunger'. http://www.wfp.org/sites/default/files/NSRFSNZH_FINAL.pdf මගින් ලබාගත හැකිය.

51 ගෘහ ඒකක ආහාර සුරක්ෂිතතා සමීක්ෂණය -2014 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

52 නිෂ්පාදන දර්ශක. ශ්‍රී ලංකා මහ බැංකුව. https://www.cbsl.gov.lk/en/statistics/statistical-tables/real-sector/production-indicators මගින් ලබාගත හැකිය.

53 ස්වේච්ඡා ජාතික සමාලෝචන වලංගුකරණ වැඩමුළුවේදී පාර්ශවකරුවන් ඉදිරිපත් කළ කරුණු.

වෙනස්වන දේශගුණ රටාවන්, විශේෂයෙන්ම වර්ෂාපතනය, සමස්ත කෘෂිකර්මාන්ත අංශයටම බලපාන විශාලතම අවදානම බවට පත්ව තිබේ. විවාදාත්මක වශයෙන් දෙවනුව මතු වන විශාල අවදානම වනුයේ, කෘෂිකර්මාන්තයේ නිරත වීමට ග්‍රාමීය තරුණයින් දක්වන අකමැත්ත ඉහළ යාම තුළින් ශ්‍රම හිඟය ඇති වීමයි. මෙම නව අවදානම් දෙක එක්ව ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ තිරසර භාවයට දැඩි අභියෝගයක් එල්ල කරයි. බිම් කොටස් කැබලි කිරීම සමග ඒ ආශ්‍රිත ගැටළු සහ දිගින් දිගටම සිදුවන භූමි හායනය, දීර්ඝ කාලයක් පුරා වර්ධනය වෙමින් පවතින අනෙකුත් අවදානම් වේ.

වර්තමානයේ වගා කිරීමට සුදුසු නව ඉඩම් නොමැතිවීම, වගා කරන ලද ප්‍රදේශ පුළුල් කිරීමට දැඩි වශයෙන් බාධාවක් වී තිබේ. තවද, දේශීය වශයෙන් වගා කරනු ලබන ආහාර බෝගවල අස්වනු මට්ටම් සිත්ගන්නා සුළු නොවීම හේතුවෙන් ඵලදායිතාව සහ ආදායම ඉහළ නැංවීම සැබෑ අභියෝගයක් වී තිබේ.

1948 වසරේ නිදහස ලබාගැනීමේ සිට ශ්‍රී ලංකාව එහි ආහාර බෝග නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා ග්‍රාමීය යටිතල පහසුකම්, වාර්මාර්ග කටයුතු, තාක්ෂණය සංවර්ධනය හා පර්යේෂණ සහ ව්‍යාප්තිය වෙනුවෙන් ප්‍රමාණවත් පරිදි ආයෝජන සිදු කොට තිබේ (2.අ ඉලක්කය). කෙසේවුවද, 1970 මුල භාගයේ අරඹන ලද හරිත විප්ලවය සමයේදී ඉහළ යන ප්‍රවණතාවක් දැක්වූ කෘෂිකාර්මික පර්යේෂණ හා ව්‍යාප්තිය සඳහා කළ ආයෝජන 1977 වසරේදී පහළ යාමට පටන් ගත් අතර ඉන් අනතුරුව එම ආයෝජන සිදු වූයේ පහළ මට්ටමකිනි. කෘෂිකාර්මික තාක්ෂණය සහ ආහාර සැකසුම සඳහා පුද්ගලික අංශය විසින් කෙරෙන ආයෝජන අතර පරතරයක් තිබේ.[54]

ආහාර නිෂ්පාදනය උනන්දු කරවීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් අපනයන දිරිදීමනා සහ මූල්‍ය උපකරණ කිහිපයක් යොදා ගෙන ඇත. බදු හා විවිධ ෆිස්කල් ක්‍රියාමාර්ග, තීරුබදු ප්‍රතිදාන යෝජනා ක්‍රමයක්, අපනයන සැකසුම් යෝජනා ක්‍රමය සඳහා තාවකාලික ආනයනය, නිෂ්පාදන බැඳුම්කර යෝජනා ක්‍රමයක්, අපනයන සංවර්ධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමය, සරල කරන ලද එකතු කළ අගය මත බදු ක්‍රමය සහ ආනයන- අපනයන බැංකුවක් ස්ථාපිත කිරීම එයට ඇතුළත් වේ.[55] කෙසේවුවද, මෙහිදී වෙළඳාම විකෘති කරන අපනයන සහනාධාර රජය විසින් සැපයෙන්නේ නැත.

අලෙවිකරණය යනු, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්‍රියා පරිපාටීන් මුහුණ දෙන විශාලතම ගැටළුවකි. එබැවින්, ආහාර භාණ්ඩ වෙළඳපොල හා ඒවායේ ව්‍යුත්පන්නයන් නිසි පරිදි ක්‍රියාත්මක වීම සහතික කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම සහ ආන්තික ආහාර මිල වාෂ්පශීලතාව සීමා කිරීමට උපකාරී වීම සඳහා (2.ඇ ඉලක්කය) ආහාර සංචිත පිළිබඳ ඇතුළු වෙළඳපොල තොරතුරු වෙත කාලීන ප්‍රවේශය ලබාගැනීමට පහසුකම් සැලසීම, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඉතා වැදගත් වේ.

මාතෘ සහ ළමා සෞඛ්‍ය වැඩසටහන් සහ පෝෂණ විශේෂිත අත්‍යවශ්‍ය ක්‍රියාමාර්ග තුළින් සැපයෙන සේවාවන්ගේ ආවරණය සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කළ යුතු වේ. ප්‍රමාණවත් පරිදි පෝෂණ උපදේශණය සහ අධ්‍යාපනය ලබාදීමේ පරතරයන් පවතින අතර එයට ප්‍රධාන වශයෙන් හේතු වනුයේ මානව සම්පත් ධාරිතා හිඟය සහ ප්‍රතිග්‍රාහකයන් විසින් ඒවාට අනුකූලව කටයුතු නොකිරීම පිළිබඳ ගැටළුව වේ.[56] මන්දපෝෂණය පැවතීම හා සමානවම මේවාද දුරස්ථ ප්‍රදේශවල තදබල අන්දමින් දැකිය හැකි වේ. උදාහරණ ලෙස, වයසට වඩා මිටි වීම (32.4%) හා අඩු බර (29.6%) ඉහළම අගයන් වාර්තා වනුයේ නුවර එළිය ප්‍රදේශයෙන් වන අතර උසට සරිලන මහත නොමැතිවීමේ ඉහළම අගය (25%) මොණරාගල ප්‍රදේශයෙන් වාර්තා වේ.

---

54 ආසියානු සංවර්ධන බැංකුව (2017). 'The Sri Lankan Economy - Charting a New Course'. https://www.adb.org/sites/default/files/publication/373316/sri-lankan-economy.pdf මගින් ලබාගත හැකිය.

55 එම

56 Weerasinghe, M., and S. Bandara (2015), "Health and Socio-economic Determinants of Malnutrition in the Plantation Sector of Sri Lanka: A Review", Working Paper Series No.21, Institute of Policy Studies of Sri Lanka, Colombo

ඉදිරි ගමන්මග

කුසගින්න, ආහාර අනාරක්ෂිත භාවය සහ මන්දපෝෂණය යන බහු මාන ගැටළුව විසඳීම සඳහා සැබෑ ලෙසම ක්‍රියාවට නැංවීමේ සැලසුම් සමග ප්‍රතිපත්ති සහ වැඩසටහන් හා සම්බන්ධ නිර්දේශ විශාල ප්‍රමාණයක් සහිත බහු ආංශික ප්‍රවේශයක් අවශ්‍ය වේ. පර්යේෂණ හා සංවර්ධන කටයුතු, කෘෂිකාර්මික ව්‍යාප්තිය, වාරිමාර්ග යටිතලපහසුකම්, නව තාක්ෂණයන්, අලෙවිකරණය හා අගය දාම සංවර්ධනය, රාජ්‍ය හා පුද්ගලික අංශ සහයෝගීතාව, ආපදාවන්හි බලපෑම අඩු කිරීම සහ දේශගුණ තත්වයන්ට අනුගත වීම මෙන්ම ඉඩම් හා බීජ වෙළඳපොල ප්‍රතිසංස්කරණ යනාදිය සඳහා ආයෝජන සිදු කිරීම මෙයට ඇතුළත් වේ.

දේශය උදෙසා සහතික කළ ආහාර සුරක්ෂිතතාවක් සමග සියල්ල ඇතුළත් හා තිරසර ආර්ථික වර්ධනයක් අත්කරගැනීම සඳහා නව්‍ය තාක්ෂණයන් හඳුන්වාදීම කේන්ද්‍ර කරගනිමින් නව ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්ති ලේඛනයක් සකස් කෙරෙමින් පවතී (2.1, 2.3 හා 2.අ ඉලක්ක). කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2016 - 2018 වසර සඳහා වන ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන, සහල් හා අනෙකුත් ආහාර බෝග නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ ගෙවතු වගා වැඩසටහනකින් සමන්විත වේ (2.1 ඉලක්කය). තවද, කිරි කර්මාන්තය සංවර්ධනය කිරීම, ධීවර කර්මාන්තය නවීකරණය කිරීම, කෘෂිකාර්මික ' සුවිසල් කලාප ' හා අගය දාම සංවර්ධනය කිරීම, රාජ්‍ය-පෞද්ගලික අංශ- නිෂ්පාදක සහයෝගිතා සංවර්ධනය කිරීම සහ වාරිමාර්ග කටයුතු නවීකරණය සඳහා රජය විසින් වැඩසටහන් ගණනාවක් ආරම්භ කොට ඇත (2.1 හා 2.අ ඉලක්ක). ශ්‍රී ලංකාව සඳහා වන කෘෂිකර්මාන්ත අංශ නවීකරණ ව්‍යාපෘතියෙහි සංවර්ධන අරමුණු වනුයේ, කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීම, වෙළඳපොල ප්‍රවේශය වැඩි දියුණු කිරීම සහ කුඩා ඉඩම්හිමි ගොවීන්ගේ හා කෘෂි ව්‍යාපාරවල අගය එකතු කිරීම වැඩි දියුණු කිරීම වේ (2.1, 2.3 හා 2.ඇ ඉලක්ක).

2.4 ඉලක්කය මගින් දැක්වෙන පරිදි කාලගුණික අවදානම්වල බලපෑම අඩු කිරීම, කෘෂිකර්මාන්තයේ ප්‍රත්‍යාස්ථිතිය වර්ධනය කිරීම සහ තිරසර ආහාර නිෂ්පාදන පද්ධතීන් සහතික කිරීම සඳහා දැනටමත් සංවර්ධන මූලාරම්භයන් ගෙන තිබේ. කුඩා වැව් සංවර්ධන වැඩසටහන, ක්ෂුද්‍ර ජල සම්පාදන වැඩසටහන්, දේශගුණයට ඔරොත්තු දෙන ප්‍රභේදීය සංවර්ධනය සහ දර්ශක පාදක කෘෂිකර්මාන්ත රක්ෂණ වැඩසටහන යන තිරසර සංවර්ධන ඉලක්ක 13 (කාලගුණය හා සම්බන්ධ ක්‍රියාමාර්ග) හා බෙහෙවින්ම සම්බන්ධතාවක් දක්වන වැඩසටහන් ඒවාට ඇතුළත් වේ. බීජ සහ රෝපණ ද්‍රව්‍යවල ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම හා නියාමනය කිරීම, බීජ හා රෝපණ ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම, බීජ භාවිතා කරන්නන්ගේ හා රෝපණ ද්‍රව්‍ය හසුරුවන්නන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සහ දේශීය බීජවල ජාන සම්පත් හා රෝපණ ද්‍රව්‍ය ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම සඳහා (2.5 ඉලක්කය) යෝජිත නව බීජ පනත ක්‍රියාවට නැංවිය යුතු වේ. ආන්තීකරණයට ලක්වූ සහ පහසුවෙන් අවදානමට ලක්වන කණ්ඩායම්වල අඩු ඵලදායිතාව, කාර්යක්ෂමතාව හා සාධාරණත්වය පිළිබඳ ගැටළුවලට විසඳුම් සපයන අතරම පහළ අගයක සිට ඉහළ අගයක කෘෂිකර්මාන්තයක් වෙත විතැන් වීම සඳහා වත්මන් නොගැලපෙන ඉඩම් හා වාරිමාර්ග ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය කළ යුතු වේ.[57]

අදාළ සියලු අමාත්‍යංශවල පෝෂණය හා සම්බන්ධ ක්‍රියාකාරකම් වඩාත් යහපත් අන්දමින් සම්බන්ධීකරණය කිරීම සඳහා 2011 වසරේදී සෘජුවම ශ්‍රී ලංකා ජනාධිපතිවරයා යටතේ පිහිටුවන ලද ජාතික පෝෂණ සභාව මගින් 2.2. ඉලක්කය හා සම්බන්ධ අභියෝගවලට විසඳුම් සෙවීම සඳහා 2013-2016 වසර වෙනුවෙන් පෝෂණය උදෙසා බහු අංශ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කොට තිබෙන අතර [58] එම සැලැස්ම තුළ විවිධ අමාත්‍යංශ හා අනෙකුත් පාර්ශවකරුවන් වෙත ක්‍රියාවට නැංවීම සඳහා නිශ්චිත විධි නියෝග පැවරී තිබේ. එයට අමතරව, රජය විසින් නිෂ්පාදකයින් අතර යහපත් කෘෂි භාවිතයන් සහ යහපත් නිෂ්පාදන භාවිතයන් ප්‍රවර්ධනය කිරීම සඳහා උපායමාර්ග සංවර්ධනය කිරීමට දැනටමත් මුල් පියවර තබා තිබේ. ශ්‍රී ලංකා යහපත් කෘෂි භාවිත ලාංඡනය දැනටමත් සංවර්ධනය කර තිබෙන අතර යහපත් කෘෂි භාවිතයන් හා යහපත් නිෂ්පාදන භාවිතයන් පිළිබඳ ගොවීන් දැනුවත් කිරීමටත් ඒ පිළිබඳ දැනුම හා තාක්ෂණික දැනුම් හැකියාව ප්‍රවර්ධනය කිරීමටත් පියවර ගණනාවක් ගෙන තිබේ.

---

57 ස්වේච්ඡා ජාතික සමාලෝචන වලංගුකරණ වැඩමුළුවේදී පාර්ශවකරුවන් ඉදිරිපත් කළ කරුණු.
58 දැක්ම 2016: ශ්‍රී ලංකාව, පෝෂිත දැයක්: පෝෂණය සඳහා වන බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම. ශ්‍රී ලංකා ජාතික පෝෂණ ලේකම් කාර්යාලය (2013)

එසේ වුවද, බෙහෙවින්ම ජලය මත රඳා පවතින කෘෂිකර්මාන්තයේ සිට අඩුවෙන් ජලය මත රඳා පවතින/ නියඟයන්ට ඔරොත්තු දෙන බෝග හා ප්‍රභේද වෙත මාරු වීම සමග යාන්ත්‍රීකරණය වෙත යොමු වීම සිදු නොකළහොත් වත්මන් ආහාර නිෂ්පාදන ඉලක්ක ලඟා කර ගැනීමට තර්ජනයක් එල්ල විය හැකිය. එසේම, වඩාත් දිගු අගය දාමවලට සම්බන්ධ කළ ජනතා/ ගොවි සමාගම් නිර්මාණය කිරීම තුළින් කුඩා ගොවීන් මුහුණ දෙන පරිමාණ බාධාවන් ජය ගැනීම අවශ්‍ය වේ. මෙහිදී පහත සඳහන් දෑ ප්‍රධාන නිර්දේශ වශයෙන් හඳුනාගැනේ: :

1. නවීන තාක්ෂණය යොදාගනිමින් සෘතුමය වර්ෂාපතනය පිළිබඳ වඩාත් නිවැරදි පුරෝකථනයන් කිරීමේත් ආන්තික කාලගුණික තත්වයන් පිළිබඳ පූර්ව අනතුරු හැඟවීම් සිදු කිරීමේත් ධාරිතාව හා හැකියාව වැඩි දියුණු කිරීම සහ එවැනි පූර්ව අනතුරු හැඟවීම්වලට වේගයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා ආයතනික වැඩපිළිවෙල සංවර්ධනය කිරීම.

2. ජලය, ශ්‍රමය සහ කෘෂි රසායන අඩුවෙන් භාවිතා වන, නියඟයන්ට ඔරොත්තු දෙන බෝග ප්‍රභේද හා වගා රටා සංවර්ධනය කිරීම සහ ඒවා භාවිතය දිරි ගැන්වීම.

3. ජලය සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාව සහ ගොවිතැන් කටයුතු, අගය එකතු කිරීම හා අලෙවිකරණය සඳහා නව තාක්ෂණය යොදා ගැනීම පිළිබඳ ගොවීන්ට අධ්‍යාපනය ලබාදීම. මධ්‍ය කාලීන සිට දිගු කාලීන දක්වා ප්‍රතිඵල මේ අන්දමට ලබා ගත හැකිය.

4. එතුළින් අඩුවෙන් ජලය භාවිතා වන බෝග නිෂ්පාදනය, ගබඩා කිරීම, අගය එකතු කිරීම හා අලෙවිකිරීම ලාබදායී අන්දමින් සිදු කළ හැකි වේ. මෙය, ඵලදායී ණය සම්පාදනය, යෙදවුම් සැපයුම, ගබඩා කිරීම මෙන්ම රක්ෂණය, තිරසර/ වාණිජමය වශයෙන් ලාභදායී අන්දමින් සිදු කිරීම සඳහා පහසුකම් සලසනු ඇත.

5. වඩාත් යහපත් පෝෂණය හා ආහාර රටාවන්ගේ ඇති කරගත යුතු සුදුසු වෙනස්කම් පිළිබඳ විශාල වශයෙන් පාරිභෝගිකයින්ට අධ්‍යාපනය ලබාදීම. පිටි හා සීනි අඩුවෙන් පරිභෝජනය කිරීම සහ එළවළු හා පළතුරු පරිභෝජනය ඉහළ දැමීම මගින්, වර්තමානයේ කෘෂිකර්මාන්තය වැඩි වශයෙන් ජලය මත රඳා පැවතීම තරමක් දුරට අඩු කළ හැකිය.

3 GOOD HEALTH AND WELL-BEING

වත්මන් තත්වය සහ ප්‍රවණතා

පහළ මාතෘ හා ළමා මරණ අනුපාතය සහ ආයු අපේක්ෂාව ඉහළ යාම වැනි ප්‍රතිඵල අත්කරගැනීම අතින් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය පද්ධතිය ප්‍රසිධියක් ලබා ඇත. කෙසේවුවද, ජනගහනය වයස්ගත වීම වේගයෙන් සිදුවීම හා ලෙඩ රෝග රටාවන්ගේ වෙනස්කම් සමග බෝ නොවන රෝග වේගයෙන් ඉහළ යාම හා ආශ්‍රිතව මතුවෙමින් පවතින ගැටළු, රටේ සෞඛ්‍ය ආරක්ෂණ අවශ්‍යතා පරිවර්තනය කිරීමට දායක වී තිබේ.

ශ්‍රී ලංකාව විසින් තිරසර සංවර්ධන ඉලක්ක යටතේ මාතෘ මරණ අනුපාතයේ ගෝලීය ඉලක්කය (3.1 ඉලක්කය) දශක දෙකකටත් වඩා වැඩි කලකට පෙර අත්කර ගන්නා ලදී (සටහන 4.13 වෙත යොමුවන්න). 2015 වසරේදී ශ්‍රී ලංකාවේ මාතෘ මරණ අනුපාතය සජීවී දරු උපත් 100,000 කට මරණ 33.7 ක් වුණු අතර තිරසර සංවර්ධන ඉලක්කය වන සජීවී දරු උපත් එම ප්‍රමාණයට 70 ක් වන අගයට වඩා එය බෙහෙවින් අඩු අගයක් විය. එයට අමතරව, වයස අවුරුදු පහට අඩු දරුවන්ගේ මරණ අනුපාතය සහ නව ජන්ම මරණ අනුපාතය සජීවී දරු උපත් 100,000 කට පිළිවෙලින් 10 සහ 5.8 ක් විය.[59] මෙම මරණ අනුපාතද, ඒ ඒ අදාළ තිරසර සංවර්ධන ඉලක්කවලින් අරමුණු කෙරෙන අගයන්ට වඩා අඩු අගයක් ගනී (3.2 ඉලක්කය).

4.13 රූපය : ශ්‍රී ලංකාවේ මාතෘ මරණ අනුපාතය (1995-2015)



මූලාශ්‍රය: සෞඛ්‍ය අමාත්‍යංශය (2017), 'වාර්ෂික සෞඛ්‍ය පුවත් නිවේදන 2015' සෞඛ්‍ය අමාත්‍යංශය, කොළඹ. http://www.health.gov.lk/moh_final/english/public/elfinder/files/publications/AHB/2017/AHB%202015.pdf මගින් ලබාගත හැකිය.

____

59 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2017)

මැලේරියාව සහ ක්ෂයරෝගය වැනි ඇතැම් බෝවන රෝග (3.3. ඉලක්කය) පහත හෙළීම සම්බන්ධයෙන්ද ශ්‍රී ලංකාව සැලකිය යුතු කාර්යසාධනයක් අත්කරගෙන තිබේ. උදාහරණ ලෙස, 2016 වසරේදී ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ශ්‍රී ලංකාව මැලේරියා රෝගය තුරන් කළ රටක් වශයෙන් සහතික කරන ලදී. [60]; 2015 වසර තුළ රටේ ක්ෂය රෝග සිදුවීම් අනුපාතය, ජනගහනය 100,000 කට 65 ක් විය. එහි මරණ අනුපාතය, ජනගහනය 100,000 කට මරණ 5.6 ක් වුණු අතර ලෝක සෞඛ්‍ය සංවිධානයේ අග්නිදිග ආසියානු කලාපයේ සමස්තයක් වශයෙන් එම අගය ජනගහනය 100,000 කට මරණ 37 ක් විය. [61] කෙසේවුවද, මෙහිදී ඩෙංගු වැනි අනෙකුත් බෝවන රෝග වෙත දැඩි අවධානයක් යොමු කළ යුතු වේ. 2016 වසරේදී ජනගහනය 100,000 කට 142 ක් වූ ඩෙංගු රෝගයට ගොදුරු වූවන් සංඛ්‍යාව, 2016 වසරේදී ජනගහනය 100,000 කට 260 ක් දක්වා ඉහළ ගොස් තිබේ. [62] තවද, 2016 වසරේදී සිදු කරන ලද ජන විකාශන හා සෞඛ්‍ය සමීක්ෂණය මගින් පෙන්නුම් කෙරෙන පරිදි, එච් අයි වී ඒඩ්ස් රෝගය පිළිබඳ පූර්ණ දැනුමක් ඇත්තේ කාන්තාවන්ගෙන් 33% කට පමණි; ශ්‍රී ලංකාවේ එච් අයි වී රෝගයේ ව්‍යාප්තිය 1% ට අඩු වුවද, වාර්තා වුණු එච් අයි වී රෝගීන් සංඛ්‍යාව 2009 වසරේ 95 ක් වූ අතර[63] එය 2017 වසරේදී 285 ක් දක්වා වර්ධනය වී ඇත.[64] සැබැවින්ම එම අගය, 1987 වසරේදී පළමු වරට එච් අයි වී ආසාදිත ශ්‍රී ලාංකිකයෙකු හඳුනාගත් අවස්ථාවේ සිට වසරකදී වාර්තා වුණු ඉහළම අගය විය.

මාර්ග හදිසි අනතුරු හේතුවෙන් සිදුවන තුවාලවීම් හා මරණ සංඛ්‍යාවද (3.6 ඉලක්කය) ඉහළ යමින් තිබේ. මාර්ග මතදී දිනකට සිදුවන මරණ සංඛ්‍යාවේ සාමාන්‍යය 2014 වසරේදී 6.6 සිට 2015 වසරේදී 7.5 දක්වා ඉහළ ගොස් ඇතැයි තක්සේරු කොට තිබේ.[65] මාර්ග අනතුරු හේතුවෙන් සිදුවන මරණ අනුපාතය 2015 වසරේදී ජනගහනය 100,000 කට 13.4 ක් විය.[66]

ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනය එහි මහජන සෞඛ්‍ය පද්ධතිය මගින් ආවරණය වේ (3.8 ඉලක්කය). කෙසේවුවද, රටේ සෞඛ්‍යය සඳහා දරන මුළු වියදමෙන් අඩකටත් වඩා පුද්ගලිකව දරන වියදම් වන අතර ඉන් 83% ක් කුටුම්භයන් විසින් අතින් කරන ගෙවීම් වේ.[67]

පරතරයන් සහ අභියෝග

බෝ නොවන රෝග හේතුවෙන් ඇති කෙරෙන තර්ජනය ශ්‍රී ලංකාවට විශාල අභියෝගයක් වී ඇති අතර (3.8 ඉලක්කය) රජයේ රෝහල් තුළ වාර්ෂිකව සිදුවන සියලු මරණවලින් 71% ක් නිධන්ගත බෝ නොවන රෝග හේතුවෙන් සිදුවන මරණ වේ.[68] හෘත් වාහිනී රෝග, පිළිකා, දියවැඩියාව සහ නිධන්ගත ශ්වසන රෝග රටේ ජනගහනයට බරක් වී ඇති ප්‍රධාන බෝ නොවන රෝග වේ; 2012 වසරේදී ශ්‍රී ලාංකිකයින් වැඩි දෙනෙකුට මරණය ගෙන දුන් රෝගය වූයේ රුද්ධරක්තක හෘද රෝගයයි. [69] එයට අමතරව, නිධන්ගත වකුගඩු රෝගය රට තුළ සැලකිය යුතු මට්ටමේ ගැටළුවක් බවට පත්ව තිබේ.

විශේෂඥයින් වෙත යොමු කිරීමේ නිසි පද්ධතියක් වෙත එකඟව කටයුතු නොකිරීම සහ ප්‍රාථමික සෞඛ්‍ය සේවා ඒකකයන්හි පහසුකම් හිඟය අභියෝග බවට පත්ව තිබේ. ඒවායේ ප්‍රතිඵලයක් වශයෙන්, ද්වීතීය හා තෘතීය සෞඛ්‍ය සේවා ආයතනවල ජනයා පිරී ඉතිරී යන තත්වයකට පත්ව ඇත. රජයේ සෞඛ්‍ය පහසුකම් තුළ පවතින එම තදබදය සහ දීර්ඝ පොරොත්තු ලේඛන හේතුවෙන් පුද්ගලික සෞඛ්‍ය සේවා ලබාගැනීමට රෝගීන් පෙළඹී ඇති අතර එය සෞඛ්‍යය වෙනුවෙන් ඔවුන් අතින් දරන වියදම් ඉහළ යාමට හේතු වේ. [70]

යටිතල පහසුකම්, උපකරණ, සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩලය, රෝගීන්ගේ ආරක්ෂාව ආදී අංශවල සෞඛ්‍ය ප්‍රමිතීන් පවත්වා ගැනීම සම්බන්ධයෙන් රටේ සෞඛ්‍ය සේවා අංශයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ. කිසිවෙකු මග නොහැරෙන බව සහතික කිරීමට (3.8 ඉලක්කය) කටයුතු කරන ශ්‍රී ලංකා රජය, නාගරික හා ග්‍රාමීය අංශවලට වඩා සෞඛ්‍ය සේවා වෙත ප්‍රවේශය අඩු මට්ටමක පවතින හා පෝෂණයේ පහළ මට්ටම් වාර්තා වන වතු අංශයේ ප්‍රජාව වෙත සෞඛ්‍ය සේවා සැපයුම වැඩි දියුණු කිරීම සඳහා අවධානය යොමු කරයි. [71]

ශ්‍රී ලංකාව මාතෘ හා ළදරු මරණ අනුපාතයේ ජාතික සාමාන්‍ය අගයන් ප්‍රශංසනීය අන්දමින් පහළ මට්ටමෙන් පවත්වාගැනීමට සමත්ව ඇතත්, ප්‍රාදේශීය වශයෙන් පවතින සැලකිය යුතු මට්ටමේ විෂමතා, කිසිවෙකු මග නොහැරෙන බව සහතික කිරීමේදී තවමත් ජයගත යුතුව තිබෙන අභියෝග ගෙන හැර දක්වයි (3.1, 3.2 සහ 3.8 ඉලක්ක). තවද, ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය සේවා වෙත ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහාද විශාල ඉඩක් පවතී (3.7 ඉලක්කය); පවුල් සැලසුම් කිරීමේ තම අවශ්‍යතාව නවීන ක්‍රම මගින් සපුරා ගෙන ඇත්තේ ප්‍රජනන අවධියේ පසුවන කාන්තාවන්ගෙන් 55.9% ක් පමණි. [72] පරිපූර්ණ ලිංගික අධ්‍යාපනික තොරතුරු පාසල් විෂයය මාලාව තුළ නොමැති වීම සහ එම විෂයය පිළිබඳ වැඩිහිටියන් වෙත අධ්‍යාපනය ලබාදීම සිදු නොවීම වැනි ගැටළු පිළිබඳ මෙන්ම, ලිංගික අධ්‍යාපනය සම්බන්ධයෙන් වන ආකල්ප වැඩි දියුණු කිරීම පිළිබඳ අවධානය යොමු කොට කටයුතු කිරීම වටී.[73]

---

60 ශ්‍රී ලංකා මහ බැංකුව (2017), 'වාර්ෂික වාර්තාව 2016' ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

61 ලෝක සෞඛ්‍ය සංවිධානය (2017) (2017), 'Bending the Curve, Ending TB: Annual Report 2017'. http://apps.who.int/iris/bitstream/handle/10665/254762/978929022584-eng.pdf?sequence=1&isAllowed=y මගින් ලබාගත හැකිය.

62 ශ්‍රී ලංකා මහ බැංකුව (2017)

63 සෞඛ්‍ය අමාත්‍යංශය (2015), 'වාර්ෂික වාර්තාව 2015: ලිංගාශ්‍රිත රෝග සහ ඒඩ්ස් පාලන ජාතික වැඩසටහන ', සෞඛ්‍ය අමාත්‍යංශය, කොළඹ

64 ලිංගාශ්‍රිත රෝග සහ ඒඩ්ස් පාලන ජාතික වැඩසටහන (2017), 'යාවත්කාල කරන ලද: 2017 4 වන කාර්තුව' , සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, කොළඹ

65 එම

66 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2017)

67 ලෝක සෞඛ්‍ය සංවිධානය (2015), 'ලෝක සෞඛ්‍ය සංඛ්‍යාලේඛන 2015' , ලෝක සෞඛ්‍ය සංවිධානය, ජිනීවා

68 සෞඛ්‍ය අමාත්‍යංශය (2012), ''වාර්ෂික සෞඛ්‍ය පුවත් නිවේදන 2012', සෞඛ්‍ය අමාත්‍යංශය, කොළඹ

69 ලෝක සෞඛ්‍ය සංවිධානය (2017), 'Sri Lanka: WHO Statistical Profile'. http://www.who.int/gho/countries/lka.pdf?ua=1 මගින් ලබාගත හැකිය.

70 රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020

71 එම

72 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2017)

බෝවන රෝග සම්බන්ධයෙන් ගත් කළ (3.3 ඉලක්කය), දැනට තර්ජනයක් එල්ල කොට නොමැති වුවත් ඩෙංගු, ජලභීතිකාව, එච් අයි වී, ලාදුරු, ක්ෂයරෝගය ආදී මතුවෙන සහ නැවත මතු වෙන රෝග තුරන් කිරීම/ පහත හෙළීම පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ. 74 එයට අමතරව, දැනුවත්භාවය නොමැතිකම සහ බහු ආංශික සම්බන්ධීකරණය නොමැතිකම, විශේෂයෙන්ම ඩෙංගු රෝගය සම්බන්ධයෙන්, මතු වෙමින් පවතින ගැටළු වශයෙන් හඳුනාගෙන තිබේ. එමෙන්ම නව රෝගීන් හඳුනාගැනීම වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍යතාවක් පවතී. 75

ශ්‍රී ලංකාවේ වේගයෙන් වයස්ගතවන ජනගහනය, නිධන්ගත වකුගඩු රෝගයේ ව්‍යාප්තිය වර්ධනය වීම, ඉහළ යන ගෘහස්ථ ආදායම සමග සෞඛ්‍ය සම්පන්න නොවන ආහාර පුරුදු සහ මත්පැන් හා දුම්කොළ පරිභෝජනය ඉහළ යාම (3.5 ඉලක්කය) යනාදිය බෝ නොවන රෝග පැතිරයාම වර්ධනය වීමට දායක වනු ඇතැයි අපේක්ෂා කරන සාධක අතර වේ (3.4 ඉලක්කය). 76 තවද, පළිබෝධනාශකවලට නිරාවරණය වීම හේතුවෙන් නිධන්ගත රෝගාබාධ ඇතිවීමේ හැකියාව පෙන්නුම් කරන, ගොවිතැන් කටයුතු බහුල වශයෙන් සිදු කෙරෙන ප්‍රදේශවල නිධන්ගත වකුගඩු රෝගයේ වර්ධනය සැලකිල්ලට ගැනීමේදී, 77 – අන්තරායකර රසායන ද්‍රව්‍ය හා දූෂණය හේතුවෙන් ඇතිවන මරණ සහ රෝග පහත හෙළීම පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ (3.9 ඉලක්කය). බෝ නොවන රෝගවලට එරෙහිව සටන් කිරීමට පසුබිම සකස් කිරීම සඳහා මෙම අභියෝග ජයගත යුතුව ඇත.

ඉදිරි ගමන් මග

රටේ සෞඛ්‍ය අංශයේ ගුණාත්මකභාවය තවදුරටත් වැඩි දියුණු කළ යුතු අතර එවිට, මතුවෙමින් පවතින සියලු ගැටළු වෙත කාලානුරූප අයුරින් අවධානය යොමු කළ හැකි වේ. ප්‍රාථමික සෞඛ්‍ය සේවා සැපයීම ශක්තිමත් කළ යුතු අතර එමගින් සෞඛ්‍ය සේවා සඳහා පුද්ගලිකව දරන වියදම් (සහ අතින් කරන ගෙවීම්) මෙන්ම ද්වීතීය හා තෘතීය සෞඛ්‍ය සේවා පහසුකම් තුළ ජනයා පිරී ඉතිරී යාමද අඩු කළ හැකි වේ. එයට අමතරව, රජයේ රෝහල් තුළ පාරිභෝගික සේවා වැඩි දියුණු කිරීමේත් මානසික සෞඛ්‍ය සේවා වෙත ප්‍රවේශය හා ඒ පිළිබඳ මහජනයාගේ අවබෝධය වැඩි දියුණු කිරීමේත් අවශ්‍යතාවක් පවතී.78 මරණයට පත්වීම සහ රෝගවලට බඳුන්වීම පමණක් නොව, දරිද්‍රතාව හා ආර්ථික වර්ධනය කෙරෙහිද බලපෑම් එල්ල කිරීම සැලකිල්ලට ගෙන බෝ නොවන රෝග ව්‍යාප්තිය පහත හෙළීම අත්‍යවශ්‍ය වේ.

යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, අත්‍යවශ්‍ය ඖෂධ හා සේවා සැපයීම සහ වත්මන් සෞඛ්‍ය පද්ධතිය ක්‍රමානුකූලව සංවර්ධනය කිරීම සහතික කිරීම පිළිබඳ රජය අඛණ්ඩව අවධානය යොමු කරයි. නව සෞඛ්‍ය ප්‍රතිපත්තියක් (2016 -2025) සහ ප්‍රාථමික සෞඛ්‍ය සේවා ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරීම මගින් රජය, සියලු දෙනා වෙත සෞඛ්‍ය ආවරණය සහතික කිරීමේදී මතුවන අභියෝග ජය ගැනීම සඳහා පහත ප්‍රතිසංස්කරණ ආරම්භ කොට තිබේ:

1. අදාළ අත්‍යවශ්‍ය සේවාවන් මෙන්ම විශේෂිත ප්‍රතිකාර සපයන රෝහල් තුළ තදබදය පහත හෙළීම සඳහා විශේෂඥ වෛද්‍යවරුන් යොමු කිරීමේ නිසි ක්‍රමවේදයක් සමග පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව හා රෝග කල්තබා හඳුනාගැනීම සහතික කරමින් ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය ප්‍රතිව්‍යූහගත කිරීම.

---

73 පළමු තේමාගත වැඩමුළුවේදී පාර්ශවකරුවන් ඉදිරිපත් කළ කරුණු
74 රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020
75 පාර්ශවකරුවන් ඉදිරිපත් කළ කරුණු
76 රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020
77 ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (2016), 'ආර්ථිකයේ තත්වය 2016' ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, කොළඹ
78 ස්වේච්ඡා ජාතික සමාලෝචන වලංගුකරණ වැඩමුළුවේදී පාර්ශවකරුවන් ඉදිරිපත් කළ කරුණු.

2. සෞඛ්‍ය සේවා සංවිධාන ශක්තිමත් කිරීම සහ ඵලදායී හා කාර්යක්ෂම ලෙස සේවා සැපයීම සඳහා පමණක් නොව, රෝගීන්ගේ තෘප්තිමත් බව සහතික කිරීම සඳහා පුරවැසියන් කේන්ද්‍රකරගත් ගුණාත්මක සේවාවක් සැපයීම සඳහාද සෞඛ්‍ය සේවා සැපයීම හා නියාමනය කිරීම.

3. හඳුනාගත් ජන කොටස් සඳහා ප්‍රාථමික වෛද්‍ය සේවා ඒකක පිහිටුවීම මගින් සෑම රෝගියෙක් සඳහාම අඛණ්ඩ වෛද්‍ය සත්කාර ලැබෙන බව සහතික කරමින්, අඩු මිල ගණන් සහිත හා තිරසර වන්නා වූ 'පුරවැසි කේන්ද්‍රිත, සංකලිත සෞඛ්‍ය සේවා පද්ධතියක්' සංවර්ධනය කිරීම.

4. විෂමතාවන් අවම කරමින් සෞඛ්‍ය සේවා සැපයුමේ ගුණාත්මකභාවය හා ආරක්ෂාව වැඩි දියුණු කිරීම.

යහපත් සෞඛ්‍යය හා යහපැවැත්ම පිළිබඳ වන තිරසර සංවර්ධන ඉලක්කය 3 අත්කරගැනීම, අනෙකුත් තිරසර සංවර්ධන ඉලක්ක අත්කරගැනීම සමගද බැඳී පවතී: සෞඛ්‍ය සේවා සඳහා අධික වියදමක් දැරීම හේතුවෙන් දරිද්‍රතාව තුරන් කිරීමේ ප්‍රයත්නයන්හි බලපෑම අකර්මක විය හැකිය (තිරසර සංවර්ධන ඉලක්කය 1 සහ 10); පෝෂණය සම්බන්ධයෙන් දුර්වල කාර්යසාධනය (තිරසර සංවර්ධන ඉලක්කය 2 වෙත යොමුවන්න) දරුවන්ගේ කායික හා මානසික සෞඛ්‍යය සහ යහපැවැත්ම කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කරයි (තිරසර සංවර්ධන ඉලක්කය 2); රෝග වැළැක්වීම පිළිබඳ අධ්‍යාපනය හා දැනුවත්භාවය, ජනගහනය තිරසර අන්දමින් නිරෝගී වීම සහතික කිරීම සඳහා අවශ්‍ය වේ (තිරසර සංවර්ධන ඉලක්කය 4); පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව (තිරසර සංවර්ධන ඉලක්කය 6) සහ පිරිසිදු බලශක්තිය (තිරසර සංවර්ධන ඉලක්කය 7) සැපයීම තුළින් මෙන්ම තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටාවන් ප්‍රවර්ධනය කිරීම මගින් (තිරසර සංවර්ධන ඉලක්කය 12), පරිසර දූෂණය හේතුවෙන් සිදුවන මරණ හා රෝගාබාධවලට ගොදුරුවීම් පහත හෙළීම අවශ්‍ය වේ; රජයේ සෞඛ්‍ය සේවා වියදම් බර අඩු කිරීම සඳහා පුද්ගලික අංශය වෙතින් සම්පත් සචලීකරණය සඳහා නවෝත්පාදන අවශ්‍ය වේ (තිරසර සංවර්ධන ඉලක්කය 8); සෞඛ්‍ය සේවා යටිතල පහසුකම්වල තත්වය වැඩි දියුණු කළ යුතු වේ (තිරසර සංවර්ධන ඉලක්කය 9); නගර සැලසුම්කරණයේදී වඩාත් පිරිසිදු, ආරක්ෂාකාරී හා සෞඛ්‍යසම්පන්න ලෙස ජීවත්විය හැකි පරිදි නිවාස පහසුකම්, ප්‍රවාහන කටයුතු සහ හරිත අවකාශ වෙත ප්‍රවේශය සැපයීමට අවධානය යොමු කළ යුතුය (තිරසර සංවර්ධන ඉලක්කය 11); කාලගුණික තත්වයන් හා ආශ්‍රිතව ඇතිවන උපද්‍රව සහ ආපදා හේතුවෙන් සෞඛ්‍යයට එල්ල වන අවදානම සම්බන්ධයෙන් රක්ෂණය ලබාදීමට පියවර ගත යුතුය (තිරසර සංවර්ධන ඉලක්කය 13); දිය යට ජීවය (තිරසර සංවර්ධන ඉලක්කය 14) සහ මිහි මත ජීවය (තිරසර සංවර්ධන ඉලක්කය 15) තිරසර අන්දමින් කළමනාකරණය කිරීම, ආහාර සැපයුමේ සුරක්ෂිතභාවය සහ සෞඛ්‍ය සම්පන්න ආහාර ලබාගැනීමේ හැකියාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය වේ; ගැටුම් හා ප්‍රචණ්ඩත්වය, මානසික මෙන්ම කායික යහ පැවැත්ම මත ඇති කරන අහිතකර බලපෑම හඳුනාගැනීම සහ එයට විසඳුම් ලබාදීම අවශ්‍ය වේ (තිරසර සංවර්ධන ඉලක්කය 16); අවසාන වශයෙන් තිරසර සංවර්ධන ඉලක්කය 17 මගින්, ජනතාවට සමෘද්ධිය ලඟා කර ගැනීම සඳහාත් නිරෝගී ජීවිත ගත කිරීම සඳහාත් ඉඩ සලසන යහපාලනය මත පදනම් වූ සමාජමය ව්‍යූහයන් සහ සංගත සාර්ව ආර්ථික ප්‍රතිපත්තිමය පසුබිම සැපයේ. [79]

79 https://unsdglk.socialcops.com/ මත පදනම්වය.

4 QUALITY EDUCATION

වත්මන් තත්වය හා ප්‍රවණතා

අධ්‍යාපනික ඉලක්ක සපුරාගැනීම අතින් ආඩම්බර විය හැකි සිත් ඇදගන්නා සුළු වාර්තාවන් ශ්‍රී ලංකාව සතුවන අතර දකුණු ආසියානු කලාපය තුළ පමණක් නොව, මැදි ආදායම් හා ඉහළ ආදායම් උපයන රටවල් කාණ්ඩ දෙක අතරද අපේක්ෂාවන් අභිබවා ඉලක්ක සපුරා ගන්නා රටක් වශයෙන් කැපී පෙනෙයි. සියලු දරුවන් වෙත ප්‍රාථමික අධ්‍යාපනය ලබාදීම හා සම්බන්ධ සහස්‍ර සංවර්ධන ඉලක්ක තුනම 2015 වසරට පෙර අත්කරගැනීමට ශ්‍රී ලංකාව සමත්ව තිබේ. 2012/13 වසර වනවිට, පළමු ශ්‍රේණියට ඇතුළත් වූ සිසුන්ගෙන් 100% ක් ඔවුන්ගේ ප්‍රාථමික අධ්‍යාපනය සම්පූර්ණ කළ අතර 96.5% ක් පහළ ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කළහ. 80. ප්‍රාථමික පාසල් වෙත ඇතුළත් කරගැනීමේ ශුද්ධ අනුපාතය 2015 වසරේදී 99% ක් වුණු අතර එය එම අගය ඉහළ ආදායම් උපයන රටවල සාමාන්‍යයට වඩා ඉහළ අගයක් විය (4.14 සටහන). ද්විතියක පාසල් වෙත ඇතුළත් කරගැනීමේ අනුපාතයද 85% ක් තරම් ඉහළ අගයක් ගත් අතර එය මැදි ආදායම් උපයන හා දකුණු ආසියානු රටවල සාමාන්‍යයට වඩා සැලකිය යුතු මට්ටමේ ඉහළ අගයක් විය. මෙම ජයග්‍රහණ රටේ සියලු දිස්ත්‍රික්ක තුළින් සහ ස්ත්‍රී පුරුෂ දෙපිරිසම වෙතින් වාර්තා වී තිබේ. වයස අවුරුදු 15-24 අතර පසුවන පිරිස අතර සාක්ෂරතා අනුපාතය සම්බන්ධයෙන්ද ශ්‍රී ලංකාව සැලකිය යුතු මට්ටමේ ප්‍රගතියක් අත්කරගෙන තිබේ. 2006/2007 වසරවලදී 95.8% ක් වූ එම අගය, දත්ත ලබාගත හැකි අවසානම වසර වන 2012 වනවිට 97.8% දක්වා වර්ධනය විය. එයද සියලු දිස්ත්‍රික්ක හා ස්ත්‍රී පුරුෂ දෙපිරිසම තුලිනි. 81. 1945 වසරේ නිදහස් අධ්‍යාපන පනත ගෙන ඒමේ සිට රජය විසින් නිදහස් අධ්‍යාපනය ලබාදීම, මෙම ජයග්‍රහණ අත්කරගැනීම සඳහා විශාල පිටිවහලක් වී ඇති සේම කිසිවෙකු මග නොහැරෙන බව සහතික කිරීම සඳහාද උපකාරී වී තිබේ (4.1 කොටුව).

4.14 රූපය : පාසල්වලට ඇතුළත් වීමේ හා පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කිරීමේ අනුපාතය



සටහන: ශ්‍රී ලංකාව සහ ලෝක සාමාන්‍ය අගයන් පිළිබඳ දත්ත 2015 වසර සඳහා වේ, එහිදී එම වසර සඳහා ශ්‍රී ලංකාවේ පහළ ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කරන අනුපාතය ඇතුළත් නොවන අතර එම අගය ඇත්තේ 2011 වසර සඳහා වේ. දකුණු ආසියානු සාමාන්‍යයන් පිළිබඳ දත්ත 2014 වසර සඳහා වේ.

මූලාශ්‍රය: ලෝක බැංකුව, 2017

---

80 එක්සත් ජාතීන්ගේ (2015) සහස්‍ර සංවර්ධන ඉලක්ක පිළිබඳ මෙරට වාර්තාව, 2014

81 එම

4.1 කොටුව: ශ්‍රී ලංකාවේ සැමට නිදහස් අධ්‍යාපනය

1943 වසරේදී එවකට සිටි අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතා විසින් රාජ්‍ය මන්ත්‍රණ සභාව වෙත නිදහස් අධ්‍යාපන පනත් කෙටුම්පත හඳුන්වා දෙනු ලැබූ අතර 1945 ඔක්තෝම්බර් 1 වනදින එම පනත බලාත්මක කරන ලදී. වයස අවුරුදු පහට වැඩි සියලු පාසල් දරුවන් සඳහා විශ්වවිද්‍යාල පළමු උපාධිය තෙක් නිදහස් අධ්‍යාපනය හිමි වන බව දැක්වෙන මෙම ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාව ප්‍රශංසනීය අන්දමින් අත්කර ගෙන තිබෙන අධ්‍යාපනික ජයග්‍රහණ සඳහා විශාල පිටිවහලක් වී ඇත. රජය එහි විවිධ මට්ටම්වලදී, රජය විසින් සැපයෙන අධ්‍යාපනය වෙනුවෙන් ප්‍රධාන වශයෙන් මුදල් යොදවයි. රජය විසින් අරමුදල් සැපයෙන අධ්‍යාපනික යෙදවුම්, ගොඩනැගිලි, ගෘහභාණ්ඩ හා උපකරණ සඳහා දරන වියදම් වැනි ආයෝජන යෙදවුම් සහ ගුරුවරුන් හා අනෙකුත් කාර්ය මණ්ඩලය, පරිභෝජ්‍ය සැපයුම්, පාසල් නිල ඇඳුම්, ආහාර වේල් හා පෙළ පොත් සැපයීම සඳහා දරන වියදම් මෙන්ම පරිපාලනය හා සංවර්ධනය ආශ්‍රිත වියදම් වැනි පුනරාවර්තන යෙදවුම් යන යෙදවුම් වර්ග දෙකෙන්ම සමන්විත වේ.

නිදහස් අධ්‍යාපන පනතේ වැදගත් සංරචකයක් වන දිවා ආහාර වේල් වැඩසටහන මගින් දිළිඳු දරුවන් ඉලක්ක කෙරුණු අතර අධ්‍යාපනය, පෝෂණය හා සම්බන්ධ කරන ලදී. එමෙන්ම 1950 වසරේදී සියලු පාසල් ආවරණය කෙරෙන පරිදි එය පුළුල් කරන ලදී. 1952 වසරේදී ආරම්භ වූ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයද තවත් වැදගත් මුල් පියවරකි. පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේදී ගන්නා ලකුණු මත පදනම්ව දිළිදු පවුල්වල දරුවන්ට වඩාත් හොඳ පාසල් වෙත ඇතුළත්වීම සඳහාත් මාසික ශිෂ්‍යාධාරයක් ලබාගැනීම සඳහාත් එය ක්‍රියාවට නංවන ලදී.

අධ්‍යාපනය හා ආශ්‍රිතව දිළිදු පවුල්වලට දැරීමට සිදුවන වියදම් බර තවදුරටත් අඩු කිරීම සඳහා 1982 වසරේදී පාසල් පෙළපොත් නොමිලේ ලබාදීම ආරම්භ වුණු අතර 1993 වසරේදී නොමිලේ නිල ඇඳුම් ලබාදීම හා සහනදායී මිල ගණන් යටතේ ප්‍රවාහන පහසුකම් සැපයීම දක්වා එය පුළුල් කරන ලදී. 1993 වසරේදීම සියලු පළාත් තුළ විමධ්‍යගත කොට්ඨාස අධ්‍යාපන කාර්යාල පිහිටුවීමත් සිදු කරන ලදී. ඒවා 1995 වසරේදී අධ්‍යාපන කලාප බවට පත් කරන ලදී. වැඩි කොටස්වලට බෙදා ඒ ඒ මට්ටම්වලින් අධ්‍යාපන වැඩසටහන් අධීක්ෂණය කිරීම හා කළමනාකරණය කිරීමත් එමගින් කලාප මට්ටමෙන් පාසල් පිළිබඳ වඩාත් නිශ්චිතව අවධානය යොමු කිරීමත් මෙම ප්‍රතිපත්තියේ අරමුණ විය.

පාසල් වෙත දරුවන් ඇතුළත් කිරීමේ ඉහළ අනුපාතය සඳහා දායක වුණු තවත් වැදගත් ප්‍රතිපත්තියක් නම්, 1997 වසරේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ඉදිරිපත් කරන ලද අනිවාර්ය අධ්‍යාපන රෙගුලාසිය. එමගින් 1998 වසරේදී වයස අවුරුදු 5-14 අතර දරුවන් සඳහා පාසල් අධ්‍යාපනය අනිවාර්ය කරමින් සියලු දරුවන් සඳහා අවම වශයෙන් වසර නවයක අනිවාර්ය අධ්‍යාපනය සහතික කරන ලදී.

පරතරයන් සහ අභියෝග

තිරසර සංවර්ධන ඉලක්කය 4 න්‍යාය පත්‍රය, ”ජීවිත කාලය පුරා අධ්‍යාපනයේ සියලු මට්ටම්වලදී ගුණාත්මක ඉගෙනුම් අවස්ථා ලබාගැනීමේ සමාන අවස්ථා සහතික කිරීම” සඳහා වන සහස්‍ර සංවර්ධන ඉලක්ක ඉක්මවා යයි. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා පහළ ද්විතීයික අධ්‍යාපනය සඳහා ඇතුළත්වීම් සැලකිය යුතු මට්ටමක පැවතියද ඉහළ ද්විතීයික හා තෘතීය මට්ටම්වල සංඛ්‍යාලේඛන එතරම් සිත්ගන්නා සුළු නොවේ. උදාහරණ ලෙස, ඉහළ ද්විතීයික සහ තෘතීය අධ්‍යාපනය සම්පූර්ණ කරන ලද වයස අවුරුදු 15 සහ ඊට ඉහළ ජනගහනය පිළිවෙලින් 35% සහ 13% වේ. [82] මෙරට අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහ ඉගෙනුම් ප්‍රතිඵල දකුණු ආසියානු කලාපය තුළ සාපේක්ෂව යහපත් මට්ටමක පැවතියද, තවදුරටත් වැඩි දියුණු කළ හැකිවේ. එහිදී පවතින විශේෂිත ඉලක්ක මට්ටමේ අභියෝග පහත සාකච්ඡා කෙරේ. ආර්ථික වර්ධනය හා සංවර්ධනය ඉදිරියට මෙහෙයවීමේදී අධ්‍යාපනය විසින් ඉටු කරනු ලබන ප්‍රධාන භූමිකාව හඳුනාගත් රජය, මෙම අභියෝග බොහොමයක් මේ වනවිටත් හඳුනාගෙන තිබෙන අතර ඒවා විසඳීම සඳහා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග යෝජනා කොට තිබේ. ඒවා ඉදිරි ගමන්මග යටතේ සාකච්ඡා කෙරේ.

මුල් ළමාවිය අධ්‍යාපනය වෙත ප්‍රවේශය කාලයත් සමග ඉහළ ගොස් ඇති නමුත් මැදි හා ඉහළ ආදායම් උපයන බොහෝ රටවල් හා සැසඳීමේදී එම අගය පවතින්නේ පහළ මට්ටමකය (4.2 ඉලක්කය). වයස අවුරුදු තුනේ සිට පහ දක්වා දරුවන්ගෙන් 76% ක් කිසියම් ආකාරයක ඉගෙනුම් වැඩසටහනක් හා සම්බන්ධව සිටියද පෙර පාසල් අධ්‍යාපන වැඩසටහනකට යොමුව සිටිනුයේ වයස අවුරුදු 3-5 දරුවන්ගෙන් 50% ක් පමණි. එමෙන්ම, ආදායම හා පිහිටන ස්ථානය අතින්ද විෂමතා පවතී; දිළිඳුතම පංචමකය තුළ වයස අවුරුදු 3-4 අතර දරුවන්ගෙන් 39% ක් පමණක් පෙර පාසල් අධ්‍යාපන වැඩසටහනකට ඇතුළත් කෙරෙන අතර ධනවත්ම පංචමකය තුළ එම අගය 56% කි. [83] තවද, මුල් ළමාවිය අධ්‍යාපන මධ්‍යස්ථාන බොහොමයක් තුළ ඉගැන්වීම හා ඉගෙනීම සඳහා, විශේෂයෙන්ම විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා, ප්‍රමාණවත් සම්පත් නොපවතී. මෑත දශකවලදී ශ්‍රී ලංකාව තුළ පිළිවෙලින් බලයට පත්ව ආ රජයන් විසින් මුල් ළමාවිය ආරක්ෂණය සහ අධ්‍යාපනය, ශ්‍රී ලංකාවේ මානව ප්‍රාග්ධන හා සාධාරණත්ව අරමුණු අත් කරගැනීම සඳහා වැදගත් වන බව හඳුනාගෙන තිබේ. [84]

ශ්‍රී ලංකාව තුළ තෘතීය අධ්‍යාපනය සහ කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව වෙත ඇතුළත්වීම් සැලකිල්ලට භාජනය කළ යුතු කාරණා වේ. වයස අවුරුදු 20-24 අතර පසුවන්නන් අතරින් විශ්වවිද්‍යාල, අනෙකුත් අධ්‍යාපනික ආයතන හෝ වෘත්තීය පුහුණු වැඩසටහන් වෙත ඇතුළත් වන්නේ 18% ක් පමණි. [85] ශ්‍රී ලංකාවේ තෘතීය අධ්‍යාපනය සඳහා ඇතුළත් වන දළ අනුපාතය 21% ක් වන අතර පිළිවෙලින් 22% ක් හා 44% ක් වන පහළ මැදි අදායම් සහ ඉහළ මැදි ආදායම් රටවල්වලට වඩා එය පහළ අගයකි. [86] රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ධාරිතාව සම්බන්ධයෙන් පවතින සීමාවන්, පුද්ගලික අංශයේ සම්බන්ධවීමද සහිත නිසි සමාන්තර උසස් අධ්‍යාපන පද්ධතියක් නොමැති වීම සහ මුල් අවස්ථාවේ පවතින කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව, ඇතුළත් වීම් අඩු මට්ටමක පැවතීමට බලපාන ප්‍රධාන හේතු වේ (4.3 ඉලක්කය).

ඇතුළත්වීම්වල අක්‍රමික භාවය සහ උපාධිධාරීන් රැකියාවක නිරත වීම පහළ මට්ටමක පැවතීම සැලකිල්ලට ගැනීමේදී, විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ සහ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ ගුණාත්මක භාවය හා අදාළත්වයද වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ. 50% කට වැඩි සිසුන් ප්‍රමාණයක් ඇතුළත් වන්නේ කලා හා සමාජ විද්‍යා විෂයයන්ට වන අතර ස්වභාවික විද්‍යා විෂයයන් වෙත ඇතුළත් වන්නේ බෙහෙවින්ම අඩු ප්‍රමාණයකි. [87] එයට විශාල වශයෙන් හේතු වන්නේ 13 ශ්‍රේණිය දක්වා විද්‍යා විෂයයන් හැදෑරීම සඳහා පහසුකම් පවතින්නේ පාසල්වලින් 10% කට පමණක් වීම ය. එම පාසල්ද වැඩි වශයෙන් එක් රැස්ව පවතිනුයේ නාගරික ප්‍රදේශ තුළය. තවද, පළමු වතාවට රැකියාවක් සොයන උපාධිධාරීන් සතුව රැකියාවට අදාළ නිපුණතා මෙන්ම ගැටළු විසඳීම, විචාරාත්මක චින්තනය, නිර්මාණශීලීත්වය, කණ්ඩායමක් වශයෙන් කටයුතු කිරීමේ හැකියාව සහ සන්නිවේදන කුසලතා වැනි මෘදු කුසලතා නොමැති බව සේවා යෝජකයින්ගේ මතය වේ [88] (4.4 ඉලක්කය).

අවුරුදු 5-14 අතර වයසේ පසුවන ආබාධ සහිත දරුවන්ගෙන් හතරෙන් එකකට ආසන්න ප්‍රමාණයක් පාසල් නොයන බව ජන හා නිවාස සංගණන දත්ත අනාවරණය කරයි.[89] තවද, එහිදී අධ්‍යාපනයේ නිරත වීම වයසත් සමග පහළ යාමක් දක්නට ලැබේ; අවුරුදු 15-19 අතර වයසේ පසුවන ආබාධිත ජනගහනයෙන් 55.4% ක් පමණද අවුරුදු 20-24 අතර වයසේ පසුවන ආබාධිත ජනගහනයෙන් 86% ක්ද කිසියම් හෝ අධ්‍යාපනික ක්‍රියාකාරකමක හෝ වෘත්තීය පුහුණුවක නිරතව නොසිටියහ. [90] අවාසියට පත් පසුබිම්වල සිසුන් සඳහාද ප්‍රවේශය හා ගුණාත්මකභාවය පිළිබඳ ගැටළු පවතී. ධනවත් හා දිළිඳු සිසුන් අතර විභාග සමත්වීමේ අනුපාත අතර පුළුල් විෂමතා පවතී: 2012/13 වසරවලදී ධනවත්ම වියදම් දශමකයට අයත් සිසුන්ගෙන් 60% ක් පමණ සාමාන්‍ය පෙළ හා උසස් පෙළ සමත්වුණු අතර පහළම වියදම් දශමකයේ එම අගය 20% ක් පමණක් විය.[91]

---

82 Arunatilake, N. 2016. Labour Market Analysis using Census Data. Colombo: UNFPA

83 Dundar, H., Millot, B., Riboud, M., Shojo, M., Aturupane, H., Goyal, S. and Raju, D. (2017). Sri Lanka Education Sector Assessment: Achievements, Challenges, and Policy Options. Directions in Development—Human Development;. Washington, DC: World Bank

84 Ibid

85 ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 2017. ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ තත්වය 2017. කොළඹ: ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

86 එම

87 Dundar, H., Millot, B., Riboud, M., Shojo, M., Aturupane, H., Goyal, S. and Raju, D. (2017). Sri Lanka Education Sector Assessment: Achievements, Challenges, and Policy Options. Directions in Development—Human Development. Washington, DC: World Bank

88 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව. 2017. ශ්‍රම ඉල්ලුම පිළිබඳ සමීක්ෂණයේ වාර්තාව 2017

89 Jayawardena, P. and M. Abeyawickrama, 2016, Barriers and Opportunities in the Provision of Education for Children with Learning Disabilities in Sri Lanka. UNICEF

90 එම

පාසල්වල සම්පත් බෙදී යාමද වරප්‍රසාද ලත් පාසල් තුළ අධ්‍යාපනය හදාරන වඩාත් ධනවත් සිසුන්ට හිතකර අන්දමින් පවතින අතර ගුණාත්මක බවින් ඉහළ පාසල් යටිතල පහසුකම් සහ ගුරුවරු හිඟය අඩු ආදායම් ලාභී සිසුන් සම්බන්ධයෙන් පවතී [92] (4.5 ඉලක්කය).

සමස්තයක් වශයෙන් ගත් කළ ශ්‍රී ලංකාව තුළ ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි වැනි විෂයයන්වල ද්විතීයික පාසල් ගුරුවරුන්ගේ අතිරික්තයක් පවතින බව පාසල් සංගණන දත්ත මත පදනම් වුණු පර්යේෂණ මගින් දැක්වෙයි. කෙසේවුවද, සුදුසුකම් සහිත පළපුරුදු ගුරුවරුන් සිටිනුයේ ඉතා අඩු ප්‍රමාණයක්ය. එම හිඟය සියලු පළාත්වල පාසල් තුළින් - විශේෂයෙන්ම අඩු වරප්‍රසාද ලත් පාසල් තුළින්- වාර්තා වෙයි. [93] පූර්ව සේවා ගුරු පුහුණුව සඳහා අවස්ථා ප්‍රමාණවත් නොවීම සහ ගුරුවරුන් යෙදවීමේ ප්‍රතිපත්ති හා සම්බන්ධ ගැටළු මෙම හිඟය ඇතිවීමට විශාල වශයෙන් දායක වී තිබේ (4 ඇ ඉලක්කය).

---

91 Jayawardena, Priyanka and Ronald. Miller, (2017), "Bridging Skills for Employment in Sri Lanka" in "Sri Lanka Fostering Workforce Skills Through Education - Employment Diagnostic Study ", Asian Development Bank and International Labour Organization

92 Abayasekara, A. and Arunatilake, N. 2017. “Better Schools for Better O-Level Results in Sri Lanka”. Colombo: Institute of Policy Studies

93 Arunatilake, N. and Abayasekara, A. 2017. “Are there Good Quality Teachers for All Classrooms in Sri Lanka?” Colombo: Institu te of Policy Studies

ඉදිරි ගමන් මග

සම අධ්‍යාපන අවස්ථා හා ප්‍රතිඵල වැඩි දියුණු කිරීම සඳහා රට පුරා උසස් තත්වයෙන් යුතු පාසල් ඉදිකිරීම ඉතා වැදගත් වේ. 2016-2020 මධ්‍ය කාලීන උපාය මාර්ගික සංවර්ධන වැඩසටහන යටතේ ශ්‍රී ලංකා රජය විසින් මේ සම්බන්ධයෙන් "ළඟම පාසල හොඳම පාසල" ජාතික වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහනේ සමස්ථ අරමුණ වන්නේ අධ්‍යාපනයේ දී සැමට සම අවස්ථා සලසා දීම වන අතර එමගින් අනාගතයේ දී එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තෝරාගත් පාසල් " සුපිරි පාසල්" බවට පරිවර්තනය කිරීමටත් ප්‍රමාණය ඉක්මවූ ප්‍රචලිත නාගරික පාසල්වල ශිෂ්‍යයන් සංඛ්‍යාව පාලනය කිරීමටත් අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහන යටතේ (1) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය නියෝජනය කෙරෙන පරිදි පාසල් 600ක්; (2) වෙනත් මෑතකාලීන සංවර්ධන වැඩසටහන්වලට ඇතුළත් නොවන උසස් පෙළ පංති සහිත පාසල් 1200ක්; (3) ද්විතීය පාසල් සංවර්ධන වැඩසටහනක කොටසක් ලෙස පාසල් 776ක් සහ

(4) ප්‍රාථමික පාසල් සංවර්ධන වැඩසටහනක කොටසක් ලෙස පාසල් 3577 ක් සංවර්ධනය කිරීමට පියවර ගනු ලැබේ.[94] ඉදිකිරීම් හා අලුත්වැඩියාවන්, මානව සම්පත් සංවර්ධනය හා භාණ්ඩ හා උපකරණ සැපයීම, පංති කාමර, ගුරු හා විදුහල්පති නිල නිවාස, ක්‍රීඩා සංකීර්ණ, විද්‍යාගාර ඉදිකිරීම, සනීපාරක්ෂක පහසුකම් සහ ජල පහසුකම්, පාසල් උත්ශ්‍රේණිගත කිරීම, දන්ත සෞඛ්‍ය පහසුකම් සහ ප්‍රධාන හා සුළු අලුත්වැඩියාවන් යන ක්ෂේත්‍රවල සංවර්ධන කටයුතු සිදු කරනු ලැබේ. විද්‍යා අධ්‍යාපනය වෙත ප්‍රවේශය වැඩි දියුණු කිරීම මගින් තෘතීය බඳවාගැනීම් සිදු කෙරෙන අක්‍රමික ස්වභාවය හා ශ්‍රම වෙළඳපළ තුළ නිපුණතා නොගැලපීම යන කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමට ද මෙම යෝජනාව වැදගත් වේ.

උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය ඉහළ නැංවීමේ දී විෂය මාලා සංශෝධනයන් ද අත්‍යවශ්‍ය වේ. ගෝලීය වෙළඳපළ ඉල්ලුමට සරිලන පරිදි පුද්ගලයන්ගේ නිපුණතා සංවර්ධනය කිරීමට රජය විසින් වැදගත් පියවර කිහිපයක් ගෙන ඇත. වාර්තමාන රැකියා වෙළඳපළ ඉල්ලුම සපුරාලීම හා සිසුන්හට තාක්ෂණ හා වෘත්තීය නිපුණතා අත්කර දීම සඳහා වැඩි විද්‍යා උගතුන් ප්‍රමාණයක් බිහි කිරීමේ අරමුණින් විද්‍යා, වාණිජ හා කලා විෂය ධාරාවන්ට අමතරව 2013 දී නව උසස් පෙළ තාක්ෂණ විෂය ධාරාවක් හඳුන්වා දෙන ලදී.95 රජයේ විශ්ව විද්‍යාල හතරක මෑත දී නව තාක්ෂණ පීඨ ද ස්ථාපිත කරන ලදී. ගෝලීයකරණය වූ ශ්‍රම වෙළඳපළක නිපුණතා ඉල්ලුමට සරිලන පරිදි පාඨමාලා සැලසුම් කිරීමේ දී විශ්ව විද්‍යාල හා පුද්ගලික අංශය අතර සබඳතා වැඩි දියුණු කිරීම ඒ සමානව ම වැදගත් වේ. පාසල් හා විශ්ව විද්‍යාල සඳහා සීමාවාසික හා ස්වේච්ඡා වැඩසටහන් ඇතුළත් කිරීම ද රැකියාවට අදාළ නිපුණතා සිසුන් තුළ සංවර්ධනය කිරීම සඳහා උපකාරී වේ.

බාල පරම්පරාව තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ නිපුණතා සංවර්ධනය කිරීම සඳහා පාසල් විෂය මාලාවන්ට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාව ඇතුළත් කිරීමට හා විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල ඩිජිටල් තාක්ෂණය පදනම් වූ ඉගැන්වීමේ හා ඉගෙනීමේ පහසුකම් වැඩි දියුණු කිරීමට ද රජය සැලසුම් කරයි.[96] 2017 ජනවාරි මස බස්නාහිර පළාත තුළ ප්‍රථම "ස්මාර්ට් පංති කාමරය" (Cloud Smart Classroom) විවෘත කරන ලද අතර දැනටමත් එහි සිසු ගුරු අභිප්‍රේරණයට, පැමිණීමට හා ඉගෙනුම් ප්‍රතිඵලවලට අදාළව කැපී පෙනෙන ප්‍රගතියක් දැකිය හැකිය. නියමු ව්‍යාපෘතියක් ලෙස අධ්‍යාපන අමාත්‍යංශය විසින් තෝරා ගත් පාසල් 25ක එවැනි පංති කාමර සංවර්ධනය කිරීමට සැලසුම් කරනු ලැබේ. තවද විදුලි සංදේශ හා ඩිජිටල් යටිතළ පහසුකම් අමාත්‍යංශය හා අධ්‍යාපන අමාත්‍යංශයේ සහයෝගීත්වය යටතේ පාසල් අධ්‍යාපන පද්ධතියට අදාළව "Internet of Things" යන මාතෘකාව යටතේ වන වැඩසටහනක් ආරම්භ කරන ලදී. පාසල් 128ක් ආවරණය කෙරෙන නියමු අදියර BBC microbit Foundation of the United Kingdom සමග හවුල්කාරීත්වයෙන් දියත් කරන ලද අතර එමගින් නවෝත්පාදනය පාදක වූ IoT උපාංග පිළිබඳ ගුරුවරුන් හා සිසුන්හට අත්දැකීමක් ලබා දීමට අවස්ථාව සලසන ලදී. 2017 සිට අදාළ විෂය මාලා සංශෝධනය හා ගුරු පුහුණුව අඛණ්ඩව සිදු කරන ලදී. [97]

---

94 ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යංශය. 2018. "ළඟම පාසල හොඳම පාසල වැඩසටහන"
95 ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යංශය. 2017
96 දැක්ම 2025
97 විදුලි සංදේශ හා ඩිජිටල් යටිතළ පහසුකම් හා විදේශ රැකියා පිළිබඳ අමාත්‍යංශය. 2018

තවද තරුණ පරම්පරාව රැකියාවට අදාළ නිපුණත්වයෙන් සන්නද්ධ කිරීම සඳහා කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු අංශයේ තත්වය, අදාළත්වය හා ප්‍රවේශ වීමේ හැකියාව වැඩි දියුණු කිරීමට ද රජය කැප වී ඇත. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ දී අඩු කාර්යසාධනයක් පෙන්නුම් කරන සිසුන් සඳහා ප්‍රායෝගික විෂයන් සහිත වෘත්තීය විෂය ධාරාවක් හඳුන්වා දීම හරහා වසර 13 ක අනිවාර්ය අධ්‍යාපන මූලාරම්භයක් ක්‍රියාත්මක කිරීමට රජය සැලසුම් කරයි.[98] මෙය "කිසිවෙකු මග නොහැරීම" යන සංකල්පය යටතේ වන වැදගත් මූලාරම්භයක් වන අතර එමගින් ශාස්ත්‍රීය විෂය ධාරාවෙන් ඉවත් වන සිසුන්හට වෘත්තීය විෂය ධාරාව යටතේ තම ඉගෙනීම් කටයුතු අඛණ්ඩව කරගෙන යාමට අවස්ථාව සැලසේ. වෘත්තීය පුහුණු ආයතන සඳහා සම්පත් වෙන් කිරීම ප්‍රධාන වශයෙන් රැකියා විරහිතභාවය හා ඌණ සේවා නියුක්තිය ඉහළ මට්ටමක පවතින දිස්ත්‍රික් සඳහා වන අතර එය සියල්ල ඇතුළත් වූ වර්ධනයක් සඳහා උපකාරී වේ.

අදාළ පාසල් යටිතළ පහසුකම් වැඩි දියුණු කිරීම, විශේෂ අධ්‍යාපන ගුරුවරුන් සඳහා යෝග්‍ය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම ආබාධිත ළමුන් ඔවුන්ගේ පාසල් ජීවිතය පුරාවට පහසුකම් සැලසීම හා සහාය වීම සඳහා විදුහල්පතිවරුන්, ගුරුවරුන් හා සෙසු ශිෂ්‍යයන් තුළ යෝග්‍ය ආකල්ප ඇති කිරීම මගින් ආබාධිත පුද්ගලයන්ගේ අධ්‍යාපනය සඳහා පහසුකම් හා ප්‍රවේශය ඉහළ නැංවීම සඳහා ද අවධානය යොමු කළ යුතුය. මේ සඳහා වඩාත් ඉලක්කගත අධ්‍යාපනික වැඩසටහන් මගින් ආබාධිත පුද්ගලයන්ට අධ්‍යාපනය සඳහා වන ප්‍රවේශය ඉහළ නැංවීමට රජය විසින් පොරොන්දු වන ලදී.

සමස්ථ වශයෙන් ගුරුවරුන්ගේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ දී විශ්ව විද්‍යාලවල පූර්ව සේවා ගුරු පුහුණුව සඳහා අවස්ථා වැඩි කිරීම කෙරෙහි රජය විසින් අවධානය යොමු කරන ලදී. මේ සඳහා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන මගින් අධ්‍යාපනවේදී උපාධියක් පිරිණැමීමට රජය විසින් යෝජනා කරන ලදී.[100] එසේ ම විශේෂයෙන් ගුරු සේවයේ අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් ජාතික අධ්‍යාපන විද්‍යාල උපාධි පිරිණමන ආයතන බවට පරිවර්තනය කිරීම තුළින් පූර්ව සේවා ගුරු පුහුණුව ශක්තිමත් කිරීමට ද රජය අපේක්ෂා කරයි. තවද උපදේශකවරුන්ගේ වෘත්තීය සංවර්ධනය හා ගුරුවරුන් සඳහා වන ඊ ඉගෙනුම් පද්ධතිවල සංවර්ධනය තුළින් ගුරු මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම මගින් සේවාස්ථ ගුරු පුහුණුව ද වැඩි දියුණු කරනු ඇත.[99]

ග්‍රාමීය පාසල් කෙරෙහි ගුරුවරුන් ආකර්ෂණය කිරීම හා ඒවායෙහි රඳවා ගැනීම සඳහා මුදල්මය හා වෙනත් දිරි දීමනා (උසස්වීම්වල දී අමතර ගෙවීම් සිදු කිරීම, කුඩා පංති කාමර, විදුහල්පති හා පාසල් ප්‍රජාවගේ සහාය, යහපත් තත්වයේ පවතින නිළ නිවාස ආදිය) තුළින් ගුරුවරුන් සඳහා අරමුදල් වෙන් කිරීම හා යෙදවීම වැඩි දියුණු කළ යුතුය. මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍යාංශ මට්ටමින් නොව පාසල් මට්ටමින් ගුරුවරුන් බඳවා ගැනීම මගින් ද ගුරුවරුන්ට පාසල් අතර ස්ථාන මාරුවීම සඳහා අඩු නම්‍යශීලීබවක් ලබා දිම තුළින් පාසල් අතර ගුරු ස්ථාන මාරු අවම කිරීමට උපකාරී විය හැකිය. වතුකරයේ පාසල්වල පවතින උග්‍ර දමිළ මාධ්‍ය ගුරු හිඟය සඳහා පිළියමක් ලෙස එම පාසල්වල පාසල් මට්ටමේ බඳවා ගැනීමමේ ප්‍රතිපත්ති දැනටමත් රජය විසින් ක්‍රියාත්මක කර ඇත.

ඉහත සාකච්ඡා කරන ලද මූලාරම්භයන්ට අමතරව අධ්‍යාපන අමාත්‍යාංශව විසින් පහත දක්වා ඇති ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ "ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අංශයේ සංවර්ධනය" සඳහා වන විශේෂ ව්‍යාපෘතියක් දියත් කරන ලද අතර එය හඳුනාගත් ප්‍රධාන ප්‍රතිපත්ති සංශෝධන සිදු කිරීමට උපකාරී වනු ඇත:

- අධ්‍යාපනයේ දී සාධාරණත්වය තහවුරු කිරීම: ළමුන් සියළුදෙනා ම සඳහා සාධාරණ අවස්ථා
- අධ්‍යාපනයේ තත්වය හා වගවීම ඉහළ නැංවීම
- පාසල් පාදක කළමනාකරණය තුළින් පාසල් සවිබල ගැන්වීම
- අධ්‍යාපන පාලනය ශක්තිමත් කිරීම හා ධාරිතා සංවර්ධනය
- අධ්‍යාපන ප්‍රතිපත්ති, සැලසුම්කරණය, පර්යේෂණ හා ප්‍රතිඵල පාදක අධීක්ෂණය හා ඇගයීම වැඩි දියුණු කිරීම

---

98 2025 දැක්ම
99 එම
100 රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020

5 GENDER EQUALITY

වර්තමාන තත්වය හා ප්‍රවනතා

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව පිළිබඳ ශ්‍රී ලංකාව මගින් මිශ්‍ර ප්‍රතිරූපයක් පිළිඹිබු කෙරේ. එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතියෙහි ප්‍රජනක සෞඛ්‍යය, සවිබලගැන්වීම හා ශ්‍රම වෙළඳපළ සහභාගීත්වය යන මිනුම් තුන යොදා ගනිමින් ස්ත්‍රී පුරුෂ අසමානතාව මනින ස්ත්‍රී පුරුෂ අසමානතාව පිළිබඳ දර්ශකයෙහි (GII) රටවල් 188 අතරින් 73වන ස්ථානය ශ්‍රී ලංකාවට හිමි විය. ලෝක ආර්ථික සන්සදය මගින් ඉදිරිපත් කරන ලද 2017 ගෝලීය ස්ත්‍රී පුරුෂ පරතරය පිළිබඳ වාර්තාවෙහි සඳහන් වන පරිදි රටවල් 144 අතරින් ශ්‍රී ලංකාව 109 වැනි පහළ මට්ටමක පැවති අතර එයට බොහෝ දුරට බලපා ඇත්තේ සමාන කාර්යයන් සඳහා ලබා දෙන වැටුප්වල පවතින විශාල පරතරයයි.

කිසිවෙකු මග නොහැරීමේ අපේක්ෂාවෙන් දශක හතක් පුරා නිදහස් සෞඛ්‍ය හා අධ්‍යාපන සේවාවන් වෙත සැමට ප්‍රවේශය ලබා දීම තුළින් ඊට අදාළ බොහෝ දර්ශකයන්හි ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ඇති වී තිබේ (5.1 ඉලක්කය). දකුණු ආසියානු සාමාන්‍යය වන මරණ 182 ට සාපේක්ෂව මාතෘ මරණ අනුපාතය සජීවී උපත් 100000ට 33.7ක් දක්වා පහළ බැස ඇත (2015 දී).101 ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ප්‍රාථමික, ද්විතියික ලියාපදිංචි කිරීම හා පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කිරීමේ අනුපාතයන්හි ද පවතින අතර ගැහැණු ළමෝ ඉහළ ද්විතියික හා තෘතීය අධ්‍යාපනයෙහි ඉහළ ලියාපදිංචි අනුපාතයක් හා රැඳී සිටීමේ අනුපාතයන් සහ පොදු විභාගවලදී ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කරති. කෙසේ වුවද, ස්වභාවික විද්‍යාවන් හා තොරතුරු තාක්ෂණය සඳහා ලියාපදිංචි කිරීමේ දී පිරිමි ළමුන්ට වාසිසහගත වන ස්ත්‍රී පුරුෂ අසමතුලිතභාවය මගින් කාන්තාවන්ට ඉහළ නිපුණතාවයෙන් යුතු හා වාසිසහගත රැකියාවන් වෙත ප්‍රවේශ වීමේ හැකියාව සීමා කෙරේ.102 ශ්‍රී ලංකාවෙහි කාන්තාවන් සඳහා කැප වූ අමාත්‍යංශයක් ඇත - එනම් ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යංශය වන අතර එමගින් කාන්තා අයිතිවාසිකම් පනත් කෙටුම්පත හා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වැනි ජාතික නීති සම්පාදනය කරමින් පවතියි.103

පරතරයන් හා අභියෝග

ශ්‍රම බලකා සහභාගීත්වයෙහි (LFP) හා රැකියා විරහිත අනුපාතයන්ගේ (5.1 ඉලක්කය) ඇතුළත් ස්ත්‍රී පුරුෂ අසමානතාවන් සමග කාන්තා අධ්‍යාපනික අරමුණු ශ්‍රම වෙළඳපළ අරමුණු බවට පරිවර්තනය කිරීමට නොහැකි වීම ප්‍රධාන ගැටළුවකි. අවිධිමත් ශ්‍රම වෙළඳපළෙහි හා විශේෂයෙන් කෘෂිකර්මාන්තයට අදාළ වැටුපක් නොලබන පවුල තුළ සිදු කෙරෙන ශ්‍රම දායකත්වයට අදාළව ආර්ථික වශයෙන් ක්‍රියාකාරී කාන්තාවන් විශාල වශයෙන් සංකේන්ද්‍රණය වීමක් දක්නට ලැබේ. ශ්‍රම බලකා සහභාගීත්වය ද 35% ක් වූ පහළ මට්ටමක පවතියි.104 සමාජය තුළ කාන්තාවගේ භූමිකාව පිළිබඳ සංස්කෘතික ඒකාකෘති හා ළමුන් හදාවඩා ගැනීමේ වගකීම් විසමානුපාතික ලෙස අම්මාවරුන් වෙත පැවරීම කාන්තාවන්ගේ අඩු ශ්‍රම බලකා සහභාගීත්වයට අදාළ ප්‍රධාන හේතු අතර වේ. 105 සියළු ම ගෘහ ඒකක අතරින් කාන්තා මූලික ගෘහ ඒකක 24.3% ක් වන අතර ඒ අනුව දරිද්‍රතාව හා ආන්තිකකරණයට භාජනය වීමේ වැඩි හැකියාවක් පවතියි.

ස්ත්‍රී පුරුෂ අසමානතාවන් දැකිය හැකි තවත් අවස්ථාවක් වන්නේ දේශපාලන සහභාගීත්වයට අදාළවයි (5.5 ඉලක්කය). 1931 සිට කාන්තාවන්හට සිය ඡන්දය භාවිතා කිරීමට හා දේශපාලන කටයුතුවල නියැලීමට අයිතිය තිබුණ ද දකුණු ආසියාවෙහි පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය 18%ක් වන සාමාන්‍ය අගයට සාපේක්ෂව මෙරට කාන්තා සහභාගීත්වය සැමවිටම 6%ට අඩු අගයක පැවතිණි. සාක්ෂි මත පදනම්ව තීරණ ගැනීම සඳහා දත්ත අවශ්‍ය වේ.

---

101 ලෝක බැංකුව.2017. ලෝක සංවර්ධන දර්ශක

102ආසියානු සංවර්ධන බැංකුව 2015 Country Gender Assessment Sri Lanka: An Update. Manilla: ADB

101 එම

102 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු.2017.ශ්‍රී ලංකා ශ්‍රම බලකාය පිළිබඳ සමීක්ෂණයඃ වාර්ෂික වාර්තාව 2016

103 Gunewardena, D. 2015. “Why aren’t Sri Lankan women translating their educational gains into workforce advantages?” The 2015 Echidna Global Scholars Working Paper, Centre for Universal Education

ඉදිරි ගමන් මග

නම්‍යශීලී වැඩ තත්වයන්, නිවසේ සිට වැඩ කිරීමේ තත්වයන් හා අර්ධකාලීන වැඩ හඳුන්වාදීම, ප්‍රවාහන පහසුකම් හා දීමනා සැපයීම සහ රැකියා විරාමයන්ට පසුව යළි ශ්‍රම වෙළඳපළ වෙත පිවිසීම සඳහා කාන්තාවන්හට යෝග්‍ය මාර්ග සකස් කර දීම කාන්තා ශ්‍රම බලකා සහභාගීත්වය (FLFP) ඉහළ නැංවීමට සඳහා වැදගත් වේ. ශ්‍රී ලංකා සන්දර්භයට ගැලපෙන හොඳම තහවුරු කිරීමේ ප්‍රතිපත්ති පිළිබඳ තීරණය කිරීම සඳහා අනාගත පර්යේෂණ අවශ්‍ය විය හැකිය. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය බැහැර කිරීමට නම් පවතින නීති පිළිබඳ දැනුවත් කිරීම, නීති නිසි පරිදි බලාත්මක කිරීම හා වින්දිතයන් සඳහා ගැටුම්වලදී ආරක්ෂාව සලසන ස්ථාන, නෛතික සහාය හා උපදේශනය වැනි ප්‍රමාණවත් උපකාරක සේවා සැපයීම සිදු කළ යුතුය. ජාතික මට්ටමින් ව්‍යාප්තව වූ දත්ත පැවතීම මගින් තවදුරටත් ප්‍රතිචාර ශක්තිමත් කිරීම හා පෙළගැස්වීම සිදු කෙරෙනු ඇති අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වළක්වනු ඇත. නොවිධිමත් රැකියාවන්හි නිරත හා ගෘහ මූලිකයන් වන කාන්තාවන් ඇතුළු නොසලකා හැරුණු පුද්ගලයන් සඳහා පිළියම් ලබා දීම සඳහා ඉලක්කගත ප්‍රතිචාර අවශ්‍ය වනු ඇත.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සඳහා පිළියම් ලබා දීමට වර්තමානයේ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කෙරෙමින් පවතින අතර ප්‍රචණ්ඩත්වයෙන් මිදුණු පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා විවිධ ස්ථානවල රක්ෂාස්ථාන ස්ථාපිත කර ඇති අතර පොලිසිය හා වෙනත් පාර්ශවකරුවන්ගේ සහාය ඇතිව ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ දත්ත රැස් කිරීම සඳහා ඩිජිටල් දත්ත පද්ධතියක් සකස් කරන ලදී.[106] විශේෂයෙන් ගැටුම්වලින් බලපෑමට ලක් වූ කාන්තාවන්ගේ සාමාජීය - ආර්ථික තත්වය ඉහළ නැංවීම, ග්‍රාමීය කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා සහාය වීම සහ රැකියා අවස්ථා වැඩි කර ගැනීමට තාක්ෂණික ක්ෂේත්‍ර වෙත පිවිසීමට ගැහැණු ළමුන් දිරිමත කිරීම සඳහා ගෘහ මූලිකයා කාන්තාව වන නිවාස ඒකක සඳහා ජාතික රාමුවක් (2017 - 2019) ද හඳුන්වා දෙන ලදී.[107] මුළු ආසන සංඛ්‍යාවෙන් 25%ක් කාන්තාවන් සඳහා වෙන් කිරීම සඳහා පළාත් පාලන ඡන්ද නීතිය සංශෝධනය කිරීමේ පනත 2016 දී සම්මත වීමත් සමග රජය විසින් දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තා සහභාගීත්වය ඉහළ නැංවීම කෙරෙහි ද අවධානය යොමු කරන ලදී.[108]

---

106 UN Women, 2018, "Sri Lanka commits to update national action plan, and sustain firm commitment to gender equality and women's empowerment (updated)". http://www.unwomen.org/en/get-involved/step-it-up/commitments/sri-lanka

107 එම

108 එම

8 DECENT WORK AND ECONOMIC GROWTH

වර්තමාන තත්වය හා ප්‍රවනතාවයන්

සිය ජනගහනයෙන් විශාල කොටසක් රැකියාවල නියුක්ත කරමින් මෑතකාලීනව රැකියා විරහිත අනුපාතය 5% ට අඩු මට්ටමක පවත්වා ගැනීමට ශ්‍රී ලංකාවට හැකි වී තිබේ.109 අනෙක් අතට ශ්‍රම බලකා සහභාගීත්වය 54%ක් වැනි එතරම් සිත් ඇද ගන්නා සුළු නොවන මට්ටමක පවතියි.110 පශ්චාත් ගැටුම් අවධිය තුළ රැකියාවක නියුතු එක් පුද්ගලයෙකුට තත්‍ය දළ දේශීය නිෂ්පාදිතයෙහි වාර්ෂික වර්ධන අනුපාතය (in constant 2011 PPP /) 6.3% ක පමණ වර්ධනයක් පෙන්නුම් කරන ලදී (8.2 ඉලක්කය).111 මුළු රැකියා ප්‍රමාණයට විධිමත් නොවූ රැකියා අංශයේ දායකත්වය සාපේක්ෂව විශාල අගයක් ගන්නා අතර එය 60.2% වන අතර එයින් 60.6%ක් කෘෂිකාර්මික නොවන අංශයට අදාළ වේ (8.3 ඉලක්කය).112 රැකියාවක නිරත වීම සඳහා අදාළ වන අවම වයස පිළිබඳ 138 සම්මුතිය හා ළමා ශ්‍රමයේ නරකම ආකාරයන් පිළිබඳ 182 සම්මුතිය ඇතුළු ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රධාන සම්මුතීන් අටක් ශ්‍රී ලංකාව විසින් අත්සන් කර අනුමත කරන ලදී. 2016 දී ළමා ශ්‍රමිකයන් මුළු ජනගහනයෙන් 1%ක් පමණක් වූ තත්වයක් යටතේ 2025 වන විට ශ්‍රී ලංකාව ළමා ශ්‍රමය ලබා ගැනීමේ සියළු ආකාර වළක්වාලීමට අවශ්‍ය නිසි මග ගමන් කරන බව පෙනී යයි (8.7 ඉලක්කය).113 ශ්‍රී ලංකාවේ සමාජීය ආරක්ෂණ වැඩසටහන් මගින් සෞඛ්‍ය, අධ්‍යාපනය, වැඩිහිටි ජනගහනය, සේවකයන් හා ආර්ථික වශයෙන් අගතියට පත් වූ හා වැඩිහිටි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම, විශ්‍රාම පාරිතෝෂිතය (සේවක අර්ථසාධක අරමුද), සේවක අනතුරු වන්දි, මාතෘ ප්‍රතිලාභ හා සමෘද්ධි යෝජනා ක්‍රමය ඇතුළු අංශ රැසක් ආවරණය කෙරේ. 2017 අයවැය මගින් රාජ්‍ය ආයෝජන වියදමින් රු. 13.9ක් සමාජ ආරක්ෂණය සඳහා වෙන් කරන ලද අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.1% විය (8බි ඉලක්කය).114 ශ්‍රී ලංකාවේ දිළිඳු ම හා ආන්තිකකරණයට ලක් වූ කණ්ඩායම් අතරින් එකක් වන තේ දළු නෙළන්නන්ගේ දෛනික වැටුප 2016 ඔක්තෝම්බර් මස රු. 620 සිට රු. 730 (ඇ.ඩො. 5) දක්වා ඉහළ නැංවීම ද සාධනීය කරුණකි.

ශ්‍රී ලංකාවේ මුළු සංක්‍රමණික සේවකයන් ප්‍රමාණය මිලියන 1.8 ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇති අතර මෙම සේවකයන් විසින් එවන මුදල් ශ්‍රී ලංකාවේ වාර්ෂික දළ දේශීය නිෂ්පාදිතයෙන් විශාල කොටසක් වේ (8.8 ඉලක්කය). විදේශ රැකියා අපේක්ෂාවෙන් සිටින නුපුහුණු කාන්තා කම්කරුවන්හට ප්‍රතිලාභ සැලසෙනු ඇතැයි අපේක්ෂිත චර්යා ධර්ම සංග්‍රහය ක්‍රියාත්මක කිරීම මගින් සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) විසින් සංක්‍රමණිකයන් බඳවා ගැනීමේ නියෝජිතායතන වෙත සහාය වන ලදී.115 පශ්චාත් යුද සමය තුළ මෙරට සංචාරක කර්මාන්තය කැපී පෙනෙන අන්දමින් වර්ධනය වී ඇති අතර 2009 - 2016 කාල සීමාව තුළ සංචාරක කර්මාන්තයෙන් ලද ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ කොටසක් ලෙස 1.8% සිට 5.6% දක්වා ඉහළ යන ලදී (8.9 ඉලක්කය).116 වර්ෂ 2016 දී සංචාරක කර්මාන්තය තුළින් සෘජු රැකියා 146115ක් හා වක්‍ර රැකියා 189544 අවස්ථා බිහි කරන ලදී.117

පරතරයන් හා අභියෝගයන්

සමස්ථ රැකියා වියුක්ත සංඛ්‍යාව ප්‍රශංසනීය මට්ටමක පැවතියද ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා අධ්‍යාපනික මට්ටම්වල පුළුල් වෙනස්කම් පවතියි. කාන්තා රැකියා වියුක්ති අනුපාතය ඊට අනුරූප පුරුෂ රැකියා වියුක්ති අනුපාතයට වඩා දෙගුණයකින් වැඩිය. අධ්‍යාපන මට්ටම සමග රැකියා වියුක්තිය ඉහළ යාමේ ප්‍රවනතාවක් ඇති අතර අ.පො.ස. උ. පෙළ සුදුසුකම් හා ඊට ඉහළ සුදුසුකම් සහිත තැනැත්තන් අතර වැඩිම රැකියා වියුක්තියක් පෙන්නුම් කරයි.118 ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතයන් සම්බන්ධයෙන් ද මෙම තත්වය සමාන වන අතර එම අනුපාතය කාන්තාවන් සඳහා 36% ක් ද පුරුෂයන් සඳහා 75% ද වේ.119 තරුණ රැකියා වියුක්තිය මීට සම්බන්ධ තවත් අභියෝගයක් (8.6 ඉලක්කය) වන අතර පසුගිය වසර හය තුළ එය 19% ක සාමාන්‍ය අගයක පැවතුණ අතර කාන්තාවන්ට අදාළව එම අනුපාතය සැලකිය යුතු ඉහළ අගයක් ගනියි. රැකියාවන්හි නිරතව සිටින හෝ ශ්‍රම බලකායට අයත් සියළු ම තරුණයින් පිළිබඳ සලකා බලන කල රැකියාවක, අධ්‍යාපනයේ හෝ පුහුණුවක නිරත නොවන තරුණයින් ප්‍රමාණය ද මුළු තරුණ පිරිසෙන් 26.1%ක් වැනි ඉහළ අගයක් ගනියි.120

---

109 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.(2017). ශ්‍රී ලංකා ශ්‍රම බලකාය පිළිබඳ සමීක්ෂණය 2016
110 එම
111 ලෝක බැංකුව. ලෝක සංවර්ධන දර්ශක 2017
112 කම්කරු හා වෘත්තීය සමිති සබඳතා පිළිබඳ අමාත්‍යංශය
113 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.(2017). ළමා ක්‍රියාකාරකම් පිළිබඳ සමීක්ෂණය 2016
114 මුදල් අමාත්‍යංශය.(2017).වාර්ෂික වාර්තාව 2016
115 බහු පාර්ශවකරුවන්ගේ අදහස් විමසීමේ වැඩමුළුවෙන් ලද කරුණු
116 ලෝක බැංකුව. ලෝක සංවර්ධන දර්ශක 2017
117 ශ්‍රී ලංකා මහ බැංකුව (2017)
118 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.(2017)..ශ්‍රී ලංකා ශ්‍රම බලකාය පිළිබඳ සමීක්ෂණය 2016
119 එම
120 එම

තරුණයින් හා උගතුන් අතර වන ඉහළ රැකියා වියුක්ති අනුපාතයන් මගින් ශ්‍රී ලාංකික ශ්‍රම වෙළඳපළෙහි පවතින ආංශික නොගැලපීම් පෙන්නුම් කෙරේ - පුද්ගලික අංශයේ පුරප්පාඩු බහුතරයක් ඇත්තේ දෛනික හා දෛනික නොවන රැකියාවන් සඳහා වන අතර උගත්හු සුදු කරපටි රැකියා සොයති.[121] සන්නිවේදනය, ගැටළු විසඳීම, ඉංග්‍රීසි හා පරිගණක කුසලතා ආදී මෘදු කුසලතාවන් දුර්වල මට්ටමක පැවතීම ද රැකියා සොයා ගැනීම කෙරෙහි වන බාධාවක් ලෙස හඳුනාගෙන ඇත.[122]

සියළු ම පුරවැසියන් සඳහා ආරක්ෂාකාරී හා සුරක්ෂිත වැඩ තත්වයන් තහවුරු කිරීම ද (8.8 ඉලක්කය) අභියෝගයක්ව පවතියි. 2013 වර්ෂයේ මුළු වේතන සහිත සේවකයන් සංඛ්‍යාව වන මිලියන 4.7 අතුරින් 56%ක් (මි. 2.6) තාවකාලික හෝ අනියම් සේවකයන් සහ ස්ථිර සේවා යෝජකයෙකු නොමැති සේවකයන් ඇතුළුව ප්‍රමිතියෙන් තොර හෝ අස්ථිර ස්වභාවයේ රැකියාවන්වල නිරත වී සිටියේය.[123] බොහෝ විට එවැනි කාර්යයන් සඳහා සේවක අර්ථසාධක අරමුදල වැනි සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමවල ප්‍රතිලාභ හිමි නොවන අතර සේවකයන් සඳහා ලිඛිත සේවා ගිවිසුමක් ලබා නොදේ. එමගින් කම්කරු නීතිවල දක්වා ඇති සේවක අයිතීන් දුර්වල කෙරේ. තවද ස්ථිර හා තාවකාලික සේවකයන් අතර වේතනයන්ගේ විශාල පැහැදිලි කළ නොහැකි වෙනස්කම් පවතියි - සම්මත රැකියාවල නියුතු පුද්ගලයෝ සම්මත නොවූ රැකියාවන්හි නිරත පුද්ගලයන්ට වඩා 89%කින් වැඩි මාසික වේතනයක් උපයති.[124]

---

121 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.(2017). ශ්‍රම අවශ්‍යතා පිළිබඳ සමීක්ෂණය2017

121 එම

122 Jayawardena, P., (2017), Why People Choose to Participate in Non-Standard Forms of Employment in Sri Lanka, Colombo: Institute of Policy Studies

123 එම

ඉදිරි ගමන් මග

තිරසර සංවර්ධන ඉලක්ක 5 යටතේ සාකච්ඡා කරන ලද පරිදි රැකියා වියුක්තියෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ පරතරය අවම කිරීමට නම් කාන්තාවන් සඳහා "නම්‍යශීලී වැඩ පැය" (flexi - hours), නිවසේ සිට වැඩ කිරීම හා අර්ධකාලීන වැඩ විකල්පයන් වැනි කාර්යයන් කිරීම සඳහා නම්‍යශීලී තත්වයන් මෙන් ම දැරිය හැකි හා විශ්වාසය තැබිය හැකි ළමාරක්ෂණ විකල්පයන් අවශ්‍ය වේ. එවැනි නම්‍යශීලී වැඩ තත්වයන් පිරිණමන සමාගම් වෙත බදු සහන වැනි දිරි ගැන්වීම් සිදු කිරීම මගින් එවැනි ප්‍රතිපත්ති යොදා ගැනීම කෙරෙහි දිරිමත් කිරීමට උපකාරී වනු ඇත.[125] විශේෂයෙන් නිෂ්පාදන හා සේවා අංශයන්හි පුහුණු රැකියා හිගය සඳහා පිළියම් ලබා දීමට තිරසර ආර්ථික සංවර්ධනයක් හා ඊට අනුරූපී රැකියා නිර්මාණය කිරීමක් සිදු කිරීමට අවශ්‍ය වේ. වත්මන් රජය විසින් එහි ජාතික සංවර්ධන ප්‍රතිපත්තිය යටතේ වන ප්‍රධාන ඉලක්ක පහකින් එකක් ලෙස රැකියා මිලියනයක් ඇති කිරීම හඳුනාගෙන ඇති අතර එමගින් නවෝත්පාදනය, ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය හා ඉහළ තත්වයේ වැදගත් රැකියා ඇති කිරීමට ප්‍රමාණවත් ආයෝජන හරහා පුද්ගලික අංශය සමග සම්බන්ධීකරණය කිරීමට ඉලක්ක කෙරේ.[126]

මෘදු කුසලතා මද බව මගින් විශේෂයෙන් විෂය නිර්දේශයට අදාළ නිපුණතා ඇතුළත් කිරීම වැනි අධ්‍යාපන පද්ධතියේ වෙනස්කම් සිදු කිරීමේ අවශ්‍යතාව ඉස්මතු කෙරේ. තිරසර සංවර්ධන ඉලක්ක 4 යටතේ සාකච්ඡා කරන ලද අන්දමට රැකියා වෙළඳපළ සඳහා අවශ්‍ය කාර්මික නිපුණතා සහිත සිසුන් බිහි කිරීම සඳහා රජය විසින් මෙම අභියෝගය ජය ගැනීම සඳහා ද ක්‍රියාමාර්ග ගන්නා ලදී. උදාහරණයක් ලෙස, උසස් පෙළ විභාගය සඳහා නව තාක්ෂණ විෂය ධාරාවක් හඳුන්වා දීම හා රජයේ විශ්ව විද්‍යාලවල තාක්ෂණ පීඨයන් සංවර්ධනය කිරීම පෙන්වා දිය හැකිය. මේවා නිපුණතා නොගැලපීම් සඳහා පිළියම් ලබා දීමට ගන්නා ලද දිගුකාලීන ක්‍රියාමාර්ග වන අතර රැකියා විරහිත තරුණයින් පුහුණු කිරීම හා තරුණයින් බඳවා ගැනීම සඳහා සමාගම් වෙත දිරිදීමනා ලබා දීම ඇතුළු අනෙකුත් කෙටිකාලීන ක්‍රමෝපායන් වැදගත්වේ. මේ සම්බන්ධයෙන් වන ශ්‍රම වෙළඳපළ අවශ්‍යතාවලට අනුව වෘත්තීය පුහුණු පාඨමාලා හැදෑරීමට තරුණයින් දිරිමත් කිරීමේ වැදගත්කම රජය විසින් හඳුනාගෙන ඇත. උදාහරණයක් ලෙස පොදු අධ්‍යාපන පද්ධතිය තුළ තාක්ෂණ විෂය ධාරාව සම්පූර්ණ කරන සිසුන් අතරින් අභ්‍යාසලාභීන් බඳවා ගැනීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම මෙන්ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, ජාතික යොවුන් සේනාංකය හා ජාතික තරුණ සේවා සභාව හරහා පාසල් අධ්‍යාපනය අවසන් කළ සිසුන් වෘත්තීය අධ්‍යාපනය සඳහා අන්තර්ග්‍රහනය කර ගැනීම කෙටිකාලීන වශයෙන් වැදගත් ලෙස හඳුනා ගන්නා ලදී.[127]

තරුණයින්ගේ මෘදු කුසලතා වැඩි දියුණු කළ හැකි තවත් ක්‍රමයක් වන්නේ ස්වේච්ඡා සේවය දිරි ගැන්වීම හා ස්වේච්ඡා සේවකයන් මෙන්ම ස්වේච්ඡා සංවිධාන සඳහා හැකියාව ඇති කෙරෙන තත්වයන් නිර්මාණය කිරීමයි. 2014 දී අවම වශයෙන් එක් වසරකට ශ්‍රී ලාංකිකයෝ මි. 8.6ක් ස්වේච්ඡා සේවයට එක් වූහ. එය මෙරට අනාබාධිත ජනගහනයෙන් 40%කට සමාන වන අතර ඔවුන් අතරින් බොහෝ දෙනෙකු ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන පුද්ගලයන්ය. සමීක්ෂණයට භාජනය කරන ලද තරුණ ස්වේච්ඡා සේවකයන්ගෙන් 96%ක් විසින් සිය කුසලතා වර්ධනය සඳහා සේවේච්ඡා සේවය ඉවහල් වූ බව පිළිගනු ලැබීය. ස්වේච්ඡා සේවය සඳහා වැඩි වැඩියෙන් තරුණ පිරිස යොමු කිරීමට ඉවහල් වන ක්‍රම පිළිබඳ අදහස් සැලකීමේදී පාසල්/ විශ්ව විද්‍යාල/ සේවා යෝජකයන් විසින් ස්වේච්ඡා සේවය සඳහා කාලය වෙන් කළ යුතු බව 57%ක් විසින් පිළිගන්නා ලදී.[128]

අනාරක්ෂිත කාර්යයන් ව්‍යාප්ත වීම සීමා කිරීම ඉලක්ක කරමින් ක්‍රියාමාර්ග ගත යුතු අතර සේවක හිමිකම් සුරක්ෂිත කෙරෙන රෙගුලාසි හරහා අනාරක්ෂිත කාර්යයන්හි නිරත සේවකයන්ගේ සේවා තත්වයන් ඉහළ නැංවීමට ද අවශ්‍ය වේ. තාවකාලික සේවකයන්ගේ සංඛ්‍යාව සීමා කිරීම, නියෝජිතායතන මගින් කුලියට ගන්නා සේවකයන් සඳහා නෛතික ආරක්ෂාව සැලසීම, මිනිස්බල නියෝජිතායතන පාලනය කිරීම හා එවැනි සේවකයන් සඳහා සමාජ ආරක්ෂණය සැපයීම මෙයට ඇතුළත්වේ.

125 ස්වේච්ඡා ජාතික සමාලෝචනය වලංගුකරණ වැඩමුළුවෙහි දී ඉදිරිපත් වූ පාර්ශවකරුවන්ගේ අදහස්
126 රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020
127 රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020
128 "Sri Lankan Youth: Volunteering to make a Difference", United Nations Volunteers, 2014

9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE

වර්තමාන තත්වය හා ප්‍රවනතාවයන්

කර්මාන්ත අංශය සඳහා වන රාජ්‍ය ප්‍රතිපත්තිය මගින් පුද්ගලික අංශයේ සංවර්ධනය ඉලක්ක කෙරේ. මෙහි දී නිෂ්පාදන හා භූගෝලීය පිහිටීම විවිධාංගීකරණය, කාර්මික සහජීවනය ප්‍රවර්ධනය කිරීම සහ ඉහළ අගයක් එක් කළ හා ඵලදායී කාර්මීකරණය අවධාරණය කරමින් විශේෂයෙන් අපනයන පාදක කර්මාන්තයෙහි සංවර්ධනය ඉලක්ක කෙරේ.[129] මෑත කාලීනව ඵලදායී දශකය 1997- 2006 වැනි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හරහා නිෂ්පාදන අංශය සංවර්ධනය කිරීම සහ කාර්මික සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා ජේෂකර්ම හා ඇඟලුම් ආයතනය, ජාතික කර්මාන්ත සංවර්ධන අධිකාරිය ආදිය ඇතුළු විවිධ ආයතනික යාන්ත්‍රණයන් හරහා 2015 කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා ජාතික රාමුවක් සකස් කිරීම සඳහා ශ්‍රී ලංකාව මගින් විවිධ ප්‍රයත්නයන් ගන්නා ලදී. 9 වන තිරසර සංවර්ධන ඉලක්කය ළඟා කර ගැනීමට අදාළ අංශයේ කැපී පෙනෙන ප්‍රගතිය මගින් මේවායේ බලපෑම පිළිඹිබු වේ.

සියළු දෙනාට දැරිය හැකි හා සම ප්‍රවේශය සහිත ආර්ථික සංවර්ධනය හා මානව යහ පැවැත්ම සඳහා උපකාරී වීම සඳහා 9.1 ඉලක්කය මගින් ප්‍රාදේශීය හා අන්තර් සීමා යටිතළ පහසුකම් ඇතුළු උසස් තත්වයේ, විශ්වසනීය, තිරසර හා ප්‍රත්‍යාස්ථ යටිතළ පහසුකම් සංවර්ධනය දක්වා ඇත. යටිතළ පහසුකම් පිළිබඳ අංශය සඳහා විශාල ආයෝජන සිදු කර ඇති අතර එයට ප්‍රවාහනය, විදුලිය හා සන්නිවේදනය ඇතුළත් වේ. මන්ද යත් ඒවා රටෙහි කාර්මීකරණය හා ආර්ථික සංවර්ධනය සඳහා ඉතා වැදගත් වන බැවිණි. මුළු මගී ප්‍රවාහනයෙන් 93%ක් හා භාණ්ඩ ප්‍රවාහනයෙන් 97% සඳහා දායක වන මාර්ගස්ථ ප්‍රවාහනය කෙරෙහි වන ඉල්ලුම ඉහළ යාමේ ප්‍රවනතාවක් පසුගිය වසරවල පෙන්නුම් කර ඇත. වර්තමාන මාර්ග ඝණත්වය වර්ග කි.මී. 1ට මාර්ග කි.මී. 1.96ක් පමණ වන අතර මාර්ග අතුරින් 50%ක් බොරළු මතුපිටක් සහිත වේ.[130] ඒ හා බී පංතියේ මාර්ගවලට අයත් කි.මී. 12,210ක ප්‍රමාණයක් පමණක් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් නඩත්තු කෙරේ. බස් රථ ප්‍රවාහනයට අදාළ මුළු මගී කිලෝ මීටර් ප්‍රමාණය 2011 කි.මී. මිලියන 11,907 සිට 2016 කි.මී. මිලියන 16,144 දක්වා ඉහළ ගිය අතර දුම්රිය ප්‍රවාහනයට අදාළව 2011 කි.මී. මිලියන 4574 සිට 2016 කි.මී. මිලියන 7,413 දක්වා ඉහළ ගියේය. ග්‍රාමීය ජනගහනයෙන් 95.4%ක් බර සීමාවන්ට යටත් නොවූ මාර්ගයක කි.මී. 2 ක් තුළ ජීවත් වන අතර එය ඉහළ ජයග්‍රහණයක් වේ.

ශ්‍රී ලංකන් ගුවන් සේවයේ ගුවන් මගී කිලෝ මීටර් ප්‍රමාණය 2011 දී කි.මී. මි. 10677 සිට 2016 කි.මී. මි. 12855 දක්වා ඉහළ ගොස් ඇත. ගුවන් මගින් භාණ්ඩ ප්‍රවාහනය 2011 දී ටොන් 90000 සිට 2016 දී ටොන් 108000 දක්වා ඉහළ ගොස් ඇති අතර දුම්රිය භාණ්ඩ ප්‍රවාහන මෙට්‍රික් ටොන් කි.මී. ප්‍රමාණය 2011 දී මි. 154 සිට 2016 මි. 140 දක්වා පහළ ගොස් ඇත. පැමිණි යාත්‍රා සංඛ්‍යාව හා වරාය සේවා මගින් හසුරුවන ලද නැව් බඩු තොග ප්‍රමාණය 2011 දී යාත්‍රා 4332 සිට 2016 යාත්‍රා 4998 දක්වාත් නැව් බඩු තොග 2011 දී මෙට්‍රික් ටොන් මි. 6.5 සිට 2016 මෙට්‍රික් ටොන් මි. 8.7 දක්වාත් ඉහළ ගොස් ඇත. විදුලි උත්පාදනය 2011 දී පැයට ගිගා වොට් 11528 සිට 2016 දී පැයට ගිගා වොට් 14149 දක්වා ඉහළ ගොස් ඇත. රටේ ජංගම දුරකථන භාවිතය ඉහළ යාමත්පු සමග ද්ගලයන් 100 කු අතරින් පොදු දුරකථන පහසුකම් ලබා ඇති ප්‍රමාණය 2011 දී 105.1 සිට 2016 දී 135.7 දක්වා ඉහළ ගොස් ඇත. රට තුළ පවතින ජංගම දුරකථන සබඳතා ප්‍රමාණය 2011 දී මි. 1.8 සිට 2016 මි. 2.6 දක්වා ඉහළ ගොස් ඇත. ස්ථාවර දුරකථන සම්බන්ධතා ප්‍රමාණය 2011 දී මි. 0.9 සිට 2016 මි. 1.1 දක්වා ඉහළ ගොස් ඇත. අන්තර්ජාල සම්බන්ධතා පිළිබඳ සැලකීමේ දී මුළු අන්තර්ජාල සම්බන්ධතා ප්‍රමාණය 2011 දී මි. 0.8 සිට දී මි. 4.9 දක්වා කැපී පෙනෙන ඉහළ යාමක් පෙන්නුම් කර ඇත.[131]

9.2 ඉලක්කය සඳහා ජාතික තත්වය අනුව සියල්ල ඇතුළත් වූ හා තිරසර කාර්මීකරණයක් හා 2030 වන විට රැකියා නියුක්තියේ සහ දළ ජාතික නිෂ්පාදිතයේ කැපී පෙනෙන ඉහළ යාමක් අවශ්‍ය වේ. 2016 දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය 4.4% න් වර්ධනය වූ අතර එහිදී කාර්මික කටයුතුවල ඉහළ ම වර්ධනය 6.7% වූයේ ප්‍රධාන වශයෙන් ඉදිකිරීම් කටයුතුවලින් අයකර ගැනීම හා පතල් කැණීම හා ගල් කැඩීමේ කටයුතු හේතුවෙනි. තවද භාණ්ඩ නිෂ්පාදනය, විදුලිය, ජලය හා අපද්‍රව්‍ය පිරියම් කිරීමේ කටයුතු වැනි කාර්මික කටයුතු මගින් කාර්මික සංවර්ධනය කෙරෙහි ධනාත්මක දායකත්වයක් සැපයීය. එය 2017 දී දළ ජාතික නිෂ්පාදිතයෙන් 26.8%ක දායකත්වයක් සැපයූ අතර විධිමත් අංශයේ මුළු ශ්‍රම බලකායෙන් 26%ක් පමණ වන මි. 2.2 ට අධික පුද්ගලයන් සඳහා ලාබදායී රැකියාවන් සපයමින් දැක්වූ දායකත්වය මුළු අපනයනයන්ගෙන් 77%ක් වේ.

---

129 රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2020

130 එම

131 ලෝක බැංකු වාර්ෂික වාර්තාව, විවිධ ගැටළු

2016 භාණ්ඩ නිෂ්පාදන අගය එක් කිරීම දළ ජාතික නිෂ්පාදිතයේ හා ඒක පුද්ගල ආදායමේ කොටසක් ලෙස සහ භාණ්ඩ නිෂ්පාදන රැකියා නියුක්තිය මුළු රැකියා නියුක්තියේ කොටසක් ලෙස 18%ක් විය. 9.3 ඉලක්කය ළඟාකර ගැනීම සඳහා දැරිය හැකි ණය ඇතුළු මූල්‍ය සේවාවන් වෙත කුඩා පරිමාණ කාර්මික හා වෙනත් ව්‍යවසායන්ගේ ප්‍රවේශය ඉහළ නැංවීම හා අගය දාමයන් සහ වෙළඳපළ වෙත ඔවුන් ඒකාබද්ධ වීම අවශ්‍ය වේ. 2013/14 දී අගය එක් කළ මුළු කර්මාන්ත ප්‍රමාණය අතුරින් 2.7ක් කුඩා පරිමාණ කර්මාන්ත (කුඩා කර්මාන්ත - පුද්ගලයන් 10 සිට 25 දක්වා යොදවා ඇති) විය.[133]

9.5 ඉලක්කය සඳහා 2030 දී නවෝත්පාදනයන් දිරිමත් කිරීම හා පුද්ගලයන් මි. 1ට පර්යේෂණ හා සංවර්ධන සේවකයන් සහ රාජ්‍ය හා පුද්ගලික පර්යේෂණ වියදම් සාරානුකූල ලෙස ඉහළ නැංවීම ඇතුළුව කාර්මික අංශවල තාක්ෂණික හැකියාවන් උත්ශ්‍රේණිගත කිරීම අවශ්‍ය වේ. කෙසේ වුවද, ශ්‍රී ලංකාව විද්‍යාව, තාක්ෂණය හා නවෝත්පාදන යන අංශවලට අදාළව පසුබෑමට ලක් වී ඇත. 0-100 පරිමාණයෙහි (නව්‍යකරණය ඉහළම මට්ටමක පවතින්නේ 100 දීය) 29.9 ලකුණු ප්‍රමාණයක් ලැබ ශ්‍රී ලංකාව 2017 ගෝලීය නවෝත්පාදන දර්ශකයේ රටවල් 127 අතරින් 90 වෙනි ස්ථානයේ පසු වන අතර නවෝත්පාදන ක්ෂේත්‍රය තුළ කිසිඳු වැඩි දියුණුවක් පෙන්නුම් කර නැත. ආයතන (111 වන ස්ථානය) මානව ප්‍රාග්ධනය හා පර්යේෂණ (105 වන ස්ථානය) යන උපදර්ශකවලට අදාළව ශ්‍රී ලංකාව දුර්වල මට්ටමක පැවති අතර යටිතළ පහසුකම් (63 වන ස්ථානය) හා දැනුම සහ තාක්ෂණික නිමැවුම් (68 වන ස්ථානය) යනාදියට අදාළව ප්‍රබලතාවක් පෙන්නුම් කර ඇත. ශ්‍රී ලංකාව වෙළඳපළ නව්‍යකරණ උප දර්ශකයෙහි 86 වන ස්ථානය හා ව්‍යාපාර නව්‍යකරණ උප දර්ශකයෙහි 83 වන ස්ථානයත් නිර්මාණශීලී නිමැවුම් උප දර්ශකයෙහි 86 වන ස්ථානයත් අත් කර ගන්නා ලදී.

පරතරයන් හා අභියෝග

පසුගිය වසර කිහිපය තුළ කර්මාන්ත අංශය කැපී පෙනෙන ජයග්‍රහණයන් පෙන්නුම් කළ ද එම අංශයේ සංවර්ධනයට බාධා එල්ල කළ අභියෝග කිහිපයක් වේ. පළමුව කාර්මික අංශයේ වර්ධනය ප්‍රධාන වශයෙන් පදනම් වූයේ ඉදිකිරීම් කටයුතු හා පතල් කැණීම් හා ගල් කැඩීම මත වන නමුත් තිරසර සංවර්ධන ඉලක්ක 9 (9.2 හා 9.3 ඉලක්ක) ළඟා කර ගැනීමට දායක විය හැක්කේ භාණ්ඩ නිෂ්පාදන අංශයට ම නොවේ. මීට අමතරව, භාණ්ඩ නිෂ්පාදන අංශය ප්‍රධාන වශයෙන් ඇඳුම්, ආහාර නිෂ්පාදන හා රබර් නිෂ්පාදන සහ අඩු තාක්ෂණයක් සහිත භාණ්ඩ නිෂ්පාදනය කරන වෙනත් විශාල වශයෙන් ශ්‍රමය යොදා ගැනෙන කර්මාන්ත කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී.

තවද විශේෂයෙන් 2000 දී ශ්‍රී ලංකාවට ලාභ ශ්‍රමයෙන් සාපේක්ෂ වාසිය අහිමි වීමෙන් පසුව නිෂ්පාදන අංශයෙහි වර්ධනය දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය කෙරෙහි ඉවහල් වූයේ මද වශයෙනි.[134] පසුගිය වසර 15ක කාලය තුළ බොහෝ අවස්ථාවල නිෂ්පාදන අංශයේ වර්ධන අනුපාතයන් දළ දේශීය නිෂ්පාදිත අනුපාතයන්ට වඩා පහළ මට්ටමක පැවති අතර එම කාලය තුළ දළ දේශීය නිෂ්පාදිතයෙහි නිෂ්පාදන අංශයට අයත් කොටස පහළ මට්ටමක පැවති අතර 15-16% පමණ ප්‍රතිශතයක් තුළ පැවතිණි.[135] තායිවානය (29.9%), කොරියාව (29.5%), තායිලන්තය (26.5%) හා මැලේසියාව (22.8%) වැනි ආසියානු කාර්මික රටවල දළ දේශීය නිෂ්පාදිතය කෙරෙහි නිෂ්පාදන අංශයේ දායකත්වය 2015 දී ශ්‍රී ලංකාවට (15.4%) වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි විය.[136]

කාර්මීකරණය හා විශේෂයෙන් නිෂ්පාදන අංශයේ වර්ධනයට බාධා එල්ල කෙරෙන ප්‍රධාන අභියෝගයන් වන්නේ ව්‍යාවසායකත්වය, නවෝත්පාදනයන්, තාක්ෂණය හා කළමනාකරණ කුසලතා; ආයෝජක විශ්වාසය පහළ මට්ටමක පැවතීම; ශ්‍රම හිඟය; නිෂ්පාදනයන්ගේ අඩු විවිධාංගීකරණය හා දේශීය වෙළඳපළ තත්වය මෙන්ම ජාත්‍යන්තර වෙළඳපළ වෙත ප්‍රවේශය ලබා ගැනීමේ ගැටළුය (9.2 හා 9.5 ඉලක්ක). ජනතාවගේ ගතික අවශ්‍යතාවන්ට ගැලපෙන ආකාරයට කාර්යක්ෂම අයුරින් අනුවර්තනය වීමේ හැකියාවක් නොමැති ශ්‍රී ලංකාව තුළ දුර්වල ලෙස නියාමනය කරන ලද හා තදබදය සහිත ප්‍රවාහන පද්ධතිය ද ආර්ථික සංවර්ධනය කෙරෙහි වන බාධකයකි.(9.1 ඉලක්කය)

විද්‍යාව, තාක්ෂණය, පර්යේෂණ හා සංවර්ධනය සඳහා පසුගිය වසර කිහිපය තුළ අඩු ප්‍රමුඛතාවක් ලබා දීම මෙන් ම රාජ්‍ය ආයතන, නියාමකයන්, පර්යේෂණ ආයතන, විශ්ව විද්‍යාල, ව්‍යවසායන්, උපදේශන ආයතන හා වෘත්තීය/ ව්‍යාපාර කණ්ඩායම්වලින් සමන්විත ශක්තිමත් ජාලයක් නොමැති වීම නවෝත්පාදනයන් හා කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීමෙහි ලා වන ප්‍රධාන බාධකයන් වේ (9.5 ඉලක්කය). මීට අමතරව, රාජ්‍යයේ ආධිපත්‍යය හා පුද්ගලික අංශයේ පර්යේෂණ අඩු වීම වාණිජකරණය හා පර්යේෂණ උපයෝගී කර ගැනීමේ අනුපාතය කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කරයි.[137]

---

132 ශ්‍රී ලංකා මහ බැංකුව වාර්ෂික වාර්තාව (2017)

133 "The Status of Sustainable Development Goals Indicators in Sri Lanka: 2017" පිළිබඳ වාර්තාව, ශ්‍රී ලංකා ජනගහන සහ ජන සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

134 ශ්‍රී ලංකා මහ බැංකුව (2018), "වාර්ෂික වාර්තාව 2017" ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ

135 ශ්‍රී ලංකා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

136 ලෝක බැංකුව, ලෝක සංවර්ධන දර්ශක 2017

137 Wijesinghe (20110). 'Dynamic Growth in Sri Lanka: the Innovation Imperative', Talking Economics Digest, Institute of Poli cy Studies of Sri Lanka, Colombo. Available at http://www.ips.lk/talkingeconomics/2011/10/13/dynamic-growth-in-sri-lanka-theinnovation-imperative/

ඉදිරි ගමන් මග

කාර්මික අංශයේ තිරසරභාවය තහවුරු කිරීම සඳහා ක්‍රමානුකූල ආකාරයට මෙම ප්‍රධාන අභියෝගයන් සඳහා පිළියම් ලබා දීමට අවශ්‍ය වේ. රටක නිෂ්පාදන අංශය රටේ ආර්ථික හා සාමාජීය සංවර්ධනයේ ප්‍රධාන උත්ප්‍රේරක කාර්යභාරයක් ඉටු කරයි. පළමුවෙන් ම වැඩි ආයෝජනයන් සමග තාක්ෂණය භාවිතා වන හා අපනයන ඉලක්ක කර ගත් කර්මාන්ත බවට නිෂ්පාදන අංශය සංවර්ධනය හා විවිධාංගීකරණය කිරීම අත්‍යවශ්‍ය වේ. තවද යටිතළ පහසුකම් සංවර්ධනය, පර්යේෂණ හා සංවර්ධන ප්‍රවර්ධනය හා මානව සම්පතෙහි කුසලතා උත්ශ්‍රේණිගත කිරීම දේශීය හා ඍජු විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීමට ඉවහල් වනු ඇත. පර්යේෂණ හා සංවර්ධන ආයතන මගින් විශේෂයෙන් කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්තවල නිෂ්පාදන සංවර්ධන අවශ්‍යතා හඳුනාගැනීමට හැකි වන පරිදි ඒවා අතර මනා සහයෝගීතාවක් පැවතීම අවශ්‍ය වේ. තවද 9 වන තිරසර සංවර්ධන ඉලක්කය ළඟා කර ගැනීම සඳහා රජය විසින් දේශපාලන ස්ථාවරභාවය, රාජ්‍ය ආයතන වෙතින් අඛණ්ඩ සහාය, ශක්තිමත් නියාමන හා නෛතික රාමු, කාර්යක්ෂම හා මනා තත්වයේ පවතින යටිතළ පහසුකම්, අවම වෙළඳ බාධක හා අඩු පිරිවැය හා ඉහළ කාර්යක්ෂතාවයෙන් යුතු මානව සම්පත් ඇතුළු ආයෝජකයන්ගේ විශ්වාසය ඉහළ නැංවීම සඳහා ඉවහල් වන පරිසරයක් නිර්මාණය කළ යුතුය.

විද්‍යාව, තාක්ෂණය හා පර්යේෂණ යන අංශ සංවර්ධනය කිරීම සඳහා රජය විසින් ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ජාතික කොමිෂන් සභාව (NASTEC) විසින් ජාතික විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ සම්පූර්ණ හා විස්තීර්ණ ප්‍රතිපත්තියක් (NSTP) සකස් කරන ලද අතර රජය විසින් එය 2009 දී අනුමත කරන ලදී (9.5 ඉලක්කය). ජාතික විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ රජයේ අමාත්‍යංශ යටතේ වන විද්‍යාත්මක ආයතනවල සහයෝගය සහිතව විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ජාතික කොමිෂන් සභාව විසින් පස් වසරක (2011- 2016) ඒකාබද්ධ ආයතනික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන ලදී. එසේ ම තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යංශය විසින් පස් වසරක (2010 - 2015) විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන උපාය මාර්ගයක් (STIS) සකස් කරන ලදී. ප්‍රගතිය පිළිබඳ සම්බන්ධීකරණය කිරීම හා අධීක්ෂණය සහ උපාය මාර්ගය ක්‍රියාවට නැංවීම සඳහා 2013 දී විද්‍යාව, තාක්ෂණය හා නවෝත්පාදන පිළිබඳ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය (COSTI) ස්ථාපිත කරන ලදී. විද්‍යා හා තාක්ෂණ ක්‍රියාකාරකම් මෙරට සංවර්ධන න්‍යාය පත්‍රයට අනුකූල වන පරිදි ක්‍රියාත්මක කිරීමේ අරමුණ ඇතිව 2016 දී තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යංශය විසින් ජාතික පර්යේෂණ හා සංවර්ධන ආයෝජන රාමුවක් සකස් කරන ලදී.

කුඩා පරිමාණ කෘෂි නිෂ්පාදන ඉලක්ක කර ගනිමින් අගය දාම සංවර්ධනය හා අලෙවිකරණ සබඳතාවලට අදාළ හවුල් ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා පුද්ගලික අංශයේ අස්ථිත්වයන් හෝ ගොවි සංවිධානවල (FBO) සහයෝගය සහිතව ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන (NADeP) ක්‍රියාත්මක වේ.

10 REDUCED INEQUALITIES

වර්තමාන තත්වය හා ප්‍රවණතාවන්

පසුගිය කාලය පුරා ශ්‍රී ලංකාව දරිද්‍රතාව අවම කිරීම සඳහා සාර්ථක ලෙස කටයුතු කළ ද ආදායම් විෂතාව තවමත් ගැටළුවක් ව පවතියි. 2009/10 දී 8.9% ක්ව පැවති ජනගහන දරිද්‍රතාව 2016 දී 4.1% දක්වා අඩු වීමට සමාන්තරව විෂමතාවයේ ද මද අඩු වීමක් සිදු වී ඇති බව ගෘහස්ථ ආදායමට අදාළ ජිනි සංගුණකය 0.49 සිට 0.45 දක්වා ද අඩු වීමෙන් පළිබිඹු වේ.[138] ජාතික සාමාන්‍යය වන 18%ට සාපේක්ෂව 2012/13 - 2016 අතරතුර පහළ මට්ටමේ පැවති 40% ගෘහස්ථ ඒක පුද්ගල ආදායම 26%ක් ලෙස වේගයෙන් ඉහළ යන ලදී.[139] (10.1 ඉලක්කය). ඊට ප්‍රතිවිරුද්ධව ගෘහස්ත වියදමට අදාළව ජිනි සංගුණකය මගින් විෂමතාවෙහි ඉහළ යාමක් (2009/10 දී 0.37 සිට 2016 දී 0.41 දක්වා) පෙන්නුම් කරනු ලබන අතර පහළ මට්ටමේ පැවති 40% හි වර්ධනය ද ජාතික සාමාන්‍යයට සාපේක්ෂව මන්දගාමී විය. (2012/13 / 2016 අතරතුර 9.1% සාපේක්ෂව 13.3%).[140]

මීට අමතරව, මෙරට ජනගහනයෙන් ජාතික මධ්‍යස්ථ ආදායමෙහි 50%න් අඩු මට්ටමේ ජීවත් වන කොටස 12.3%ක් (2016 දී) වූ අතර මෙහි දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා වයස් කණ්ඩායම් අතර මද වශයෙන් විචල්‍යයන් සිදු විය (2 ඉලක්කය).

සමාන අවස්ථාවන් තහවුරු කිරීම හා ප්‍රතිඵලයන්ගේ විෂමතාවන් අඩු කිරීම ආදායම් විෂමතාව සඳහා පිළියම් ලබා දීම සඳහා ප්‍රධාන මාර්ගය වේ. අවස්ථාවන් හා සේවාවන්ට අදාළව විෂමතාවන් සඳහා පිළියම් ලබා දීමට ශ්‍රී ලංකා රජය විසින් විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදී. ආදායම් විෂමතාව මගින් දිළිඳුතම ජන කොටස් කෙරෙහි එල්ල වන බලපෑම අවම කිරීමේ දී ශ්‍රී ලංකාවේ සියළු දෙනාටම නිදහස් අධ්‍යාපනය ලබා දීමේ ප්‍රතිපත්තිය හා සියළු දෙනාටම නිදහස් සෞඛ්‍ය සේවාවක් ලබා දීමේ ප්‍රතිපත්තිය මෙන්ම ඇතැම් සමාජ සුරැකුම් වැඩසටහන් මගින් ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරන ලදී (10.3 හා 10.4 ඉලක්ක).

එහෙත් සේවාවන් වෙත වන ප්‍රවේශය මෙන්ම වයස අවුරුදු පහට අඩු ළමා මරණ අනුපාත හා අධ්‍යාපන කාර්යසාධනය වැනි ප්‍රතිඵල දර්ශකවලට අදාළව කලාපීය අසමානකම් නිරීක්ෂණය වේ.[141]

ආදායම් විෂමතාවෙහි බලපෑමෙන් මිදීම සඳහා අඩු ආදායම්ලාභී පවුල් සඳහා ප්‍රේෂණයන් ප්‍රයෝජනවත් විය හැකිය. මෙය විශේෂයෙන් ශ්‍රී ලංකාවට අදාළව වේ. මන්ද යත් එහි සංක්‍රමණික ප්‍රේෂණයන් දළ දේශීය නිෂ්පාදනයෙන් 8.9% වන බැවිණි; සෑම ගෘහයන් අටකින් එකක් ප්‍රේෂණ ලබා ගනියි.[142] පළමුවෙන් ම 2008 දී බලාත්මක වූ ශ්‍රී ලංකාවේ ජාතික ශ්‍රම සංක්‍රමණ ප්‍රතිපත්තිය 143 මගින් සංක්‍රමණ ක්‍රියාවලිය පාලනය කිරීම, සංක්‍රමණික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල් ආරක්ෂා කිරීම හා සවිබල ගැන්වීම මෙන් ම සංක්‍රමණය හා සංවර්ධන ක්‍රියාවලීන් සම්බන්ධ කිරීම සිදු කෙරේ. 2010 සිට ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රජයට සහාය දක්වන ලද අතර එය මේ වන විට සංශෝධනය සඳහා සමාලෝචනය කෙරෙමින් පවතියි. 2016 දී ස්විස් රජයේ සහාය ඇතිව ශ්‍රී ලංකා රජය විසින් විස්තීර්ණ ආරක්ෂාකාරී ශ්‍රම සංක්‍රමණික වැඩසටහනක් ස්ථාපිත කරන ලදී. බඳවා ගැනීමේ පිරිවැයට අදාළව සංක්‍රණික මාර්ගය තෝරා ගැනීම පිළිබඳ පර්යේෂණ මගින් මිශ්‍ර ප්‍රතිඵල පෙන්නුම් කරනු ලැබේ: සවුදි අරාබිය සම්බන්ධයෙන් ගත් කල මුළු පිරිවැය සේවායෝජකයා විසින් දරනු ලබන අතර දකුණු කොරියාව වෙත සංක්‍රමණය වන්නෙකු විසින් සම්පූර්ණ සංක්‍රමණික පිරිවැය දරනු ලැබේ.[144] 2017 ජනවාරි මස ශ්‍රී ලංකා රජය විසින් සංක්‍රමණික සේවකයන් සඳහා අවම වේතනය ඇ.ඩො. 300 ලෙස ප්‍රකාශයට පත් කරන ලදී (10.7 හා 10. ඇ ඉලක්ක).

සංවර්ධනය සඳහා වන වෙනත් මූල්‍ය ප්‍රවාහ පිළිබඳ සැලකීමේ දී සෘජු විදේශ ආයෝජන ප්‍රවාහ 2006/08 සිට 2015 දක්වා 11%න් ඉහළ ගොස් ඇති අතර නිල සංවර්ධන සහාය (ODA) 11%න් පහළ බැස ඇත; ජපානය අංක එකේ ආධාර ලබා දෙන රට ලෙස පවතින අතර ඉන් පසුව යුරෝපා සංගමයේ ආයතන වේ. [145] (10 ආ ඉලක්කය)

ගෝලීය මට්ටමින් සංවර්ධනය වෙමින් පවතින කුඩා දූපත් රාජ්‍යයක් ලෙස ජාත්‍යන්තර තීරණ ගැනීමේ දී ශ්‍රී ලංකාවේ හඬ සීමා සහිත වේ. කෙසේ වුවද, ජාත්‍යන්තර ආර්ථික හා මූල්‍ය ආයතනයන්හි ශ්‍රී ලංකාවේ සහභාගීත්වය ජාත්‍යන්තරය තුළ අප රටේ හඬ ප්‍රබල තත්වයට ගෙන ඒම සඳහා වන සාධකයක් ලෙස හඳුනා ගත හැකිය. වෙළඳාම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (UNCTAD)

138 ශ්‍රී ලංකා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2018)
139 ශ්‍රී ලංකා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2017)
140 එම
141 United Nations (2015) Millennium Development Goals Country Report, 2014
142 Weeraratna (2017), 'Did the Blue-Green Budget Forget Migrants and their "Greenbacks"?', Talking Economics Digest. Available at http://www.ips.lk/talkingeconomics/2017/12/18/did-the-blue-green-budget-forget-migrants-and-their-greenbacks/
143 විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභ සාධන අමාත්‍යංශය (2008), ' National Labour Migration Policy for Sri Lanka' Available at http://www.ilo.org/dyn/migpractice/docs/268/Policy.pdf
144 Weeraratne, B et al (2018) 'Cost of Low-Skilled Migration to Saudi Arabia, South Korea and Malaysia: Value Chain Analysis – Sri Lanka', Labour Economics Series No. 20, Institute of Policy Studies of Sri Lanka, Colombo
145 ආර්ථික සහයෝගීතාව හා සංවර්ධනය සඳහා වන සංවිධානය, ලෝක වෙළඳ සංවිධානය (20017), 'Sri Lanka: Aid for Trade at a Glance'. https://www.wto.org/english/tratop_e/devel_e/a4t_e/ profiles_e/LKA_e.pdf ලබා ගත හැකිය.

සහ පසුව ලෝක වෙළඳ සංවිධානය බවට පත් වූ බදු හා වෙළඳාම පිළිබඳ පොදු ගිවිසුම (GATT) වැනි ආයතනවල මුල්ම සාමාජිකයන් අතර ශ්‍රී ලංකාව විය ; ශ්‍රී ලාංකිකයකු 1974-1984 දක්වා කාල සීමාව තුළ වෙළඳාම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනයේ (UNCTAD) මහ ලේකම් ලෙස කටයුතු කළේය (10.6 ඉලක්කය).

විදේශ වෙළඳපළ වෙත වන වරණීය ප්‍රවේශය සුරැකීමට අදාළව ශ්‍රී ලංකාව විසින් දැනට වරණයන් පිළිබඳ පොදු ක්‍රමයෙහි (GSP) ප්‍රතිලාභවලට අදාළ පහසුකම් සපයන රටවල් කිහිපයට ඇමරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමය, ජපානය හා නෝර්වේ ඇතුළත්වේ. කෙසේ වුවද, 2016 දී ගෝලීය වරණ වෙළඳ ක්‍රමය (GSTP) යටතේ ශ්‍රී ලංකාවේ අපනයනයන් ඉතා සුළු ප්‍රමාණයකින් අඩු වී ඇත. සිංගප්පූරුව, චීනය, බංග්ලාදේශය, මැලේසියාව, ඉන්දුනීසියාව හා තායිලන්තය වැනි රටවල් සමග වෙළඳ ගිවිසුම් ඇති කර ගැනීමේ ශ්‍රී ලංකාවේ ප්‍රයත්නය මගින් වරණීය නියමයන් මත විදේශ වෙළඳපළ වෙත ප්‍රවේශ වීමෙන් වාසිදායක ප්‍රතිඵල ලබා ගැනීමට ද අපේක්ෂා කෙරේ[146] (10.අ ඉලක්කය)

පරතරයන් හා අභියෝග

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පහළ මට්ටමකට ගෙන ඒමට හා මූලික සෞඛ්‍ය හා අධ්‍යාපන දර්ශකවලට අදාළව ජයග්‍රහන ලබා ගත හැකි වුව ආදායම් විෂමතා අවම කිරීම හා කලාපීය අසමානතාවන් සඳහා පිළියම් ලබා දීම සඳහා අවශ්‍යතාව පවතියි (10.1 හා 10.2 ඉලක්ක)

නැගී එන ආර්ථිකයන් රැසකට සාපේක්ෂව ශ්‍රී ලංකාව ගෝලීය ආර්ථිකය සමග ඒකාබද්ධ වීමේ මට්ටම පහත අගයක පවතියි. රටේ වෙළඳ විවෘතභාවය අඩු වීම, අපනයන නිෂ්පාදන හා වෙළඳපළවල විවිධාංගීකරණය අවම වීම මෙන්ම වෙළඳ පහසුකරණය තෘප්තිමත් නොවූ මට්ටමක පැවතීම ද මෙම තත්වයට බලපා ඇත. දැනට ශ්‍රී ලංකාව මෙරට වෙළඳ පහසුකරණය ඉහළ නැංවීම සඳහා ජාතික කේවල කවුළුවක් ස්ථාපිත කිරීමේ ක්‍රියාවලියෙහි නිරත වෙමින් පවතියි.

සංක්‍රමණිකයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා රටක් අත් කරගත යුතු ජයග්‍රහණයන් ලෙස පුද්ගලික සම්පත් හරහා සංක්‍රමණය ඉහළ නැංවීම හා බලපත්‍රලාභී නියෝජිතායතන මගින් සංක්‍රමණය අඩු කිරීම ද හඳුනාගත හැකිය (10.7 ඉලක්කය)

ඉදිරි ගමන් මග

කිසිවෙකු මග නොහරින බවට වග බලා ගැනීම සඳහා විෂමතාව අවම කිරීම වැදගත් වේ. ආදායම් විෂමතාව, අවස්ථාවන් හා සේවාවන් සඳහා වන ප්‍රවේශයට අදාළ විෂමතාවන් සමග බැඳී පවතියි. එබැවින් 10 වන තිරසර සංවර්ධන ඉලක්කය තිරසර සංවර්ධන ඉලක්ක රැසකට සම්බන්ධ වේ. උදාහරණයක් ලෙස, සියළු ම ආකාරයෙන් පවතින දරිද්‍රතාව තුරන් කිරීම පිළිබඳ වන 01 වන තිරසර සංවර්ධන ඉලක්කය ළඟා කර ගැනීම විෂමතාව අවම කිරීමට ඉතා වැදගත් වේ. මීට අමතරව, සියළු දෙනාහට වැදගත් රැකියාවක් ලබා දීම පිළිබඳ වන 08 වන තිරසර සංවර්ධන ඉලක්කය ආදායම මෙන්ම අවස්ථාවන්ට අදාළ විෂමතාව පිළිබඳ ගැටළුව සඳහා පිළියම් ලබා දීමට අත්‍යවශ්‍ය වේ.

සේවාවන් හා අවස්ථාවන් සඳහා වන ප්‍රවේශයට අදාළ විෂමතාව අවම කිරීම සඳහා මෑත අවුරුදු කිහිපය තුළ රජය විසින් විවිධ මූලාරම්භයන් ගන්නා ලදී. එහෙත් පවතින කලාපීය අසමානතාවන් සඳහා පිළියම් ලබා දීම හා සම්පත් බෙදා හැරීම වැඩි දියුණු කිරීම සඳහා තවදුරටත් ප්‍රතිපත්ති/ උපාය මාර්ග අවශ්‍යවේ.[148]

තවද සංක්‍රමණික සේවකයන්ගේ සුභසාධනය ඉහළ නැංවීම සඳහා සංක්‍රමණික ශ්‍රමයට අදාළ වන බඳවාගැනීමේ පිරිවැය හා ගණුදෙනු පිරිවැයෙහි බලපෑම හා සම්බන්ධතාවන් පිළිබඳ සොයා බැලීම ප්‍රයෝජනවත් විය හැකිය. මීට අමතරව, මෙය ඉහළ ආදායමක් ඉපයීම හා වෘත්තීය/ නිපුණ සංක්‍රමණය දිරිගැන්වීම සඳහා මෙය ප්‍රයෝජනවත් වනු ඇත.

ගෝලීය තීරණ ගැනීමේ දී මෙරට හඬ කෙරෙහි තවදුරටත් අවධානය ලබා ගැනීමට මෙන්ම විදේශීය මූල්‍ය ප්‍රවාහවල ප්‍රතිලාභ ලබාගත හැකි වන පරිදි ලෝකයේ සෙසු රටවල් සමග ඒකාබද්ධතාව ඉහළ නැංවීම කෙරෙහි ශ්‍රී ලංකා රජයේ අවධානය යොමු කෙරේ.

146 ශ්‍රී ලංකා මහ බැංකුව (2017)
147 එම
148 වලංගුකරණ වැඩමුළුවේ ද පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කරන ලද අදහස්

13 CLIMATE ACTION

වර්තමාන තත්වය හා ප්‍රවණතාවන්

දේශගුණ විපර්යාසය මෙරට ආර්ථික හා සාමාජීය සංවර්ධනය කෙරෙහි වන ප්‍රධාන තර්ජනයකි. ආන්තික කාලගුණ තත්වයන් නිතර ඇති වීම හා ඒවා තීව්‍ර වීම මගින් කාලගුණ විපර්යාසයන් පිළිබඳ ඉතා පැහැදිලි සංඥා පිළිබිඹු කෙරේ. රට තුළ දේශගුණික හේතූන් නිසා ඇති වන විපත් නිරන්තරයෙන් ඇති වූ අතර එමගින් ආර්ථික හා සාමාජීය ජීවිතය කෙරෙහි දැඩි හානි ඇති විය. 2015 දී ඇති වූ ආර්ථික පාඩු හා හානි පමණක් රු. 99.8ක් ලෙස තක්සේරු කර ඇත.[149] 2017 දී විපත් හේතුවෙන් ඇති වූ මරණ සංඛ්‍යාව 219 ක් ලෙස වාර්තා වී ඇත.[150] තවද පසුගිය කාලගුණික දත්ත විශ්ලේෂණය මගින් රට පුරා පවතින පරිවේෂී වායු උෂ්ණත්වය ඉහළ යාමක් පෙන්නුම් කරයි. පසුගිය දත්ත විශ්ලේෂණ මගින් වර්ෂාපතන වෙනස්වීමෙහි පැහැදිලි රටාවක් හඳුනාගත නොහැකි වුවද එම රටාව ඉතා වේගයෙන් වෙනස් වෙමින් පවතින බව නිරීක්ෂණ මගින් පෙනී යයි. වර්ෂ 2080 තෙක් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් මෑතදී ඉදිරිපත් කරන ලද අනාවැකි මගින් අනාගතයේ දී වඩාත් ධ්‍රැවීය ව්‍යාප්තියක ප්‍රවනතාවක් පෙන්නුම් කෙරේ. එනම් තෙත් කලාපයන් තවදුරටත් තෙත් බවටත් වියළි කලාපයන් තවදුරටත් වියළි බවටත් පත් වීමයි. නිවර්තන කලාපීය, පුළුල් ලෙස ව්‍යාප්ත වූ පහත් මට්ටමකින් පිහිටි වෙරළ තීරයක් සහිත දිවයිනක් වන ශ්‍රී ලංකාව දිගු කාලීනව මුහුදු මට්ටම ඉහළ යාමේ තර්ජනයට ලක් වීමේ අවදානම සහිත වේ.

දේශගුණය පිළිබඳ පුරෝකථනය කරන ලද විපර්යාසයන්ගේ බලපෑම් හේතුවෙන් කැපී පෙනෙන ප්‍රතිඵල ඇති විය හැකිය. දේශගුණ විපර්යාසයන් හේතුවෙන් කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීනව ඇති වන බහුවිධ බලපෑම් මගින් කෘෂිකාර්මි හා ධීවර අංශයේ ජීනනෝපායන් කෙරෙහි බාධා එල්ල වනු ඇත. 2014 දී ආසියානු සංවර්ධන බැංකුව විසින් සිදු කරන ලද අධ්‍යයනය මගින් රටේ ප්‍රධාන කෘෂි දේශගුණ කලාප හතක වී එලදාව කෙරෙහි සමුච්චිත හා ප්‍රගාමී අයුරින් සෘණාත්මක බලපෑම් එල්ල කරන බවට අනාවැකි පල කරන ලදී. ඇතැම් ප්‍රදේශයන්හි 2080 වර්ෂය වන විට සිදු වන පාඩුව වර්තමාන එලදාවෙන් තුනෙන් එකක් වනු ඇත.

වියළ කලාපයේ ඇතැම් දිස්ත්‍රික්කයන්හි පදිංචිකරුවන්හට ආර්ථික හා ගෘහස්ථ භාවිතාවන් සඳහා දැඩි ජල හිඟයකට මුහුණ දීමට සිදු වන බවට අනාවැකි පළ කර ඇත. දිගුකාලීනව වෙරළබඩ ප්‍රදේශවල ආර්ථික හා සාමාජීය ජීවිත මුහුදු මට්ටම ඉහළ යාම හේතුවෙන් බලපෑමට ලක් වීමේ අවදානම සහිත වන අතර එමගින් සංක්‍රමණය කෙරෙහි පීඩනයක් ඇති කෙරේ. සෘණාත්මක බලපෑම් මැඩපැවැත්වීම සඳහා නිසි ක්‍රියාමාර්ග නොගතහොත් 2010 - 2050 දක්වා වන කාල සීමාව තුළ සාමාන්‍ය පරිදි ව්‍යාපාර සිදු කෙරෙන තත්වයක් යටතේ දළ දේශීය නිෂ්පාදිතයේ 6%ක පරාසයක් තුළ ආර්ථික වශයෙන් පාඩු ලබනු ඇති බවට අනාවැකි පළ කර ඇත.[151]

හරිතාගාර වායු විමෝචනයට අදාළව මෙරට වාර්ෂික ඒක පුද්ගල විමෝචනය ටොන් 2.16 ලෙස තක්සේරු කර ඇත. මෙම මට්ටමේ විමෝචනය ආසියානු පැසිෆික් කලාපයේ අඩුම මට්ටම වුවද, ශ්‍රී ලංකා විසින් පැරිස් දේශගුණ ගිවිසුමට අත්සන් තැබීමෙන් හා බලපෑම් අවම කිරීම, පාඩුව, හානිය හා ක්‍රියාත්මක කරන ආකාරයන් ආවරණය කරමින් ජාතිකමය නිර්ණය කරන ලද දායකත්වයන් (NDCs) ඉදිරිපත් කිරීම මගින් ගෝලීය දේශගුණ විපර්යාසවල බලපෑම් අවම කිරීම සඳහා වන බැඳීම් සපුරාලන බව ප්‍රකාශයට පත් කරන ලදී.

දේශගුණික විපර්යාසයෙහි බලපෑම්වල වැදගත් ස්වභාවය හේතු කොටගෙන රාජ්‍ය අංශයේ ප්‍රතිචාර පිළිබඳ උපායමාර්ගය " මුඛ්‍යධාරාගත කිරීම" කෙරෙහි යොමු වී ඇති අතර එමගින් පවතින අදාළ ආංශික නියෝජිතායතන හරහා අනුවර්තනය, බලපෑම් අවම කිරීම හා හානි හා පාඩු කළමනාකරණයට අදාළ ක්‍රියාකාරකම් සිදු කිරීම හැගවේ. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශය - දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය සඳහා වන ජාතික වශයෙන් නම් කරන ලද නියෝජිතායතනය (NDA) විසින් මුඛ්‍යධාරාගත කිරීමේ ක්‍රියාවලියෙහි ප්‍රධාන සම්බන්ධීකරණ කාර්යභාරය භාරගන්නා ලදී. එහි සම්බන්ධීකරණ කාර්යභාරය සඳහා පහසුකම් සැලසීම පිණිස මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශය විසින් දේශගුණික විපර්යාස පිළිබඳ ලේකම් කාර්යාලය ස්ථාපිත කරන ලදී (13.3 ඉලක්කය). දේශගුණය පිළිබඳ පියවර මුඛ්‍යධාරාගත කිරීම සඳහා ප්‍රතිපත්තිමය රාමු හා සම්බන්ධීකරණ යාන්ත්‍රණයන් සකස් කිරීමේ කාර්යය දේශගුණික විපර්යාස පිළිබඳ ලේකම් කාර්යාලය විසින් සිදු කරන ලදී. මෙම ක්‍රියාවලියෙහි ප්‍රධාන අවස්ථාවන්ට 2011 දී දේශගුණික විපර්යාස පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය, දේශගුණික විපර්යාස බලපෑම් සඳහා වන ජාතික අනුවර්තන සැලසුම 2016 - 2025 සකස් කිරීම හා 2016 දී අනුවර්තනය, බලපෑම් අවම කිරීම හා පාඩු හා හානි සඳහා ජාතිකමය නිර්ණය කරන ලද දායකත්වයන් (NDCs) ඉදිරිපත් කිරීම ඇතුළත් වේ.

දේශගුණ විපර්යාස බලපෑම් සඳහා වන ජාතික අනුවර්තන සැලසුම (NAP-CC) මගින් බලපෑමට ලක් වීමේ අවදානම සහිත අංශ නවයක්, එනම් ආහාර සුරක්ෂිතතාව (භෝග- සත්ව නිෂ්පාදන- ධීවර),

149 ආපදා කළමනාකරණ අමාත්‍යංශය හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (2016). ශ්‍රී ලංකාවේ පශ්චාත් ආපදා අවශ්‍යතා ඇගයුම

150 ආපදා කළමනාකරණ අමාත්‍යංශය හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (2017). ශ්‍රී ලංකාවේ වේගවත් පශ්චාත් ආපදා අවශ්‍යතා ඇගයුමඃ ජල ගැලීම් හා නාය යාම්

151 ආසියානු සංවර්ධන බැංකුව (201). දකුණු ආසියාවේ දේශගුණික විපර්යාස ඇගයුම හා අනුවර්තන

ජලය, සෞඛ්‍ය, මානව ජනාවාස, ජෛව විවිධත්වය හා පරිසර පද්ධති, වෙරළබඩ හා නාවික, අපනයන කෘෂිකර්මාන්තය, කාර්මික-බලශක්ති- ප්‍රවාහන හා සංචාරක ව්‍යාපාරය සඳහා ගැලපුම් ක්‍රියාමාර්ග හඳුනා ගැනිණි (13.1 ඉලක්කය). දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය විසින් තෝරා ගත් ආර්ථික අංශ සඳහා ආංශික අවදානම්සහගත බව පිළිබඳ පැතිකඩ, ගැලපුම හා බලපෑම් අවම කිරීම සඳහා කාර්මික අවශ්‍යතා ඇගයුම් සිදු කිරීම, දේශගුණ විපර්යාස පිළිබඳ මූලික (2001) හා දෙවන ජාතික සන්නිවේදනයන් (2012) සකස් කිරීම සහ ප්‍රදායක සහාය සහිතව තෝරා ගත් බලපෑම් අවම කිරීමේ යෝග්‍ය ජාතික ක්‍රියාමාර්ග පිළිබඳ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම දේශගුණ විපර්යාස පිළිබඳ ජාතික සන්නිවේදනය වැනි කාර්මික මූලාරම්භයන් සඳහා නායකත්වය ලබා දෙන ලදී. දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය විසින් දැනට දේශගුණ විපර්යාස පිළිබඳ තෙවන ජාතික සන්නිවේදනය සකස් කිරීමේ ක්‍රියාවලිය සකස් කරමින් පවතියි.

බලපෑම් අවම කිරීම සඳහා වන ජාතිකමය නිර්ණය කරන ලද දායකත්වයන් (NDCs) මගින් සාමාන්‍ය පරිදි ව්‍යාපාර සිදු කෙරෙන තත්වයක් යටතේ 2030 වන විට කොන්දේසි විරහිතව හරිතාගාර වායු විමෝචනය 7%න් (බලශක්ති අංශය 4% හා අනෙක් අංශවලින් 3%) හා කොන්දේසි සහිතව 23%න් (බලශක්ති අංශය 16% හා අනෙකුත් අංශ 7%) අවම කිරීමට සහතික වී ඇත. බලශක්ති අංශය පිළිබඳ සලකා බලන කල දැනට පවතින ජල විදුලි උත්පාදනයන්, සාම්ප්‍රදායක නොවන පුනර්ජනනීය බලශක්තිය (NCRE) හා අනාගත ජල විදුලි සංවර්ධනයන්ට අදාළව tCO_2 මි. 4.88 ක විමෝචනයක් අඩු වීමක් (2015 - 2030 දක්වා වූ කාලය සඳහා tCO_2 මි. 74.56 ක සමුච්චිත අඩු වීමක්) - 2010 හි පාදක රේඛාවෙන් 4%ක් අඩු වීමක් අපේක්ෂා කෙරේ. ප්‍රවාහන, අපද්‍රව්‍ය, කාර්මාන්ත හා වනාන්තර යන අංශයන්ගෙන් අපේක්ෂිත විමෝචනය අවම කිරීම සාමාන්‍ය පරිදි සිදු කෙරෙන ව්‍යාපාරවලට අදාළව අපේක්ෂිත විමෝචනය අවම කිරීම කොන්දේසි විරහිතව 3% හා කොන්දේසි සහිතව 7%කි.

ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාසය සම්බන්ධයෙන් කටයුතු කරන අනෙක් ප්‍රධාන ජාතික නියෝජිතායතන වන්නේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයයි. ආපදා කළමනාකරණ කටයුතු පිළිවෙලින් සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය සඳහා දේශගුණය පිළිබඳ තොරතුරු ලබා දීමේ වගකීම ඒවා සතු වේ. එම ආයතන දෙකම ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය හා ලෝක කාලගුණ සංවිධානය සඳහා ජාතික කේන්ද්‍රීය ලක්ෂය වන්නේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වන අතර ශ්‍රී ලංකාව තුළ සෙන්දායි රාමුව ක්‍රියාත්මක කිරීමේ වගකීම ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සතුවේ.

මෙම ප්‍රධාන නියෝජිතායතන විසින් ඉටු කරන කාර්යභාරයන් සම්බන්ධීකරණයට අමතරව විවිධ අංශවල දේශගුණ විපර්යාස බලපෑම්වලට අදාළව අනුවර්තී ක්‍රියාමාර්ග ගැනීමේ බලතල සහිත රේඛීය අමාත්‍යාංශ හා නියෝජිතායතන කිහිපයක් වේ (උදා: කෘෂිකර්ම අමාත්‍යාංශය, වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව). දේශගුණ විපර්යාසය යනු ආංශික ප්‍රතිපත්තිමය පියවර හරහා පිළියම් අවශ්‍ය වන මතු වෙමින් පවතින තර්ජනයක් ලෙස හඳුනාගෙන ඇති ඇතැම් ආංශික සැලසුම්/ වැඩසටහන් ඇත.

මීට අදාළ ප්‍රධාන උදාහරණ වන්නේ වෙරළබඩ කලාපීය හා වෙරළබඩ සම්පත් පිළිබඳ ප්‍රධාන සැලැස්ම (CZCRMP) 2016 දී ජාතික ජෛව විවිධත්ව උපායමාර්ගික සැලැස්ම 2016 - 2022 (NBSAP), ශ්‍රී ලංකා විස්තීර්ණ ආපදා කළමනාකරණ වැඩසටහන (SLCDMP) 2014 - 2018 හා ශ්‍රී ලංකාව තුළ භූමි භායනයට එරෙහිව සටන් කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NAP-LD) වේ (13.1 හා 13.2 ඉලක්ක). ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් දැනට ශ්‍රී ලංකා ජාතික ආපදා කළමනාකරණ සැලසුම (SLNDMP) - 2030 සකස් කිරීමේ අවසන් අදියරෙහි සිටින අතර එය අදියර තුනකින් ක්‍රියාත්මක කිරීමට නියමිතය. ජාතික REDD+ ආයතනික රාමුව හා ක්‍රියාකාරී සැලැස්ම යනු බලපෑම් අවම කිරීම කෙරෙහි අවධානය යොමු කරන එකම ආංශික සැලසුමයි. ඉහත දැක්වෙන්නේ මුඛධාරාගත කිරීමේ මූලධර්මය යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත මෑතදී සකස් කරන ලද බහු ආංශික, බහු නියෝජිතායතන වැඩසටහන්/ සැලසුම් වේ. ඔවුන්ගේ සම්බන්ධීකරණ නියෝජිතායතන මේ වන විට අදාළ නියෝජිතායතනවල සහයෝගය සහිතව ක්‍රියාත්මක කිරීමේ අභියෝගයට මුහුණ දී ඇත. එය දුෂ්කර කාර්යයකි.

දේශගුණයට අදාළ බිම් මට්ටමේ කටයුතු පිළිබඳ සැලකීමේ දී පොදුවේ කෘෂිකර්මාන්ත හා ජල කලමනාකරණ අංශයන්හි කටයුතු සඳහා ඉහළ මට්ටමේ දැනුවත්භාවයක්, සූදානමක් හා මූලාරම්භයන් නිරීක්ෂණය කළ හැකිය (13.3 ඉලක්කය). අනෙක් අංශයන්ගේ තත්වය සාපේක්ෂ වශයෙන් පසුගාමී ස්වරූපයක් පෙන්නුම් කරයි. සාපේක්ෂව විශාල ව්‍යාපෘති තුනක් එනම් කාලගුණ ප්‍රත්‍යස්ථිතිය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (CRIP), කාලගුණ ප්‍රත්‍යස්ථිති අනුකලිත ජල කළමනාකරණ ව්‍යාපෘතිය (CRIWMP) හා ශ්‍රී ලංකාවේ මහවැලි ගංගා ද්‍රෝණියෙහි ජීවත් වන ආන්තිකකරණයට ලක් කරන ලද කෘෂිකාර්මික ප්‍රජාවන් කෙරෙහි දේශගුණික විපර්යාස මගින් එල්ල වන බලපෑම් සඳහා පිළියම් ලබා දීම සඳහා වන ව්‍යාපෘති පිළිවෙලින් ලෝක බැංකුව හා හරිත දේශගුණ අරමුදල සහ අනුවර්තන අරමුදලේ සහාය ඇතිව ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘති තුන මගින් විශාල හා මධ්‍යම වාරිමාර්ග යෝජනා ක්‍රමවල, කුඩා එල්ලන්ගාව පද්ධති හා මහවැලි ගංගා ද්‍රෝණියේ තෝරාගත් ගොවි ප්‍රජාවන්හි අවදානම්සහගත ගොවීන්ගේ ප්‍රත්‍යස්ථිති හා අනුවර්තන ධාරිතාව ඉහළ නැංවීම ඉලක්ක කෙරේ (13.1 ඉලක්කය).

පරතරයන් හා අභියෝග

අනුවර්තන හා බලපෑම් අවම කිරීමේ ක්‍රියාමාර්ග හරහා දේශගුණික විපර්යාසවල බලපෑම් සඳහා පිළියම් ලබා දීම රාජ්‍ය ප්‍රතිපත්තියෙහි ඇති නව ක්ෂේත්‍රයකි. එබැවින් දේශගුණික විපර්යාසට අදාළ තර්ජන සඳහා පිළියම් ලබා දීමේ ප්‍රතිපත්ති රාමු හා ආයතනික කටයුතු ක්‍රමයෙන් සකස් වෙමින් පවතියි. සියළු අංශවල දේශගුණික විපර්යාස බලපෑම්වලට අදාළව ඵලදායී අනුවර්තන පියවර වළක්වන පරතරයන් පහක් කාලගුණ විපර්යාස බලපෑම් සඳහා වන ජාතික අනුවර්තන සැලසුම මගින් හඳුනා ගන්නා ලදී: එනම් තොරතුරු පරතරය, තාක්ෂණ පරතරය, ප්‍රතිපත්ති පරතරය, ආයතනික පරතරය හා සම්පත් සචලීකරණය වේ.

මේවා අතරින් මෙම සන්ධිස්ථානයේ දී ඉතාම තීරණාත්මක ලෙස පෙනී යන්නේ තොරතුරු පරතරය හා ආයතනික පරතරයයි. තොරතුරු පරතරය යන්නෙන් අදහස් වන්නේ අනුවර්තන ක්‍රියාමාර්ග ගත යුතු අනාගත දේශගුණ විපර්යාස හඳුනා ගැනීම සඳහා විශ්වසනීය තොරතුරු මද බවයි. කෙටි කාලයක් තුළ තොරතුරු පරතරය යන්නෙන් අදහස් වන්නේ අදාළ ජීවනෝපාය ක්‍රියාකාරකම් පිළිබඳ වන ගැලපුම් සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන නිවැරදි කාලගුණ අනාවැකි නොමැති බවයි. දීර්ඝ කාලයක් තුළ තොරතුරු පරතරය යන්නෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට ඉවහල් වන දේශගුණයෙහි දිගු කාලීන විපර්යාස පිළිබඳ විශ්වසනීය අනාවැකි මද බව අදහස් කෙරේ. මානව සම්පත් හා කාර්මික පහසුකම් සීමා වීම හේතුවෙන් කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් විශ්වසනීය කාලගුණ අනාවැකි හා දේශගුණ විපර්යාස පිළිබඳ අනාවැකි සකස් කිරීමට බාධා එල්ල වී ඇති අතර එය අවශ්‍ය ධාරිතා සංවර්ධන ක්‍රියාමාර්ග හරහා ඉවත් කළ යුතු පරතරයකි.

ආයතනික පරතරය යනු දේශගුණයට අදාළව යෝග්‍ය පියවර ගැනීම සඳහා ආයතන හිඟකම පමණක් නොවේ. මන්ද යත්, ශ්‍රී ලංකාව තුළ දේශගුණ විපර්යාසයට අදාළ ආංශික හා එකිනෙකට සම්බන්ධ වූ බලපෑම් සඳහා පිළියම් ලබා දිය හැකි රේඛීය නියෝජිතායතන ගණනාවක් වන බැවිණි. වඩාත් නිශ්චිතව කිවහොත් විවිධ අංශයන්හි දේශගුණික විපර්යාසයේ බලපෑම්වලට අදාළව සම්බන්ධීකරණය කරන ලද පියවර ගැනීම සඳහා බලතල හිමිව සිටින්නන් අතර ධාරිතා සීමාවන් හා දුර්වල සම්බන්ධීකරණය මෙයින් අදහස් කෙරේ. ඉහත සඳහන් කළ ආකාරයට දේශගුණ විපර්යාසවලට අදාළව පියවර ගැනීම සඳහා විධිවිධාන සලසා ඇති ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් වේ. මේවා අදාළ ආයතන අතර සම්බන්ධීකරණය අවශ්‍ය වන මූඛ්‍යධාරාගත කිරීමේ මූලධර්මය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර ඇත. ආයතනික සම්බන්ධීකරණය හා විවිධ පාර්ශවකරුවන් අතර ධාරිතා හිඟය හේතුවෙන් මෙම මූලධර්ම හා සැලසුම් ක්‍රියාත්මක කිරීම දුෂ්කර වී ඇත.

ඉදිරි ගමන් මග

මැත කාලීනව දේශගුණික විපර්යාස මගින් විවිධ අංශයන් තුළ ඇති වන තර්ජන සඳහා පිළියම් ලබා දීමට ශ්‍රී ලංකාව විසින් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හා සැලසුම් ගණනාවක් සකස් කරන ලදී. එම සැලසුම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම කෙරෙහි අනෙක්වා අතර ආයතනික හා තොරතුරු පරතරයන් බාධා එල්ල කර ඇත. එබැවින් මෙම සන්ධිස්ථානයෙහි දී වහාම අවධානය යොමු කළ යුතු අත්‍යවශ්‍ය කරුණ වන්නේ තොරතුරු හා සම්බන්ධීකරණ පරතරයන් ඉවත් කරමින් මෙම ප්‍රතිපත්ති හා සැලසුම් වේගවත් ලෙස ක්‍රියාත්මක කිරීමයි. තොරතුරු පරතරය ඉවත් කිරීම ප්‍රධාන වශයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙහි වගකීමක් වන අතර එබැවින් යෝග්‍ය දේශගුණ තොරතුරු නිමැවුම් ඇති කිරීම සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙහි ධාරිතා සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසියක් වේ. මෙම තත්වය හඳුනාගනිමින් 2018 ජාතික අයවැය මගින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙහි ධාරිතා සංවර්ධනය සඳහා වැදගත් විධිවිධාන ඇතුළත් කර ඇත. ක්‍රියාත්මක කිරීම කෙරෙහි බාධා එල්ල කරන ආයතනික පරතරයන් වඩාත් ගැඹුරින් මුල් බැසගෙන ඇති අතර ඒ සඳහා වඩාත් විස්තීරණ ක්‍රියාමාර්ග අවශ්‍ය වේ. වඩාත් වැදගත් පියවර වන්නේ සැලසුම්, වැඩසටහන් හා ව්‍යාපෘතිවල ප්‍රගතිය අඛණ්ඩව හඳුනා ගත හැකි ඵලදායී අධීක්ෂණ හා ඇගයුම් රාමුවක් සකස් කිරීමයි.

වර්තමාන තත්වය හා ප්‍රවනතාවන්

ශ්‍රී ලංකාවේ භූමිය මෙන් අට ගුණයක විශාලත්වයෙන් යුතු ප්‍රදේශයක් ආවරණය කරන සුවිශේෂී ආර්ථික කලපාපය, යාබද කලාපය, දේශභූමික සාගරය හා වොහාරික සමුද්‍ර තීරයෙන් සමන්විත සමුද්‍ර සම්පත්වල ප්‍රතිලාභ ලබා ගැනීමේ හිමිකම ශ්‍රී ලංකාවේ පුරවැසියන්හට ඇත. තවද සුවිශේෂී ආර්ථික කලපාපයෙන් ඔබ්බට විහිදුණු මුහුදු පත්ල කලාපය (seabed zone) සඳහා ශ්‍රී ලංකාවට ඇති අයිතිය ශ්‍රී ලංකාව විසින් සමුද්‍ර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UNCLOS) වෙත ඉදිරිපත් කරන ලදී. කි.මී. 1700 ඉක්මවා යන වෙරළ තීරයක් දිවයින සතු වන අතර එය විවිධ වෙරළබඩ හා සමුද්‍ර පරිසර පද්ධතීන්ගෙන් ගහන වේ. වෙරළබඩ හා සමුද්‍ර සම්පත් මත පදනම් වූ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් වන්නේ ධීවර කටයුතු හා ජලජීවී වගාව, සංචාරක කර්මාන්තය සහ වරාය හා නාවික කටයුතුයි. වෙරළබඩ කලාපයේ ඇතැම් ප්‍රදේශයන්හි නිෂ්පාදන කර්මාන්ත හා බලශක්ති උත්පාදනය ස්ථාපිත කර ඇත. පවුල් 300,000ක පමණ ජීවිකාව ධීවර කටයුතු වන අතර පුද්ගලයෝ 350,000ක් පමණ සංචාරක කර්මාන්තයේ කටයුතුවල නිරතව සිටිති.

මහද්වීපික තටක ප්‍රදේශයේ නොගැඹුරු මුහුද විවිධ සමුද්‍ර විශේෂවලින් පොහොසත් වන අතර එයට ආර්ථික වශයෙන් වාසිසහගත වූ මත්ස්‍යයින් හා ක්‍රස්ටේසියානුවන් අයත් වේ. දිවයින අවට මුහුදු ප්‍රදේශයන් ද තල්මසුන්ගේ හාවෙනත් ක්ෂීරපායී මුහුදු සත්ව විශේෂවල වාසභූමිවලින් ද ගහන වන අතර එමගින් ලොව පුරා සංචාරක අවධානය ලබා ගෙන ඇත. මෙරට සමුද්‍ර ජෛව විවිධත්වයට සම්බන්ධ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් වන්නේ ධීවර කටයුතු හා සංචාරක කර්මාන්තයයි. ශ්‍රී ලංකවේ කරදිය ධීවර කර්මාන්තය ප්‍රධාන සංරචක දෙකකින් සමන්විත වන අතර ඒවා නම් වෙරළබඩ මසුන් ඇල්ලීම හා අක් වෙරළ/ ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීමයි. මීට අමතරව, දේශීය ජල දේහවල මසුන් ඇල්ලීම දායක වන්නේ මුළු සැපයුමෙන් කුඩා ප්‍රමාණයකට පමණි. 1980 දී බහු දින යාත්‍රා හඳුන්වා දීමත් සමග අක් වෙරළ හා ගැඹුරු මුහුදු ප්‍රදේශවල නිෂ්පාදනය ඉහළ යාම හේතුවෙන් වෙරළබඩ මසුන් ඇල්ලීම පහළ බසිමින් තිබුණ නමුත් 2015 දී වෙරළබඩ මසුන් ඇල්ලීම මුළු මත්ස්‍ය නිෂ්පාදනයෙන් 51%ට දායක විය.

මිරිස්ස, කල්පිටිය හා ත්‍රිකුණාමලය වැනි රට පුරා ස්ථාන රැසක තල්මසුන් හා ඩොල්ෆින් මසුන් නැරඹීමේ කර්මාන්තය වර්ධනය වෙමින් පවතියි. වෙරළබඩ ස්ථාන රැසක "හිරු එළිය හා වැලි සහිත වෙරළවල" සතුටු වීම සඳහා අවස්ථාව සලසා දෙනු ලබන අතර ඇතැම් වෙරළබඩ ප්‍රදේශ වෙරළාසන්නව විනෝද වීමේ ගමනාන්තයන් ලෙස ප්‍රචලිතව පවතියි. හික්කඩුවේ කොරල් පර, නැගෙනහිර වෙරළ තීරයේ කල්පිටියේ කොරල් පරය හා පරවි දූපත සහ ආරුගම් බොක්ක ප්‍රධාන සංචාරක ආකර්ෂණයන් බවට පත් වී ඇත.

පරිසර පද්ධතීන් හා ජීවීන් කෙරෙහි අයහපත් අයුරින් බලපාන දැනට ශ්‍රී ලංකාවේ තුළ පැන නැගෙමින් පවතින ගැටළුවක් වන්නේ සමුද්‍ර හා වෙරළබඩ දූෂණයයි. සමුද්‍ර හා වෙරළබඩ පරිසර දූෂණය වන්නේ භූමිය පාදක වූ මෙන්ම සමුද්‍රය පදනම් වූ දූෂණකාරක හේතුවෙනි. භූමිය පාදක වූ දූෂණය වේගවත් නාගරීකරණය, ඉහළ ගොස් ඇති සංචාරක කටයුතු, ඉහළ යමින් පවතින කාර්මික කටයුතු සහ වෙරළබඩ කලාපය තුළ වන දුර්වල කලස කළමනාකරණ පහසුකම්වල ප්‍රතිඵලයකි. භූමිය පාදක වූ ප්‍රධාන දූෂ්‍යකාරකයන් වන්නේ වෙරබඩ නගර සහ සංචාරක පහසුකම් වෙතින් නිකුත් කෙරෙන කසල හා අපජලය/ මලාපවහනය, වෙරළාසන්න පහසුකම් වෙතින් නිකුත් කෙරෙන කාර්මික දූෂ්‍යකාරක, වෙරළබඩ කෘෂිකර්මාන්තයෙන් හා ජලජීවී වගාව මගින්නි කුත් කෙරෙන කෘෂි රසායන සහ රට අභ්‍යන්තර ප්‍රදේශ වෙතින් ගලා එන ගංගා ජලය සමග මුසු වී එන දූෂ්‍යකාරකයි. සමුද්‍රය පාදකවූ දූෂණය සිදු වන ප්‍රධාන මූලාශ්‍ර වන්නේ ප්‍රවාහනයේදී හා මුහුදේ දී සිදු වන අනතුරු හේතුවෙන් තෙල්/ රසායනික ද්‍රව්‍ය පිටාර යාම, යාත්‍රා මගින් දිරා නොයන ද්‍රව්‍ය (ප්ලාස්ටික්)ඉවත දැමීම, කලින් කලට සිදු කෙරෙන වියළි තටාකගත කිරීම හා යාත්‍රා සේවා කිරීම සහ බැලස් ජලය මුදා හැරීම යි. කලින් කලටරට වටා වෙරළාසන්න ප්‍රදේශයන් වෙතින් තෙල්/ රසායන ද්‍රව්‍ය පිටාර යාම හා සමුද්‍ර අනතුරු සිදුවීම කිහිපයක් වාර්තා වී ඇත.

පුළුල් පරාසයක වන පාර්ශවකරුවන් විසින් සූරා කෑමට ලක් කරන සමුද්‍ර හා වෙරළ සම්පත් යනු සංකීර්ණ පද්ධති වේ. මෙරට සමුද්‍ර ධීවර කටයුතු බහු යාත්‍රා, බහු ආම්පන්න හා බහු විශේෂ ධීවර කටයුතු මත සිදු කෙරේ. එබැවින් සම්පත් තිරසර ලෙස කළමනාකරණය කිරීම සඳහා සංකීර්ණ සම්පත් කළමනාකරණ ගැටළුවලට පිළියම් ලබා දීම සඳහා යෝග්‍ය ප්‍රතිපත්ති, නෛතික හා ආයතනික රාමු අවශ්‍ය වේ. තිරසර පදනමකින් සම්පත් භුක්ති විඳිමින් සමුද්‍ර හා වෙරළබඩ පරිසරයන් ආරක්ෂා කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකාව විසින් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගණනාවක් හඳුන්වා දී ඇත (14.2, 14.4 හා 14.7 ඉලක්ක). මේවාට අණ පනත්, ජාතික ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් ඇතුළත් වේ. අණ පනත් මගින් සමුද්‍ර හා වෙරළබඩ සම්පත් කළමනාකරණයෙහි විවිධ අංග පිළිබඳ කටයුතු කරන නෛතික රාමුවක් හා ආයතනික සැලැස්මක් ස්ථාපිත කරන ලදී. මෙරට සමුද්‍රය (හා වෙරළබඩ සම්පත්) තිරසර ලෙස කළමනාකරණය කිරීම පිළිබඳ නෛතික රාමුව ප්‍රධාන නීති කිහිපයකින් සැකසී ඇත.

එනම් 1996 ධීවර හා ජලජ සම්පත් පනත (ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව), 1981 වෙරළ සංරක්ෂණ පනත (වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව), 1981 සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත (සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය), 1937 වනසත්ව හා තුරුලතා ආරක්ෂා කිරීමේ ආඥා පනත (වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව) හා 2009 ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂණ පනත (ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව) වේ. ජාතික නෛතික රාමුව රජය විසින් අත්සන් කරන ලද ජාත්‍යන්තර ගිවිසුම් හා සම්මුතීන් ගණනාවකින් බැඳී පවතියි. මෙම නෛතික රාමුව මගින් විශේෂ ප්‍රදේශ (උදාඃ වෙරළබඩ කලාපයේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ, ධීවර කළමනාකරණ ප්‍රදේශ, ධීවර කළමනාකරන ප්‍රදේශ, ධීවර රක්ෂිත, ජාතික සමුද්‍ර උද්‍යාන හා සමුද්‍ර අභයභූමි) නිර්මාණය සහ තර්ජනයට ලක් වූ විශේෂ ඇල්ලීම, අපනයනය හෝ ආනයනය පාලනය කිරීමට රෙගුලාසි පැනවීම හරහා තෝරා ගත් විශේෂ හා/ හෝ වාසභූමි ආරක්ෂා කිරීමට ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඉඩ සලසනු ලැබේ (14.5 හා 14.4 ඉලක්ක). නෛතික රාමුවට අමතරව, ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් ගණනාවක් මගින් සමුද්‍ර හා වෙරළ සම්පත් සංරක්ෂණය හා තිරසර කළමනාකරණය සවිබල ගන්වනු ලැබේ. ජාතික ධීවර හා ජල ජීවී වගාව පිළිබඳ ප්‍රතිපත්තිය (කෙටුම්පත), 2000 ජාතික වනජීවී ප්‍රතිපත්තිය, 2005 ජාතික ජෛව ආරක්ෂණ ප්‍රතිපත්තිය, වෙරළබඩ කලාපය හා වෙරළ සම්පත් කළමනාකරණ සැලසුම (2016), 2005 තෙල් කාන්දු වීම පිළිබඳ ජාතික ආපතිකතා සැලැස්ම, 2016 - 2022 ජෛව විවිධත්වය පිළිබඳ ජාතික උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම මීට ඇතුළත්වේ. නෛතික හා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීමේ නිශ්චිත බලතල සහිත පුද්ගලයන් සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ ද සහාය ලබා දෙනු ලැබේ. සමුද්‍ර ජෛව විවිධත්වයට අදාළ ගැටළුවලට පිළියම් ලබා දීම සඳහා සමස්ථයක් ලෙස ශ්‍රී ලංකාව විසින් විස්තීරණ ප්‍රතිපත්තියක්, නෛතික හා ආයතනික රාමුවක් සකස් කරන ලද අතර එය කැපී පෙනෙන ජයග්‍රහනයක් ලෙස සැලකිය හැකිය.

රජය විසින් සමුද්‍ර මූලාශ්‍රයන්ගෙන් සිදු කෙරෙන මත්ස්‍ය සැපයුම ඉහළ නැංවීම සඳහා සැලකිය යුතු ප්‍රයත්නයන් ගන්නා ලදී (14.7 ඉලක්කය). කෙසේ වුවද, පසුගිය දශක දෙක තුළ වාර්තා වූ වේගවත් නිෂ්පාදන වර්ධනය සිදු වී ඇත්තේ ප්‍රධාන වශයෙන් අක් වෙරළ/ ගැඹුරු මුහුදු කලාපයන්ගේ වැඩි දුර ප්‍රමාණයක ධීවර කටයුතු සිදු කිරීමේ හැකියාව සලසන ලද නවීන යාත්‍රා හා තාක්ෂණය සඳමා පුද්ගලික ආයෝජනය ඉහළ යාම හේතුවෙනි. එහි ප්‍රතිඵලයක් ලෙස 1980 සිට වාණිජ ධීවර යාත්‍රා එකතුව දෙගුණයකට වැඩි ප්‍රමාණයකින් වැඩි වී ඇත. 1980 දී යාත්‍රා එකතුවෙන් 60%ක් පමණ සම්පදායික යාත්‍රාවලින් සමන්විත විය. එකල සිට inboard - multiday, inboard- day, outboard- FRP හා සාම්ප්‍රකදායක මෝටර් බෝට්ටු වැනි මෝටර් බෝට්ටු සඳහා පුද්ගලික ආයෝජන ක්‍රමිකව ඉහළ ගොස් ඇති අතර එම සංඛ්‍යාව සාම්ප්‍රදායක යාත්‍රා සංඛ්‍යාව ඉක්මවා ගොස් ඇත.
ධීවර වරායන්, නවතා තැබෙන ස්ථාන, ගබඩා හා අලෙවිකරණ පහසුකම් වැනි යටිතළ පහසුකම් සඳහා පුද්ගලික අංශ මූලාරම්භයන් සඳහා රජයේ සහාය ලබා දෙන ලදී. රට පුරා ධීවර වරායන් ඉදි කිරීම හා කළමනාකරණය සඳහා රජය විසින් ධීවර වරාය නීතිගත සංස්ථාව ස්ථාපිත කරන ලදී. ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම ඉහළ යාම මත්ස්‍ය සැකසීමේ කර්මාන්තය ඇති වීම සඳහා ඉවහල් වූ අතර එමගින් පුද්ගලික ආයෝජන ආකර්ෂණය කරන ලද අතර අපනයන වෙළඳපළ සඳහා විදෙස් මූලාශ්‍රයන්ගෙන් පවා ආදායම් ඉපයීමට හැකි විය. එමගින් විදෙස් විනිමය ඉපයීමට හැකි විය. රජය විසින් ධීවර ප්‍රජාවට අදාළ පර්යේෂණ, ව්‍යාප්තිය හා පුහුණු පිළිබඳ කටයුතු කරනු ලැබේ (14.7 ඉලක්කය). ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA) හා ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය මගින් පර්යේෂණ හා පුහුණු කටයුතු සිදු කෙරේ.

සැපයුම් අංශයේ මැදිහත් වීම් දිරිගැන්වෙන ධීවර කටයුතු ඉහළ යාමට සම්බන්ධ පරිසර හා සම්පත් කළමනාකරණට අදාළ ගැටළු විසඳීම සඳහා රජය විසින් බෝට්ටු ලියාපදිංචි කිරීම, බලපත්‍ර නිකුත් කිරීම, හානිදායක ධීවර ආම්පන්න භාවිතය පාලනය කිරීම හා සීමාව ඉක්මවූ සූරාකෑම වැළැක්වීම සඳහා දේශීය ධීවර කටයුතු කළමනාකරණය කිරීමට ධීවර සංවිධානයන්ගේ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම වැනි නියාමන ක්‍රියාමාර්ග ගනු ලැබේ (14.4 ඉලක්කය). ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ධීවර හා ජලජ සම්පත් පනතෙහි විධිවිධාන යටතේ මෙම මැදිහත්වීම් සිදු කරනු ලැබේ. මෙම ක්‍රියාමාර්ගවල අරමුණ වන්නේ සීමාව ඉක්මවූ සූරාකෑම වළක්වමින් තිරසර සීමාවන් යටතේ නිෂ්පාදන මට්ටම් පවත්වා ගැනීමයි.

පරතරයන් හා අභියෝග

දිවයින පුරා සමුද්‍ර හා වෙරළබඩ පරිසර පද්ධතීන් ඉන්දියානු සාගරයේ කාර්ය බහුල මුහුදු මාර්ගවල වර්ධනය වන ධීවර කටයුතුවලට නිරාවරණය වේ. ඒ සමගම "නිල් ආර්ථික" අවස්ථා ලබා ගැනීම සඳහා වන ශ්‍රී ලංකාවේ ප්‍රයත්නයන් මගින් ද පීඩනයක් එල්ල වේ. එහි ප්‍රතිඵලයක් ලෙස සමුද්‍ර ජෛව විවිධත්වය තිරසර ලෙස කළමනාකරණය කෙරෙහි බලපෑම් එල්ල කළ හැකි පරතරයන් හා අභියෝග ගණනාවක් පැන නැගී ඇති අතර එයට පහත ලැයිස්තුගත කර ඇති වඩාත් තීරණාත්මක ගැටළු ද ඇතුළත් වේ.

- මුහුදු පත්ලේ දැල් එළීමේ ක්‍රමය වැනි හානිදායක ක්‍රම භාවිතා කරමින් දකුණු ඉන්දියානු ධීවරයින් විසින් ශ්‍රී ලංකාවට අයත් මුහුදේ නීති විරෝධී ධීවර කටයුතු ධීවර කටයුතුවල තිරසරභාවය කෙරෙහි එල්ල වී ඇති ප්‍රබල අභියෝගයකි. මෙය කෙතරම් උග්‍ර වී ඇති ද යත් මෙරට නාවික බලකායට පවා මෙම තත්වය පාලනය කිරීම දුෂ්කර වී ඇත. නීති විරෝධී මසුන් මරන්නන් විසින් සියළු ම රාජතාන්ත්‍රික ප්‍රයත්නයන් හා පනවා ඇති නීති උල්ලංඝණය කිරීම අඛණ්ඩව සිදු කරමින් පවතියි.
- නීති විරෝධී, වාර්තා නොවූ හා නියාමනය නොවූ (IUU) ධීවර කටයුතු මගින් දේශීය ධීවර කටයුතු කෙරෙහි සැලකිය යුතු හානියක් සිදු කළ හැකි ප්‍රධාන පෙළේ තර්ජනයකි.

සම්පත් පදනම කෙරෙහි එයින් ඇති වන අහිතකර බලපෑමට අමතරව එමගින් ධීවර අපනයන කර්මාන්තයේ වර්ධනය කෙරෙහි ද අහිතකර ලෙස බලපෑම් එල්ල විය හැකිය. නීති විරෝධී, වාර්තා නොවූ හා නියාමනය නොවූ (IUU) ධීවර කටයුතු වැළැක්වීම සඳහා ප්‍රමාණවත් පියවර නොගන්නේය යන පදනම මත සිට ශ්‍රී ලංකාව යනු සහයෝගය නොදක්වන රටක් ලෙස හඳුනාගෙන යුරෝපා සංගමය විසින් වරක් ශ්‍රී ලංකාවෙන් මසුන් අපනයනය කිරීම තහනම් කරන ලදී.

- ශ්‍රී ලංකාව අවට මුහුදු මාර්ගයන්ගේ තදබදය මෙන්ම ශ්‍රී ලංකාවේ වරායන් වෙත පැමිණෙන නැව් ප්‍රමාණය ද ඉහළ ගොස් ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස අනාගතයේ තෙල් කාන්දු වීමේ අවදානම හා නාවික අනතුරු ඉහළ යා හැකිය. යෝග්‍ය ආරක්ෂණ ක්‍රියාමාර්ග නොගතහොත් මන්නාරම ද්‍රෝණියෙහි අක්වෙරළ තෙල් ගවේෂණය සමුද්‍ර දූෂණය ඉහළ යාමට හේතු විය හැකිය.

සමුද්‍ර දූෂණය ජාතික නියෝජිතායතනයන්ගේ ප්‍රයත්නයන් මගින් පමණක් පාලනය කළ නොහැක. මන්ද යත් දූෂණයට හේතුවන ජාත්‍යන්තර මූලාශ්‍ර පිළිබඳ කටයුතු කිරීමට ශ්‍රී ලංකාවට ද හැකියාවක් නොමැති බැවිණි.

- වැඩි වෙමින් පවතින මුහුදු මාර්ග තදබදය හේතුවෙන් ජෛව ආරක්ෂාව අදාළව ගැටළු නිර්මාණය කරමින් ආක්‍රමණශීලී ආගන්තුක විශේෂ පැතිරීමේ අවදානම ඉහළ යයි.

- ශ්‍රී ලංකාව විසින් වෙරළබඩ හා සමුද්‍ර සම්පත් කළමනාකරණය සඳහා විස්තීරණ නෛතික, ප්‍රතිපත්තිමය හා ආයතනික රාමුවක් සකස් කරනු ලැබුවද මෙම රාමුව ක්‍රියාත්මක කිරීමේ දී අකාර්යක්ෂමතාවන් කිහිපයක් ඇති වී තිබේ. සුපරීක්ෂණය, අධීක්ෂණය හා බලාත්මක කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනවල ධාරිතාව සීමා වීම මෙම තත්වය කෙරෙහි බලපෑ ඇති ප්‍රධාන සාධකයකි.

ඉදිරි ගමන් මග

ශ්‍රී ලාංකිකයින්ගේ මෙන්ම අසල්වැසි රටවල ධීවරයන්ගේ ධීවර කටයුතු සඳහා වන උත්සාහය ඉහළ යාම හේතුවෙන් දිවයින වටා සමුද්‍ර ජෛව විවිධත්වය කෙරෙහි දැඩි පීඩනයක් එල්ල වී ඇත. මුහුදුබඩ හා වෙරළබඩ ආර්ථික ක්‍රියාකාරකම් ඉහළ යාම හා මුහුද ආශ්‍රිත සංචාරක කර්මාන්තයෙහි වර්ධනය හේතුවෙන් වැඩි වී ඇති සමුද්‍ර දූෂණය මගින් අතිරේක පීඩනයක් එල්ල කෙරේ. තිරසරබවෙහි ප්‍රතිඵලයක් ලෙස පැන නැගී ඇති ගැටළු සඳහා පිළියම් ලබා දීමට විස්තීර්ණ නෛතික හා ප්‍රතිපත්තිමය රාමුවක් සකස් කිරීම සඳහා වන ශ්‍රී ලංකාව උත්සාහ දැරුවද අදාළ පද්ධතිය තුළ තවමත් ධාරිතා සීමාවන් පවතියි; විශේෂයෙන් එහි සාර්ථක ක්‍රියාකාරීත්වයට දැඩි ලෙස බලපා ඇති දුර්වල සුපරීක්ෂණය, අධීක්ෂණය හා බලාත්මක කිරීමේ ධාරිතාවයි. දැනට සමුද්‍ර පරිසර පද්ධතීන් මුහුණ පා ඇති සියළු ම අභියෝග පාහේ මෙම ඌණතාවයට සෘජුව හෝ වක්‍රව සම්බන්ධ බව හඳුනා ගත හැකිය. එබැවින් රට වටා ශක්තිමත් හා ආරක්ෂිත සාගරයක් පැවතීම තහවුරු කිරීම සඳහා ප්‍රධාන කරුණක් වන්නේ තිරසර කළමනාකරණ ක්‍රියාමාර්ග සුපරීක්ෂණය, අධීක්ෂණය හා බලාත්මක කිරීමේ ධාරිතාවන් ඉහළ නැංවීමයි. ශ්‍රී ලංකාව විසින් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම හා නීති විරෝධී, වාර්තා නොවූ හා නියාමනය නොවූ (IUU) ධීවර කටයුතු වැළැක්වීම හා තුරන් කිරීම සඳහා වන ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම වැනි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සකස් කිරීම මගින් ශ්‍රී ලංකාව විසින් මේ සඳහා ධනාත්මක පියවර ගන්නා ලදී. කෙසේ වුවද, ඉහත දැක්වූ සිදුවීම්වලට අදාළ ඉහළ යන අභියෝග මගින් මෙම ප්‍රයත්නයන් තවදුරටත් උත්ශ්‍රේණිගත කිරීමේ අවශ්‍යතාව පෙන්නුම් කෙරේ.

16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS

වර්තමාන තත්වය හා ප්‍රවනතා

තිරසර සංවර්ධන ඉලක්ක 16.1 සඳහා සෑම ස්ථානයකම සියළු ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් හා ඊට සම්බන්ධ මරණ අනුපාතයන්ගේ සැලකිය යුතු අඩු වීමක් අවශ්‍යවේ. 2008ට සාපේක්ෂව 2016 දී ශ්‍රී ලංකාව තුළ මනුෂ්‍ය ඝාතන අනුපාතය 1000000ට සිද්ධීන් 2.5ක් දක්වා අඩු වී ඇති අතර වාර්තා වූ බරපතල අපරාධ සංඛ්‍යාව ආසන්න වශයෙන් 40%ක අඩු වීමක් එනම් 2017 දී 35,987 දක්වා පහළ බැස ඇත.152 ඉලක්ක 16.2 සඳහා ළමුන්ට එරෙහි අපයෝජනය, සූරාකෑම, හොර ජාවාරම් හා සියළු ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් අවසන් කිරීම අවශ්‍ය වේ. 2016 දී පුද්ගලයන් 100000කින් මිනිස් ජාවාරමෙහි වින්දිතයන් වූ ප්‍රමාණය 0.12ක් විය. පැහැර ගැනීම් 2010 දී 1239 සිට 2017 දී 897 දක්වා අඩු වී ඇත. ළමුන්ට එරෙහි කෘෘරත්වය හා ළමුන් ලිංගික අපයෝජනයට ලක් කිරීම 2010 දී 340 සිට 2017 දී 131 දක්වා අඩු වී ඇත.153 විශේෂයෙන් කාන්තාවන් හා ළමුන්ට අදාළ මිනිස් ජාවාරම වැළැක්වීම, මර්ධනය හා අදාළ පුද්ගලයන්හට දඬුවම් දීම සඳහා ශ්‍රී ලංකාව විසින් 2015 ජූනි 15 දින පලමෝ ප්‍රොටෝකෝලය (Palermo Protocol) පිළිගන්නා ලද අතර දැනුවත්භාවය ඉහළ නැංවීම, වින්දිතයන් සඳහා සහාය ලබා දීම හා අපරාධකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අදාළව අධිකරණ අමාත්‍යාංශය මගින් නායකත්වය ලබා දෙන ලද පාර්ශවකරුවන්ගේ කාර්ය සාධක බලකාය හරහා සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගන්නා ලදී. "බාලි ක්‍රියාවලිය" (Bali Process) වැනි යාන්ත්‍රණ හරහා ශ්‍රී ලංකාව ද්වීපාර්ශවික හා කලාපීය මට්ටමින් ක්‍රියාකාරීව දායකත්වය දක්වන ලදී.

16.3 ඉලක්කය සඳහා ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම හා සියල්ලන්ට යුක්තිය සඳහා සමාන අයිතිය තහවුරු කිරීම අවශ්‍ය වේ. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හා පොලිස් කොමිෂන් සභාව, අධිකරණ සේවා කොමිෂන් සභාව වැනි ස්වාධීන ආයතන හඳුන්වා දීම සහ අධිකරණ වෛද්‍ය විද්‍යාව, විමර්ශනය වැනි ධාරිතාවන් වර්ධනය හරහා අධිකරණ කාර්යය පිළිබඳ විශ්වසනීයත්වය යළි ලබා ගෙන ඇත.

ජාතික මානව හිමිකම් පිළිබඳ ගෝලීය එකමුතුව (GANRI) මගින් මෑත කාලීනව ජාතික මානව හිමිකම් කොමිෂන් සභාව " ඒ ශ්‍රේණිය" වෙත සිදු කරන ලද ප්‍රතීතනය මෙරට නීතියේ ආධිපත්‍යය ඉහළ නැංවීමට උපකාරී වූ වැඩි දියුණු කරන ලද ආයතනික ධාරිතාව පිළිබඳ පැහැදිලි සාක්ෂියකි. විශ්ලේෂකයන් සවිබල ගැන්වීම හේතුවෙන් ගොණු කරන ලද අධිචෝදනා සංඛ්‍යාව ඉහළ ගොස් ඇති අතර 2016 දී දඬුවම් නියම නොකර රඳවා සිටින සංඛ්‍යාව සමස්ථ බන්ධනාගාර ජනගහනයේ කොටසක් ලෙස ගත් කල 0.5ක් විය.154 රජය විසින බන්ධනාගාරවල තත්වය වැඩි දියුණු කිරීම සඳහා ද ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය හා සම්පව කටයුතු කරනු ලැබේ.

16.4 ඉලක්කය මගින් නීති විරෝධී මූල්‍ය හා අවි ප්‍රවාහ කැපී පෙනෙන අයුරින් අවම කිරීමට සහාය ලබා දෙනු ලැබේ. එමගින් මංකොල්ල කන ලද වත්කම් සොයාගෙන යළි ලබා දීම හා සියළු ආකාරයේ සංවිධානාත්මක අපරාධවලට එරෙහිව සටන් කිරීම සිදු කෙරේ. ජාත්‍යන්තර ප්‍රමිතීන් හා නීත්‍යානුකූල ලේඛනවලට අනුව 2016 දී තහනම් කළ සුළු අවි හා සැහැල්ලු අවි ප්‍රමාණය ජනගහනයෙන් 100,000ට 0.4 ක් විය.155 තවද නීති විරෝධී මත් ද්‍රව්‍ය නිෂ්පාදනය/ළඟ තබා ගැනීම පිළිබඳ අනාවරණ කර ගැනීමේ සිද්ධීන් 2008 දී 511 සිට 2017 දී 2845 දක්වා ඉහළ ගොස් ඇති අතර ඒ පිළිබඳ සාධනීය ලෙස කටයුතු කිරීමේ හැකියාව පැවතියේ නීති ක්‍රියාත්මක කිරීමේ අධිකාරයන් ශක්තිමත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙසයි.156

අල්ලස් හා දූෂණ වැළැක්වීම සඳහා ඇති 2006 අංක 5 දරණ මුදල් විශුද්ධිකරණ පනත හා 2006 අංක 6 දරණ මූල්‍ය ගණුදෙනු වාර්තා කිරීමේ පනත යන පනත් ඇතුළු පනත් කිහිපයක් තිබියදී වුව අල්ලස් හා දූෂණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව කටයුතු කරන ලබන්නේ දුර්වල අන්දමිනි (16.4 හා 16.5 ඉලක්ක). ට්‍රාන්ස් පේරන්සි ඉන්ටර්නැෂනල්හි දූෂණය පිළිබඳ දර්ශකය (CPI) 2016 අනුව රටවල් 176 ක් අතුරින් ශ්‍රී ලංකාව 95 වන ස්ථානය ලබා ගත් අතර රටවල් 168ක් අතුරින් 83වන ස්ථානය ලබා ගත් 2015 වසරට සාපේක්ෂව 2016 දී ලකුණු 36ක් ලබාගෙන ඇත.157 මානව හිමිකම් පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NHRAP) හා විශ්ව කාලීන සමලෝචනය (UPR) මගින් පිළිගන්නා ලද යහපාලනයෙහි ප්‍රධාන මූලධර්ම වන්නේ විනිවිදභාවය හා වගවීම යන මූලධර්ම මත ගොඩනගන ලද විශ්වසනීය ආයතන (16.6 ඉලක්කය) හා සියල්ල ඇතුළත් වූ/ නියෝජනාත්මක තීරණ ගැනීම (16.7 ඉලක්කය)යි.

2009 එල්.ටී.ටී.ඊ. සංවිධානය සමග පැවති ගැටුම අවසන් වූ දින පටන් සාමය ප්‍රතිස්ථාපනය කිරීම හා ජීවත් වීමේ අයිතිය තහවුරු කිරීම මෙරට සැලකිය යුතු ජයග්‍රහණයකි.

---

152 Sri Lanka Police website, Crime Trends data. Available at https://www.police.lk/index.php/crime-trends
153 එම
154 ශ්‍රී ලංකා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2017)
155 එම
156 ශ්‍රී ලංකා පොලිසියේ වෙබ් අඩවිය, අපරාධ ප්‍රවනතා පිළිබඳ දත්ත. https://www.police.lk/index.php/crime-trends ලබා ගත හැකිය
157 ශ්‍රී ලංකාවේ දූෂණ විරෝධී වාර්තාව, දූෂණ විරෝධී පෝටලය, GAN Integrity https://www.business-anti-corruption.com/country-profiles/sri-lanka/

සාමය, යුක්තිය හා ශක්තිමත් ආයතන පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකාව විසින් තිරසර සංවර්ධන ඉලක්ක මගින් විශිෂ්ඨ පූර්වාදර්ශයක් පෙන්නුම් කරනු ලැබේ. 2009 සිට ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිසංස්කරණ හා සාමය ගොඩනැගීමේ ප්‍රතිපත්තිය සංහිඳියාව, ප්‍රතිසංස්කරණය, පුනරුත්ථාපනය හා ආපසු ලබා ගැනීම වටා කේන්ද්‍ර වී ඇත. මෙම කරුණු හතර මත පදනම් වූ ප්‍රතිපත්තිය (4R policy) සාමකාමී හා සියල්ලන් ඇතුළත් වූ සමාජයක් ප්‍රවර්ධනය කරමින් හා වග වන ආයතන ස්ථාපිත කිරීම මෙන්ම නිදහස් හා යුක්තිසහගත සමාජයක් නිර්මාණය කරමින් දීර්ඝ කාලයක් තිස්සේ පැවති ගැටුමෙහි ප්‍රතිඵල සඳහා පිළියම් ලබා දීම සඳහා වේ. 2009 වසරේ සිට ශ්‍රී ලංකා රජය විසින් "සංවර්ධනය හරහා සාමය" යන ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවන ලදී. ගැටුම අවසන් වූ වහාම ශ්‍රී ලංකාවේ සාමය ගොඩනැගීමේ ප්‍රතිපත්තිය යටිතළ පහසුකම් සංවර්ධනය පිළිබඳ වූ අතර එමගින් සාමය ගොඩනැගීමේ නව ප්‍රවනතා නිර්මාණය කරන ලදී.158 බලපෑමට ලක් වූ ප්‍රදේශ යළි ගොඩනැගීම හා ප්‍රතිසංස්කරණය සඳහා රජය විසින් ප්‍රධාන ප්‍රතිපත්ති දෙකක් හඳුන්වා දෙන ලදී; උතුරු වසන්තය හා නැගෙනහිර නවෝදය.

රජය විසින් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ව්‍යාපෘති කිහිපයක් සඳහා ආයෝජනය කරන ලද අතර ඊට නිවාස හා ජනාවාස, මාර්ග සංවර්ධනය, ජල සම්පාදනය හා වාරිමාර්ග, අධ්‍යාපනය සහ පරිපාලනය ඇතුළු ප්‍රතිසංස්කරණ වැඩසටහන් ඇතුළත් වේ159; එසේ ම නැගෙනහිර ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වලට අභ්‍යන්තරිකව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කරවීම, බම් බෝම්බ ඉවත් කිරීම, පුනරුත්ථාපනය හා නව මාර්ග, පාලම්, වරාය, විදුලි බලාගාර, විදුලිය බෙදාහැරීමේ ජාල, රෝහල් සහ පාසල් ඉදි කිරීම වේ. 160 පශ්චාත් ගැටුම් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා රජය විසින් 2009 සිට විවිධ අමාත්‍යංශ හරහා ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති 65ක් ක්‍රියාත්මක කරන ලද අතර ඒ සඳහා ඇ.ඩො.මි. 2659ක ආයෝජනයක් සිදු කරන ලදී. මීට අමතරව, ඇතැම් ප්‍රදායක නියෝජිතායතන මගින් දේශීය රාජ්‍ය නොවන සංවිධාන/ හවුල්කාර සංවිධාන හරහා ඍජුව ව්‍යාපෘති විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරන ලදී. මීට අදාළ මුළු ආයෝජනය (රජයේ අයවැයට අයත් නොවූ) ඇ.ඩො.මි. 1430 පමණ විය.

රජය විසින් සංවර්ධනය හරහා සාමය ප්‍රවර්ධනය කරන ලද අතර සියළු ශ්‍රී ලාංකිකයන්හට සමානාත්මතාව භුක්ති විඳීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදයේ හා පුරවැසිභාවයේ ඵල නෙළා ගැනීමේ අරමුණින් තිරසර සාමය හා ආරක්ෂව ගොඩනැගීමට උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිෂන් සභාව පත් කරන ලදී.161 ගැටුම් මධ්‍යයේ 2002 දී ආරම්භ කරන ලද බිම් බෝම්බ ඉවත් කිරීමේ වැඩසටහන වසර ගණනාවක් පුරා අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර රජය විසින් බිම් බෝම්බ ඉවත් කිරීමෙන් ජාතික වැඩසටහන සඳහා වන මූල්‍යනයෙන් සැලකිය යුතු කොටසක් දරණ ලද අතර හවුල්කාර රටවල් හා සංවිධානවල සහාය ද මේ සඳහා ලැබිණි. මෙම හවුල්කරුවන් හා ශ්‍රී ලංකා ආරක්ෂක අංශවල ප්‍රයත්නයන්ගේ ප්‍රතිඵලයක් ලෙස බිම් බෝම්බ තහනම් කිරීම පිළිබඳ ඔට්ටාව සම්මුතිය (Ottawa Convention) පිළිගැනීමට ශ්‍රී ලංකාවට හැකි වූ අතර 2020 වන විට ශ්‍රී ලංකාව බිම් බෝම්බවලින් තොර රටක් බවට පත් කිරීම ඉලක්කය වේ. එතැන් පටන් බිම්බෝම්බ ඉවත් කිරීමේ මානුෂීය ප්‍රයත්නයන් හේතුවෙන් වේගවත් නැවත පදිංචි කරවීමක් සිදු කිරීමට හැකි වී ඇති අතර විශ්වාසය ගොඩනැගීමේ ක්‍රියාමාර්ගයක් ලෙස එහි කාර්ය භාරය මෙරට සංහිඳියා ප්‍රයත්නයන්ට අදාළව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

Gaps and Challenges

කල් පවතින සාමයක් පවත්වා ගැනීම සඳහා රජය උත්සාහ ගත්තද අභියෝග කිහිපයක් ඉතිරිව පවතියි. ඉතා විශාල වශයෙන් හමුදාව රැඳී සිටීම, දරිද්‍රතාව, නූගත්කම හා දූෂණය ආදී සාධක හේතුවෙන් උතුරු හා නැගෙනහිර පළාත්හි කලහකාරී තත්වයන් ඇති විය (16.1 ඉලක්කය). සන්නද්ධ ගැටුම් අතරතුර උතුරු පළාතේ ජනතාවට අයිති ඉඩම් ආරක්ෂක අංශ විසින් භාවිතා කරන ලදී. 2018 මාර්තු වන විට ගැටුම් අතරතුර ආරක්ෂක අංශ භාවිතා කළ පුද්ගික ඉඩම්වලින් 70%කට අධික ප්‍රමාණයක් ඒවායේ මුල් හා නීත්‍යානුකූල හිමිකරුවන් වෙත භාර දීම සඳහා නිදහස් කෙරිණි. 2018 ජනවාරිහි දී ජනාධිපති ලේකම්ගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත් කරන ලද අතර එය ඉඩම් නිදහස් කිරීමේ ක්‍රියාවලිය, වන්දි ගෙවීම හා ලිපිනයන් හා සම්බන්ධ ගැටළු පිළිබඳ අධීක්ෂණය කිරීම සඳහා අදාළ සියළු පාර්ශවකරුවන් සමග නිතර රැස් වී කටයුතු කිරීම අඛණ්ඩව සිදු කරනු ඇත.162

සාමය හා යුක්තිය තහවුරු කිරීම සඳහා නියාමන යාන්ත්‍රණ, නෛතික රාමු හා ප්‍රතිපත්ති පවතියි. කෙසේ වුවද, පාර්ශවික වශයෙන් ශක්තිමත් ආයතන හිඟය හේතුවෙන් ක්‍රියාත්මක කිරීමේ හා අධීක්ෂණය කිරීමේ පරතරයන් පවතියි (16.6 ඉලක්කය).

____

158 Kristine Höglund and Camilla Orjuela (2012) Hybrid Peace Governance and Illiberal Peacebuilding in Sri Lanka. Global Governance: A Review of Multilateralism and International Organizations: January-March 2012, Vol. 18, No. 1, pp. 89-104.

159 ආර්ථික සංවර්ධන අමාත්‍යංශය (2010). කාර්ය සාධන වාර්තාව-2010. ආර්ථික සංවර්ධන අමාත්‍යංශය

160 Sri Lanka Guardian. (2008). Information Gateway to "Nagenahira Navodaya". Available at http://www.srilankaguardian.org/2008/05/information-gateway-to-nagenahira.html

161 උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිෂන් සභාවේ වාර්තාව (2011). http://slembassyusa.org/ downloads/LLRC-REPORT.pdf ලබා ගත හැකිය

162 2018 මාර්තුහිදී පැවති මානව හිමිකම් කවුන්සිලයේ 37වන සැසිවාරයේ දී ගරු මුදල් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රකාශය, http://www.lankamission.org/image

උදාහරණ ලෙස, රජය විසින් දණ්ඩ නීති සංග්‍රහය, අල්ලස් පනත හා අසාධාරණ අය කිරීම් හා අල්ලස් ලෙස සිදු කෙරෙන දූෂණ සහ දූෂණ ප්‍රයත්නයන් අපරාධ ලෙස දක්වන දූෂණය වැළැක්වීමේ පනත ඇතුළු දූෂණ වැළැක්වීමේ නීති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කර ඇත.

දුර්වල පාලනය හා ආයතනික යාන්ත්‍රණ මගින් අඛණ්ඩව ශ්‍රී ලංකාවේ දිගුකාලීන වර්ධන හැකියාව අවතක්සේරු කරමින් පවතියි. අනෙක් කරුණු අතර නීතියේ ආධිපත්‍යයෙහි දුර්වලතාවන්, දූෂණය හා ප්‍රජාතන්ත්‍රවාදී නිදහස නොමැති වීම යන කරුණු මගින් යහපාලන ප්‍රතිපත්ති පිළිබඳ ගෝලීය දර්ශක අතර මෙරට රැඳී සිටීම කෙරෙහි අඛණ්ඩව සෘණාත්මකව බලපෑම් එල්ල කරනු ලැබේ. ප්‍රතිපත්ති පිළිබඳ කලින් කිව නොහැකි බව, දුර්වල රාජ්‍ය සේවා සැපයීම හා ආයෝජන කෙරෙහි බාධා එල්ල කරන දහ මහජන විශ්වාසය අවතක්සේරුවට පත් කරන පරිපාලනයට අදාළ අනවශ්‍ය රෙගුලාසි මගින් එවැනි දුර්වලතා පෙන්නුම් කෙරේ.[164]

සියල්ල ඇතුළත් වූ වර්ධනයක් මගින් දරිද්‍රතා චක්‍රය බිඳ හෙළීම, ආන්තිකකරණය සහ ගැටුම් ඇති වීම අවම කිරීම සිදු කෙරේ. එබැවින් සාමය හා සමගිය පවත්වා ගැනීමට ආන්තිකකරණයට ලක් වූ ප්‍රදේශවල ග්‍රාමීය ආදායම සහ රැකියා අවස්ථා ඉහළ නැංවීම සඳහා ආයෝජන වැඩි කිරීම අවශ්‍ය වේ. දිගුකාලීන සාමය හා යුක්තිය තහවුරු කිරීම සඳහා සංවර්ධන මාන තුළට ප්‍රජාතන්ත්‍රීකරණය ඇතුළත් කිරීම කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතුය. සිය ප්‍රජාව සංවර්ධනයේ දී පාර්ශවකරුවන් වීමට ප්‍රජාවන්ට අවස්ථාව සලසා දීම හා දේශීය ව්‍යාපෘති මුඛ්‍යධාරාවේ සංවර්ධන න්‍යාය පත්‍ර සමග ඒකාබද්ධ කිරීම 16.7 ඉලක්කය සපුරා ගැනීමේ දී ඉතා වැදගත් වේ. කෙසේ වුවද, සංවර්ධනය හා පාලනය කෙරෙහි ජනතාවගේ සහභාගීත්වය යනු තවදුරටත් වැඩි දියුණු කළ යුතු ක්ෂේත්‍රයකි.

සැඟවුණු දත්ත හා වාර්තා නොවුණු සිද්ධීන් අගයක් ගන්නා බැවින් දත්ත හා තොරතුරු පරතරය 16 වන ඉලක්කයට අදාළ තීරණාත්මක ගැටළුවක් වේ. අදාළ අමාත්‍යාංශ සිය ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්ති දත්ත හා තොරතුරු මත පදනම්ව සකස් කළ යුතු බැවින් 16 වන තිරසර සංවර්ධන ඉලක්කය සපුරා ගැනීමේ දී දත්ත රැස් කිරීම හා වාර්තාකරණය ඉතා වැදගත් වේ.[165]

Way Forward

2025 රාජ්‍ය දැක්මෙහි දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා රජය විසින් ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයකට අවශ්‍ය නීතියේ ආධිපත්‍යය හා යහ පාලනය තහවුරු කිරීම, සියල්ලන්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ රටෙහි සියල්ල ඇතුළත් වූ හා සාධාරණ වර්ධනය හා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සිදු කරනු ඇත. මේ වන විට මෙරට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කරමින් පවතියි. මෙය සෑම වාර්ගික හා ආගමික ප්‍රජාවකම හිමිකම් පිළිගන්නා අවකාශයක් විය හැකිය. නීතිය ක්‍රියාත්මක කරන ආයතන ශක්තිමත් කිරීම හා නිසි අධීක්ෂණ යාන්ත්‍රණ මෙරට සාමය හා යුක්තිය තහවුරු කිරීම සඳහා ඉතා වැදගත් වේ. ශක්තිමත් ආයතන සහිතව ව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හරහා මිනිසුන්, ලෝකය, සෞභාග්‍යය හා හවුල්කාරීත්වය එක් කළ හැකිය. ඕනෑම ආරවුලක් සාමයෙන් සහ මානව අභිමානයට ගරු කරමින් හා ඉවසීම හා වෙනස් කොට නොසැලකීම හරහා විසඳා ගැනීමට හැකි වන පරිදි අගයන්, ආකල්ප, හැසිරීම් රටාවන්, ජීවන රටාවන් පිළිබඳ අධ්‍යාපනය ලබා දීම.

2015 දී නව රජයක් තෝරා පත් කර ගැනීමත් සමග සංවර්ධන මානය තුළට ප්‍රජාතන්ත්‍රීයකරණය ඇතුළත් කිරීම සඳහා සංවර්ධනය හරහා සාමය යන සංකල්පය තවදුරටත් වැඩි දියුණු කෙරිණි. ප්‍රචණ්ඩත්වයෙන් හා බියෙන් තොර සමාජයක් සඳහා යුක්තිය හා වගවීම ආයතනගත කිරීම කෙරෙහි ප්‍රජාතන්ත්‍රීයකරණ ක්‍රියාවලිය අවධානය යොමු කරයි (16.1 හා 16.2 ඉලක්ක). මෙම අරමුණ ළඟා කර ගැනීම සඳහා වර්තමාන රජය විසින් ප්‍රතිපත්ති කිහිබයක් ක්‍රියාවට නංවන ලදී. ජාතික ගීය සිංහල හා දමිළ භාෂා දෙකෙන් ම ගායනා කිරීම ආරම්භ කෙරිණි. ශ්‍රී ලංකාව තුළ එක් වාර්ගික කණ්ඩායමක් අනෙක් වාර්ගික කණ්ඩායමට වඩා වැදගත් යැයි පිළිබිඹු කෙරෙන පරිදි වීර ඒකාකෘතීන් යොදා ගත් පෙළ පොත්හි දිරි ගන්වන සුළු වෙනස්කම් සිදු කිරීමට ද හැකි විය. සමාජ ඒකාබද්ධතාව සඳහා වන ජාතික ප්‍රතිපත්තිය

163 ශ්‍රී ලංකාවේ දූෂණ විරෝධී වාර්තාව, දූෂණ විරෝධී පෝටලය, GAN Integrity https://www.business-anti-corruption.com/country-profiles/sri-lanka/

164 දැක්ම 2025

165 වලංගුකරණ වැඩමුළුවේ ද පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කරන ලද අදහස්

සකස් කරනු ලැබුවේ සංස්කෘතික බහුවිධතාව ප්‍රවර්ධනය කිරීම හා පුරවැසියන්ගේ සමාජීය හිමිකම් තහවුරු කිරීම සඳහා වගකිව යුත්තන් සහ වගකිව යුතු ආයතන නියම හිමිකරුවන් හඳුනාගැනීම සඳහා මානව හිමිකම් ප්‍රවේශයක් මුඛ්‍යධාරාගත කිරීම සඳහාය. සංහිඳියාවේ අවශ්‍යතාව අවධාරණය කිරීම පිණිස ජාතික සමගිය හා සංහිඳියා කාර්යාලය මගින් ශ්‍රී ලංකාවේ සංහිඳියාව හා සහජීවනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවන ලදී.

මෙරට තුළ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම පිණිස ශ්‍රී ලංකා රජය විසින් වැදගත් පනත් දෙකක් සම්මත කරන ලදී; එනම් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත සහ 2017 අංක 9 දරණ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පනතයි. තොරතුරු දැනගැනීමේ පනත මගින් සියළු පුරවැසියන් සඳහා තොරතුරු දැන ගැනීමේ අයිතිය තහවුරු කිරීම මගින් රාජ්‍ය අධිකාරයන්ගේ විනිවිදභාවය හා වගවීමේ සංස්කෘතිය කෙරෙහි අනුබල දෙනු ලැබේ (16.10 ඉලක්කය). මෙමගින් ශ්‍රී ලාංකිකයන්හට වඩා හොඳින් සමාජ ජීවිතය ගත කිරීමටත් දූෂණයට එරෙහිව සටන් කිරීමටත් වගවීම හා යහපාලනය ප්‍රවර්ධනය කිරීමටත් හැකියාව ලැබේ. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පනත මගින් සංක්‍රාන්ති යුක්තිය ළඟා කර ගැනීම සඳහා වන යාන්ත්‍රණයක් නිර්මාණය සහ මෙරට දශක තුනක් පුරා පැවති සන්නද්ධ ගැටුමෙහි වින්දිතයන් සඳහා හානි පූර්ණය සිදු කරනු ලැබේ. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ක්‍රියාකාරීත්වය සඳහා 2018 දී රජය විසින් රු.බි. 1.3ක් වෙන් කරන ලදී.

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යංශය විසින් ප්‍රාදේශීය මට්ටමින් කාන්තා හා ළමා කටයුතු පිළිබඳ ඒකක ස්ථාපිත කරන ලද අතර එහි කාර්ය මණ්ඩලය ආරක්ෂාව සැලසීම, රැක බලා ගැනීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට අදාළ ගැටළු විසඳීම සඳහා මග පෙන්වීම සහ චිත්තවේගී සහාය හා උපදේශනය ලබා දීම සඳහා කටයුතු කරයි (16.1 හා 16.2 ඉලක්ක). ඔවුහු රෝහල් හා ප්‍රජා සංවිධාන වැනි වෙනත් රාජ්‍ය නියෝජිතායතන සමග ද සහයෝගයෙන් කටයුතු කරන අතර රාජ්‍ය යාන්ත්‍රණය හා ප්‍රජාව අතර තීරණාත්මක සබැඳුමක් ලෙස ක්‍රියා කරති. මිනිස් ජාවාරම වැළැක්වීමේ ජාතික කාර්ය සාධක බලකාය විසින් මිනිස් ජාවාරම අධීක්ෂණය හා ඊට එරෙහිව සටන් කිරීම, ඉලක්කගත මැදිහත් වීම් පිළිබඳ සහයෝගයෙන් යුතුව කටයුතු කිරීම පිණිස පාර්ශවකරුවන් ඒකරාශී කිරීම සඳහා 2015 - 2018 දක්වා වූ කාලය සඳහා උපාය මාර්ගික සැලැස්මක් සකස් කරන ලදී.166 ශ්‍රී ලංකාව තුළ එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස්වරයාගේ (UNHCR) කාර්යයන් අතර අනෙකුත් එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනවල සහයෝගය ඇතිව රජයේ සාමය පිළිබඳ න්‍යාය පත්‍රයට හා 2016 සාමය ගොඩනැගීමේ ප්‍රමුඛතා සැලැස්ම සඳහා සහාය දැක්වීම; ගැටුම් හේතුවෙන් අවතැන් වූවන් සඳහා කල් පවතින විසඳුම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2016 අමාත්‍ය මණ්ඩලය විසින් සම්මත කර බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කරවීම හා හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යංශය විසින් පරිපාලනය කරන ලද) පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා සහාය දැක්වීම; සහ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පිළිබඳ කොමිෂන් සභාවේ හා නීති ආධාර කොමිෂන් සභාවේ කටයුතු සඳහා සහාය ලබා දීම මගින් නැවත පැමිණෙන්නන්හට යුක්තිය හා නීතියේ ආධිපත්‍යය වෙත වන ප්‍රවේශය ශක්තිමත් කිරීමවේ.

ශ්‍රී ලංකාව තුළ බහු පාර්ශවීය ප්‍රවේශයක් හරහා සාමය ගොඩනැගීම පිණිස වන සාමූහික ප්‍රයත්නයක් සඳහා තවත් කදිම උදාහණයක් වන්නේ සාමය ගොඩනැගීමේ ප්‍රමුඛතා සැලැස්ම (ෂෂෂ) වන අතර එමගින් සාමය ගොඩනැගීමේ දී සිවිල් සමාජයෙහි හා ස්වේච්ඡා සේවය යොදා ගැනීමෙහි කාර්ය භාරය ශක්තිමත් කිරීමේ වැදගත්කම හඳනා ගැනේ. 2016 දී අග්‍රාමාත්‍ය කාර්යාලය, සංහිඳියා යාන්ත්‍රණයන් සම්බන්ධීකරණය කිරීම සඳහා වූ ලේකම් කාර්යාලය, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යංශය සහ ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා පිළිබඳ අමාත්‍යංශය එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල, එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා සේවකයන් සහ එක්සත් ජාතීන්ගේ කාන්තා අංශය සමග හවුල්කාරීත්වයෙන් සහ එක්සත් ජාතීන්ගේ සාමය ගොඩනැගීමේ අරමුදලේ සහාය ඇතිව කාන්තාවන් හා තරුණයන්හට පාලනය හා තීරණ ගැනීමේ ක්‍රියාවලිය සහ ශ්‍රී ලංකාවේ සියළු මට්ටම්වල සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීමට අදාළ ප්‍රතිචාර සඳහා සහභාගී වීම පිණිස සවිබල ගැන්වීම සඳහා කටයුතුකරන ලදී.

මීට අමතරව, රාජ්‍ය පාලනය හා සංවර්ධනය සඳහා ජනතාවගේ සහභාගීත්වයෙහි පරතරයන් සඳහා පිළියම් ලබා දීම පිණිස රජය විසින් ග්‍රාම රාජ්‍ය සංකල්පය යෝජනා කරන ලදී. ග්‍රාම රාජ්‍ය මගින් දේශීය ප්‍රජාවන්හට සිය ප්‍රජාවේ සංවර්ධනයෙහි හවුල්කරුවන් වීමට සහ දේශීය ව්‍යාපෘති මුඛ්‍යධාරාවේ සංවර්ධන න්‍යාය පත්‍රයන් තුළට ඒකාබද්ධ කිරීමට අවස්ථාව සලසා දෙනු ලැබේ. ග්‍රාම රාජ්‍ය සංකල්පයේ ප්‍රධන අරමුණු අදාළ ප්‍රදේශයවල සමාජ ආර්ථික හා සංස්කෘතික සංවර්ධනය, සමාජ යහ පැවැත්ම, සමාජ ආර්ථික දේපළවල හවුල් හිමිකාරීත්වය සහ දේශීය සංවර්ධනය ජාතික සංවර්ධන ඉලක්ක සමග ගැලපීම වටා කේන්ද්‍රගතවේ. ග්‍රාම රාජ්‍ය මගින් පළාත් පාලනය සඳහා ජනතාවගේ සහභාගීත්වය රටේ පුළුල් සාර්වආර්ථික රාමුව තුළදී ද අදාළ කරගත හැකි අවකාශයක් නිර්මාණය කරනු ඇත. 167

166 දැක්ම 2025
167 එම

05

ක්‍රියාත්මක කිරීමේ ආකාර

තිරසර සංවර්ධනය පිළිබඳ 2030 න්‍යාය පත්‍රයට ඉලක්ක සඳහා වන හවුල්කාරීත්වයන් පිළිබඳ වන තිරසර සංවර්ධන ඉලක්ක 17 හරහා එය ක්‍රියාත්මක කරන ආකාර ඇතුළත් කර ඇත. මූල්‍යනය ප්‍රවර්ධනය කිරීම, තාක්ෂණ සංවර්ධනය, ධාරිතා සංවර්ධනය, වෙළඳ හා ආයෝජන, බහු පාර්ශවීය හවුල්කාරීත්වයන් හා අධීක්ෂණය හා වගවීම හරහා තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා සහාය වීමට මෙන්ම ප්‍රතිපත්ති හා ආයතනික සංසක්තිය වැනි ක්‍රමානුකූල ගැටළු සඳහා විසඳුම් ලබා දීමට ශ්‍රී ලංකාව විසින් ක්‍රියාත්මක කිරීමේ ආකාර සකස් කරන ලදී. මෙම කොටස මගින් ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කරන ආකාරයන්ගේ කාර්යසාධනය විශ්ලේෂණය කෙරේ.

අ) මූල්‍යනය

අවශ්‍ය වන නව හෝ අමතර සම්පත් ප්‍රමාණය සැලකීමේ දී තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන ගැටළුවක් වන්නේ මූල්‍යනයයි. උදාහරණ ලෙස, පවතින අමාත්‍යංශ හා දෙපාර්තමේන්තුවල භෞතික හා මානව සම්පත් වැඩි දියුණු කිරීම පෙන්වා දිය හැකිය. තිරසර සංවර්ධන ඉලක්කවලට අදාළ ක්‍රියාකාරකම් ඇතුළුව පළාත් හා පලාත් පාලන ආයතනවල සියළු ම ක්‍රියාකාරකම් සඳහා අරමුදල් වෙන් කිරීම පිළිබඳ වගකීම ශ්‍රී ලංකාවේ මුදල් කොමිෂන් සභාව සතු වේ. ශ්‍රී ලංකාව 2010 දී පහළ-මධ්‍ය ආදායම්ලාභී රටක තත්වයට උසස් වීමත් සමග සහනදායී මූල්‍යනය සඳහා ප්‍රවේශය සාපේක්ෂන අඩු වී ඇත. උදාහරණ ලෙස, දළ දේශීය නිෂ්පාදිතයේ කොටසක් ලෙස ලැබෙන නිළ සංවර්ධන සහාය 2010 දී 1.0% සිට 2016 දී 0.4% දක්වා ක්‍රමික අඩු වීමක් පෙනුණි (5.1 රූපය). එබැවින් ශ්‍රී ලංකාව විසින් දේශීය හා ජාත්‍යන්තර මට්ටමින් වෙනත් මූල්‍යන හා ධාරිතා සංවර්ධන මූලාශ්‍රයන් පිළිබඳ සොයා බැලිය යුතුවේ.

5.1 රූපයඃ නිළ සංවර්ධන සහාය (දළ දේශීය නිෂ්පාදිතයෙන් %)



මූලාශ්‍රය: ලෝක සංවර්ධන දර්ශක 2017, ලෝක බැංකුව

අප රට පිළිබඳ සැලකීමේ දී බදු හා වෙනත් ආදායම් රැස් කිරීම පිණිස දේශීය ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සම්පත් සචලීකරණ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම අවශ්‍යවේ (17.1 ඉලක්කය). දැනට මුළු ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් 14%ක් වන අතර එය රජයේ පුනරාවර්ථන වියදම ආවරණය කිරීමට පවා ප්‍රමාණවත් නොවේ. එහි ප්‍රතිඵලයක් ලෙස දළ දේශීය නිෂ්පාදිතයෙන් 5% ක් වැනි විශාල අයවැය හිඟයක් ඇති වී තිබේ.168 බදු ආදායම පහළ මට්ටමක පැවතීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ බදු පදනම පහළ මට්ටමක පැවතීම වන අතර එය ආදායමේ හා ආර්ථික ක්‍රියාකාරකම්වල වැඩි වීමට අනුව පුළුල් වී නොමැත. තවද බදු ආදායම අඩු වීම හේතුවෙන් අනුප්‍රාප්තික රජයන්ට කලින් කලට එම අවස්ථාවට පමණක් සීමා වන පරිදි බදු පැනවීමට සිදු වී ඇති අතර එමගින් බදු ක්‍රමය සංකීර්ණ හා අවබෝධ කර ගැනීමට අපහසු තත්වයට පත් වී ඇත. බදු පදනම පුළුල කරන අතර ම බදු ව්‍යුහය සරළ කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් තිබෙන අතර ඊට බදු ක්‍රමයේ සරළ බව, පැහැදිලි බව හා අනුකූලභාවය තහවුරු වන පරිදි පවතින බදු නීති යළි කෙටුම්පත් කිරීම ඇතුළත් වේ.169 මෑතදී ක්‍රියාත්මක කරන ලද නව දේශීය ආදායම් පනත මගින් මෙම වසර අගභාගය තුළ රැස් කෙරෙන රජයේ බදු ආදායම රු.බි. 30න් ඉහළ නැංවීම හා 2018 දී දළ දේශීය නිෂ්පාදිතය සඳහා බදු ඉලක්කය වන 15% ළඟා කර ගැනීමේ රජයේ බලාපොරොත්තුව ඉටු වෙතැයි පුරෝකථනය කෙරේ.

5.2 රූපයඃ ආදායම (දළ දේශීය නිෂ්පාදිතයෙන් %)



මූලාශ්‍රය: ලෝක සංවර්ධන දර්ශක 2017, ලෝක බැංකුව

දුර්වල ආදායම් කාර්යසාධනය හේතුවෙන් අයවැය හිඟයට අදාළ මූල්‍යනය සඳහා ණය මත වැඩියෙන් යැපීමට රජයට සිදු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස මෑත වසරවල වාර්ෂික ණය අනුපාතය වසරකට 6%ක ඉහළ යාමක් පෙන්නුම් කර ඇති අතර දැනට දළ දේශීය නිෂ්පාදිතයෙන් 79.3%ක විශාල අගයක් ගනියි (17.4 ඉලක්කය).170

---

168 ශ්‍රී ලංකා මහ බැංකුවෙහි වාර්ෂික වාර්තාව 2016
169 එම
170 එම

අවධානයට ලක් වී ඇත්තේ 2006 දී 7% ක්ව පැවති සහදායී නොවන බාහිර ණය ප්‍රතිශතය 2016 වන විට 53% දක්වා ඉහළ යාම පිළිබඳව වන අතර ඊට ප්‍රධාන හේතුව 2010 දී ශ්‍රී ලංකාව මධ්‍ය ආදායම්ලාභී රටක තත්වය ලබා ගැනීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස විදේශීය ප්‍රදානයන් හා සහනදායී මූල්‍යනය කෙරෙහි වූ සීමාවන්ය.[171]

ආ) තාක්ෂණය

ශ්‍රී ලංකාව විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රවලට අදාළව පසුබෑමකට ලක් වී ඇත. මෙම තත්වය උද්ගත වී ඇත්තේ පාසල්වල විද්‍යා අධ්‍යාපනය සඳහා වන අඩු ප්‍රවේශය හා එහි ප්‍රතිඵලයක් ලෙස විද්‍යා හා තාක්ෂණ විෂයන් අධ්‍යයනය සඳහා විශ්ව විද්‍යාලවලට ඇතුළත් වන ප්‍රමාණය අඩු වීම හේතුවෙනි. වයස අවුරුදු 15 හා ඊට වැඩි ජනගහනයෙන් විද්‍යා හා තාක්ෂණ විෂයන් ට අදාළව තෘතීය අධ්‍යාපනය ලබා ඇති හා එම ක්ෂේත්‍රයේ රැකියාවල නිරත ප්‍රමාණය 3.1%ක් පමණක් වන අතර එවැනි රැකියා අතුරින් 50%ට වැඩි ප්‍රමාණයක නිරත වී සිටින්නේ සුදුසුකම් නොලද පුද්ගලයන්ය.[172] තවද ශ්‍රී ලංකාවේ පරිගණක සාක්ෂරතා අනුපාතය 2016 දී 27.5% වූ අතර එය සතුටුදායක ප්‍රතිශතයක් නොවන අතර අන්තර්ජාල සම්බන්ධතා ඇත්තේ නිවාස අතුරින් 15.1%ට පමණි. 2013 දී පර්යේෂණ හා සංවර්ධන සඳහා ශ්‍රී ලංකාව දරණ වියදම දළ දේශීය නිෂ්පාදිතයේ කොටසක් ලෙස 0.1%ක් වැනි පහළ අගයක පැවතිණි. එසේම පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රයේ පර්යේෂකයන් සංඛ්‍යාව පුද්ගලයන් මිලියනයකට 111ක් වැනි අඩු අගයක පවතියි. තාක්ෂණික සූදානම්බවට අදාළව ලෝක ආර්ථික සංසදය මගින් නිකුත් කරන ලද නවතම ගෝලීය තරඟකාරීත්වය පිළිබඳ වාර්තාවට අනුව මෙම සාධක හේතුවෙන් ශ්‍රී ලංකාව රටවල් 137ක් අතුරින් 106වන ස්ථානයේ ශ්‍රේණිගත කර ඇත. විද්‍යා පර්යේෂණ ආයතනවල සහ උසස් තාක්ෂණ නිෂ්පාදනවල රාජ්‍ය ප්‍රසම්පාදනයේ තත්වයට අදාළව පසුබෑමකට ලක් වී සිටියද නවෝත්පාදනයට අදාළව ශ්‍රී ලංකාව 54 වාරයකින් උසස් තත්වයකට ළඟා වී ඇත.

නිෂ්පාදන අංශය සඳහා අවශ්‍ය තාක්ෂණය සංවර්ධනය කිරීමට ප්‍රතිපත්ති හා උපායමාර්ග හිඟයක් පවතින බව 2025 රජයේ දැක්ම පිළිබඳ ප්‍රතිපත්ති ලේඛනය මගින් පිළිගනු ලැබේ. ඖෂධ, ඉලෙක්ට්‍රොනික්, වෛද්‍ය උපකරණ, මෝටර් රථ වාහන උපාංග කර්මාන්ත සඳහා ප්‍රමාණවත් සහායක් ලැබී නොමැති අතර මෙම අංශවල පර්යේෂණ හා සංවර්ධන පිළිබඳ අවධානය හා දැනුවත්භාවය පහළ මට්ටමක පවතියි. එබැවින් මෙම අංශයන්ට ප්‍රවිශ්ට වීමට හා ආයෝජනය කිරීමට පුද්ගලික අංශය දිරිමත් වීම අඩුය.

වඩා ධනාත්මක කරුණක් වන්නේ ශ්‍රී ලංකාව ඩිජිටල් වාණිජ යුගය වෙත යන ගමන සඳහා පහසුකම් සැලසීම පිණිස පවතින නීති "ජාත්‍යන්තර කටයුතුවලදී ඉලෙක්ට්‍රොනික් සන්නිවේදනයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියට" (ජාත්‍යන්තරව "ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය" හෝ UNECC ලෙස ද හැඳින්වේ) පූර්ණ වශයෙන් අනුකූල බව තහවුරු කරමින් 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික් ගණුදෙනු පනත නවීකරණය කරන ලදී. ශ්‍රී ලංකාව 2015 ජූලි 17 දින උක්ත ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය පිළිගත් දකුණු ආසියාවේ පළමු රට හා ආසියානු කලාපයේ දෙවන රට (සිංගප්පූරුවට පසු) විය.[173] තමන් ඉලෙක්ට්‍රොනික් වාණිජ, ජංගම වාණිජ, ඊ පාලනය සඳහා පහසුකම් සැලසීම පිණිස කලාපය තුළ වඩාත් යාවත්කාලීන වූ නීති පවතින රට බව ශ්‍රී ලංකාව ප්‍රකාශ කරන අතර ඩිජිටල් තාක්ෂණය සඳහා ඉලෙක්ට්‍රොනික් අත්සන් හා වෙනත් සහතික කිරීමේ තාක්ෂණයන් පරිශීලකයන්හට ලබා දෙනු ලැබේ.

තවද වඩා නව්‍ය, දැනුම පාදක වූ ආර්ථිකයක් වෙත මාරු වීමේ අවශ්‍යතාව හඳුනා ගනිමින් රජය විසින් ශ්‍රී ලංකාවේ තාක්ෂණය හා ඩිජිටල්කරණය යන අංශ සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් යෝජනා කරන ලදී.[174] වැදගත් මූලාරම්භයන් අතරට ශ්‍රී ලංකාව වෙත යෝග්‍ය විදෙස් තාක්ෂණයන් ලබා ගැනීම දිරිමත් කිරීම, ඩිජිටල් තාක්ෂණය තුළ රාජ්‍ය-පුද්ගලික ආයෝජන ප්‍රවර්ධනය සඳහා දිරිගැන්වීම්, පාසල් විෂය නිර්දේශ තුළට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඒකාබද්ධ කිරීම, රජයේ කාර්යයන් ඩිජිටල්කරණය ඉහළ නැංවීම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මත පදනම් වූ අතුරු මුහුණත් ශක්තිමත් කිරීම, ලියාපදිංචි කිරීමට අදාළ උපයෝජනය, නියාමනය හා බේරුම්කරණය වඩා ඵලදායී ලෙස කළමනාකරණය සඳහා වන ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ පිළිබඳ කාර්යාලය ශක්තිමත් කිරීම සහ ඉලෙක්ට්‍රොනික් ගණුදෙනු සඳහා නෛතික රාමුව සකස් කිරීම - ඉලෙක්ට්‍රොනික් ගණුදෙනු (සංශෝධනය) පනත - එමගින් ශ්‍රී ලංකාවේ ඊ වාණිජ නෛතික රාමුව සිංගප්පූරුව, ඕස්ට්‍රේලියාව, චීනය හා වෙනත් සංවර්ධිත රටවල්වලට සමාන තත්වයකට පත් කරනු ලැබේ.

ශ්‍රී ලංකාව විසින් පවතින වෙළඳ ගිවිසුම් උපයෝජනය හා ඒවා තාක්ෂණය මත පදනම් වූ සහ දැනුම බලවත් වූ ඍජු විදේශ ආයෝජන සඳහා වන ක්‍රම ලෙස ගොඩනැගීම. තවද පරිසරයට හිතකර තාක්ෂණයන් සංවර්ධනය (17.7 ඉලක්කය) යනු අවධානය යොමු විය යුතු ක්ෂේත්‍රයකි.

---

171 Weerakoon, D. 2017. “Sri Lanka’s Debt Overhang: Getting Better, or Worse?” Colombo: Institute of Policy Studies
172 Arunatilake, N. 2016. Labour Market Analysis using Census Data. Colombo: UNFPA
173 ශ්‍රී ලංකා විදුලි සංදේශ, ඩිජිටල් යටිතළ පහසුකම් හා විදේශ රැකිවයා අමාත්‍යංශය,2018
174 දැක්ම 2025

ඈ) ධාරිතා සංවර්ධනය

තිරසර සංවර්ධන ඉලක්ක සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම පිණිස සියළුම පාර්ශවකරුවන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා උත්සාහයන් කිහිපයක් ගන්නා ලදී. සැලසුම් කරන ලද හා/ හෝ දැනටමත් ආරම්භ කරන ලද ක්‍රියාකාරකම්වලට තිරසර සංවර්ධන ඉලක්ක සඳහා මාර්ගෝපදේශ රාමුවක් සකස් කිරීම; ප්‍රාථමික් හා ද්විතියික අධ්‍යාපනය, විශ්ව විද්‍යාල, වෘත්තීය අධ්‍යාපනය, සිවිල් සමාජ සංවිධාන හා පුද්ගලික අංශයේ පුහුණුකරුවන් පුහුණු කිරීම; පාර්ලිමේන්තු සභිකයින් පුහුණු කිරීම; ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීම; පළාත් හා පළාත් පාලන දේශපාලඥයින් පුහුණු කිරීම සහ ජාතික තිරසර සංවර්ධන ඉලක්ක සන්නිවේදනයන් හා දැනුවත් කිරීමේ ව්‍යාපාර ඇතුළත්වේ. තිරසර සංවර්ධනය, වනජීවී හා කලාපීය සංවර්ධන අමාත්‍යංශය විසින් දැනටමත් ජාතික හා පළාත් තිරසර සංවර්ධනයට සම්බන්ධ වීමේ වේදිකාවන් නම් වූ වැඩසටහන දියත් කරන ලද අතර එමගින් මධ්‍යම රජය හා පළාත් පාලන ආයතන, සිවිල් සමාජය, විද්වතුන්, පුද්ගලික අංශය, සංවර්ධන නියෝජිතායතන ආදියෙහි නියෝජනයන් ඒකරාශී කරනු ලැබේ.[175] එක් ජාතික වේදිකාවක් හා පළාත් වේදිකා කිහිපයක් දැනටමත් සම්පූර්ණ කර ඇති අතර තවත් පළාත් වේදිකා සැලසුම් කෙරෙමින් පවතියි. තිරසර සංවර්ධනය, වනජීවී හා කලාපීය සංවර්ධන අමාත්‍යංශය විසින් තිරසර සංවර්ධන ඉලක්ක අධීක්ෂණය සඳහා ඩිජිටල් වේදිකාවක් හා පාර්ශවකරුන්හට සම්බන්ධ වීම සඳහා මාර්ගගත වේදිකාවක් සකස් කිරීම සඳහා ද පියවර ගන්නා ලදී.

මෙම සියළු සාධක තිබියදී වුව ධාරිතා සංවර්ධනයේ, විශේෂයෙන් දත්ත ජනනය හා විශ්ලේෂණය ඇතුළුව අධීක්ෂණය හා ඇගයීම් යන ක්ෂේත්‍රය තුළ පරතරයන් වේ. ශ්‍රී ලංකාව තුළ සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති සම්පාදනය හා තිරසර සංවර්ධන ඉලක්ක වාර්තාකරණය සඳහා භාවිතා කළ හැකි දත්ත ජනනය, රැස් කිරීම හා ඵලදායී විශ්ලේෂණයට සම්බන්ධ ධාරිතාවන් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව පවතියි.[176]

තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා සියළු පුරවැසියන්ගේ සාමූහික ප්‍රයත්නයක අවශ්‍යතාවයට අනුව විශේෂයෙන් තරුණයන් අතර ස්වේච්ඡා සේවයේ යෙදීමේ සංකල්පය යනු ධාරිතා සංවර්නය පිළිබඳ සලකා බැලිය හැකි තවත් එක් අංශයකි.

ඈ) වෙළඳ හා ආයෝජන

ඉතුරුම් ආයෝජන පරතරය පියවීම පිණිස ශ්‍රී ලංකාව විසින් මූල්‍ය ඒකාබද්ධකරණ ප්‍රයත්නයන් සමග අපනයන ඉපයීම් හා විදේශ ඍජු ආයෝජන ඉහළ නැංවීම ද සිදු කළ යුතු වේ (17.11 ඉලක්කය). ශ්‍රී ලංකාවේ අපනයන ඉපයීම් දළ දේශීය නිෂ්පාදිතයෙන් 21%ක් පමණ වන අතර එය ඉහළ හා මධ්‍යම ආදායමලාභී රටවල්වලට සාපේක්ෂව පිළිවෙලින් 31% හා 24% පමණ පහළ අගයක් පවතියි.[177] 2009 වසරේ සිට ඍජු විදේශ ආයෝජන ගලා ඒම් සැලකිය යුතු ලෙස පහළ අගයක් ගත් අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් 1.1%ක සාමාන්‍යයක පැවති අතර මූලිකවම ඉඩකඩම් හා මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති මත රඳා පැවතුණි. නිදහස් ආර්ථිකයක් ඇති කිරීම සඳහා මෑත කාලීනව ගන්නා ලද ප්‍රයත්නයන්වලදී අපනයන ආදායම ඉහළ යාමක් පෙන්නුම් කරන ලද අතර 2017 දී ඩො. බි. 11.4 ක ඉහළ යාමක් වාර්තා විය. එය 2016ට වඩා 10%ක ඉහළ යාමකි. මෙම තත්වය අඛණ්ඩව පවත්වා ගත යුතුය. යුරෝපා සංගමය වෙත අපනයනය කෙරෙන භාණ්ඩ සඳහා බදු අඩු කිරීම් ආකාරයෙන් GSP+ ප්‍රතිලාභ යළි ලබා ගැනීම ද අපනයනයන් ඉහළ යාමට ඉවහල් වී ඇත (17.12 ඉලක්කය).

ඍජු විදේශ ආයෝජනවල වැදගත්කම හඳුනා ගනිමින් වසරකට ඇ.ඩො.බි. 5ක් බැගින් ඍජු විදේශ ආයෝජන ඉහළ නැංවීම පිණිස ශ්‍රී ලංකා රජය විසින් සාර්ව ආර්ථික, සාධක වෙළඳපළ, ආයතනික හා නියාමන ප්‍රතිසංස්කරණ කිහිපයක් යෝජනා කරන ලදී. එය විශේෂයෙන් අපේක්ෂා කරන්නේ ශ්‍රී ලංකාවේ ව්‍යාපාරකරණ ශ්‍රේණිගත කිරීමේ 110 සිට 70 දක්වා ඉහළ මට්ටමකට ගෙන ඒම සහ නව ව්‍යාපාර ලියාපදිංචිය සඳහා රාජ්‍ය නියෝජිතායතන රැසක් ඒකරාශී කෙරෙන හා ක්‍රියාපරිපාටීන් අනුකූලන කෙරෙන තනි කවුළුවක් ස්ථාපිත කිරීමයි.[178]

5.3 රූපයඃ අපනයන (දළ දේශීය නිෂ්පාදිතයේ %)



මූලාශ්‍රය: ලෝක සංවර්ධන දර්ශක 2017, ලෝක බැංකුව

---

175 ලෝක ආහාර වැඩසටහන2017

176 UN (2018). 'United Nations Sustainable Development Framework 2018 – 2022: Sri Lanka'. Available at http://lk.one.un.org/wp-content/uploads/2017/08/Final_UNSDF_2018-2022.pdf

177 ලෝක බැංකුව, ලෝක සංවර්ධන දර්ශක 2017

178 දැක්ම 2025

ද්විපාර්ශවීය හා කලාපීය වෙළඳ හා ආයෝජන ගිවිසුම්වලට සම්බන්ධ වීම ද ඉහළ අපනයන හා ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා වැදගත් වේ (17.6 ඉලක්කය). ඇමරිකා එක්සත් ජනපදය හා යුරෝපා සංගමය ශ්‍රී ලංකාවේ විශාලතම අපනයන වෙළඳපළවල රැඳී සිටින අතර දිගු කාලීව ආර්ථික වර්ධනය සඳහා අපනයනය සිදු කෙරෙන ස්ථාන විවිධාංගීකරණය කිරීම මෙරටේ අවශ්‍යතාවක් වන අතර ඒ සඳහා ආර්ථික වශයෙන් සංවර්ධිත සහ නැගී එන ශක්තිමත් ආසියානු ආර්ථිකයන් කෙරෙහි අවධානය යොමු කළ යුතුය. දශක දෙකකට පෙර භාණ්ඩ වෙළඳාමට අදාළව අත්සන් කරන ලද නිදහස් වෙළඳ ගිවිසුම මත පදනම්ව සකස් කෙරෙන ආයෝජන හා සේවා ලිබරල්කරණය සම්බන්ධයෙන් වන ආර්ථික හා තාක්ෂණ සහයෝගීතා ගිවිසුමකට එළඹීම සඳහා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව කටයුතු කරමින් සිටියි. ශ්‍රී ලංකාව නැගෙනහිර ලෝකයේ ගතික ආර්ථිකයන් සහිත චීනය හා සිංගප්පූරුව වැනි රාටවල් වෙත ද අවධානය යොමු කරන ලදී. චීනය සමග නිදහස් ආර්ථික ගිවිසුමක් අත්සන් කිරීම පිළිබඳ කටයුතු කරමින් පවතින අතර 2018 ජනවාරි ශ්‍රී ලංකාව හා සිංගප්පූරුවේ රජයන් අතර නිල වශයෙන් නිදහස් වෙළඳ ගිවිසුමක් අත්සන් තබන ලදී. ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම මගින් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කෙරෙන්නේ නිෂ්පාදන හා සේවා අංශයන්හි ආයෝජන ලිබරල්කරණය පිළිබඳ වන අතර ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමයේ රටවල නිෂ්පාදන අගය දාමයන් ඒකාබද්ධ කිරීම සඳහා වන අවස්ථාවන් රාශියක් ප්‍රයෝජනයට ගැනීමට ශ්‍රී ලංකාවට හැකි වෙතැයි අපේක්ෂා කෙරේ.

ඉ) ප්‍රතිපත්ති හා ආයතනික සංසක්තිය

2030 වන විට ඉලක්ක 17 සම්පූර්ණ කිරීමට ශ්‍රී ලංකා රජය විසින් 2015 දී නිව්යෝර්ක්හි දී පැවති එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන සමුළුවේ දී ප්‍රතිඥා දෙන ලදී. තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමේ පළමු පියවර ලෙස ප්‍රධාන වශයෙන් තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා වන ඉදිරි සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම පිණිස 2015 දී තිරසර සංවර්ධනය, වනජීවී හා කලාපීය සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවන ලදී. තවද 2017 අංක 19 දරණ ශ්‍රී ලංකාවේ ජාතික තිරසර සංවර්ධන පනතෙහි "සෑම අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක්, පළාත් සභාවක්, පළාත් අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තුවක් සහ පළාත් පාලන ආයතනයක් ම තම විෂය පථයට අදාළව තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා උපායමාර්ගයට අනුකූලව තිරසර සංවර්ධන උපාය මාර්ගය සකස් කළ යුතු වන්නේය" යනුවෙන් දක්වා ඇත. එබැවින් තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික, කලාපීය හා ජාත්‍යන්තර වශයෙන් වන බැඳීම් සඳහා පහසුකම් සැලසීම පිණිස විවිධ ආංශික රේඛීය නියෝජිතායතන සහ සිවිල් සමාජය හා පුද්ගලික අංශය ඇතුළුව අනෙකුත් ක්‍රියාකාරීන් හරහා 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට නෛතික හා ආයතනික් රාමුවක් සකස් කිරීම සඳහා මෙම පනත මගින් පදනමක් සැපයේ. තවද එමගින් තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් හා උපායමාර්ගයක් සැපයෙන අතර එමගින් වසර 15ක කාලයක් සඳහා රජය විසින් සියළු ම තීරණ ගැනීමේදී පාරිසරික, ආර්ථික හා සාමාජීය සාධක ඒකාබද්ධතාව ප්‍රවර්ධනය කෙරේ.

මීට අමතරව, ජනාධිපතිවරයා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද සංදේශයකට අනුව අමාත්‍යාංශයීය අනුකමිටුවක් පත් කරන ලදී. අමාත්‍යාංශයීය අනුකමිටුව කැබිනට් අමාත්‍යවරුන් පස් දෙනෙකු හා පළාත් ප්‍රධාන අමාත්‍යවරයෙකුගෙන් සමන්විත වන අතර 2030 සඳහා වන තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ දැක්ම සකස් කිරීම පිණිස උපදේශක මණ්ඩලයක් පත් කිරීම සඳහා ද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී. තවද ජනාධිපති ලේකම් කාර්යාලය මගින් නව උපාය මාර්ගික සංවර්ධන ඇගයුම් කාර්යාලයක් ස්ථාපිත කරන ලද අතර එමගින් ශ්‍රී ලංකාවේ සංවර්ධන කාර්යසාධනය ඇගයීමට ලක් කරනු ඇති අතර ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ ක්‍රියාවලියෙහි සංවර්ධනය හා එහි අනාගත අපේක්ෂාවන් පිළිබඳ ජනාධිපතිවරයා වෙත වැදගත් තොරතුරු සපයනු ඇත. [179]

තිරසර සංවර්ධන ඉලක්ක උපාය මාර්ගික සැලසුම් ක්‍රියාවලිය තුළට මුඛ්‍යධාරාගත කිරීමට පළමුව අදාළ වන්නේ තිරසර සංවර්ධන ඉලක්ක පවතින ජාතික ප්‍රතිපත්ති හා ප්‍රමුඛතාවන්ට අනුව පෙළගැන්නුම් කෙරෙන "ජාතික අනුකූලතා රාමුව" මත පදනම්ව තිරසර සංවර්ධන ඉලක්ක යමකට සීමා වන අන්දමින් සකස් කිරීම වන අතර ප්‍රගති සමාලෝචනය සඳහා දේශීය දර්ශක හඳුනාගනු ඇත. තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම ඒවා ප්‍රමුඛතාකරණයට අනුව අදියර තුනකින් සම්පූර්ණ කිරීමට නියමිතයඃ පළමු අදියර 2017-2020 දක්වා (කෙටි කාලීන); දෙවන අදියර 2020-2025 දක්වා (මධ්‍ය කාලීන); තෙවන අදියර 2025-2030 දක්වා (දිගු කාලීන). තිරසර සංවර්ධන ඉලක්ක උපාය මාර්ගික සැලසුම් ක්‍රියාවලිය තුළට මුඛ්‍යධාරාගත කිරීම සඳහා මගින් තිරසර සංවර්ධන ඉලක්ක භාර ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ජාතික හා උප ජාතික මට්ටමින් පත් කිරීම, සිසුන් අතර තරඟ පැවැත්වීම හා මාධ්‍ය වැඩසටහන් හරහා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටන් ක්‍රියාත්මක කිරීම හා "තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහනක්" ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලැබේ.

179එම

ඊ) බහු පාර්ශවීය හවුල්කාරීත්වයන්

ඵලදායී සංවර්ධන සහයෝගීතාවක් හා තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා ඵලදායී බහු පාර්ශවීය හවුල්කාරීත්වයන් වැදගත් වන බව ශ්‍රී ලංකාව අවබෝධ කොටගෙන ඇත. ආකාර කිහිපයකින් ධාරිතා සංවර්ධනය ඉහළ නැංවීම සඳහා හවුල්කාරීත්වයන් හා වැඩසටහන් හරහා ජාත්‍යන්තර සංවිධාන ශ්‍රී ලංකා රජයේ අමාත්‍යාංශවලට සහාය දක්වන ලදී. ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන 13 වැඩසටහන මගින් එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන රාමුව 2018 - 2022 හරහා තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය අනුව කටයුතු සිදු කිරීම සඳහා සහාය ලබා දීම පිණිස ශ්‍රී ලංකාව විසින් අන්‍යෝන්‍ය එකඟතාවකට පැමිණීමට කටයුතු කර ඇත.180 උදාහරණ ලෙස, ළමා හිතකාමී අධිකරණ ඇති කිරීම, ප්‍රජා සමථ මණ්ඩල ඇති කිරීම හා ශක්තිමත් කිරීම සහ සැමට සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) හා ආසියානු පදනම අධිකරණ අමාත්‍යාංශය හා එක්ව කටයුතු කරන ලද අතර රාජ්‍ය නිලධාරීන්ට අනුව මෙය විශේෂයෙන් කාර්මික හා මූල්‍ය පරතරයන් පියවීමට ඉවහල් වී ඇත.[181]

තවද තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමේ දි පුද්ගලික අංශය, නිෂ්පාදන සංවිධාන හා පුද්ගලයන්ට අදාළව රජය විසින් මෑත කාලීනව තනිව සිදු කරන ලද මූලාරම්භයන් ද වේ. උදාහරණ ලෙස, කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන ශ්‍රී ලංකා ජනාධිපති කාර්යාලය යටතේ තිරසර සංවර්ධන අංශය විසින් ක්‍රියාත්මක කරන අතර ශ්‍රී ලංකා රජය හා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුද (IFAD) එක්ව මේ සඳහා අරමුදල් සපයනු ලැබේ. රජයේ ප්‍රධාන තිරසර සංවර්ධන ඉලක්කය වන විෂමතාව අවම කිරීම හා දිළිඳුබව පිටුදැකීම උදෙසා ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමේ අරමුණින් සුළු පරිමාණ කෘෂි නිෂ්පාදකයන් ඉලක්ක කරමින් අගය දාම සංවර්ධනය හා වෙළඳපළ සබඳතාවන්වලදී හවුල් ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා මෙම වැඩසටහන පුද්ගලික අංශයේ අස්ථිත්වයන්ගේ සහයෝගය ඇතිව ක්‍රියාත්මක වේ.

කෙසේ වුවද, සහස්‍ර සංවර්ධන ඉලක්කවලට අදාළව කටයුතු කිරීමේ අත්දැකීම් මත පදනම්ව පුද්ගලික අංශය, විද්වතුන්, මහජනතාව හා ස්වේච්ඡා සේවකයන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය ප්‍රමාණවත් නොවන බවත් ඊට ප්‍රධාන හේතුව ඉලක්ක හා ඒවායේ නිශ්චිත ඉලක්ක පිළිබඳ අවබෝධය මද බව යන්නත් හඳුනාගෙන ඇත. සිය සංස්ථාපිත සමාජ වගකීම් රාමුව තුළට තිරසර සංවර්ධන ඉලක්ක යොදා ගැනීම කෙරෙහි පුද්ගලික අංශය දිරිමත් කිරීම තුළින් අදාළ සංස්ථාපිත ආයතනවලට ඍජුව සම්බන්ධ වීමේ අවස්ථාව ලැබේ; දැනට ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව, ඉන්සී සිමෙන්ති හා ඩිල්මා විසින් තිරසර සංවර්ධන ඉලක්ක සිය සංස්ථාපිත සමාජ වගකීම් රාමුව තුළට ඒකාබද්ධ කර ඇත.[182] තවද ස්වේච්ඡා සේවය මගින් ප්‍රජා සහභාගීත්වය ශක්තිමත් කිරීම, සාමාජීය අන්තර්කරණය සුරැකීම, එකමුතු බව වැඩි කිරීම හා සංවර්ධන ප්‍රතිඵලවල හිමිකාරීත්වය ශක්තිමත් කිරීම සිදු කෙරෙන බව සැලකිල්ලට ගෙන සංවර්ධන තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමේ දී මහජනතාව හා ස්වේචඡා සේවකයන් විසින් ප්‍රබල කාර්යභාරයක් ඉටු කළ යුතුය. තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ න්‍යාය ක්‍රියාත්මක කිරීමේ දී වාර්තාකරණය හා ප්‍රචාරණය හරහා මෙම ගැටළුවලට පිළියම් ලබා දිය යුතුය.

උ) දත්ත, අධීක්ෂණය හා වගවීම

තිරසර සංවර්ධන ඉලක්කවල ප්‍රගතිය හඳුනා ගැනීමේ අවශ්‍ය වන සංඛ්‍යාන දත්ත රැස් කිරීම, සංග්‍රහගත කිරීම, විශ්ලේෂණය හා බෙදාහැරීම පිළිබඳ වගකීම ශ්‍රී ලංකා ජනගහන සහ ජන සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සතුවේ. ශ්‍රී ලංකාවේ සංඛ්‍යාන පද්ධතිය ඉතා ස්ථාවර හා මනාව පවත්වාගෙන යන සහ ඇතැම් තිරසර සංවර්ධන ඉලක්කවල ප්‍රගතිය හඳුනා ගැනීම පිණිස මනාව ස්ථාපිත කර ඇති පද්ධතියක් වේ. තිරසර සංවර්ධන ඉලක්කවල තත්වය අධීක්ෂණය කිරීම සඳහා වන අමතර දත්ත අවශ්‍යතාවන් තක්සේරු කිරීම හා අවශ්‍ය නිර්දේශයන් ලබා දීමේ කාර්යය ශ්‍රී ලංකා ජනගහන සහ ජන සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ පර්යේෂණ ඒකකය වෙත පැවරී ඇත.

ශ්‍රී ලංකා රජය විසින් තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ දර්ශකයන්ගේ තත්වය තත්වය පිළිබඳ වාර්තා කිරීම සඳහා 2017 ජූලි හිදී වාර්තාවක් නිකුත් කළ අතර ඒ සඳහා වෙබ් අඩවියක් ද දියත් කරන ලද අතර ඒවා අඛණ්ඩව උත්ශේණිගත කෙරේ. ශ්‍රී ලංකා ජනගහන සහ ජන සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාව සඳහා තිරසර සංවර්ධන ඉලක්කවලට අදාළ දත්ත ලද හැකි බව පිළිබඳ අධ්‍යයනය කිරීම සහ විවිධ මූලාශ්‍රයන්ගෙන් දත්ත රැස් කර පවතින දත්ත ඇතුළත් වාර්තාවක් සකස් කිරීම සඳහා කමිටුවක් පිහිටුවන ලදී. මෙම කමිටුව විසින් ශ්‍රී ලංකා ජනගහන සහ ජන සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා ජනගහන සහ ජන සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් වෙනත් ප්‍රධාන දෙපාර්තමේන්තුවල ස්ථාපිත කරන ලද සංඛ්‍යා ලේඛන ඒකක සම්පාදනය කළ සියළු දර්ශක විචාරාත්මක ලෙස සමාලෝචනය කරන ලදී. සිදු කෙරෙමින් පවතින සංගනන, සමීක්ෂණ හා පරිපාලන දත්ත මගින් තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ දර්ශක 46 සඳහා දත්ත පවතින බව කමිටුව විසින් සොයා ගනු ලැබීය.

---

180 ලෝක ආහාර වැඩසටහන2017

181 Tilakaratna et al. (2017). "National Level Implications of SDG Implementation: The Case of Sri Lanka." Occasional Paper Series 41, Southern Voice on Post-MDG International Development Goals

182 ස්වේච්ඡා ජාතික සමාලෝචන වලංගුකරණයේ දී පාර්ශවකරුවන් ඉදිරිපත් කළ අදහස්

මීට අමතරව පවතින සංගනන හා සමීක්ෂණ තුළට නව මොඩියුල එක් කිරීමෙන් හෝ නව සමීක්ෂණ හෝ විශේෂ අධ්‍යයන මගින් දර්ශක 29ක් සඳහා වන දත්ත සංග්‍රහගත කළ හැකි බව ඔවුන් විසින් හඳුනා ගන්නා ලදී (5.1 ඉලක්කය). [183]

5.1 වගුව: ශ්‍රී ලංකාව සඳහා තිරසර සංවර්ධන ඉලක්කවලට අදාළ දත්ත ලද හැකි බව

වර්ගීකරණය	දර්ශක සංඛ්‍යාව
ශ්‍රී ලංකා ජනගහන සහ ජන සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් දැනටමත් සංග්‍රහගත කර ඇති	46
ශ්‍රී ලංකා ජනගහන සහ ජන සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් සංග්‍රහගත කිරීමට නියමිත	29
දැනට පවතින හෝ වෙනත් ආයතන මගින් සංග්‍රහගත කිරීමට නියමිත	131
කලාපීය/ ගෝලීය දර්ශක	35
ශ්‍රී ලංකාවට අදාළ නොවේ	3
එකතුව	244

කෙසේ වුවද, තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ දර්ශක සැලකිය යුතු සංඛ්‍යාවක් සඳහා පාදම් රේඛා දත්ත හිඟය තිරසර සංවර්ධන ඉලක්කවලට අදාළ ප්‍රගතිය විශ්ලේෂණය හා අධීක්ෂණය කෙරෙහි පවතින බාධාවකි. විශේෂයෙන් තිරසර සංවර්ධන ඉලක්කය 12 (වගකීම්සහගත පරිභෝජනය හා නිෂ්පාදනය), 13 (කාලගුණය හා සම්බන්ධ ක්‍රියාමාර්ග), 14 (දිය යට ජීවය), 15 (මිහි මත ජීවය) හා 17 (ඉලක්ක සඳහා හවුල්කාරීත්වයන්) ට අදාළ දර්ශක සඳහා පාදම් රේඛා දත්ත නොමැත.[184] දත්ත ලද හැකි අවස්ථාවලදී දේශීය වශයෙන් භාවිතා කරන නිර්වචන හා දර්ශක වාර්තාවට ඇතුළත් වේ. දත්ත රැස් කිරීමේ දී කිසිවෙකු මග නොහැරීමට වග බලා ගනිමින් අනාගත සමීක්ෂණවලදී වෙන් වෙන් වූ මට්ටම්වලට අවධානය යොමු කිරීමට ඔවුහු සැලසුම් කරති.

වෙනත් නියෝජිතායතන මගින් කටයුතු කිරීම සඳහා තවත් දර්ශක 131ක් හඳුනා ගන්නා ලදී. ඒ අනුව තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ දර්ශක සඳහා දත්ත සැපයීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අමතරව වෙනත් ආයතනවල අවශ්‍යතාව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් අවධාරණය කරන ලදී. ශ්‍රී ලංකාවට අදාළ නොවන හෝ තවදුරටත් ස්ථානීකරණය කළ යුතු ඇතැම් දර්ශක වේ. එක්සත් ජාතීන්ගේ විශේෂඥ නියෝජිතායතන වැනි වෙනත් ආයතන විසින් ගෝලීය හෝ කලාපීය ඉලක්කවලට සමාන දර්ශක සංග්‍රහගත කරනු ලැබේ. මෙමගින් ද විවිධ ආයතන අතර ශක්තිමත් හවුල්කාරීත්වයන් හා දත්ත සහ වෙනත් සම්පත් හුවමාරු කිරීමේ අවශ්‍යතාව අවධාරණය කෙරේ.[185]

ජලය විද්‍යාත්මක මැනීම හා කෘෂිකාර්මික දර්ශකයන්ට අදාළ ඉලක්ක සඳහා සහ 17.7 හා 17.8 ඉලක්ක ඇතුළුව විද්‍යාත්මක හා කාර්මික ඇස්තමේන්තු අවශ්‍ය දර්ශකයන් සඳහා දත්ත රැස් කිරීම සඳහා ධාරිතා සංවර්ධනය හා පුහුණු කිරීම අවශ්‍ය වනු ඇත. විශේෂයෙන් රටේ සංඛ්‍යාලේඛන ලබා දීම හා බෙදාහැරීමේ දී ජාත්‍යන්තර ප්‍රමිති භාවිතා කරන බවට වග බලා ගැනීම සඳහා ද උප ජාතික මට්ටම්වලදී ධාරිතා සංවර්ධනය වැදගත් වේ. ජාතික සංඛ්‍යාලේඛන පද්ධතිය (NSS) ජාතික සංඛ්‍යාලේඛන කාර්යාලයෙන් (NSO) සහ නිල සංඛ්‍යාලේඛන ලබා දෙන වෙනත් ඕනෑම ආයතනයකින් සමන්විත වේ. ක්‍රමවත් හා විශ්වසනීය දත්ත ලබා දෙන ඵලදායී හා කාර්යක්ෂම ජාතික සංඛ්‍යාලේඛන පද්ධතියක් (NSS) යනු යහපත් ප්‍රතිපත්ති ඇති බව පිළිබිඹු කරන්නක් හා යහ පාලනයේ තීරණාත්මක සංරචකයක් ද වේ.

තිරසර සංවර්ධන ඉලක්ක සඳහා ජාතික සංඛ්‍යාලේඛන පද්ධති මගින් සාම්ප්‍රදායකව ලබා නොදෙන ක්ෂේත්‍රවල දත්ත පමණක් නොව කිසිවෙකු මග නොහරින බවට වග බලා ගැනීම සඳහා වෙන් වෙන් වූ නව මට්ටම්වල දත්ත ද අවශ්‍ය වේ. සාම්ප්‍රදායක ජාතික සංඛ්‍යාලේඛන පද්ධති මගින් අවශ්‍ය සියළු ම දත්ත සැපයිය නොහැකි අතර වෙනත් දෙපාර්තමෙන්තු හා අමාත්‍යංශ, පුද්ගලික අංශ සංවිධාන, පර්යේෂණ ආයතන හා විශ්ව විද්‍යාල වැනි නව ක්‍රියාකාරීන් මේ වන විට පුළුල් දත්ත පද්ධතියකට අදාළව කටයුතු කළ යුතුය. එබැවින් තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමේ දී ඵලදායී ලෙස සම්පත් යොමු කිරීම හා ආයෝජන ප්‍රමුඛතාකරණය සඳහා

183 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු (2017)

184 සැලකිය යුතු දර්ශක සංඛ්‍යාවක් සඳහා පාදම් රේඛා දත්ත හිඟය මෙන් ම යාවත්කාලීන කරන ලද දත්ත නොමැති වීම පාර්ශවරුවන් විසින් ස්වේච්ඡා ජාතික සමාලෝචන වලංගුකරණයේ දී මතු කරන ලද කරුණු වේ

181 ස්වේච්ඡා ජාතික සමාලෝචන වලංගුකරණයේ දී පාර්ශවකරුවන් ඉදිරිපත් කළ අදහස්

ශ්‍රී ලංකාවේ දත්ත ධාරිතාවට අදාළව ගුණාත්මකභාවය හා සංඛ්‍යාතයෙහි සැලකිය යුතු සංවර්ධනයන් අවශ්‍ය වේ. තිරසර සංවර්ධන ඉලක්ක ජාතික සැලසුම් ක්‍රියාවලීන් හා සංවර්ධන උපාය මාර්ග තුළට ඇතුළත් කිරීම සැලසුම් කිරීම සඳහා ජාතික දර්ශකයන් අවශ්‍ය වේ. දත්ත සඳහා කේන්ද්‍රගත ව්‍යුහයක අවශ්‍යතාව හඳුනා ගන්නා ලද අතර වෙනත් රටවල උදාහරණ භාවිතා කළ හැකි ආකෘති ලෙස සලකන ලදී. දත්ත අවශ්‍යතා බොහෝමයක් හඳුනාගැනීමේ දී ප්‍රගතියක් ලබා ගෙන ඇති ජනගහන සහ ජන සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්ට අදාළ දර්ශක ඇගයීමට ලක් කරන ලද අතර අමාත්‍යංශ විසින් ද ඒවා යටතේ වන ක්ෂේත්‍ර සඳහා එලෙස ම කටයුතු කරන ලදී. තිරසර සංවර්ධන ඉලක්ක දත්ත කාර්යසාධක කණ්ඩායමක් පිහිටුවීම තිරසර සංවර්ධන ඉලක්කවල දත්ත අවශ්‍යතාවන් සම්බන්ධීකරණය කිරීමේ තීරණාත්මක කාර්යය අධීක්ෂණය කිරීමේ දී ඉතා ප්‍රයෝජනවත් වනු ඇත. එක් එක් ඉලක්කට පිළිබඳ වෙන වෙනම කටයුතු කිරීම හෝ ඉලක්ක පොදු තේමා යටතේ වෙන් කිරීම සඳහා මෙම කාර්යසාධක කණ්ඩායම යටතේ ක්‍රියාකාරී කණ්ඩායම් ස්ථාපිත කළ හැකිය.

06

නිගමනය

ශ්‍රී ලංකා රජය විසින් තිරසර සංවර්ධන ඉලක්ක මුඛ්‍යධාරාගත කිරීම සඳහා මූලාරම්භයන් කිහිපයක් ගන්නා ලදී. තිරසර සංවර්ධනය පිළිබඳ පාර්ලිමේන්තු තේරීම් කමිටුවක් පිහිටුවීම, 2017 අංක 19 දරණ තිරසර සංවර්ධන පනත ක්‍රියාවට නැංවීම හා තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාවට නැංවීම සම්බන්ධීකරණය හා ඒ සඳහා පහසුකම් සැලසීමේ කේන්ද්‍රීය ලක්ෂය ලෙස තිරසර සංවර්ධනය, වනජීවී හා කලාපීය සංවර්ධන අමාත්‍යංශය පිහිටුවීම තිරසර සංවර්ධන ඉලක්ක කෙරෙහි ශ්‍රී ලංකාවේ කැපවීම අවධාරණය කෙරෙන ප්‍රධාන මූලාරම්භයන් අතර වේ. තවද 2017 දී ශ්‍රී ලංකාව විසින් 2018 ජූලි මස පැවැත්වෙන ඉහළ මට්ටමේ දේශපාලන සාකච්ඡාවේ දී පළමු ස්වේච්ඡා ජාතික සමාලෝචනය ඉදිරිපත් කිරීමට ඇති කැමැත්ත ප්‍රකාශ කරන ලදී.

ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති රාමුව මගින් රට තිරසර සංවර්ධන මූලධර්මවල පිළිගන්නා බව පිළිබිඹු කෙරේ. මෙරට උපාය මාර්ගික සංවර්ධන රාමුව එහි දිගු කාලීන සංවර්ධන සැලැස්ම, 2025 දැක්මඃ පොහොසත් රටක්, එහි මධ්‍ය කාලීන සංවර්ධන සැලැස්ම, රාජ්‍ය ආයෝජන වැඩසටහනඃ 2017 - 2020, 2018 " නීල හරිත" අයවැය තුළින් පිළිබඳ පරීක්ෂා කර බැලිය හැකිය. තිරසර සංවර්ධන ඉලක්ක ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීම ඒවා ජාතික ප්‍රතිපත්ති හා උපාය මාර්ගික රාමුවලට අනුකූල වීම මත රඳා පවතියි. අරමුණු හා ඉලක්ක යන මට්ටම් දෙකේදීම ජාතික ප්‍රතිපත්ති තිරසර සංවර්ධන ඉලක්කවලට අනුකූල වන බව සොයා ගැනීම්වලින් අනාවරණය වේ. කෙසේ වුවද, විශේෂයෙන් පරිසරය හා හවුල්කාරීත්වයන්ට අදාළව අර්ධ වශයෙන් අනුකූල වන ඉලක්ක/ ක්ෂේත්‍ර ගණනාවක් වේ. මීට අමතරව, 2015 දැක්ම, 2017 - 2020 රාජ්‍ය ආයෝජන වැඩසටහන හා 2018 අයවැය මගින් ඉදිරිපත් කර ඇති ශ්‍රී ලංකාවේ වර්තමාන උපාය මාර්ගික සංවර්ධන රාමුවට ආර්ථික, සාමාජීය හා පාරිසරික යන තිරසර සංවර්ධනයේ පැතිකඩ තුනම ඇතුළත් කර ඇත.

ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා ජාතික සමාලෝචන ක්‍රියාවලිය යනු උපදේශක වැඩමුළු හරහා බහු පාර්ශවකරුවන්ගේ සම්බන්ධ වීම - රාජ්‍ය, පුද්ගලික අංශය, විද්වතුන් හා සිවිල් සමාජ සංවිධාන සහිත වූ සහයෝගීතා සහ සියල්ල ඇතුළත් වූ ක්‍රියාවලියක් වන අතර එමගින් 2018 ස්වේච්ඡා ජාතික සමාලෝචනයෙන් ඔබ්බට තවදුරටත් සම්බන්ධ වීම සඳහා පදනම සකස් කරන ලදී.

ශ්‍රී ලංකා ස්වේච්ඡා ජාතික සමාලෝචනය මගින් තිරසර සංවර්ධන ඉලක්ක 17 ම ආවරණය කරන ලද අතර එමගින් 2018 පැවති ඉහළ මට්ටමේ දේශපාලන සාකච්ඡාවේ දී ගැඹුරින් සමාලෝචනය කිරීම සඳහා තෝරා ගත් ඉලක්ක පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණය සහිතව වර්තමාන තත්වය හා ප්‍රවණතාවන්, පරතරයන් හා අභියෝග සහ එක් එක් ඉලක්කය සඳහා ඉදිරි ගමන් මග විශ්ලේෂණය කරන ලදී. පිළියම් ලබා දීම සඳහා කලාපීය විෂමතාවන් තිබුණ ද තිරසර සංවර්ධන ඉලක්ක 6 සම්බන්ධයෙන් ආරක්ෂිත පානීය ජලය ලබා ගැනීමට අදාළව ශ්‍රී ලංකාව විසින් ප්‍රගතියක් අත් පත් කර ගනු ලැබීය. තවද මේ සම්බන්ධයෙන් දේශගුණ විපර්යාස මගින් ඇති කෙරෙන බලපෑම් මගින් ද අභියෝග එල්ල විය හැකිය. නිවාස අතරින් බහුතරයක් සඳහා නිවාස ආශ්‍රිතව ම සනීපාරක්ෂක පහසුකම් පවතින නමුත් එම ස්ථානීය සනීපාරක්ෂක පහසුකම් මගින් ඇති විය හැකි සෞඛ්‍ය හා පාරිසරික බලපෑම් අවම කිරීම සඳහා කේන්ද්‍රගත මළාපවහන පද්ධතියක අවශ්‍යතාව පවතියි. 7 වන තිරසර සංවර්ධන ඉලක්කය සම්බන්ධයෙන් පොසිල ඉන්ධන මත රඳා පැවතීම ඉහළ යාම බලශක්ති අංශය තුළ පවතින ප්‍රබල අභියෝගයකි.

විදුලිය සැපයීමට අදාළව මෙරට සැලකිය යුතු සාධනයක් ළඟා කරගෙන ඇත. පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර වැදගත් කාර්ය භාරයක් ඉටු කරන අතර සූර්ය බල ශක්තිය ඇතුළුව පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර තවදුරටත් උපයෝජනය සඳහා හැකියාව පවතියි.

නාගරීකරණය හේතුවෙන් ප්‍රවාහනය, නිවාස හා පාරිසරික ගැටළුවලට අදාළව ශ්‍රී ලංකාව අභියෝගවලට මුහුණ දී ඇත (තිරසර සංවර්ධන ඉලක්ක 11). මෙම ගැටළු සඳහා විසඳුම් ලබා දීම පිණිස ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම ගැටළු සඳහා ආපදා අවදානම අවම කිරීමට අදාළව විසඳුම් ලබා දීම පිණිස මේ වන විට ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක වෙමින් පවතියි. 2018- 2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සකස් කරන ලදී. වගකීම්සහගත පරිභෝජනය හා නිෂ්පාදනය යනු මෑත කාලීනව ප්‍රතිපත්ති මගින් අවධානය යොමු කරන ලද ක්ෂේත්‍රයකි (12වන තිරසර සංවර්ධන ඉලක්කය). වගකීම්සහගත පරිභෝජනය හා නිෂ්පාදනය සඳහා ප්‍රතිපත්තියක් සකස් කිරීම, වගකීම්සහගත පරිභෝජනය හා නිෂ්පාදනය පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම, හරිත ප්‍රසම්පාදන හා හරිත වාර්තාකරණ පද්ධතිය යනු වැදගත් මූලාරම්භයන් කිහිපයකි. වගකීම්සහගත පරිභෝජනය හා නිෂ්පාදනය ආංශික ප්‍රතිපත්ති තුළට මුඛ්‍යධාරාගත කිරීම හා මේ සම්බන්ධයෙන් පුද්ගලික අංශ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම වැදගත් වේ. 2016 - 2022 ජාතික ජෛව විවිධත්ව උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලද්දේ ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය අහිමි වීමට අදාළ ගැටළු සඳහා පිළියම් ලබා දීම පිණිසයි (15 තිරසර සංවර්ධන ඉලක්කය). ජෛව විවිධත්වය අහිමි වීමට ප්‍රධාන හේතුවක් වන්නේ වන හායනය වන අතර එය භූමි හායනයට ද සම්බන්ධවේ. වන හායනය හා වනහරණය අවම කිරීම සඳහා අදාළ නීති නිසි පරිදි බලාත්මක කිරීම වැදගත් වේ. වන සීමාවන් පැහැදිලි ලෙස වෙන් කිරීම හා වන කළමනාකරණ නියෝජිතායතනවල ධාරිතාව ඉහළ නැංවීම සහ ජනතාවගේ දැනුවත්භාවය ඉහළ නැංවීම මගින් මේ සඳහා සහාය දැක්විය යුතුය.

ශ්‍රී ලංකා විශේෂයෙන් අධ්‍යාපන, සෞඛ්‍ය හා දරිද්‍රතාව ආදී තිරසර සංවර්ධන ඉලක්කවලට අදාළ ක්ෂේත්‍ර කිහිපයක් තුළ කැපී පෙනෙන ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

මාතෘ හා ළමා මරණ ප්‍රමාණය අඩු වීම හා ආයු අපේක්ෂාව ඉහළ යාම වැනි ප්‍රතිඵල ළඟා කර ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය පද්ධතිය ප්‍රසිද්ධියක් උසුලයි. සැබවින්ම දශක දෙකකට පෙර තිරසර සංවර්ධන ඉලක්ක (3.1 ඉලක්කය) යටතේ ශ්‍රී ලංකාව මාතෘ මරණ අනුපාතයේ ගෝලීය ඉලක්කය ළඟා කරගෙන ඇත. මීට අමතරව, අධ්‍යාපන අංශයේ ද ජයග්‍රහණ රැසක් ලබා ගැනීමට ශ්‍රී ලංකාවට හැකි වී ඇත. දකුණු ආසියානු කලාපය තුළ පමණක් නොව මධ්‍ය ආදායම්ලාභී හා ඉහළ ආදායම්ලාභී රටවල් අතර ද ප්‍රාථමික හා ද්විතියික මට්ටම්වල අධ්‍යාපනික ජයග්‍රහන ලබා ගැනීමට අදාළව ශ්‍රී ලංකාව සැලකිය යුතු තත්වයක් හිමි කරගෙන සිටියි. දිළඳුබව අඩු කිරීමට අදාළව පසුගිය දශකය තුළ ශ්‍රී ලංකාව සැලකිය යුතු ප්‍රගතියක් ලබාගෙන ඇති අතර 2016 දී දරිද්‍රතා දර්ශකයේ 4.1%ට ළඟා විය. කෙසේ වුවද, දරිද්‍රතාවයට හා මූලික සේවාවන් වෙත වන ප්‍රවේශයට අදාළව කලාපීය විෂමතාවන් පවතින අතර ආදායම් අසමානතාව අවධානයට ලක් විය යුතු ගැටළුක්ව පවතියි.

තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව අභියෝග කිහිපයකට මුහුණ දෙයි. විශේෂයෙන් මූල්‍යනය, තාක්ෂණ සංවර්ධන, ධාරිතා සංවර්ධනය, වෙළඳ හා ආයෝජන මෙන්ම ප්‍රතිපත්ති හා ආයතනික සංසක්තිය, බහු පාර්ශවීය හවුල්කාරීත්වයන් සහ දත්ත අධීක්ෂණය හා වගවීම වැනි ක්‍රමානුකූල ගැටළු ද මීට අදාළ වේ. මූල්‍යනය සම්බන්ධයෙන් ගත් කල බදු හා වෙනත් ආදායම් රැස් කිරීම සඳහා දේශීය ධාරිතා සංවර්ධනය පිණිස ශ්‍රී ලංකාවේ සම්පත් සචලීකරණ ප්‍රයත්නයන් ශක්තිමත් කළ යුතු අතර බදු පදනම් පුළුල් කරමින් බදු ව්‍යුහය සරළ කිරීම සඳහා දැනටමත් ක්‍රියාමාර්ග ගෙන ඇත.

වඩා නව්‍ය, දැනුම් පාදක ආර්ථිකයක් වෙත මාරු වීමේ අවශ්‍යතාව හඳුනා ගනිමින් රජය විසින් ශ්‍රී ලංකාවේ තාක්ෂණ හා ඩිජිටල්කරණ අංශ වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම හා සැලසුම්කරණය, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණයට සම්බන්ධ පාර්ශවකරුවන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා ද රජය විසින් ප්‍රයත්නයන් කිහිපයක් ගන්නා ලදී.

Printed in Sri Lanka
June 2018